199 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 199 - இல. 3
**Volume 199 - No. 3**

2011 මැයි 05 වන බ්‍රහස්පතින්දා
2011 மே 05, வியாழக்கிழமை
**Thursday, 05th May, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

ස්වානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

හෘදය රෝග සැත්කම් පහසුකම් වැඩි කිරීම

**පාසල් නිල ඇඳුම් රෙදි  සැපයීම:**

වැඩ බලන අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**මහජන ආරක්ෂක ප්‍රකාශනය**

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු**


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புக்கள்:**

ஊழியர் ஓய்வூதிய நன்மைகள் நிதியம் சட்டமூலம்: உயர்நீதிமன்றத் தீர்ப்பு

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

இருதயநோய்ச் சத்திரசிகிச்சை வசதிகளை அதிகரித்தல்

**பாடசாலைச்  சீருடைத் துணி விநியோகம்:**

பதில் கல்வி அமைச்சரினது கூற்று

**பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்**

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்**


---

# PRINCIPAL  CONTENTS


ANNOUNCEMENTS:

Employees' Pension Benefits Fund Bill: Determination of the  Supreme Court

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Increase of   Heart Surgery Facilities

SUPPLY OF SCHOOL UNIFORM MATERIAL:

Statement by Acting Minister of Education

PUBLIC SECURITY PROCLAMATION

WRITTEN ANSWERS TO QUESTIONS

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2011 මැයි 05 වන බ්‍රහස්පතින්දා***
*2011 மே 05, வியாழக்கிழமை*
*Thursday, 05th May, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.*, MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### ஊழியர் ஓய்வூதிய நன்மைகள் நிதியம் சட்டமூலம்: உயர்நீதிமன்றத் தீர்ப்பு
### EMPLOYEES' PENSION BENEFITS FUND BILL: DETERMINATION OF THE SUPREME COURT

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද "සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල්" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ස්ථාවර නියෝග 50(2)(ඇ) අනුව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

පනත් කෙටුම්පත හෝ එහි වගන්ති කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.

***ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය:***
*உயர் நீதிமன்றத் தீர்ப்பு:*
*Determination of the Supreme Court:*

**IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

A Bill titled "**Employees' Pension Benefits Fund**".

In the matter of an application under Article 121 of the Constitution.

Present: Dr. Shirani A. Bandaranayake - Judge of the Supreme Court
N. G. Amaratunga - Judge of the Supreme Court
R.K.S. Suresh Chandra - Judge of the Supreme Court

**S.C. Special Determination No. 01/2011**

Ekeshwara Kottegoda Vithana,
F/25, National Housing Scheme,
Polhena,
Kelaniya.

**Petitioner**

Vs.

Hon. The Attorney-General,
Attorney General's Department,
Colombo 12.

**Respondent**

Counsel: Ronald C. Perera with S.H.A. Mohamed and Nalin Amarajeewa for the petitioner

W.P.G. Dep, P.C., S.G., with Indika Demuni de Silva, D.S.G., and Viveka S. de Silva, S.S.C., for the Hon. The Attorney-General

Court assembled for hearing at 10.45 a.m. on 02nd May, 2011.

A Bill bearing the title Employees' Pension Benefits Fund was placed on the Order Paper of Parliament on 08.04.2011. A petition has been filed invoking the jurisdiction of this Court in terms of Article 121(1) for a determination in terms of Article 123 of the Constitution as to whether the Bill or any provision thereof is inconsistent with the Constitution.

Upon receipt of the petition, the Court had issued notice on the Hon. The Attorney-General as required by Article 134(1) of the Constitution.

Learned Counsel representing the petitioner, and the Solicitor-General, representing the Hon. The Attorney-General, were heard before this Bench at the sittings held on 02.05.2011.

Learned Counsel for the petitioner contended that clauses 2, 3, 5(3) and clause 10 are in violation of Article 12(1) of the Constitution. Learned Counsel for the petitioner also contended that clauses 13, 25(2) and 26(1) are violative of Article 14(1)g of the Constitution.

The long title of the Bill indicates that the objective of the Bill is to establish an Employees' Pension Benefits Fund in order to provide for a pension benefit scheme to pensioners, who are not entitled to any pension benefits.

Learned Solicitor-General, while making his submissions, informed Court that according to the statistics provided by the Department of Census and Statistics, it is clearly evident that in Sri Lanka only less than 20% of retired employees enjoy some form of retirement benefits from Government pension schemes and other

pension funds. He also submitted that as a result, employees have to face many hardships after retirement or when they reach a non-working age. It was accordingly submitted that this Bill has made provision to introduce a modest and a meaningful pension scheme to benefit employees of certain categories after their retirement.

Learned Counsel for the petitioner submitted that the objectives of the said Bill are laudable.

**Clause 2**

The Bill consists of 51 clauses under 5 Parts. Clause 2 is listed under Part I, which deals with the establishment and administration of the Act. The said clause 2 is to provide for the establishment of Employees' Pension Benefits Fund and reads as follows:

> "2(1) For the purpose of this Act there shall be established a fund called the Employees' Pension Benefits Fund (hereinafter in this Act referred to as "the Fund")
>
> (2) There shall be paid into the Fund –
>
> a) ten percentum of the annual profit of the Employees' Trust Fund;
>
> b) the money lying in inactive accounts of members of the Employees' Provident Fund, where such members have passed the age of seventy years; and
>
> c) a Government Bond for rupees one thousand million having long term maturity period."

The contention of the learned Counsel for the petitioner was that clause 2(2)(a) of the Bill stands to deprive the members of the Employees' Trust Fund of their due entitlements to the dividends realized from the investment of the monies of the Trust Fund. His position was that in terms of the last Annual Report and Accounts published for the year 2009 by the Employees' Trust Fund (ETF) it had provided additional benefits for its members and monies had been released for such purposes. For instance, it was submitted that Rs. 199 Million was released to the NDB Bank on behalf of "*Viyana*" Housing Loan Programme to facilitate 217 members to obtain housing loans during the year.

Accordingly learned Counsel for the petitioner contended that the said provision in clause 2(2)(a), which provides for 10% of the annual profit of the Employees' Trust Fund" to be paid into the "Fund", is inconsistent with Article 12(1) of the Constitution.

Article 12(1) of the Constitution, that deals with the right to equality, is in line with Article 7 of the Universal Declaration of Human Rights (1948), which states that, "all are equal before the law and are entitled without any discrimination, to equal protection of the law." The said Article 12(1) clearly postulates that there should be equal treatment in equal circumstances and that there should not be any discrimination between persons, who are similarly circumstanced.

It is quite evident that the dividends of the Employees' Trust Fund are being utilized for the benefit of its members. It is also evident that the objective of the Bill is to provide for a pension scheme for those in certain employments who are also members of the Employees' Trust Fund. Accordingly as was contended by the learned Solicitor-General, the monies for the Employees' Trust Fund are finally to be utilized to provide benefits to the members of the said Fund during their life time. It would also not be correct to state that there is no provision in the Employees' Trust Fund Act, for the deduction of the aforesaid 10% from the annual profit of the Employees' Trust Fund, as provision has already been made for such deductions and moreover as such amendments could be brought to the Employees' Trust Fund Act, by way of subsequent legislation.

Considering the aforementioned circumstances, it would not be correct to state that there is unequal treatment by the transfer of the 10% of the annual profit of the Employees' Trust Fund into the Employees' Pension Benefit Fund. In such circumstances, there cannot be any violation of Article 12(1) of the Constitution.

Learned Counsel for the petitioner contended that clause 2(2)(b) of the Bill, which provides for the monies lying in inactive accounts of members of the Employees' Provident Fund, where such members have passed the age of seventy years to be paid into the Fund is inconsistent with Article 12(1) of the Constitution.

Learned Solicitor-General submitted that the Government has already decided to amend the said sub-clause by adding a proviso thereto permitting the payment of any claim in respect of such accounts.

Learned Counsel for the petitioner submitted that it is a concern and inquired as to whether the Government Bond for rupees one thousand million having long term maturity period which would be another source to the Employees' Pension Benefits Fund would be taken as a loan. Learned Solicitor-General quite categorically stated that the Treasury Bonds cannot be regarded as a loan, but a grant given by the State as its contribution to the said Employees' Pension Benefits Fund, which would have a long term maturity period. It was also submitted that the said Treasury Bonds would generate interest and if the Manager of the said Fund so decides could be discounted at any given time.

**Clause 3**

Learned Counsel for the petitioner submitted that clauses 3(1) and 3(2) are in violation of Article 12(1) of the Constitution. Objection was taken in terms of clause 3(1) on the basis of the continuation of the membership of the Fund being limited 'for so long as there remains to his credit, any sum of money in his individual account in the Fund'.

Learned Solicitor-General submitted that the provisions of clauses 3(1) and 3(2) are identical to Section 3(1) of the Employees Provident Fund, Act No. 15 of 1958, but considering the nature of the Employees' Pension Benefits Fund, the Government has decided to extend the membership of the employee during his life time. The proposed amendment is as follows:

> "An employee shall become a member of the Fund at the time such employee first becomes liable under Section 12 and Section 13 to pay contributions to the Fund and shall continue to be a member during his life time".

Learned Counsel for the petitioner contended that clause 3(2) deprives the members and heirs from claiming entitlements, which are lawfully due to them and therefore is in violation of Article 12(1) of the Constitution.

Learned Solicitor-General submitted that Section 3(2) of the Employees' Provident Fund Act, No. 15 of 1958 and Section 15(2) of the Employees' Trust Fund Act, No. 46 of 1980 are also in similar terms. When there are similar provisions contained in two of the statutes which provide benefits for employees, it would not be correct to contend that clause 3(2), which is being drafted on the same terms as in Employees' Provident Fund Act and the Employees' Trust Fund Act is in violation of Article 12(1) of the Constitution. Such a violation could arise only if there is unequal treatment under similar circumstances. When all are being treated similarly under equal terms there cannot be any unequal treatment and in such circumstances clause 3(2) is not in violation of Article 12(1) of the Constitution.

**Clause 5(3)**

Learned Counsel for the petitioner submitted that, clause 5(3) of the Bill is inconsistent with Article 12(1) of the Constitution. The said clause reads as follows:

> "For the purposes of paragraph (m) of sub-section (1) 'expenses' shall include –
>
> (i) any loss of moneys on account of theft, misappropriation or overpayment;
>
> (ii) any loss of articles, being furniture, office equipment or stationery used in or purchased for the administration of the Fund, the cost of which cannot be recovered from the persons responsible for such loss; and
>
> (iii) the value of any articles being stationery, furniture or office equipment which are not usable or which are not functioning and are incapable of being repaired."

Clause 5(1)(m) states that the

> "Monetary Board . . . .
>
> shall, deduct from the income from the investment of moneys of the fund, the expense incurred by the Board and the Commissioner in carrying out their respective functions under this Act."

Referring to the aforementioned clauses, learned Counsel for the petitioner contended that legal recognition of protection for criminal acts, which are under normal circumstances considered as offences have been given and therefore the said clause 5(3) is inconsistent with Article 12(1) of the Constitution.

Learned Solicitor-General for the respondent contended that the purpose of the provision laid down in clause 5(3) was not to circumvent any criminal proceedings against any type of perpetrators of an offence in respect of the Fund. He further contended that what is intended is that to set off any loss on account of the matters, where the recovery would not be feasible.

It is to be noted that a provision similar to clause 5(3) of the Bill under review is contained in Section 5(3) of the Employees' Provident Fund Act. The said Section in the Employees' Provident Fund Act is as follows:

> "For the purposes of paragraph (k) of sub-section (1), 'expenses' shall include –
>
> i) any loss of moneys on account of theft, misappropriation or over-payment;
>
> ii) any loss of articles of furniture, office equipment or stationery used in or purchased for the administration of the Fund the cost of which cannot be recovered from the persons responsible for such loss; and
>
> iii) the value of any article of furniture, office equipment or stationery written off on grounds of unserviceability.

It is therefore abundantly clear that clause 5(3) of the Bill is not introduced for the first time to give legal recognition of protection for criminal acts, which are under normal circumstances considered as offences.

Moreover, it is to be borne in mind that, the Bill itself provides sufficient safeguards with regard to the security of the monies in the Employees' Pension Benefits Fund. For instance, clause 4 of the Bill clearly states that, the Commissioner-General of Labour shall be in charge of the general administration. Also in terms of clause 5 of the Bill the monies lying to the credit of the Fund would be in the custody of the Monetary Board. Clause 7 clearly states that the accounts of the Fund in respect of each year shall be audited by the Auditor-General. Learned Solicitor-General submitted that the activities of the Fund would be scrutinized by the Parliament and thereby the accountability of the officers concerned is ensured.

Considering all the aforementioned, it is quite obvious that there are several measures provided by the Act itself in order to safeguard the Fund and in such circumstances there is no violation of Article 12(1) of the Constitution.

**Clause 10**

Clause 10 of the Bill, which is contained in Part II the Bill deals with employees to whom the Act applies and contribution. Learned Counsel for the petitioner contended that there is a contradiction in clause 10, which results in the discretion of those who are identified as being in covered employment. The contention of the learned Counsel for the petitioner was that although in terms of clause 10(1) of the Bill all persons other than those exempted are deemed to be members of the Fund, clause 10(2)(i) brings in a further qualification, wherein an employee should be of an age where he would have more than 10 years to become a member of the Fund and to be entitled to receive a pension under the said Fund.

Learned Solicitor-General for the respondent submitted that the restriction stipulated in the Bill under review that 10 years of contribution to the Fund, being mandatory has not been limited to the Bill on Employees' Pension Benefits Fund. Learned Solicitor-General drew our attention to Section 2 of the Minutes on Pension, where the mandatory requirement of a minimum period of 10 years of contribution has been clearly laid down. In fact under the present Bill a concession has been given to persons, who would not have 10 years as regards to become members of the Fund in terms of clause 10(2)(ii) of the Bill. According to the said clause a person, who is of an age where such person has less than 10 years in which to become entitled to receive a pension in terms of

the Bill, would be entitled to apply to the Commissioner-General if he so desires to become a member of the Fund and in terms of clause 25(3) to make the balance payment with regard to the remaining years in installments that may be approved by the Fund.

As stated earlier, Article 12(1) of the Constitution deals with equality among equals and the objective of the said Article is to protect persons similarly placed, against discriminatory treatment. However, it is to be noted that Article 12(1) of the Constitution does not operate against rational classifications. It is therefore to be noted that in terms of Article 12(1) of the Constitution same rules of law would not be applicable to all persons throughout the Democracy. What it postulates is that all persons similarly circumstanced shall be treated alike in privileges conferred and liabilities imposed. As stated by Sharvananda, J. (as he then was) in **Palihawadana v Attorney-General** (F.R.D.) Vol. I pg. 1)

> "The principle underlying the guarantee in Article 12 is not that same rules of law should be applicable to all persons within the Democratic Socialist Republic of Sri Lanka, or that the same remedies should be made available to them irrespective of differences of circumstances. It only means that all persons similarly circumstanced shall be treated alike both in respect of privileges conferred and liabilities imposed."

Considering the clauses referred to above, it is quite apparent that there has been no unequal treatment with regard to any of the said clauses and in such circumstances there is no violation of Article 12(1) of the Constitution.

Learned Counsel for the petitioner contended that clauses 13, 25(2) and 26(1) are in violation of Article 14(1)g of the Constitution.

Article 14(1)g of the Constitution is as follows:

> ""Every citizen is entitled to –
>
> the freedom to engage by himself or in association with others in any lawful occupation, profession, trade, business or enterprise".

**Clause 13**

Clause 13 of the Bill refers to the contributions in relation to employees in institutions that does not extend pension benefits to its employees after 01.01.1996. Learned Counsel for the petitioner contended that the requirement in clause 13(c) that the total amount due as gratuity and payable to an employee in terms of Gratuity Act, No. 12 of 1983 shall be paid to the Fund by the employer in one installment on the day the employee becomes a member of the Fund, is in violation of Article 14(1)g of the Constitution.

Learned Solicitor-General contended that prior to 01.01.1996, the Peoples Bank and the Bank of Ceylon had a pension scheme for its employees and the National Savings Bank also had a similar scheme prior to 01.06.1995. At the time these Banks had such a scheme, gratuity was not paid in view of the benefit of the pension scheme that was in place. Later the payment of gratuity was introduced to Bank employees only after the said schemes were changed. Accordingly the submission of the learned Solicitor-General was that it has never been consistent to pay a pension and gratuity to an employee at the same time.

It is to be noted that the right guaranteed in terms of Article 14(1)g deals with the freedom to engage in a lawful occupation, profession, trade, business or enterprise and the exercise and operation of the said fundamental right is subject to such restrictions as may be prescribed by law provided under and in terms of Article 15(5) of the Constitution. Accordingly, the right guaranteed in terms of Article 14(1)g cannot be taken as a right which is unrestricted in its application as there cannot be absolute or unrestricted rights existing in any modern State. The Rights must be reasonably exercised without any conflicts. The applicability of the provisions of the Gratuity Act and the modes of payment are governed under the said Act and cannot be linked to the freedom of occupation, profession, trade, business or enterprise and in such circumstances there cannot be a violation of Article 14(1)g of the Constitution.

**Clause 25(2)**

Learned Counsel for the petitioner contended that in terms of clause 25(2)(i) only those members who have not less than 20 years of service would be entitled to the pension.

Learned Solicitor-General submitted that the Government has already taken a decision to provide a basis of computation for these members, who have contributed for a minimum period of 10 years, but less than 20 years by amending clause 25(2) of the Bill by inserting a new sub-clause numbered as 25(2)(iii), which would read as follows:

> "If such member has a lesser period of service, he will be entitled to an amount calculated with a deduction of 2% for every year of such period of lesser service".

**Clause 26(1)**

Learned Counsel for the petitioner submitted that the said clause has excluded the spouse from the persons identified as being eligible to receive the lump sum payment referred to in clause 26(1) and the said exclusion is in violation of Article 14(1)g of the Constitution.

It is to be noted that the pension scheme introduced under the Employees' Pension Benefits Fund is different to the scheme stipulated under the Widowers' and Orphans' Pension Fund and does not have a component similar to the said Fund. Accordingly the present Bill deals only with a pension scheme payable to the member, who makes the relevant contribution. A child below the age of 18 years or a child, who is certified by a registered medical practitioner to be physically or mentally disabled was to be considered under and in terms of clauses 26(1)(a) and 26(1)(b) as an exception.

When the said clause 26(1) was taken for consideration, learned Solicitor-General informed Court that the Government had decided to include the surviving spouse of a member of the Fund to the category of persons identified in clause 26(1) of the Bill.

Accordingly, the learned Solicitor-General for the respondent informed Court that the Government had decided to take steps with regard to the following:

1. Clause 2(2)(b)- to amend the said sub-clause by adding a proviso thereto permitting the payment of any claim in respect of such accounts.

2. Clause 3(1)- to delete the words 'for so long as there remains to his credit any sum of money in his individual account in the Fund and to substitute the words 'during his life time'

3. Clause 25(2)- to amend sub-clause 25(2)(ii) and to insert a new sub-clause 25(2)(iii) to bring in a minimum period of 10 years

4. Clause 26(1)- to include the surviving spouse of a member to the category of person identified in clause 26(1)

There were typographical errors in clause 17(1) and clause 25(3) of the Bill.

Clause 17(1) refers to Section 11(1) and Section 11(2) which should read as clause 12 and clause 13, respectively. Clause 25(3), where there is a reference to Section 12, should be amended by replacing it with Section 10.

For the reasons aforementioned, we make a determination that in terms of Article 123(1) of the Constitution that neither the Bill nor any provision thereof is inconsistent with the Constitution.

We shall place on record our deep appreciation of the assistance given by learned Counsel for the petitioner and learned Solicitor-General who appeared on behalf of the Hon. The Attorney-General.

Dr. Shirani A. Bandaranayake,
Judge of the Supreme Court.

N.G. Amaratunga,
Judge of the Supreme Court.

R.K.S. Suresh Chandra,
Judge of the Supreme Court.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)

(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු කථානායකතුමනි, මම 2007 වර්ෂය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා අවසන් ගිණුම් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2011 ජනවාරි මස 24 දිනැති අංක 1690/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය. -[උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු එස්. බී. දිසානායක මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)

(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2009 වර්ෂය සඳහා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## 47 (5) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තාව
## நிலைக்கட்டளை இல. 47 (5)இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கை
## REPORT PRESENTED UNDER STANDING ORDER NO. 47(5)

### සමනලගිරි සතරංග (නාඩි) වෛද්‍ය සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### சமனலகிரி சதராங்க (நாடி) வைத்திய சபை (கூட்டிணைத்தல்) சட்டமூலம்
### SAMANALAGIRI SATHARANGA (NADI) MEDICAL COUNCIL (INCORPORATION) BILL

"සමනලගිරි සතරංග (නාඩි) වෛද්‍ය සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳ වාර්තාව". - [ගරු සාලින්ද දිසානායක මහතා]

***පනත් කෙටුම්පත 2011 මැයි මස 06 වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.***
*சட்டமூலம் 2011 மே 06, வெள்ளிக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Bill ordered to be read a Second time upon Friday,06th May, 2011.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා - පැමිණ නැත.
ගරු අතාවුද සෙනෙවිරත්න මහතා - පැමිණ නැත.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මම තල්ගස්වල, නියාගම, ගා/නියාගම විජිත මධ්‍ය මහා විද්‍යාලයේ සේවයේ නියුතු ඒ.එච්. රුවිනි චම්පිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි - පැමිණ නැත.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මම ගොතටුව නව නගරය, ඇල්හේන පාර, අංක 625 දරන ස්ථානයේ පදිංචි ජේ.එම්.එස්. බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වසන්ත සේනානායක මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3 -0756/'10 - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (වැඩ බලන අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - பதில் கல்வி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa – Acting Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුරක් ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4 -0811/'10 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුරක් ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5 -0860/'10 - (2), ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුරක් ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ස්කන්ධපුරම් ගම්මානයේ ගොවීන්: සහනාධාර පොහොර
### ஸ்கந்தபுரம் கிராம விவசாயிகள்: மானிய உரம்
### FARMERS OF SKANDHAPURAM VILLAGE: SUBSIDIZED FERTILIZER

1059/'10

8. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගොවිජන සේවා සහ වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, අක්කරායන් ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත්, ස්කන්ධපුරම් ගම්මානයේ ගොවීන්ට නියමිත කාලය තුළදී සහනාධාර යටතේ ලබා දෙන පොහොර ලබා දී නොමැති බවත්;

(ii) වී වපුරා දින 60ක පමණ කාලයක් ගත වී තිබුණද, දින 35 - 45කින් යෙදිය යුතු දෙවන අදියරයේ පොහොර මුළුමනින්ම ලබා දී නොමැති බවත්;

(iii) එම තත්ත්වයන් යටතේ තම වී වගාවට පොහොර යෙදීමේදී ගොවීන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නැවත පදිංචි වූ ජනතාවට තම කෘෂිකාර්මික කටයුතු ආරම්භ කිරීමට පහසු වන සේ සහනාධාර පදනම මත ලබා දෙන යෙදවුම් නිසි කාලය තුළ ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி மாவட்டத்தின் அக்கராயன் கமநல சேவைகள் ஆளுகைப் பிரதேசத்துக்குரிய ஸ்கந்த புரம் கிராமத்தைச் சேர்ந்த விவசாயிகளுக்கு உரிய காலத்தில் உர மானிய நிவாரணத் திட்டத்தின்கீழ் பெற்றுக்கொடுக்கப்படுகின்ற உரம் வழங்கப் படவில்லை என்பதையும்,

(ii) நெல் விதைக்கப்பட்டு 60 நாட்கள் கடந்திருந்தும் 35-45 நாட்களுக்குள் இடப்படவேண்டிய இரண்டாம் கட்ட உரம் முழுமையாக இவர்களுக்கு வழங்கப் படவில்லையென்பதையும்,

(iii) இந்நிலைமையின் கீழ் தமது பயிர்களுக்கு உரமிடும் விடயத்தில் விவசாயிகள் பாரிய கஷ்டங்களுக்கு முகம் கொடுத்துள்ளார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) மீளக்குடியமர்த்தப்பட்ட மக்களுக்கு தமது விவசாய நடவடிக்கைகளை ஆரம்பிப்பதற்கு இலகுவான விதத்தில் நிவாரண அடிப்படையில் வழங்கப்படும் உள்ளீடுகளை உரிய காலத்தில் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agrarian Services and Wildlife :

(a) Is he aware that-

(i) fertilizer given under the fertilizer subsidy has not been provided on time to farmers of Skandhapuram Village belonging to the Akkarayan agrarian service area in the Kilinochchi District;

(ii) through a period of about 60 days has lapsed since the sowing of paddy, the fertilizer of second stage which is to be applied within 35-45 days has not been provided at all;

(iii) the farmers are immensely inconvenienced in applying fertilizer to their paddy fields under these circumstances ?

(b) Will he state whether action will be taken to provide the inputs supplied under the subsidy basis on time making it easier for the resettled people to commence their agricultural activities ?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගොවිජන සේවා සහ වනජීවී අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා. මට සිංහල පිළිතුරයි කියවන්න වෙලා තිබෙන්නේ. ඒකේ පරිවර්තනය හොඳින් අසා ගන්න කියලා ගරු අස්වර් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා.

(අ) (i) අක්කරායන්කුලම් වාරි යෝජනා ක්‍රමය යටතේ ස්කන්ධපුරම් ප්‍රදේශයේ ක්‍රියාත්මක ගොවි සංවිධාන 05 විසින් කරන ලද සහතික කිරීම් මත 2010/2011 මහ කන්නය සඳහා සහනාධාර පොහොර ගබඩා කිරීමේ පහසුකම් නොමැති වුවද, ගොවිජන සේවා මධ්‍යස්ථාන ගොඩනැඟිල්ලේ ගබඩා කර ගනිමින් කොටස් වශයෙන් ගොවීන් වෙත පොහොර ලබා දී ඇත.

(ii) 2010 අවසාන භාගයේ හා 2011 ආරම්භ කාලය තුළ ඇති වූ ධාරාණිපාත වැස්ස හේතුවෙන් අක්කරායන්කුලම් ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත යන මුරුගංඩි පාර අවහිර වීම නිසා දෙවන වර නිකුත් කිරීමට තිබූ සහනාධාර පොහොර ලබා දීම ප්‍රමාද වී ඇත.

(iii) දෙවන වරට දෙනු ලබන සහනාධාර පොහොර, නියමිත කාලය පසුවී වගා කරන ලද විශේෂයෙන් ස්කන්ධපුරම් උක් ගොවි පොළේ වී වගා කළ ගොවීන්ට ලබා දීමට නොහැකි වී ඇත.

(ආ) නැවත පදිංචි කරන ලද ගොවි ජනතාවට සහනාධාර මත ලබා දිය යුතු සේවාවන් වශයෙන් 2010 යල කන්නයේ බිම් සැකසීමේ මුදල්, සහනාධාර පෙහොර සඳහා බැංකු මඟින් ලබා ගත යුතු ණය වෙනුවෙන් සහතික කිරීම් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව බිත්තර වී ලබා දීමටද කටයුතු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු කථානායකතුමනි, මුරුගංඩි පාර වැස්ස සහ ගංවතුර නිසා වැසී තිබෙන බව ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. දැන් වැස්ස වැහැලා

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

ඉවරයි; ගංවතුරත් බැහැලා ඉවරයි. ඒ නිසා දැන් එය සකස් කරලා අවසානද? [බාධා කිරීමක්] රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා දෙමළ භාෂාවට විරුද්ධව ආයෙත් කථා කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

වර්ෂාව හමාර වීමෙන් පසු ගොවීන්ට යළිත් ගොවිතැන් කිරීම සඳහා අවශ්‍ය සහනාධාර, මා සඳහන් කළ පරිදි මුදල් සහ පොහොර සඳහා වූ සහතිකය බැංකුවලින් ලබා දීමට කටයුතු ආරම්භ කරලා තිබෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ඒ පාර පිළිබඳව තමුන්නාන්සේ අදාළ අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරලා පාර සකස් කිරීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ ප්‍රශ්නය අදාළ නැහැ. කෘෂිකර්මය පිළිබඳ ප්‍රශ්නයක් නිසා ඒ ප්‍රශ්නය අදාළ නැහැ. ඒ ප්‍රශ්නයට නියෝජ්‍ය කාරක සභාපතිතුමා උත්තර දෙනවා. [බාධා කිරීමක්] It is under construction.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Thank you very much. මගේ අතුරු ප්‍රශ්න තුන අහලා ඉවරයි, ගරු කථානායකතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දෙකයි ඇහුවේ. තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අහනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

නැහැ, නැහැ. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි. එහෙම නැත්නම් මම අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

අහලා ඉවරයි. අතුරු ප්‍රශ්න 3ක් ඇහුවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

තුන්වැනි අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි. එතුමාට හතරවැනි අතුරු ප්‍රශ්නයක් දෙන්න බැහැ. [බාධා කිරීම්] නැහැ, නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මටත් ඇහුණේ දෙවැනි අතුරු ප්‍රශ්නය වාගේ. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු කථානායකතුමනි, එහෙම නම් තව අතුරු ප්‍රශ්න 30ක් වුණත් අහන්නම්. [බාධා කිරීමක්] ඇහුවා, මම අතුරු ප්‍රශ්න තුනම ඇහුවා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න මම ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට අවසර දෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, විශේෂයෙන් මා මෙය අහන්නේ කෘෂිකර්මයට අදාළ ප්‍රශ්නයක් නිසායි. විශේෂයෙන් පොහොර සම්බන්ධයෙනුයි. ගරු ඇමතිතුමනි, සහනාධාර පොහොර යටතේ පොහොර ලබා දීමේදී යූරියා පොහොර, බණ්ඩි පොහොර සහ මඩ පොහොර ලබා දීමේදී එක්, එක් අක්කරය සඳහා යම් නිර්දේශිත පොහොර ප්‍රමාණයක් තිබුණා. නමුත් ගොවිජන සේවා අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබෙන චක්‍රලේඛනය අනුව අක්කරයකට ලබා දෙන පොහොර ප්‍රමාණය සියයට 25කින් විතර අඩු කරලා තිබෙනවා. එතකොට පොහොර සහනාධාරය වක්‍රානුකූලව ඉවත් කිරීමේ සැලැස්මක් තමයි මේ තිබෙන්නේ. මීට කලින් සහනාධාරය යටතේ ලබා දුන් පොහොරවලට වඩා අඩු පොහොර ප්‍රමාණයකුයි දැන් ලබා දෙන්නේ. එය සහනාධාරය ඉවත් කිරීමේ පළමුවැනි පියවරද කියලා මා ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order. Supplementary Questions ඇසීමේදී - [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, හතරවන අතුරු ප්‍රශ්නය එතුමාට අහන්න දුන්නා. ඒකට කමක් නැහැ. ඒත් එතුමා - [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, ඒක පාවිච්චි කරන්න එපා -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

There is no point in it. You have to have a point.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මේක වැදගත් අතුරු ප්‍රශ්නයක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා නඟන කාරණාව පරිදි, කිසි සේත්ම පොහොර ප්‍රමාණයන් අඩු කිරීමට රජය කටයුතු කරලා නැහැ. මේ ප්‍රශ්නය මතු කරලා තිබෙන්නේ උතුරු පළාතේ ගොවිතැන් බත් කර ගන්න බැරි වුණු ප්‍රදේශ සඳහායි. ඒ ගැනයි මම මේ ප්‍රකාශය කරන්නේ. කිසි ලෙසකින් පොහොර සහනාධාරය උතුරුකරයේ ගොවිතැන් කරන ද්‍රවිඩ, මුස්ලිම්, සිංහල ජනතාවට අඩු කරලා නැහැ. හදිසි තත්ත්වයන් ඇති වෙනවා නම් එය වැඩි කිරීම සඳහා කටයුතු කරලා තිබෙනවා. ඔබතුමා අහන අනෙක් ප්‍රශ්නය වෙනම අහන්න. එතකොට ඒක -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙන පිළිතුර තවත් පැහැදිලි කර ගැනීමට තමයි අතුරු ප්‍රශ්න අහන්නේ. ඒක අදාළ නැති ප්‍රශ්නයක්. අලුත් ප්‍රශ්නයක් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේක මේ චක්‍රලේඛනයේ තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
චක්‍රලේඛනය මොක වුණත්-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. ඔය ප්‍රශ්නය අදාළ ඇමතිවරයාගේ අවධානයට යොමු කරන්න. ප්‍රශ්න අංක 10-0812/'10-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හරි සෙල්ලමක් නේ ගරු කථානායකතුමනි. මේක බොහොම සරල ප්‍රශ්නයක්.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තමුන්නාන්සේට නිවැරදි පිළිතුරක් දෙන්න සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමා පොරොන්දුවක් වුණා, අර නිල ඇඳුම් ප්‍රශ්නය ගැන අද පිළිතුරක් දෙනවා කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒක දෙනවා, ඒක දෙනවා. තව පොඩ්ඩක් ඉන්න. ඉවසීමෙන් ඉන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමාට දකුණු පළාත් සභාවේ අධ්‍යාපන ඇමතිතුමා ගෙන්වලා සාකච්ඡා කරන්න පුළුවන්. මොකද, හම්බන්තොට, මාතර හැම දාම ප්‍රශ්න තිබෙනවා නේ. එතකොට ලේසියි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ගාල්ල-මාතර දුම්රිය මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතිය: විස්තර
காலி - மாத்தறை புகையிரத வீதி நிர்மாணக் கருத்திட்டம்: விபரம்
CONSTRUCTION PROJECT OF GALLE-MATARA RAILWAY LINE: DETAILS

11. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

0861/'10

ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ගාල්ල - මාතර දුම්රිය මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන වැඩ කටයුතු කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දෙන රට හෝ ආයතනය කවරේද;

(iv) ලබා දෙන එම මූල්‍ය ප්‍රතිපාදනය ණයක්ද නැතහොත් ආධාරයක්ද;

(v) එය ණයක් නම්, ඊට අදාළ පොලිය, ආපසු ගෙවිය යුතු කාල සීමාව හා කොන්දේසි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන්;

(i) අත්සන් කළ ගිවිසුම් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(ii) නිම කිරීම සඳහා භාර දුන් කොන්ත්‍රාත්කරු/ කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(iii) උපදේශකයින් ලෙස කටයුතු කරන්නේ කවුරුන්ද;

(iv) අධීක්ෂණය කරනු ලබන ආයතනය කවරක්ද;

(v) නිම කිරීමට අපේක්ෂිත කාලය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතියේ උප කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ඔවුන්ට පැවරී ඇති උප කොන්ත්‍රාත්තුවේ ස්වභාවයන් හා එහි වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ ඉන්දියාවේ හෝ වෙනත් රටක කම්කරුවන් සේවයේ යෙදී සිටින්නේද;

(iii) එසේ නම්, ඔවුන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி - மாத்தறை புகையிரத வீதியை நிர்மாணிக்கும் கருத்திட்டத்திற்காக மதிப்பீடு செய்யப்பட்ட பணத்தொகை எவ்வளவென்பதையும்,

(ii) மேற்படி கருத்திட்டத்தின் மூலம் செயற்படுத் தப்படும் பணிகள் யாவை யென்பதையும்,

(iii) இக்கருத்திட்டத்திற்கு நிதி வழங்கும் நாடு அல்லது நிறுவனம் யாதென்பதையும்,

(iv) வழங்கப்படும் அந்நிதி ஒரு கடனா அல்லது உதவியா என்பதையும்,

(v) அது ஒரு கடன் எனில், அதற்குரிய வட்டி, மீள செலுத்த வேண்டிய கால எல்லை மற்றும் நிபந்த னைகள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி கருத்திட்டம் தொடர்பாக,

(i) கைச்சாத்திடப்பட்ட உடன்படிக்கைகளை இச்சபைக்கு சமர்ப்பிப்பாரா என்பதையும்,

(ii) நிறைவு செய்வதற்காக ஒப்படைக்கப்பட்ட ஒப்பந்தக் காரர்கள் யாரென்பதையும்,

(iii) ஆலோசகர்களாக பணியாற்றுவோர் யாவர் என்பதையும்,

(iv) மேற்பார்வை செய்யும் நிறுவனம் யாதென்பதையும்,

(v) நிறைவு செய்வதற்கு எதிர்பார்க்கப்படும் காலம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி கருத்திட்டத்தின் துணை ஒப்பந்தக் காரர்களின் பெயர்கள், விலாசங்கள் மற்றும் இவர்களுக்குரிய துணை ஒப்பந்தப் பணியின் தன்மைகளும் அதன் பெறுமதிகளும் வெவ்வேறாக யாவையென்பதையும்,

(ii) இக்கருத்திட்டத்தில் இந்தியாவின் அல்லது வேறு நாட்டின் தொழிலாளர்கள் பணியில் அமர்த்தப் பட்டுள்ளார்களா என்தையும்,

(iii) ஆமெனில், இவர்களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்

அவர் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Transport :

(a) Will he state-

(i) the estimated cost of the project for the construction of the Galle-Matara railway line ;

(ii) the work carried out by the aforesaid project ;

(iii) the name of the organization or the country that provide funds for this project ;

(iv) whether the funds are provided the form of a loan or a grant ; and

(v) if it is a loan the relevant interest, the duration of repayment, conditions on which it has been granted?

(b) Will he inform this House, in relation to the aforesaid project-

(i) whether he would submit this House the agreements that have been signed ;

(ii) the name of the contractor or the names of contractors responsible for the implementation;

(iii) the names of the persons who provide consultancy services ;

(iv) the name of the institution responsible for supervision ; and

(v) the period of time taken for the completion of work?

(c) Will he state-

(i) separately, the names and addresses of the subcontractors of the aforesaid project and the nature and the value of the subcontractors awarded to them ;

(ii) whether workers from India or any other country are employed in the aforesaid project ; and

(iii) if so, the number of such workers?

(d) If not, why?

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)

(අ) (i) ඇමෙරිකානු ඩොලර් මිලියන 36.

(ii) * අලුත් කොන්ක්‍රීට් සිල්බර හා දුම්රිය පීලි සමඟ සම්පූර්ණ දුම්රිය මාර්ග අලුත්වැඩියාව.

* මූට්ටු රහිත වෙල්ඩින් කරන ලද අලුත් රේල් පීලි එලීම.

* ABC මිශ්‍රණය සෑදීම ඉහළ නැංවීම.

* ශක්තිමත් තාප්ප ගොඩ නැඟීම.

* කානු ඉදි කිරීම.

* දුම්රිය හරස් මාර්ග අලුත්වැඩියාව.

(iii) ඉන්දියාව

(iv) ණය

(v) අදාළ පොලිය - LIBOR + 0.5%

ආපසු ගෙවිය යුතු කාල සීමාව - අවු. 10

කොන්දේසි - ණය ගිවිසුමෙහි කොන්දේසි ඇතුළත්ව ඇති කොටස ඇමුණුම I ලෙස දැක්වේ.

(ආ) (i) අදාළ ව්‍යාපෘති ගිවිසුම (ඇමුණුම II වශයෙන් ඉදිරිපත් කරමි)

(ii) IRCON ජාත්‍යන්තර සමාගම.

(iii) මධ්‍යම ඉංජිනේරු උපදේශක සභාව.

(iv) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා මධ්‍යම ඉංජිනේරු උපදේශක සභාව.

(v) අවු. 02කි.

(ඇ) (i) උප කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ විස්තර ඇමුණුම III හි දැක්වේ. ඇමුණුම් **සභාගත*** කරමි.

(ii) ඔව්.

(iii) 2010.12.31 දිනට 152 දෙනෙකු සේවය කරයි.

(ඈ) අදාළ නොවේ.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු ඇමතිතුමනි, අතුරු ප්‍රශ්නවලට කලින් මා දැන ගන්න කැමැතියි, (ඇ) (i) යටතේ එම ව්‍යාපෘතියේ උප කොන්ත්‍රාත්කරුවන් කී දෙනෙක් ඉන්නවාද කියා. ඔවුන්ගේ නම් කියන්න පුළුවන්ද? ඒ අය ගොඩක් ඉන්නවාද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඒක ලොකු ප්‍රශ්නයක්.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

උප කොන්ත්‍රාත්කරුවන් කී දෙනෙක් ඉන්නවාද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඇමුණුම IIIහි සඳහන්ව තිබෙනවා: Name of agency and work done value for Phase 1. Civil හතර දෙනෙක් ඉන්නවා. Ballast supply work එකට නව දෙනෙක් ඉන්නවා. Survey agencyවලට දෙදෙනෙක් ඉන්නවා. Track linking workවලට දෙදෙනෙක් ඉන්නවා. C & F worksවලට හතර දෙනෙක් ඉන්නවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, එම කොළඹ-මාතර දුම්රිය මාර්ගයේ ගාල්ල සහ මාතර දක්වා පළමුවෙනි අදියර නිමා කරලා ගරු ඇමතිතුමාගේ මැදිහත් වීමෙන්ම පළමුවෙනි දුම්රිය ධාවනය කළා. පුවත් පත් වාර්තා කර තිබුණු පරිදිත්, මාධ්‍යවේදීන් වාර්තා කළ පරිදිත් එම කිලෝමීටර් 43 දුර යාම සඳහා විනාඩි 38කට ආසන්න කාලයක් තමයි ගත වුණේ, වැලිගම සහ අහංගම යන දුම්රිය ස්ථාන දෙකේ නතර නොකොට. ඔබතුමා ගියේ බලවේග කට්ටලයක. "රුහුණු කුමාරි" කෝච්චිය විනාඩි 48න් යනවා, අහංගම සහ වැලිගම දුම්රිය ස්ථාන දෙකේත් නතර කොට. දැන් මේ ව්‍යාපෘතිය සඳහා රුපියල් කෝටි 360ක් වියදම් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, රුහුණු කුමාරි කෝච්චියත් එම දුම්රිය ස්ථාන දෙකේ නතර කරන්නේ නැත්නම් විනාඩි 44ට යන්න පුළුවන්. එතකොට විනාඩි 44 සිට විනාඩි 38 දක්වා විනාඩි 6කින් කාලය අඩු කර ගැනීම තමයි මෙම රුපියල් කෝටි 360ක් වියදම් කරලා හදපු ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිලාභය. විනාඩි 6කින් කාලය අඩු කර ගැනීම සඳහා රුපියල් කෝටි 360කට ආසන්න මුදල් ප්‍රමාණයක් වැය කිරීම හරිද කියලා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

මම හිතන්නේ මෙතුමා කාරණා නොදැනයි කථා කරන්නේ. පළමුවෙනි කාරණය මේකයි. අපි අලුතෙන් දුම්රිය හඳුන්වා දුන්නාට පස්සේ, අලුත් දුම්රිය මාර්ගය මාතර ඉඳන් ගාල්ලට හැදුවාට පස්සේ එතුමා කිව්වා වාගේ විනාඩි 28ක් අඩුවෙන් ආවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒ කරුණ හරි නේ එතකොට. ඒ කරුණ දැන ගෙනයි තියෙන්නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

මේ දුම්රියෙන් -ඒ කියන්නේ ඉස්සෙල්ලා දුම්රියෙන් නොවෙයි. "රුහුණු කුමාරි" කියන දුම්රියෙන්- දැන් අපේ ගමන් කාලය විනාඩි 28ක් අඩු කර ගෙන තිබෙනවා. අපි පැය තුනකට අඩු කාලයකින් තමයි කොළඹ සිට මාතරට යන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

විනාඩි 28 කොහේ ඉඳන් කොහේටද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඒ කියන්නේ මුළු කාල සීමාව. කොළඹින් නැග්ගාම මාතරට යන කොට විනාඩි 28ක් අඩු කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් හොඳට දැන ගන්න. අපි හදපු මේ දුම්රිය මාර්ගයේ අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග 106ක් තිබෙනවා. ඒ කියන්නේ අපි කිලෝමීටර් 43ක් හැදුවා. මේ කිලෝමීටර් 43 ඇතුළේ අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග 106ක් තිබෙනවා. එතකොට ඔබතුමා බලාපොරොත්තු වන වේගයෙන් අපට ගමන් කරන්න බැහැ. [බාධා කිරීමක්] මොකද, මේ හැම අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගයකදීම හොඳට බලලා, brake ගහලා යන්න engine driverට සිද්ධ වනවා. ගරු කථානායකතුමනි, මේ ලංකාවේ අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග 900ක් විතර තිබෙනවා. මේ ටික හරියාකාරව හදන්නේ නැතිව, bell and light දමන්නේ නැතිව අපි හිතන ඉලක්කයට යන්න බැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

රේල් පාර හදන්නේ නැතිව?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

නැහැ, රේල් පාර හදන්න ඕනෑ. අපි රේල් පාර හදනවා. රේල් පාර හදන්නේ නැතිව දුම්රියට යන්න බැහැ නේ. දුම්රියට යන්න රේල් පාර තියෙන්න ඕනෑ. දුම්රිය ධාවනය කිරීම සඳහා තිබෙන්න ඕනෑ කාරණා තුනයි. එකක් තමයි - [බාධා කිරීමක්] කළු ගල වාගේ නොවෙයි. [බාධා කිරීමක්] එකක් තමයි, දුම්රිය මාර්ගය හරියට තියෙන්න ඕනෑ. දෙවනුව, signal හරියට තියෙන්න ඕනෑ. අනෙක, එන්ජිම හරියට තියෙන්න ඕනෑ. දැන් එන්නේ power set එක. පෙට්ටි යුගය දැන් ඉවරයි. ගරු කථානායකතුමනි, දැන් පෙට්ටි repair කරන්නත් පුළුවන්. ඒ නිසා දැන් ඒ කාලය ඉවරයි. ඒ නිසා මම තමුන්නාන්සේට කියන්නේ දුම්රිය හරියට යන්න නම් මේ අංග තුන හරියට තියෙන්න ඕනෑ බවයි. ඒ වාගේම අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග දැන් හුඟක් ඉල්ලනවා. "මෙතැනින් අපට පාරක් දෙන්න, තවත් තැනකින් පාරක් දෙන්න" කියලා හැම තැනින්ම ඉල්ලනවා. එහෙම දුන්නාම දුම්රිය යන්න බැහැ. අනාරක්ෂිත මාර්ග පුළුවන් තරම් අඩු වන්න ඕනෑ. ඒ නිසා මේක ඉතාම සාර්ථක වැඩ පිළිවෙළක්.

ඊ ළඟට අපි මේ දුම්රිය මාර්ගයේ ඉදිරි පියවර ගාල්ලේ සිට කළුතර දක්වා අගෝස්තු මාසයේදී පටන් ගන්නවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මගේ ප්‍රශ්නය මේකයි. රුපියල් කෝටි 360ක් වියදම් කරලා කාලය අඩු කරලා තිබෙන්නේ විනාඩි 6යි. ඔබතුමා කියනවා නම් කොළඹ සිටම කාලය අඩු වීම විනාඩි 28යි කියලා, ඒක වෙනම ප්‍රශ්නයක්.

[ගරු අනුර දිසානායක මහතා]

ගරු කථානායකතුමනි, මේ දුම්රිය මාර්ගය අලුත්වැඩියා කරන්න කලිනුත් ඔය හරස් මාර්ග තිබුණා. ඒ නිසා හරස් මාර්ග සහ මේක අතර සම්බන්ධතා හදා ගන්න එපා. මීට කලිනුත් හරස් මාර්ග තිබෙද්දී තමයි "රුහුණු කුමාරි" දුම්රිය ඒ වේගයට ගියේ. ඊ ළඟට මම දැන ගන්න කැමැතියි, -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, මේ මන්ත්‍රීතුමා අහන දෙවැනි අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්. දෙවැනි අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ ගිවිසුම අනුව එම ඉවත් කරන ලද රේල් පීලි සහ සිල්පර කොට ලබා දිය යුත්තේ කාටද? ඒවා දැන් ලබා දී තිබෙන්නේ කාටද කියලාත් දැන ගන්න කැමැතියි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, ඉවත් කරන ලද රේල් පීලි ගැන මේ ප්‍රශ්නයෙන් අහලා නැහැ. මේ ප්‍රශ්නයෙන් ඉවත් කරන ලද සිල්පර කොට ගැන අහලා නැහැ. ඒක ගැන ආපහු ප්‍රශ්නයක් ඇහුවොත් මම ඒකට උත්තර දෙන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ඒකට අලුත් ප්‍රශ්නයක් අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක ප්‍රශ්නයට අදාළයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක අදාළ නැහැ නේ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක අදාළ නැහැ කියනවා. [බාධා කිරීමක්]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මේ ඉවත් කරන ලද රේල් පීලි, මේ ප්‍රශ්නයට කිසි සේත් අදාළ නැහැ. ගරු කථානායකතුමනි, දැන් මන්ත්‍රීතුමා අහන්නේ තුන්වැනි අතුරු ප්‍රශ්නය. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
රේල් පීලි ඉවත් කරන එක වෙනම ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළ එකක් හැරෙන්න වෙන ඒවාට උත්තර දෙන්න මම කැමැති නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ ගිවිසුම කුමක්ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගිවිසුම ලියා තිබෙනවා. මේ තිබෙන්නේ ගිවිසුම.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ ගිවිසුම අනුව ඉවත් කරන ලද රේල් පීලි සහ සිල්පර කොට ඉන්දියානු සමාගමකට ලබා දීමට එකඟ වී තිබේද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
කිසිම එකඟවීමක් නැහැ. මොකක්ද එකඟ වෙන්න තිබෙන්නේ? අලුත් පීලි දමන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඉන්දියානු සමාගම මෙම රේල් පීලි ටික අරගෙන ගිහිල්ලා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒ කවුද? ඔබතුමා දවල් හීන දැකලා. ඒ මිනිස්සු ඒ ටික අරන් ඉන්දියාවට යනවාද? නැහැ නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කාටද දුන්නේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒකට ඔබතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න. මම උත්තර දෙන්නම්.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය, ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඒ දුන්න කෙනා අද කියන්නේ නැහැ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දුන්න කෙනා කියන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නයත් ඉවරයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මම අහනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අපේ ප්‍රවාහන ඇමතිතුමා උත්තරයක් දෙන්න සැහෙන කාලයකින් සභා ගර්භයට ආපු නිසාම ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළව තවත් ප්‍රශ්නයක් අහනවා.

දැන් සියයට15කින් විතර බස් ගාස්තුවල වැඩි කිරීමක් කරන්න හදනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ නේ ගරු කථානායකතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඒකයි කිව්වේ -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, කාලයකින් ගරු ප්‍රවාහන අමාත්‍යතුමා පාර්ලිමේන්තුවට ආපුවාම අපට මෙහෙම ප්‍රශ්නයක් අහන්න බැරි නම් -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එහෙම බැහැ. ස්ථාවර නියෝග අනුව ඔබතුමාට බැහැ, මේ ප්‍රශ්නයට පිටස්තර එකක් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඔබතුමාගෙන් අහන්නේ -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක මේ දොරෙන් පිටතදී අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක එළියට ගිහින් අහන්න දෙයක් නොවෙයි, මේ සභාවේ අහන්න ඕනෑ දෙයක්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මේ දොරෙන් පිටතදී අහන්න. මම උත්තර දෙන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පළමුවෙන් ප්‍රශ්නය අහලා ඉඳිමු. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රටට වැදගත් ප්‍රශ්නයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න බලන්න, මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රටේ ලක්ෂ ගණනක් මිනිසුන්ට වැදගත් ප්‍රශ්නයක්. ඒකයි මම ඇමතිතුමාගෙන් අහන්නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මොකක්ද අහන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සියයට 15කින් විතර බස් ගාස්තු වැඩි කිරීමේ වැඩ පිළිවෙළක් පෞද්ගලික අංශය විසින් දැන් ඉල්ලා තිබෙනවා.දැන් ඔබතුමන්ලා ඔවුන්ගේ ඉල්ලීම් සම්බන්ධව යම් කිසි විධියක ප්‍රතිචාරයක් දක්වනවාද? නැත්නම් සාමාන්‍යයෙන් අනෙක් වෙළෙඳ භාණ්ඩයක් වැඩි වුණාම කියනවා වාගේ, කිරි පිටි මිල වැඩි වුණාම දියර කිරි බොන එක වැඩි කරන්න පුළුවන් කියනවා වාගේ, පාන් පිටි මිල

[ගරු දයාසිරි ජයසේකර මහතා]

වැඩි වුණාම හාල් පරිභෝජනය වැඩි කරන්න පුළුවන් කියනවා වාගේ උත්තරයක්ද දෙන්නේ? නැත්නම් ඔබතුමන්ලාත් යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරලා මගී ජනතාවට සහනයක් සලස්වන්න කටයුතු කරනවාද කියලා ඔබතුමාගෙන් මම අහනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, මම ඇත්තටම දුක් වනවා, මගේ උගත් මිත්‍රයා මේ වාගේ ප්‍රශ්නයක් මගෙන් අහන එක ගැන. මොකද, මේ ප්‍රශ්නය මට අදාළ නැහැ. මේක අදාළ පුද්ගලික ප්‍රවාහන සේවා ඇමතිතුමාට. ඔබතුමා එතුමාගෙන් අහන්න ඕනෑ ප්‍රශ්නය නොදැනුවත්ව මගෙන් ඇසීම ගැන මම කනගාටු වෙනවා. මගෙන් අහන්න CTB එක ගැන. මගෙන් අහන්න CGR එක ගැන. මගෙන් අහන්න RMV එක ගැන.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාට බස් කීයක් තිබෙනවාද කියලා කියන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ අහන්නේ කෝච්චි පාරක් ගැන. ඒ නිසා කලබල වෙන්න එපා.

## නීරක්තියෙන් පෙළෙන ළදරුවන්: ක්‍රියාමාර්ග
குருதிச் சோகைப் பாதிப்புற்ற குழந்தைகள் : நடவடிக்கை
INFANTS SUFFERING FROM ANAEMIA: MEASURES TAKEN

1020/'10

14. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වාර්තා වූ නීරක්තිය නමැති මන්ද පෝෂණ තත්ත්වයෙන් පෙළෙන ළදරුවන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) නීරක්තියෙන් පෙළෙන ළදරු පරපුර එම තත්ත්වයෙන් මුදා ලීමට රජය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග නීරක්තියට විසඳුම් ලබා දීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டு இறுதியில் இலங்கையில் அறிக் கையிடப்பட்ட குருதிச்சோகை என்னும் போஷாக் கின்மையினால் பாதிக்கப்பட்டுள்ள குழந்தைகளின் சதவீதம் எவ்வளவென்பதையும்,

(ii) குருதிச் சோகையினால் பாதிக்கப்பட்டுள்ள குழந்தைகள் சமுதாயத்தினரை இந்நிலைமையி லிருந்து மீட்பதற்கு அரசாங்கம் எடுக்கும் நடவடிக் கைகள் யாவையென்பதையும்,

(iii) மேற்படி நடவடிக்கைகள் குருதிச்சோகைப் பிரச் சினையைத் தீர்ப்பதற்குப் போதுமானதா என்ப தையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House-

(i) the percentage of infants suffering from the condition of malnutrition called Anaemia, as reported in Sri Lanka by the end of 2010;

(ii) the measures taken by the government to save the infants suffering from anaemia, from that condition;

(iii) whether, those measures are adequate to provide solutions to the conditions caused by anaemia ?

(b) If not, why ?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 25.4% (යකඩ ඌනතාවත් ඇතුළත්ව)

(ii) මුළු දිවයින පුරා ක්‍රියාත්මක වන වැඩසටහන්

1. සෑම අලුත උපන් දරුවෙකුටම උපතේදී ළදරු ළමා වර්ධන සටහන් පතක් ලබා දීම තුළින් ළදරු ළමා සෞඛ්‍යයට අදාළ පණිවුඩ සහ පෝෂණ තත්ත්වය ඇගැයීම ආරම්භ කිරීම.

2. උපතේ සිට මාස හය දක්වා මවු කිරි පමණක් ලබා දීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.

3. අවුරුදු දෙක දක්වා මවු කිරි දීම පවත්වාගෙන යෑමට උපදෙස් ලබා දීම.

4. ළදරුවන්ගේ සහ ළමුන්ගේ වර්ධන තත්ත්වය ක්‍රමානුකූලව ඇගැයීම හා ප්‍රවර්ධනය.

5. ළදරුවන්ට හා ළමුන්ට අවශ්‍ය අමතර ආහාර ලබා දීම පිළිබඳ නව සංකල්ප හඳුන්වා දීම.

6. ඒකාබද්ධ පෝෂණ වැඩසටහන (ජීවන චක්‍රයේ විවිධ අවස්ථා අරමුණු කර ගත් පෝෂණ වැඩසටහන්) යොවුන් වියේදී විවාහයට පෙර කාන්තාවගේ, ගැබිනි මවගේ සහ කිරි දෙන මවගේ පෝෂණය නංවාලීම තුළින් අඩු බර උපත් අවම කිරීම.

ළදරුවන්ගේ හා පෙර පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීම තුළින් මන්ද පෝෂණය අවම කිරීම.

7. අවුරුදු පහට අඩු වයස් කාණ්ඩවල දරුවන්ගේ පෝෂණ ඌනතා හඳුනා ගැනීම සහ පහත සඳහන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ත්‍රිපෝෂ ලබා දීම, ක්ෂුද්‍ර පෝෂක ලබා දීම.

පාසල් ළමුන් සඳහා යකඩ සහ ෆෝලික් අම්ලය පෙති ලබා දීම.

8. උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය වැඩි දිස්ත්‍රික්ක හඳුනා ගෙන පෝෂණ පුරුත්ථාපන

වැඩසටහන් දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම.

(උතුරු නැඟෙනහිර සියලුම දිස්ත්‍රික්ක සහ හම්බන්තොට, මොණරාගල, බදුල්ල, නුවරඑළිය)

උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය සහිත ළමුන් සඳහා ඖෂධීය ආහාර (BP 100, Plumply nut, F100, F75)

මධ්‍යස්ථ තීව්‍ර මන්ද පෝෂණය සහිත ළමුන් සඳහා පරිපූරක ආහාර (ත්‍රිපෝෂ, කෝන් සෝයා පිටි, අධිපෝෂිත ආහාර) ලබා දීම.

උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය සහිත රෝගී දරුවන් සඳහා රෝහල් තුළ විශේෂ ප්‍රතිකාර ලබා දීම.

9. පෝෂණය දියුණු කිරීම සඳහා ප්‍රජා සහභාගිත්වය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

10. පෝෂණය ඇතුළත්ව මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

11. ළමාවියේ පෝෂණය සහ සෞඛ්‍යය නංවාලීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.

(iii) ඔව්.

(ආ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම නිරක්තිය කියන ප්‍රශ්නය විසඳීම සඳහා අපේ රටට අවශ්‍ය වෙලා තිබෙනවා, සමස්ත ජනගහනය ඉලක්ක කර ගත් යකඩ සවිබල ගැන්වීමේ වැඩසටහනක්. අපේ රටේ තවමත් එවැනි වැඩසටහනක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා මගේ පළමුවන අතුරු ප්‍රශ්නය වෙන්නේ, මුළු ජනගහනයම ඉලක්ක කර ගත්ත, යකඩ සවිබල ගැන්වීමේ පුළුල් ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඔබතුමා සහ රජය අදහස් කරනවාද කියන එකයි?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, මා කලින් කී තොරතුරු තමයි අදාළ දරුවන්ගේ යකඩ ඌනතාව -නිරක්තිය- වැළැක්වීම සම්බන්ධයෙන් කරන වැඩසටහනේ තිබෙන්නේ. ඒ වැඩසටහන තුළින් තමයි මේ ක්‍රියා දාමය සිද්ධ වෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සමා වන්න, මා පළමුවන අතුරු ප්‍රශ්නයේයි ඉන්නේ ගරු කථානායකතුමනි. මම බොහොම සරල ප්‍රශ්නයක් ඇහුවේ. [බාධා කිරීමක්] මා නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇහුවේ සරල ප්‍රශ්නයක්. මුළු රටේම ජනගහනය ආවරණය වන යකඩ සවිබල ගැන්වීමේ වැඩසටහනක් ගැන ඇහුවේ. ඉංග්‍රීසියෙන් ඒකට කියන්නේ iron fortification කියලා. අපේ රටේ එවන් වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඔබතුමාම සඳහන් කළ සංඛ්‍යා ලේඛනවලට අනුව සියයට 25කට වැඩි පිරිසක් නිරක්තියෙන් පෙළෙනවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නයෙන් මා ඔබතුමාගෙන් ඇහුවේ යකඩ සවිබල ගැන්වීමේ පුළුල් ජාතික වැඩසටහනක් - Universal Iron Fortification Programme එකක් - ඔබතුමා ක්‍රියාත්මක කරනවාද කියන එකයි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, යකඩ ඌනතාව හා නිරක්තිය කියන ඒ කරුණු දෙක සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන වැඩසටහන තමයි මම කිව්වේ. වැඩසටහන් එකොළහක් තිබෙනවා. පොදුවේ ගත්තාම ඒක තමයි ක්‍රියාත්මක වන්නේ මුළු රටම ආවරණය වන පරිදි. විශේෂයෙන් ළමයින් සම්බන්ධයෙන් තමයි මේ කරුණ වැදගත් වන්නේ. ළමයින් ආවරණය වන පරිදි තමයි ඒ වැඩසටහන ක්‍රියාත්මක වන්නේ. මව්වරුන් සම්බන්ධයෙනුත් මේ වැඩසටහන ක්‍රියාත්මක වනවා. මවු කිරි දෙන නිසා මවටත් මේ කරුණු වැදගත් වෙනවා. ඒ සම්බන්ධයෙන් වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා.පොදුවේ සම්පූර්ණයෙන්ම ආවරණය වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔබතුමා මගේ ප්‍රශ්නයට නිවැරදි පිළිතුරක් ලබා නොදීම ගැන මා කනගාටු වෙනවා.

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. පිළිගත් කාරණාවක් තමයි, නිරක්තිය කියන ප්‍රශ්නය සෘජුවම ජාතික ආර්ථිකයට, අධ්‍යාපනයට, නිෂ්පාදන ධාරිතාවට, කාර්යක්ෂමතාවට, බුද්ධි වර්ධනයට - cognitive development - යන මේ කාරණාවලට සෘජු සම්බන්ධතාවක් තිබෙනවා. විශේෂයෙන්ම ආර්ථිකයට, අධ්‍යාපනයට, නිෂ්පාදන ධරිතාවට සෘජු බලපෑමක් තිබෙන නිරක්තියේ ප්‍රශ්නය, ළදරු පරපුරේ සියයට විසිපහකට තිබෙන මේ ප්‍රශ්නය විසඳීම සඳහා සමස්ත ජනගහනය ආවරණය වන වැඩසටහනක් ඔබතුමන්ලා ක්‍රියාත්මක කරනවාද කියලා මා නැවත වරක් අහන්න කැමතියි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, මම කලිනුත් මෙයට පිළිතුරු දුන්නා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔබතුමා ඔව්ද, නැද්ද කියලා කියන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මේ වැඩසටහන් දැනට ක්‍රියාත්මක වෙනවා. ඒ ක්‍රියාත්මක වන වැඩසටහන පිළිබඳව තමයි මම කලින් පැහැදිලි කරලා දුන්නේ. එය මුළු දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, යකඩ ඌනතාව සහ නිරක්තිය කියන දෙකම සම්බන්ධයෙන් තමයි මේ ක්‍රියාදාමයන් කර ගෙන යන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මේකයි. නිරක්තිය මැඩ පවත්වා ගන්නට යකඩ බහුල ආහාර ලබා ගැනීම වැදගත් වෙනවා. ඒ නිසා අද යකඩ බහුල ආහාර දිහා බැලුවාම වර්තමාන උද්ධමන වේගයත් එක්ක ඒ යකඩ බහුල ආහාරවල මිල ගණන් ශීඝ්‍ර වර්ධනයකට ලක් වෙලා තිබෙනවා. ඒ නිසාම නිරක්තියෙන් පෙළෙන අඩු ආදායම්ලාභී පවුල්වලට, ඒ වාගේම උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල ජනතාවට, වතු කම්කරු ක්ෂේත්‍රයේ අයට යකඩ බහුල ආහාර ප්‍රමාණවත් ලෙස ලබා ගැනීම බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ නිසා යකඩ ඌනතාවෙන්, නිරක්තියෙන් පෙළෙන ඒ ජන පරපුර ඉලක්ක කර ගත් සහන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඔබතුමන්ලා කටයුතු කරනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මම කලිනුත් සඳහන් කළ පරිදි මෙම පෝෂණ වැඩසටහන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනවා. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල තිබෙනවා. ඒ සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවලට දැන් පෙර මෙන් නොවෙයි මේ වතු අංශයත් අයිති වෙනවා. එතකොට පොදුවේ මේ සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල ක්‍රියාත්මක වෙනවා. ඒ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල හරහා තමයි පොදුවේ මේ වැඩසටහන ක්‍රියාත්මක වන්නේ. ඒ වාගේම යුද්ධයෙන් අවතැන් වූවන් සඳහා කරන ලද පෝෂණ පුනරුත්ථාපන වැඩසටහන් තුළින් ගරු කථානායකතුමනි, උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය සහිත ළමුන් සියයට 8.8ක ප්‍රමාණයක් තිබිය එක දැන් 1.5 දක්වා අඩු කර තිබෙනවා. මධ්‍යස්ථ තීව්‍ර මන්ද පෝෂණය සහිත ළමුන් 26.8ක්ව තිබුණු ප්‍රතිශතය සියයට 13.1 දක්වා අඩු කරලා තිබෙනවා. මේ වැඩසටහන පොදුවේ රට තුළ ක්‍රියාත්මක වෙනවා. ඒක කෙරෙන්නේ වතු කම්කරුවාද, එහෙම නැත්නම් අඩු ආදායම් කෙනාද කියන කාරණය සලකලා නොවෙයි. පොදුවේ වැඩසටහන ක්‍රියාත්මක කරලා තිබෙනවා. විශේෂයෙන්ම දිස්ත්‍රික්ක කිහිපයක් තෝරා ගෙන තිබෙනවා. ඒ දිස්ත්‍රික්ක සඳහා විශේෂිත වූ වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා. එතකොට මුළු රටම ආවරණය වන පරිදි ඒක ක්‍රියාත්මක වෙනවා. ඉතින් මා හිතන්නේ -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පැහැදිලියි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපේ ගරු මන්ත්‍රීතුමනි, මන්ද පෝෂණය ගැන කියන කොට මන්ද පෝෂණය ගැන ඔබතුමාටත් බලන්න වෙනවා. මොකද, ඔබතුමාට තවම බැරි වුණා නායකත්වය ගන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මා හිතන්නේ ඒ නිසා මන්ද පෝෂණය ටිකක් අඩු කර ගත්තොත් හොඳයි නායකත්වය සම්බන්ධයෙන් - [බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා අනවශ්‍ය විධියට බාධා කිරීම් කරන පුද්ගලයකු නොවන නිසා මට ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් අවශ්‍යයි. මා අහපු ප්‍රශ්නයට නොවෙයි උත්තරය දුන්නේ. මා ඇහුවේ ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඒක ඉවරයි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
නිරක්තිය සහ යකඩ ඌනතාව සම්බන්ධයෙන් තමයි උත්තර දුන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහපු ප්‍රශ්නයට උත්තරය හැන්සාඩ් එකේ පළ වෙනවා. ඒ හින්දා ඒක කියවලා ඊට පස්සේ අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා ඇහුවේ බඩු මිලයි, යකඩ ඌනතාවයි -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා උත්තරයක් දීලා ඉවරයි දැන්.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාට ඕනෑ නම් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15ට යමු දැන්.

## විදුලි බල ජනනය සඳහා සාගර රළ බලශක්තිය යොදා ගැනීම: ශක්‍යතා අධ්‍යයනය
மின்வலு உற்பத்திக்கு கடல் அலைகளின் சக்தியைப் பயன்படுத்தல்: சாத்தியவள ஆய்வு
USE OF OCEAN WAVE ENERGY FOR ELECRICITY GENERATION: FEASIBILITY STUDY

1087/'11

15. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) සාගර රළ බලශක්තිය විදුලි බල ජනන ප්‍රභවයක් ලෙසට යොදා ගැනීමේ ශක්‍යතා අධ්‍යයනයක් මේ දක්වා සිදු කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සාගර රළ බලශක්තිය අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හා තරගකාරී ලෙසට යොදා ගැනීමට ඇති හැකියාව කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரி சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) கடல் அலைகளின் சக்தியை மின்வலு உற்பத்திக்கான மூலமாக பயன்படுத்துவதற்கான சாத்தியவள ஆய்வு ஏதும் இதுவரை மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) கடல் அலைகளின் சக்தியை ஏனைய மீள் பிறப்பாக்கி எரிசக்தி மூலங்களுடன் போட்டி அடிப்படையில் பயன் படுத்தக்கூடிய சாத்தியப்பாடுகள் எவை என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House whether a feasibility study has been carried out by now to find out the possibility of using the energy of ocean waves as a source of generating electricity?

(b) Will he state the possibility of using the energy of ocean waves competitively with other renewable sources of energy?

(c) If not, why ?

**ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு, எரிசக்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)

(අ) සාගර රළ බලශක්තිය විදුලි බල ජනන ප්‍රභවයක් ලෙසට යොදා ගැනීමේ ශක්‍යතා අධ්‍යයනයක් මේ දක්වා සිදු කර නොමැත. පූර්ව අධ්‍යයනවලින් පෙනී යන්නේ ගාල්ල උනවටුන සිට පානම දක්වා කලාපය වඩාත් සුදුසු කලාපය බවයි.

(ආ) රළ බලශක්තිය පෘථිවි ගෝලයේ ධ්‍රැවාසන්න ප්‍රදේශවලට වැඩියෙන්ද, නිරක්ෂය ආසන්න ප්‍රදේශවලට අඩුවෙන්ද ජනනය වේ. මේ නිසා වර්තමානයේ පවතින තාක්ෂණ ව්‍යුහය තුළ එම රළ බලශක්ති තරගකාරිව අනෙකුත් දියුණු පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සමඟ යෙදවීම අනාගත තාක්ෂණ දියුණුව මත තීරණය වේ. උදම් රළ, රළ ප්‍රවාහය, සයුරේ උණුසුම වෙනස් වීම යන ක්‍රම තුනම පරිහරණය කරමින් විදුලිය නිපද වීමට හැකියාව ඇති අතර ඒ පිළිබඳව විධිමත් ශක්‍යතා අධ්‍යයනයන් හා නියමු ව්‍යාපෘති කිරීමට ඉදිරියේදී අදහස් කර ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I thank the Hon. Minister for giving me a detailed reply. My first Supplementary Question is, will the Hon. Minster agree that the use of energy of ocean waves as a source of generating electricity is being implemented by most of the countries in the world?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, ධ්‍රැවාසන්න ප්‍රදේශවල, විශේෂයෙන්ම ස්වීඩනය, නෝර්වේ වැනි බෝල්ටික් රටවල -ඒ ප්‍රදේශවල- තමයි දැනට මේ ක්‍රමය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. මා ගරු මන්ත්‍රීතුමාට සඳහන් කළ ආකාරයට උදම් රළ -tidal waves-, රළ ප්‍රවාහය -wave energy එක, wave momentum එක-, ඒ වාගේම සයුරේ උණුසුම -ocean thermal energy- කියන ඒ ක්‍රම තුන ගැන බලා තිබෙනවා.

සයුරේ උණුසුම වෙනස් වීම පිළිබඳ කාරණය - ocean thermal energy conversion - ත්‍රිකුණාමලය ආශ්‍රිත ප්‍රදේශවල කරන්න පුළුවන් කියලා අපට දැනට වැටහිලා තිබෙනවා. මම අර කලින් සඳහන් කරපු ආකාරයට රළ ප්‍රවාහයන් අනුව උනවටුන ඉඳන් පානම දක්වා කරන්න පුළුවන් කියලා වාර්තා වෙලා තිබෙනවා. ඉතාම අඩු මට්ටම් තිබෙන නිසා තවම නිරක්ෂය ආසන්න ප්‍රදේශවල මේක තාක්ෂණික වශයෙන් සිදු කරලා නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

My second Supplementary Question is, if the feasibility report has not been studied, from Unawatuna to Panama, as the Hon. Minister says, -

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

It is a pre-feasibility study that was done.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Will a feasibility study be carried out in the near future?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

A pre-feasibility study had been done, not a feasibility study. A complete feasibility study has to be done.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

If that is so, as I said, this is a very important matter as far as energy generation is concerned. Will that project of generating electricity from ocean waves as another source of renewable energy be taken up by your Ministry as early as possible?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

Yes, we are exploring the possibility of using ocean wave energy as a source of energy and as a clean green energy in the near future.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

අතුරු ප්‍රශ්න තුනටම උත්තර දීම පිළිබඳව ගරු ඇමතිතුමාට ස්තුතියි.

## පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය: ආයතන
## உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சு: நிறுவனங்கள்
## MINISTRY OF LOCAL GOVERNMENT AND PROVINCIAL COUNCILS: INSTITUTIONS

0286/'10

1. **ගරු දයාසිරි ජයසේකර මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர-மாண்புமிகு ரவி கருணா நாயக்க சார்பாக)
(The Hon. Dayasiri Jayasekara on behalf of the Hon. Ravi Karunanayake)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා කවරේද;

(ii) ඉහත කී අමාත්‍යාංශයේ වත්මන් සමස්ත මාසික සහ වාර්ෂික පිරිවැය කොපමණද;

(iii) ස්ථිර කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව සහ ඔවුන්ට මාසිකව ගෙවනු ලබන සමස්ත වැටුප් සහ දීමනා ප්‍රමාණය කොපමණද;

(iv) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලවල වත්මන් සමස්ත මාසික පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உள்ளூராட்சி மாகாண சபைகள் அமைச்சின் கீழ்வரும் திணைக்களங்கள், நியதிச்சட்ட நிறுவனங்கள் மற்றும் அரசாங்கக் கூட்டுத் தாபனங்கள் ஆகியவற்றையும்,

(ii) மேற்படி அமைச்சின் தற்போதைய மொத்தச் செலவினத்தை மாத மற்றும் வருட வாரியாகவும்,

(iii) நிரந்தர பணியாள் தொகுதியின் எண்ணிக்கையையும் அவர்களுக்கு வழங்கப்படும் மாதாந்த மொத்த ஊதியங்களையும்,

(iv) உள்ளூராட்சி மாகாண சபைகள் அமைச்சர், பிரதி அமைச்சர் மற்றும் அவர்களின் பணியாள் தொகுதியினர் ஆகியோருக்கான மாதாந்த மொத்தச் செலவினத்தையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Will he inform this House-

(i) the departments, statutory institutions and public corporations under the Ministry of Local Government and Provincial Councils;

(ii) the total cost of the aforesaid Ministry per month and per year at present;

(iii) the number of permanent staff and the total emoluments paid to them per month; and

(iv) the total cost of the Minister and Deputy Minister of Local Government and Provincial Councils and their staff per month at present?

(b) If not, why?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය.
අංක 17,
මලලසේකර මාවත,
කොළඹ 07.

(ii) 2010 වර්ෂයේ වාර්ෂික පිරිවැය රුපියල් 7,046,692,826යි.
(විදේශාධාර ව්‍යාපෘති සමඟ)

2011 වර්ෂයේ මාර්තු මස මාසික පිරිවැය රුපියල් 156,266,106යි.
(විදේශාධාර ව්‍යාපෘති සමඟ)

2010 වර්ෂයේ වාර්ෂික පිරිවැය රුපියල් 618,508,234යි.
(විදේශාධාර ව්‍යාපෘති හැර)

2011 වර්ෂයේ මාර්තු මස මාසික පිරිවැය රුපියල් 28,686,500යි.
(විදේශාධාර ව්‍යාපෘති හැර)

(iii) ස්ථිර කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව - 186යි.
මාසිකව ගෙවනු ලබන සමස්ත වැටුප් සහ දීමනා -
රුපියල් 4,927,153යි. (මාර්තු මස)

(iv) රුපියල් 1,916,120යි.

(ආ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

නැහැ, අතුරු ප්‍රශ්න අහන්න බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අතුරු ප්‍රශ්න එකක් අහන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බැහැ.

## ලී කණු සැපයීමට ප්‍රදානය කරන ලද ටෙන්ඩරය: පාඩුව

## மரத்தூண்கள் கொள்வனவுக்கான கேள்வி: நட்டம்

## TENDER AWARDED FOR PROVISION OF WOODEN POLES: LOSS INCURRED

0293/10

2. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (5):

(අ) 2006 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව පෙන්වා දෙන පරිදි,

(i) මීටර් 9ක් දිග ලී කණු 21,000ක් හා මීටර් 10ක් දිග ලී කණු 3,400ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද බවත්;

(ii) අවම මිල ගණන් ඉදිරිපත් කළ රාජ්‍ය දැව සංස්ථාවේ ටෙන්ඩරය නොපිළිගත් බවත්;

(iii) දෙවනුව අඩුම මිල ගණන් ඉදිරිපත් කළ දකුණු අප්‍රිකානු සමාගමට ටෙන්ඩරය ප්‍රදානය කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කෙසේ වෙතත් මීටර් 9ක් දිග ලී කණු 10,500ක් හා මීටර් 10ක් දිග ලී කණු 1,700ක් මිලදී ගත් බවත්;

(ii) එයින් දකුණු පළාතට සැපයූ කණු 2,363කින් පාවිච්චියට ගෙන තිබුණේ කණු 73ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) රාජ්‍ය දැව සංස්ථාවට ඉහත ටෙන්ඩරය ප්‍රදානය නොකිරීම නිසා රුපියල් මිලියන 79.5ක පාඩුවක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එකී පාඩුව පිළිබඳව වග කිව යුත්තන්ගේ නම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006ஆம் ஆண்டிற்கான கணக்காய்வாளர் நாயகத்தின் அறிக்கையில் சுட்டிக்காட்டப்பட்டுள்ள தற்கமைய, 9 மீற்றர் நீளமான 21000 மரத்தூண்களும் 10 மீற்றர் நீளமான 3400 மரத்தூண்களும் கொள்வனவு செய்வதற்காக விலை கோரப்பட்டது என்பதையும்,

(ii) குறைந்தபட்ச விலைகளைச் சமர்ப்பித்த அரச மரக் கூட்டுத்தாபனத்தின் கேள்விப்பத்திரம் ஏற்றுக்கொள்ளப்படவில்லை என்பதையும்,

(iii) இரண்டாவதாக குறைந்தபட்ச விலைகளை சமர்ப்பித்த தென்னாபிரிக்க நிறுவனத்திற்கு கேள்விப் பத்திரம் அளிக்கப்பட்டதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) எவ்வாறாயினும், 9 மீற்றர் நீளமான 10500 மரத்தூண்களும் 10 மீற்றர் நீளமான 1700 மரத் தூண்களும் கொள்வனவு செய்யப்பட்டதென் பதையும்,

(ii) இதில் தென் மாகாணத்திற்கு விநியோகிக்கப்பட்ட 2363 தூண்களில் 73 தூண்கள் மட்டுமே பாவனைக்கு எடுக்கப்பட்டதென்பதையும்

அவர் அறிவாரா?

(இ) அரச மரக் கூட்டுத்தாபனத்திற்கு மேற்கூறிய கேள்விப் பத்திரத்தை அளிக்காமையினால் ரூபா 79.5 மில்லியன் நட்டம் ஏற்பட்டதை அவர் ஏற்றுக்கொள்வாரா?

(ஈ) அந்த நட்டம் தொடர்பில் பொறுப்புக் கூறவேண்டிய வர்களின் பெயர்கள் எவை என்பதை அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he admit the fact that -

(i) as pointed out by the Auditor-General's Report for the year 2006, tenders were called to purchase 21,000 wooden poles with a length of nine metres and 3,400 wooden poles with a length of 10 metres;

(ii) the tender with lowest bids submitted by the State Timber Corporation was not accepted; and

(iii) the tender was awarded to the South African company that submitted the next lowest bids?

(b) Is he aware that -

(i) 10,500 wooden poles with a length of nine metres and 1,700 wooden poles with a length of 10 metres were purchased; and

(ii) of the 2,363 poles provided to the Southern Province, only 73 had been used?

(c) Will he admit that a loss of Rs. 79.5 million had to be incurred owing to the fact that the tender was not awarded to the State Timber Corporation?

(d) Will he state the names of those who are responsible for the aforesaid loss?

(e) If not, why?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, අප පළමුවෙන්ම ගරු මන්ත්‍රීතුමාටත්, ගරු සභාවටත් කනගාටුව පළ කරනවා කීප අවස්ථාවක් මේ ප්‍රශ්නයට පිළිතුර දීමට කල් ගැනීම ගැන.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) නැත.

ටෙන්ඩරය කැඳවීමට පෙර හා පසු ද රාජ්‍ය දැව සංස්ථාව දිගු කාලීන වැඩ පිළිවෙළක් යටතේ එකඟ වූ මිල සූත්‍රයක් පදනම් කර ගෙන ලංකා විදුලිබල මණ්ඩලයට විදුලි කණු සැපයීමේ සැපයුම්කරු ලෙස පසු විය. එම නිසා ප්‍රශ්නගත ටෙන්ඩරයේ ටෙන්ඩර්කරු වශයෙන් ඉදිරිපත් වීමේ අවශ්‍යතාවක් රාජ්‍ය දැව සංස්ථාව සතුව නොපැවතුණි. එතෙකුදු වුවත් ටෙන්ඩර්කරුවෙකු වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව ඉදිරිපත් වී ඇති අතර

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

ඉදිරිපත් කළ මිල ගණන් අනුව අඩුම මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේද එම ආයතනය විසිනි. රාජ්‍ය දැව සංස්ථාව දිගු කාලීනව විදුලි කණු සැපයීමේ සැපයුම්කරු වශයෙන් අවශ්‍ය සම්පූර්ණ විදුලි කණු කලට වේලාවට සැපයීමට නොහැකි තත්ත්වයක පසු වීමත් - ඒ පිළිබඳ විස්තර පසුව දැනුම් දෙනවා. - 2005 වර්ෂයේ සිට 2010 දක්වා ලංකා විදුලිබල මණ්ඩලය ඇණවුම් කරන ලද මීටර් 9 සහ මීටර් 10 ලී කණු ප්‍රමාණය ආයු කාලය අනුව සතුටුදායක නොවීමත් සහ සුනාමි ව්‍යසනයෙන් පසු සිදු වූ විදුලිය බෙදා හැරීමේ පද්ධතිය ඉතා කෙටි කාලීනව යථා තත්ත්වයට පත් කිරීමේ අවශ්‍යතාවක් සහ අවශ්‍ය විදුලි කණු ඉතා ඉක්මනින් ලබා ගැනීමේ විවෘත ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලියෙන් විදුලි කණු ඉතා ඉක්මනින් සැපයිය හැකි සාර්ථක සැපයුම්කරුවෙකු තෝරා ගැනීමේ අවශ්‍යතාවත්, එසේ නොවුණහොත් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයෙන් ඉතාමත් සහනදායි ණය ආධාර යටතේ ලැබූ රුපියල් මිලියන 2,150 අහිමි වීම වළක්වා ගැනීමත් සලකා ඉදිරිපත් වූ මිල ගණන් අතරින් ඒ වන විට දිගු කාලීන සැපයුම්කරුවෙකු වූ රාජ්‍ය දැව සංස්ථාව ඉදිරිපත් කළ ටෙන්ඩරය ප්‍රතික්ෂේප කර ඉතිරි මිල ගණන් අතුරෙන් අඩුම මිල ගණන් ඉදිරිපත් කළ ටෙන්ඩරය පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කර ඇති බව අප කළ මූලික විමර්ශනයෙන් හා ටෙන්ඩර් මණ්ඩල වාර්තාවෙන්ද, රාජ්‍ය දැව සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් ඉදිරිපත් කළ කරුණුවලින්ද අනාවරණය වේ.

| වර්ෂය | 9 M | | 10M | | 9 M+10M | |
|---|---|---|---|---|---|---|
| | ලංවීම මගින් ඇනවුම් කරන ලද ලී කණු ප්‍රමාණය | රාජ්‍ය දැව සංස්ථාව විසින් සපයනු ලැබූ ලී කණු ප්‍රමාණය | ලංවීම මගින් ඇනවුම් කරන ලද ලී කණු ප්‍රමාණය | රාජ්‍ය දැව සංස්ථාව විසින් සපයනු ලැබූ ලී කණු ප්‍රමාණය | ලංවීම මගින් ඇනවුම් කරන ලද මුළු ලී කණු ප්‍රමාණය | රාජ්‍ය දැව සංස්ථාව විසින් සපයනු ලැබූ මුළු ලී කණු ප්‍රමාණය |
| 2005<br>2006 | 3800 | 3149 | 3050 | 1142 | 6850 | 4291 |
| 2007<br>2008 | 11075 | 7695 | 8175 | 3768 | 19250 | 11463 |
| 2009 | 5200 | 4100 | 1050 | 650 | 6250 | 4750 |
| 2010 | 5472 | 4714 | 528 | 528 | 6000 | 5242 |
| එකතුව | 25547 | 19658 | 12803 | 6088 | 38350 | 25746 |

2005 සිට 2010 දක්වා ලංකා විදුලිබල මණ්ඩලය මඟින් රාජ්‍ය දැව සංස්ථාවෙන් මීටර් 9 ලී කණු 25,547ක් ඇණවුම් කර තිබෙනවා. මීටර් 10 ලී කණු 12,803ක් ඇණවුම් කර තිබෙනවා. දෙකම එකතු කළාම ලී කණු 38,350ක් ඇණවුම් කර තිබෙනවා. නමුත් රාජ්‍ය දැව සංස්ථාවෙන් සපයා තිබෙන්නේ ලී කණු 25,746යි. ඒ කියන්නේ ඉල්ලුම සපයා ගැනීමට නොහැකි තත්ත්වයක රාජ්‍ය දැව සංස්ථාව සිටියා.

ඇත්තටම ඔබතුමාගේ දැන ගැනීම පිණිස මා කියන්නට ඕනෑ, මා පරිසර හා ස්වාභාවික සම්පත් ඇමතිවරයා හැටියට කටයුතු කළ කාලයේ මෙම තත්ත්වය අපි අවබෝධ කර ගත්ත බව. 2005 සහ 2006 වැනි ඊට කලින් වසරවල සාමාන්‍යයෙන් වසරකට ලී කණු 2,000ක් පමණ තමයි සපයන්නට හැකියාව තිබුණේ. නමුත් අප විසින් බුත්තල, ඒ වාගේම කල්දෙමුල්ල, කැප්පෙටිපොළ කියන ඒ ආයතන තුනටම; බුත්තලට රුපියල් මිලියන 14කුත්, කල්දෙමුල්ලට රුපියල් මිලියන 15කුත්, කැප්පෙටිපොළට රුපියල් මිලියන 9කුත් වියදම් කළා, මේ ක්‍රියාදාමය වැඩිදියුණු කරන්න. එහි ප්‍රතිඵලයක් හැටියට දැන් ආසන්නයෙන් වසරකට ලී කණු 5,000ක් පමණ සපයන්නට පුළුවන්කම තිබෙනවා. නමුත් අපේ ලී කණු අවශ්‍යතාව 7,000ක් පමණ වනවා, අපට තේරෙන හැටියට. මොකද, අපි වේගවත් සංවර්ධන ක්‍රියාදාමයක් දියත් කර තිබෙන නිසා.

(ආ) (i) ඔව්.

මීටර් 09ක් දිග ලී කණු 21,000ක් හා මීටර් 10ක් දිග ලී කණු 3,400ක් සඳහා මිල කැඳවුම් 2006.02.02 දින පුවත් පත් නිවේදනයෙන් කළ අතර, ටෙන්ඩර් ප්‍රදානය කළ 2006.05.16 දින වන විට සුනාමි ව්‍යසනයෙන් විපතට පත් වූවන්ගෙන් සැහෙන ප්‍රමාණයකගේ විදුලිය බෙදා හැරීමේ පද්ධතීන් යථා තත්ත්වයට පත් කර තිබූ බැවින්, විදුලි කණු ප්‍රමාණය අවශ්‍ය වී තිබෙන්නේ ඒ වන විට යථා තත්ත්වයට පත් කිරීමට ශේෂ වූ කොටස් වෙනුවෙන් පමණි. එම නිසා අදාළ ආයතනය විසින් ඉල්ලුම් කරන ලද ලී කණු ප්‍රමාණයෙන් අඩක් පමණ, එනම් මීටර් 9ක් දිග ලී කණු 10,500ක් හා මීටර් 10ක් දිග ලී කණු 1,700ක ප්‍රමාණයක් මිලදී ගන්නා ලදී.

(ii) නැත.

බොහෝ විට කඳු බෑවුම් සහිත විදුලි යෝජනා ක්‍රම සඳහා ලී කණු සිටුවන බැවින් ගබඩාවේ ගබඩා කර අවශ්‍යතාව අනුව ප්‍රයෝජනයට ගැනේ. සපයන ලද එම කණු ප්‍රමාණය ගබඩාවේ තොගයේ තබා ගෙන පසුව අත්‍යවශ්‍ය විදුලි යෝජනා ක්‍රම සඳහා ප්‍රයෝජනයට ගත් බව වාර්තා කර ඇත.

(ඇ) රාජ්‍ය දැව සංස්ථාව නිෂ්පාදනය කරන විදුලි කණු අඛණ්ඩව විදුලිබල මණ්ඩලයට සපයන නිසා මෙම ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් රාජ්‍ය දැව සංස්ථාවට අමතර වාසියක් සිදු නොවන අතර, එම ටෙන්ඩරය ප්‍රදානය නොකිරීමෙන් අමතර පාඩුවක්ද සිදු වී නැත. රාජ්‍ය දැව සංස්ථාවට ප්‍රදානය කළේ නම් විදුලි කණු කලට වේලාවට ලබා ගත නොහැකි වීම නිසා විදුලිය බෙදා හැරීමේ පද්ධතිය කලට වේලාවට යථා තත්ත්වයට පත් කිරීමට නොහැකි වාතාවරණයක් ඇති වීමට ඉඩ ඇති අතර ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයෙන් ලද සහනදායී ණය ආධාරද නොලැබෙනවා ඇත. ඒ නිසා උද්ගත වන්නේ විශාල පාඩුවකි. බැලූ බැල්මට පාඩුවක් වී ඇති ආකාරයක් පෙනී ගියද සහනදායී ණය ආධාර කලට වේලාවට පාවිච්චි කිරීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සෘජු හා වක්‍ර ආකාරයකින් මූල්‍ය පාඩුවක් සිදු වී නැති බව ප්‍රකාශ කළ හැක.

(ඈ) අදාළ නොවේ.

(ඉ) පැන නොනඟී.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය මෙකයි. සැලකිය යුතු කාලයක් අරගෙන මෙම ප්‍රශ්නයට දීර්ඝ පිළිතුරක් ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. ගරු ඇමතිතුමනි, දැන් මෙම ටෙන්ඩරය කැඳවූවේ මීටර් 9ක් දිග ලී කණු 21,000ක් සහ මීටර් 10ක් දිග ලී කණු 3,400ක් මිලදී ගැනීමේ

පදනම මතයි. එතකොට මිලදී ගත්තේ මේ ප්‍රමාණයෙන් සියයට 50ක් -අඩක්- තමයි. රාජ්‍ය දැව සංස්ථාව අඩුම ටෙන්ඩරය ඉදිරිපත් කර තිබුණත්, රාජ්‍ය දැව සංස්ථාව ප්‍රතික්ෂේප කරන ලද්දේ හදිසි අවශ්‍යතාවක් වෙනුවෙන් වේගවත්ව ලී කණු සැපයීම් කර ගන්න බැරි වේය කියන පූර්ව උපකල්පනය මතයි. මොකද, ඔබතුමා කිවූ පරිදි කලින් අවස්ථාවල එහෙම සිදු වෙලා තිබෙන නිසා. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. මිලදී ගන්නේ මේ ප්‍රමාණයම නොවෙයි. මිලදී ගන්නේ හරි අඩයි. රාජ්‍ය දැව සංස්ථාවට සැපයීමට නොහැක්කේ ලී කණු 21,000ක් කියලා උපකල්පනය කරන්න පුළුවන්. නමුත් සැබෑ අවශ්‍යතාව ලී කණු 10,500ක් නම් -මා දන්නේ නැහැ, ඒ ප්‍රමාණය සපයන්න පුළුවන්ද, බැරිද කියලා.- රාජ්‍ය දැව සංස්ථාව තෝරා ගැනීමේ වැඩි ඉඩක් තිබුණා. මෙතැනදී වැඩියෙන් කණු ඉල්ලා, රාජ්‍ය දැව සංස්ථාව එම ටෙන්ඩරයෙන් ඉවත් කරලා, ඇත්තටම අත්‍යවශ්‍ය කණු ප්‍රමාණය ගත්තාද කියන සැකයක් මෙහිදී මතු වනවා. මොකද, වෙනත් කාටවත් එම ටෙන්ඩරය ලබා දීම සඳහා. එවැනි තත්ත්වයක් ඇති වී තිබෙනවාද කියා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඔබතුමා මතු කරන කාරණය ගැන අපටත් යම් කිසි විමර්ශනයක් කරන්න ඕනෑ නිසා අපි ඒ පිළිබඳව මූලික විමර්ශනයක් කළා. පසු ගිය සංඛ්‍යා ලේඛන දිහා බලන කොට අපට පෙනී ගියා, රාජ්‍ය දැව සංස්ථාවේ -කැප්පෙටිපොල, බූස්සේ සහ රත්මලානේ- අදාළ දැව තෙල් කාන්දුකරණයේ, සීසන්කරණයේ ප්‍රමාණයේ ධාරිතාව දිහා බැලුවාම සාමාන්‍යයෙන් කණු 2,100ක්, 2,200ක් පමණ තමයි දීලා තිබෙන්නේ කියලා. උදාහරණයක් හැටියට 2005, 2006 වසර දෙකටම දීලා තිබෙන්නේ කණු 4,291යි. ඒ කියන්නේ 2,100ක්, 2,200ක් වාගේ ප්‍රමාණයක් තමයි සපයන්න පුළුවන් වෙලා තිබෙන්නේ. 2007 දී අපි මේ ගැන විමර්ශනය කිරීමෙන් පසු පිට රටින් කණු ගෙන ඒම ප්‍රශ්නයක් කියන පදනම මත ඉඳ ගෙන අපි ඒකේ ධාරිතාව වැඩි කළා. වැඩි කළත්, අපිට 2007 දී, 2008 දී දෙන්න පුළුවන් වුණේ කණු 11,463යි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එතකොට ඉල්ලුවේ?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඉල්ලපු කණු දසදහස් ගණන දෙන්න නම් දැව සංස්ථාවට වසර 5ක් පමණ ගත වෙනවා. මොකද, වසරකට කණු 2,000 ගණනේ නේ දෙන්න පුළුවන්. සුනාමි ආකාරයේ ව්‍යසනයක් අවස්ථාවේදී එච්චර කාලයක් ජයිකා ආධාර පවත්වාගෙන යන්න බැරි වීම නිසා ඒක ලබා දුන් බව තමයි කියන්නේ. ඒකේ යම් කිසි සාධාරණත්වයක් පෙන්නුම් කළ නිසා එම පරීක්ෂණයෙන් ඒ අය දක්වපු තර්කවලට අපි එකඟ වුණා. මොකද, අනෙක් ප්‍රදේශවල, විශේෂයෙන්ම කඳුකර ප්‍රදේශවලට තමයි අපට විශාල වශයෙන් දැව කණු අවශ්‍ය වෙන්නේ. මොකද, කඳුකර ප්‍රදේශවලට සිමෙන්ති කණු ප්‍රවාහනය කරන්න අමාරුයි. එම නිසා දැනට අපි දැව සංස්ථාවේ කණු තමයි ඒ කලාපයට යොදා ගන්නේ. ඒ අතර අපි ආපු තවත් වැදගත් නිගමනයක් තමයි ආයු කාලය. විදේශවලින් ගෙන එන දැව කණුයි, දැව සංස්ථාවේ දැව කණුයි ගත්තාම සාමාන්‍යයෙන් විදේශවලින් ගේන ඒවායේ ආයු කාලය දැව සංස්ථාවේ කණුවල ආයු කාලය වාගේ 1.5ක් වෙනවා. ඒ කියන්නේ දැව සංස්ථාවේ කණු පවතින්නේ අවුරුදු 10ක් නම්, විදේශවලින් ගේන ඒවා අවුරුදු 15ක් පවතින බව දැන් පෙනී ගිහින් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළ නොවුණත් මා දන්නවා ගරු ඇමතිතුමා පැහැදිලි පිළිතුරක් ලබා දේවි කියලා. ඔබතුමා මීට කලින් ප්‍රකාශයක් කරලා තිබුණා, අපේ රටේ බලශක්ති අවශ්‍යතාව වෙනුවෙන් පරමාණුක බලශක්තිය කෙරෙහි යම් අවධානයක් යොමු කළ යුතුයි කියලා. ජපානයේ ඇති වුණු තත්ත්වයත් එක්ක ඒ පිළිබඳව දැන් ලෝකයේ යම් ප්‍රවණතාවක් මතු වී තිබෙනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය දැන් ඒ පිළිබඳව අරගෙන තිබෙන ක්‍රියා මාර්ග හෝ යම් ප්‍රගතියක් තිබේ නම් ඒ පිළිබඳව කරුණු දැන ගන්න කැමැතියි.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, පරමාණු බලයෙන් විදුලිය නිපදවා ගැනීමේ ප්‍රධාන මාර්ග දෙකක් තිබෙනවා. එකක් තමයි න්‍යෂ්ටික විලයන ප්‍රතික්‍රියාව. අනෙක න්‍යෂ්ටික විඛණ්ඩන ප්‍රතික්‍රියාව. පරමාණු බලාගාරවල යුරේනියම් භාවිත කිරීම මඟින් න්‍යෂ්ටික විඛණ්ඩනයෙන් බලශක්තිය නිපද වන තැනට තමයි දැනට ගමන් කරලා තිබෙන්නේ. පරමාණු බලය පිළිබඳව අපේ රටේත් යම් කිසි විමසුමක් කාලාන්තරයක් තිස්සේ තිබුණා. 2025 පමණ වන විට පරමාණු බලයත් පාවිච්චි කරන්න සිද්ධ වන මට්ටමට අපේ බලශක්ති අවශ්‍යතාවන් වැඩි වන බවත්, ඒ වාගේම අපි දැනට භාවිත කරන ගල් අඟුරු, එහෙම නැත්නම් ඛනිජ තෙල්, එහෙමත් නැත්නම් අනෙකුත් ප්‍රභවයන්වල මිල ගණන් වෙනස් වන බවත් අපේ දිගු කාලීන ජනන සැලසුම් අනුව අපට පෙනී ගියා. ඒ සඳහා ස්වයංක්‍රීය පරිගණක ක්‍රමවේදයක් තිබෙනවා, කොයි බලශක්ති ප්‍රභවයද කොයි මොහොතේදී ගන්නේ කියන එක තීරණය කරන්න. ඒකට අපි කියනවා WASP system එක කියලා. ඒ මඟින් තමයි මේක අපට තෝරා දුන්නේ. දැන් තිබෙන ගැටලුව වන්නේ පරමාණු බලයේ ගැටලු තුනක් තිබීමයි. එකක්, මේ යුරේනියම් භාවිත කිරීමෙන් පසු ඇති වන අළු තැන්පත් කිරීම පිළිබඳ ගැටලුව. දෙවැනි ගැටලුව වන්නේ මේ සඳහා අවශ්‍ය කරන තාක්ෂණික සහ මූල්‍යමය ශක්තීන් පිළිබඳ ගැටලුව. ඒක ඉතා වැදගත්. තුන්වැනි කාරණය හැම තැනම මතු වුණු කාරණයක්. ඒ තමයි අනතුරක් වුණොත් මොන විධියටද ප්‍රතික්‍රියා දක්වන්නේ කියන කාරණය. දැන් අළු පිළිබඳව කල්පනා කිරීමේදී යුරේනියම් වෙනුවට තෝරියම් භාවිත කළා නම් මේ අළු පිළිබඳ ප්‍රශ්නය පැන නොනඟින බව නෝර්වේ වාගේම ඉන්දියාව ආදී රටවල කරලා තිබෙන පරීක්ෂණවලින් පෙනී ගොස් තිබෙනවා.අපට ලැබී තිබෙන වාර්තා අනුව ඒ නව තාක්ෂණය වසර 2022න් පස්සේ ලෝකයට ලැබෙන්න නියමිතයි. ඒ වාගේම රුසියාව සහ ස්වීඩනය තීරණය කර තිබෙනවා ඒ ගොල්ලන් අපට මූලද්‍රව්‍ය -යුරේනියම්- දීලා අළු ඒ අය භාර ගන්න. එතකොට ඒ අළු භාවිත කිරීමේ ප්‍රශ්නයක් පැන නඟින්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඊ ළඟ කාරණය අධික මිල ගණන්. මේ අධි තාක්ෂණය දැනට අපේ රටේ භාවිත කරලා නැහැ. මා ඔබතුමන්ලාට කියන්න ඕනෑ 90 දශකයේ අපි විශ්වවිද්‍යාලයේ ඉන්න කාලයේ මේ පාඨමාලාව විශ්වවිද්‍යාලයේ හැදෑරීමට තිබුණු බව. දැන් ඒ පාඨමාලාව විශ්වවිද්‍යාලවල නැහැ. ඒ නිසා පළමුවැනි පියවර හැටියට අපි දැනට කරලා තිබෙන්නේ විශ්වවිද්‍යාලවලට පරමාණුබල ශක්තිය පිළිබඳ ඉංජිනේරු පාඨමාලාව ඇතුළත් කිරීම සහ මේ පිළිබඳව ලෝක ප්‍රවණතා සහ අනෙක් ප්‍රවණතාවන් හැදෑරීම සඳහා මේ ඉදිරි අවුරුදු තුන ඇතුළත 30 දෙනකුගෙන් යුතු අපේ විද්‍යාඥයන් කණ්ඩායමක් මේ තත්ත්වයට පුහුණු කිරීමයි. ඒක ඉතා වැදගත්. මොකද, අපේ අවට කලාපයේත් මේවා තිබෙන නිසා අනතුරක් වුණොත් කොහොමද මුහුණ දෙන්නේ කියන එක දැන ගැනීම සඳහා. ඉතින් ඒ තත්ත්වයේ තමයි අපි දැනට ඉන්නේ. ඒ වාගේම මේ පිළිබඳව තිබෙන සෑම තාක්ෂණික ප්‍රභේදයක්

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

පිළිබඳව පුළුල් අධ්‍යයනයකින් පසුව තමයි අපි ශක්‍යතා අධ්‍යයනයට යන්න බලාපොරොත්තු වෙන්නේ.එහෙම තත්ත්වයක් එනවා නම් එන්නේ වසර 2015 දී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පාසල් ළමුන් ගැලරියේ ඉන්න වෙලාවේ ඉතා පැහැදිලි පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ප්‍රශ්න අංක 6-0905/'10-(2), ගරු එම්.ටී. හසන් අලි මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
கௌரவ சபாநாயகர் அவர்களே, மாண்புமிகு எம்.ரீ. ஹசன் அலி சார்பாக நான் அவ்வினாவைக் கேட்கிறேன்.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ගල් අඟුරු හා ජල විදුලි බලාගාර: විදුලි අවශ්‍යතාව
## நிலக்கரி மற்றும் நீர் மின் நிலையங்கள்: மின்சாரத் தேவை
## COAL-FIRED AND HYDRO ELECTRIC POWER PLANTS: POWER REQUIREMENT

1003/'10

7. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු ශාන්ත බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு சாந்த பண்டார சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Shantha Bandara)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වත්මන් ජාතික විදුලි බල අවශ්‍යතාව දෛනික, මාසික හා වාර්ෂික පදනම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වර්ෂ 2005 දක්වා ජාතික විදුලිබල පද්ධතියට දායක වූ විදුලිය ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 2005 සිට මේ දක්වා ජාතික විදුලිබල පද්ධතියට අලුතින් එකතු කිරීමට හැකි වූ විදුලිබල ප්‍රමාණය මෙගාවොට් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දැනට ඉදිකිරීම් ආරම්භ කර ඇති ගල් අඟුරු හා ජල විදුලි බලාගාර මඟින් ඉදිරියේදී උත්පාදනය කිරීමට අපේක්ෂිත විදුලි බල ප්‍රමාණය මෙගාවොට් කොපමණද;

(ii) එම නව විදුලි උත්පාදනය තුළින් ජාතික විදුලි අවශ්‍යතාව සම්පූර්ණ වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போதைய தேசிய மின்சக்தித் தேவை நாளாந்த, மாதாந்த மற்றும் வருடாந்த அடிப்படையில் தனித் தனியாக எவ்வளவென்பதையும்,

(ii) 2005ஆம் ஆண்டு வரை தேசிய மின்சக்தி முறை மைக்கு பங்களிப்புச் செய்துள்ள மின்சாரத்தின் அளவு யாதென்பதையும்,

(iii) 2005ஆம் ஆண்டு முதல் இற்றைவரை தேசிய மின்சக்தி முறைமையில் புதிதாக சேர்ப்பதற்கு முடியுமாயிருந்த மின்சக்தியின் அளவு எவ்வளவு மெகாவோற்கள் என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) தற்போது நிர்மாணிப்புப் பணிகள் ஆரம்பிக்கப் பட்டுள்ள நிலக்கரி மற்றும் நீர் மின் நிலையங்களின் மூலமாக எதிர்காலத்தில் உற்பத்தி செய்வதற்கு எதிர்பார்க்கப்படுகின்ற மின்சக்தியின் அளவு எவ்வளவு மெகாவொற்கள் என்பதையும்,

(ii) மேற்படி புதிய மின்சார உற்பத்தியின் மூலமாக தேசிய மின்சாரத் தேவை பூர்த்தி செய்யப்படுமா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy :

(a) Will he state-

(i) separately, current national power requirement on daily, monthly and annual basis;

(ii) the amount of power added to the national electricity grid up to year 2005;

(iii) the amount of power in megawatts that was able to be added to the national electricity grid from year 2005 up to now ?

(b) Will he state-

(i) the amount of power in megawatts expected to be generated through coal-fired and hydro electric power plants of which construction work has been commenced by now;

(ii) whether the aforesaid new power generation will meet the national power requirement?

(a) If not, why ?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) සතියේ දිනය, කාලගුණ තත්ත්වය ආදිය මත ජාතික විදුලිබල අවශ්‍යතාව වෙනස් වේ. පවත්නා වර්ෂයේ ඉහළම උපරිම ඉල්ලුම මෙ.වො. 2020ක් වූ අතර, එය 2011 මාර්තු මස 30 වන දින ඇති විය.

සාමාන්‍ය දෛනික විදුලිබල අවශ්‍යතාව (ආසන්න වශයෙන්) ගි.වො. පැ. 31 මාසික විදුලිබල අවශ්‍යතාව (ආසන්න වශයෙන්) ගි.වො. පැ. 892 වාර්ෂික විදුලිබල අවශ්‍යතාව ආසන්න වශයෙන් ගි.වො. පැ. 10714.5
(2010 තුළ)

(ii) මෙ.වො. 2411
(ලංවිම : මෙ.වො. 1758, ස්වාධීන විදුලි නිෂ්පාදකයින් මෙ.වො. 653)

(iii) මෙ.වො. 708
(ලංවිම : මෙ.වො. 3000, ස්වාධීන විදුලි නිෂ්පාදකයින් මෙ.වො. 408)

(ආ) (i) මෙ.වො. 897
(පුත්තලම ගල් අඟුරු මෙ.වො. 600, ඉහළ කොත්මලේ මෙ.වො. 150 සහ උමා ඔය මෙ.වො. 120; කුඩා පරිමාණ ජල මෙ.වො. 27)

සටහන:

අ. මීට අමතරව, මෙ.වො. 40ක ඩෙන්ඩ්‍රෝ විදුලි බලාගාරයක් සහ මෙ.වො. 30ක සුළං විදුලි බලාගාරයක් ඉදි කිරීම් අදියරේ පවතී.

ආ. එසේම තවත් මෙ.වො. 562ක් ක්‍රියාත්මක කරමින් පවතී.

(i) බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාරය (මෙ.වො. 35).

(ii) මොරගොල්ල ජල විදුලි බලාගාරය (මෙ.වො. 27)-

ශක්‍යතා අධ්‍යයන වාර්තාව සම්පූර්ණ කර ඇත.

(iii) ත්‍රිකුණාමලය ගල් අඟුරු බලාගාරය - (මෙ.වො. 500)-

සාකච්ඡා මට්ටමේ පවතී.

(ii) ඉදි කිරීම් සහ ක්‍රියාත්මක කෙරෙමින් පවත්නා විදුලි බලාගාරවලට අපේක්ෂිත විදුලිබල වර්ධනය සපුරාලීමට හැකි වනු ඇත.

(ඇ) අදාළ නොවේ.

## නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය: ආයතන
## மீள்குடியேற்ற அமைச்சு: நிறுவனங்கள்
## MINISTRY OF RESETTLEMENT: INSTITUTIONS

0287/'10

9. **ගරු ආර්. යෝගරාජන් මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஆர். யோகராஜன் - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. R. Yogarajan on behalf of the Hon. Ravi Karunanayake)
නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා කවරේද;

(ii) ඉහත කී අමාත්‍යාංශයේ වත්මන් සමස්ත මාසික සහ වාර්ෂික පිරිවැය කොපමණද;

(iii) ස්ථිර කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව සහ ඔවුන්ට මාසිකව ගෙවනු ලබන සමස්ත වැටුප් සහ දීමනා ප්‍රමාණය කොපමණද;

(iv) නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලවල වත්මන් සමස්ත මාසික පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மீள்குடியேற்ற அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மீள்குடியேற்ற அமைச்சின் கீழ்வரும் திணைக் களங்கள், நியதிச்சட்ட நிறுவனங்கள் மற்றும் அரசாங்கக் கூட்டுத்தாபனங்கள் ஆகியவற்றையும்,

(ii) மேற்படி அமைச்சுக்கான தற்போதைய மொத்தச் செலவினத்தை மாத மற்றும் வருட வாரியாகவும்,

(iii) நிரந்தர பணியாள் தொகுதியின் எண்ணிக்கை யையும் அவர்களுக்கு வழங்கப்படும் மாதாந்த மொத்த ஊதியங்களையும்,

(iv) மீள்குடியேற்ற அமைச்சர், பிரதி அமைச்சர் மற்றும் அவர்களின் பணியாள் தொகுதியினர் ஆகியோருக் கான மாதாந்த மொத்தச் செலவினத்தையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Resettlement :

(a) Will he inform this House-

(i) the Departments, Statutory Institutions and Public Corporations under the Ministry of Resettlement;

(ii) the total cost of the aforesaid Ministry per month and per year at present;

(iii) the number of permanent staff and the total emoluments paid to them per month; and

(iv) the total cost of the Minister and Deputy Minister of Resettlement and their Staff per month at present?

(b) If not, why?

**ගරු ගුණරත්න වීරකෝන් මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு குணரத்ன வீரகோன் - மீள்குடியேற்ற அமைச்சர்)
(The Hon.Gunaratne Weerakoon - Minister of Resettlement)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) නැවත පදිංචි කිරීමේ අධිකාරිය
උතුරු පළාතෙන් අවතැන් වූ මුස්ලිම් ජනතාව සඳහා වූ ලේකම් කාර්යාලය
යටිතල පහසුකම් හා නිවාස සංවර්ධන ව්‍යාපෘතිය, පුත්තලම

(ii) මාසික රු. 68,875,681.17
වාර්ෂික රු. 824,600,200.50

(iii) ස්ථිර කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව 113
අමාත්‍යාංශයේ 91

උතුරු පළාතෙන් අවතැන් වූ මුස්ලිම් ජනතාව සඳහා වූ

| | |
|---|---|
| ලේකම් කාර්යාලය | 21 |
| නැවත පදිංචි කිරීමේ අධිකාරිය | 01 |
| | 113 |

මාසිකව ගෙවනු ලබන සමස්ත වැටුප් හා දීමනා රු. 2,916,754.00

(iv) රු. 8,423,964.56

(ආ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12-0977/'10-(2), ගරු එම්.ටී. හසන් අලි මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
கௌரவ சபாநாயகர் அவர்களே, மாண்புமிகு எம்.ரீ. ஹசன் அலி சார்பாக நான் அவ்வினாவைக் கேட்கிறேன்.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති: විස්තර
## குருநாகல் மாவட்ட வீதி அபிவிருத்திக் கருத்திட்டம்: விபரம்
## ROAD DEVELOPMENT PROJECTS IN KURUNEGALA DISTRICT: DETAILS

1004/'10

13. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු ශාන්ත බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு சாந்த பண்டார சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Shantha Bandara)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මග නැගුම වැඩසටහන යටතේ කොන්ක්‍රීට් කැට අල්ලා මාර්ග සංවර්ධනය කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එවැනි ව්‍යාපෘති සඳහා 2010 වර්ෂයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයට වෙන් කළ මුදල කොපමණද;

(ii) ඒ යටතේ සිදු කළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එමඟින් සංවර්ධනය කළ මාර්ගයන්හි දුර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மகநெகும திட்டத்தின் கீழ் கொங்கிறீட் கற்கள் இடப்பட்டு வீதி அபிவிருத்தி செய்யப்படுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) அவ்வாறான கருத்திட்டங்களுக்காக 2010 ஆம் ஆண்டில் குருநாகல் மாவட்டத்துக்கு ஒதுக்கப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்,

(ii) அதன்கீழ் மேற்கொள்ளப்பட்ட வீதி அபிவிருத்திக் கருத்திட்டங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்,

(iii) அதன்மூலம் அபிவிருத்தி செய்யப்பட்ட வீதிகளின் நீளம் எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways :

(a) Is he aware that roads are developed by fixing concrete blocks under the Maga Neguma Programme ?

(b) Will he state;

(i) the amount of money that was allocated for the Kurunegala District for the year 2010 for such projects;

(ii) the number of roads development projects carried out under that programme;

(iii) the length of the roads developed under that programme?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) වෙන් කරන ලද මුළු මුදල් ප්‍රමාණය රු. මිලියන 277.85

(ii) සම්පූර්ණ කළ මාර්ග ව්‍යාපෘති සංඛ්‍යාව 256කි.

(iii) සම්පූර්ණ කළ මාර්ග මුළු දුර ප්‍රමාණය කි.මී. 25.2කි.

(ඇ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය. ගරු අනුර දිසානායක මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
### தனி அறிவித்தல் மூல வினா
### QUESTION BY PRIVATE NOTICE

## හෘදය රෝග සැත්කම් පහසුකම් වැඩි කිරීම
### இருதயநோய்ச் சத்திரசிகிச்சை வசதிகளை அதிகரித்தல்
### INCREASE OF HEART SURGERY FACILITIES

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ශ්‍රී ලංකාව තුළ හෘදය රෝගය හේතුවෙන් ඉතා විශාල රෝගීන් සංඛ්‍යාවක් මිය යන බව වාර්තාවලින් පෙන්නුම් කරනවා. එය ස්වාභාවික හේතුවලින් මිය යන වැඩිම ප්‍රමාණය වනු ඇත. එම තොරතුරු අනුව සාමාන්‍යයෙන් දින පතා රෝගීන් 109ක් පමණ හෘදය රෝගය නිසා මිය යන අතර, ඉන් 70කගේ පමණ ජීවිත ශල්‍යකර්ම මඟින් බේරා ගත හැකි බව වාර්තා වනවා.

නමුත් රජයේ සහ පෞද්ගලික රෝහල් සියල්ලම සලකා බැලුවත් දිනකට සිදු කරනු ඇත්තේ ශල්‍යකර්ම 07ක් වැනි ප්‍රමාණයකි. ඒ අනුව හෘදය රෝග හේතුවෙන් මිය යන අයගෙන් ජීවිත ගලවා ගත හැකි ප්‍රමාණයෙන් සියයට 10ක් වත් බේරා ගැනීමට නොහැකි ඛේදනීය තත්ත්වයක් අපේ රට තුළ පවතිනවා. එසේම රාජ්‍ය අංශය තුළ සිදු කරන හෘදය රෝග ශල්‍යකර්මවලින් සියයට 40ක් පමණ පසු ගිය කාලය තුළ සිදු කරනු ලැබ ඇත්තේ ගාල්ල, කරාපිටිය ශික්ෂණ රෝහලේ හෘදය හා උරස් ශල්‍ය ඒකකය මඟින් බව වාර්තා වනවා. දැනට ගාල්ල කරාපිටිය රෝහලේ ශල්‍යාගාරයේ ප්‍රතිසංස්කරණ හේතුවෙන් එම ශල්‍යකර්ම නවතා දමා තිබෙනවා. 2011 පෙබරවාරි මස සිට නවතා ඇති ශල්‍යකර්ම ජූනි මස අගදී ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව බලධාරීන් පවසා සිටියත් දැනට එම ප්‍රතිසංස්කරණ සිදු කරනු ලබන ආකාරය අනුව ශල්‍යකර්ම ආරම්භ කිරීමට තවත් මාස කිහිපයකට වඩා පමා විය හැකි බව මේ වන විට පෙනී යනවා. එසේම ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහල තුළ සාමාන්‍යයෙන් දිනකට ශල්‍යකර්ම තුනක් හතරක් පමණ සිදු කරනු ලබන අතර 2010 වසරේදී පමණක් ශල්‍යකර්ම 900කට ආසන්න ප්‍රමාණයක් සිදු කරනු ලැබුවා. එසේ වුවද පසු ගිය කාලය වන විට කරාපිටිය රෝහල තුළ ශල්‍යකර්ම සිදු කරන වාට්ටුව හා ශල්‍යාගාරය දෙකට බෙදීමෙන් සිදු කරන ශල්‍යකර්ම ප්‍රමාණය ශීඝ්‍රයෙන් පහත බැස තිබෙනවා. දැනට තිබෙන ශල්‍යාගාර සහ වාට්ටුව ශල්‍යකර්ම කිරීමටවත් ප්‍රමාණවත් නොමැති අවස්ථාවකදී මෙය ගැටලු සහගත තත්ත්වයකි. මේ කරුණු සියල්ල සැලකීමේදී ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු බලාපොරොත්තු වනවා.

1. ශ්‍රී ලංකාව තුළ දිනකට මිය යන හෘදය රෝගීන් ප්‍රමාණය අඩු කර ගැනීමට දැනට සිදු කරන ශල්‍යකර්ම ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බව ඔබතුමා පිළිගන්නේද?

2. එසේ නම් එම ශල්‍යකර්ම ප්‍රමාණය වැඩි කිරීමට ජාතික වශයෙන් වැඩ පිළිවෙළක් සකස් කර ඇත්තේද?

3. එසේ වැඩ පිළිවෙළක් සකස් කර නොමැති නම් ඉදිරියේදී එවැනි වැඩ පිළිවෙළක් සකස් කිරීමට අපේක්ෂා කරන්නේද? කෙතරම් කාල සීමාවකටද?

4. කරාපිටිය හෘදය උරස් ශල්‍ය ඒකකය තුළ ජාතික මට්ටමින් සිදු කරන ශල්‍යකර්මවලින් සියයට 40ක් පමණ සිදු කරන බව ඔබතුමා පිළිගන්නේද?

5. දැනට සිදු කරනු ලබන්නේ ප්‍රතිසංස්කරණ පමණක් වන අතර පුළුල් කිරීමක් නොමැති බැවින් කරාපිටිය රෝහල තුළ සිදු කරනු ලබන ශල්‍යකර්ම ප්‍රමාණය වැඩි කිරීමට වාට්ටුව හා ශල්‍යාගාරය පුළුල් කිරීමටත්, එම රෝහල තුළ දැනට තිබෙන වාට්ටු හා ශල්‍යාගාරය දෙකට බෙදීමෙන් දිනකට සිදු කරනු ලබන ශල්‍යකර්ම ප්‍රමාණය අඩු වීමේ ගැටලුව නිරාකරණය කිරීමටත් ක්‍රියා මාර්ග ගන්නේද?

6. දැනට තාවකාලිකව කරාපිටිය හෘදය උරස් ශල්‍ය ඒකකය ප්‍රතිසංස්කරණය කිරීමෙන් මාස ගණනාවක් තිස්සේ ප්‍රමාද වන ශල්‍යකර්ම කිරීමට විකල්ප වැඩ පිළිවෙළක් සකස් කරන්නේද?

ගරු කථානායකතුමනි, ඉහත ප්‍රශ්න සම්බන්ධයෙන් ගරු සභාව දැනුවත් කිරීමට ආණ්ඩුව පියවර ගනු ඇතැයි අපේක්ෂා කරන අතරම මෙම ගැටලුව කඩිනමින් විසඳීමට අවශ්‍ය වන පිළිතුරක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

මතු දිනකදී ඔබතුමාගේ ප්‍රශ්නයට සෞඛ්‍ය ඇමතිතුමා පිළිතුරු ලබා දෙනවා ඇති.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අමාත්‍යාංශ නිවේදන. ගරු අධ්‍යාපන අමාත්‍යතුමා.

## පාසල් නිල ඇඳුම් රෙදි සැපයීම: වැඩ බලන අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
### பாடசாலைச் சீருடைத் துணி விநியோகம்: பதில் கல்வி அமைச்சரினது கூற்று
### SUPPLY OF SCHOOL UNIFORM MATERIAL: STATEMENT BY ACTING MINISTER OF EDUCATION

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (වැඩ බලන අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - பதில் கல்வி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa – Acting Minister of Education)

ගරු කථානායකතුමනි, මා මේ ප්‍රකාශය කරන්නේ පසු ගිය දිනක ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා පාසල් නිල ඇඳුම් සම්බන්ධයෙන් මතු කරන ලද කාරණාවට අදාළවයි.

2011 වර්ෂයට අදාළව පාසල් නිල ඇඳුම් රෙදි බෙදා දීමේ වැඩසටහන යටතේ මේ වන විට දිවයිනේ දිස්ත්‍රික්ක 19ක පිහිටි කලාප අධ්‍යාපන කාර්යාල 63ක් හරහා පාසල් 6,220ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 26,33,454ක් වෙනුවෙන් අනුමත ප්‍රමිතිය පිළිබඳව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

ශ්‍රී ලංකා රෙදිපිළි ආයතනයේ -ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත සහ ඇඟලුම් ආයතනයේ- නිරන්තර අධීක්ෂණය හා සහතිකය යටතේ නිල ඇඳුම් රෙදි පැකට් 46,68,335ක ප්‍රමාණයක් මේ වන විට බෙදා හැර අවසන් කර ඇත. දිස්ත්‍රික්ක 06ක නිල ඇඳුම් බෙදා දීමේ ඌනතාවක් ඇත. ඉතා ඉක්මනින් එම නිල ඇඳුම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

දේශීය නිෂ්පාදකයින් විසින් පොලියෙස්ටර් සියයට 65 + කපු සියයට 35 වර්ගයෙන් රෙදි කැබලි 50 බැගින් පෙට්ටිවල අසුරා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය විසින් තත්ත්ව පරීක්ෂාවට ලක් කර අදාළ සෑම පෙට්ටියකටම මුද්‍රා තබනු ලබයි.

එබැවින් ඉහත ප්‍රකාශයට ප්‍රස්තුත වූ අධ්‍යාපන කලාපයෙන් කළ විමසීමේදී අදාළ කලාප අධ්‍යක්ෂවරයා විසින් එවැනි කිසිදු පැමිණිල්ලක් තම කලාපයේ පාසල් 96 අතරින් කිසිම පාසලකින් වාර්තා වී නොමැති බව ලිඛිතව දන්වා ඇත.

මෙම සෑම රෙදි පැකට් එකකම රෙදි හඳුනා ගැනීමේ අංකයත්, සැපයුම්කරුවන්ගේ සංකේත අංකයත් සඳහන් වී තිබේ.

මොරටුව විශ්වවිද්‍යාලයෙන් කරන ලද සමීක්ෂණයක් අනුව නිල ඇඳුම් නිෂ්පාදනය කිරීමේ දේශීය ධාරිතාව සියයට 50ක් බැවින් ඉතිරිය විදේශයෙන් ආනයනය කර රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව හරහා ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.

පාසල් ළමුන්ට රෙදි ලබා දීමේදී රෙදි සෑම දේශගුණයකටම සරිලන ආකාරයෙන් සකස් විය යුතුව ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට ගොරෝසු රෙදි සැපයීමට හැකියාවක් නොමැත.

කෙසේ නමුදු එතුමා ඉදිරිපත් කර ඇති රෙදි කැබැල්ලේ කිසිදු මුද්‍රාවක් සඳහන් වී නොමැති බැවින් එය පිළිගැනීමට හැකියාවක් නොමැත. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අහන්න බැහැ. සාමාන්‍යයෙන් අමාත්‍යාංශ නිවේදන කළ යුත්තේ අමාත්‍යවරුන් පමණයි. අද ඔබතුමා -

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මා වැඩ බලන අමාත්‍යවරයා හැටියට වැඩ බාර ගෙන තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වැඩ බලන ඇමතිවරුන්ට අමාත්‍යාංශ නිවේදන කරන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
Sir, I rise to a point of Order. ගරු කථානායකතුමනි, ඔය කාරණය මතු කළේ මම නේ. මම විවාදයකට යනවා නොවෙයි. නමුත් මම ඉතා වග කීමක් ඇතිව කියනවා, ඒ පාසලෙන් හම්බ වෙච්ච රෙදි කැබැල්ලේ -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක පසුව බලමු. ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 7හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මී ළඟට, යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව සම්මත කිරීම.

# මහජන ආරක්ෂක ප්‍රකාශනය
## பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
## PUBLIC SECURITY PROCLAMATION

[අ. භා. 2.01]

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2011 අප්‍රේල් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

ගරු කථානායකතුමනි, (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන 2005 අගෝස්තු මස 13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරනු ලැබ ඇති ප්‍රකාශනය අනුමත කරන මෙන් යෝජනා කරමි.

ගරු කථානායකතුමනි, 2005 අගෝස්තු 13වන දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක වූ හදිසි අවස්ථා තත්ත්වය පිළිබඳ යෝජනාව 2011 අප්‍රේල් මස 07වන දින මෙම ගරු සභාව රැස් වූ අවස්ථාවේ දී සම්මත කර ගන්නා ලදී.

ගරු කථානායකතුමනි, සෑම මසකම හදිසි අවස්ථා තත්ත්වය ප්‍රකාශයට පත් කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමේ අවස්ථාවේ දී අපගේ මාතෘ භූමියේ ආරක්ෂක තත්ත්වය පිළිබඳව වාර්තාවක් අප විසින් ඉදිරිපත් කරනවා. මෙයින් මෙම ගරු සභාවට රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ලබා දීමට මා උත්සාහ ගන්නවා.

ගරු කථානායකතුමනි, රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රකාශ ඉදිරිපත් කරන සෑම අවස්ථාවකම සාකච්ඡාවට භාජනය කෙරෙන්නේ එල්ටීටීඊ ත්‍රස්තවාදී සංවිධානයේ ක්‍රියාකලාපයයි. එයට හේතුව අපගේ මාතෘ භූමිය වසර 35කට ආසන්න කාලයක් වෙළා ගෙන සිටි යුද භීෂණයේ පුරෝගාමීන් හා නිර්මාණකරුවන් වන්නේ එල්ටීටීඊ සංවිධානය නිසායි. ඔවුන් සම්බන්ධයෙන් කථා නොකර රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියා කළ නොහැකියි.

සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය පසු ගිය මාසයට යෙදී තිබුණා. සමස්ත සිංහල, දෙමළ ජනතාව එකට එක් වී පවත්වන එකම ජාතික උත්සවය මෙයයි. මෙම උත්සව සමයේ දී ජන කොට්ඨාස දෙකේ සමගිය ගොඩ නැඟෙන ආකාරය හොඳින් පැහැදිලි වුණා. රටේ සෑම පුද්ගලයන්ම ජාති, ආගම් භේදවලින් තොරව මෙම උත්සව සමය ඉතා සාමකාමීව සමරනු ලැබුවා. එසේ සමරන්නට අවස්ථාව උදා වුණේ එල්ටීටීඊ සංවිධානයේ යුද භීෂණයත්, මරා ගෙන මැරෙන බෝම්බකරුවන්ගේ විනාශකාරී ක්‍රියාවන්ගෙනුත් අපගේ මව් බිම මුදා ගන්නට අවස්ථාව අපට උදා වූ නිසායි. දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා වෙසෙන සෑම පුද්ගලයකුටම එක හා සමාන නිදහසක් හා වරප්‍රසාදයක් භුක්ති විඳීමේ අවස්ථාව අප උදා කර දී තිබෙනවා. ඒ නිසා තමයි මෙවර සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය ඉතාමත් ඉහළින් සමරන්නටත්, සිංහල හා දෙමළ ජාතීන් අතර පළුදු වී තිබුණු ජාතික සමගිය නැවත ගොඩ නඟන්නටත් අපට හැකියාව ලැබී තිබෙන්නේ. දැනට උතුරු ප්‍රදේශයට සංචාරය සඳහා යන සිංහල ජනතාවගේ ප්‍රමාණය අතිවිශාලයි. උතුර, දකුණ යා කිරීමට අප ගන්නා උත්සාහයේ ප්‍රතිඵල අපට දැනටමත් ලැබී තිබෙනවා. එයින් දෙමළ ජනතාවටත් මෙන්ම සිංහල ජනතාවටත් ආර්ථික වශයෙන් ඉතා සුබදායී තත්ත්වයක් උදා වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, දැනට අප රට එල්ටීටීඊ සංවිධානයේ භීෂණ ක්‍රියාවන්ගෙන් සම්පූර්ණයෙන්ම මිදී ඇතත්, යුද්ධයේ භීෂණ ක්‍රියාවන්ගෙන් ඇති වූ අතුරු ප්‍රතිඵල තවමත් අප ඉදිරියේ පවතිනවා. යුද්ධයේදී පූර්ණ වශයෙන් හා අර්ධ වශයෙන් ආබාධිත රණ විරුවන් දහස් ගණනක් පුනරුත්ථාපනය මෙන්ම නඩත්තු කිරීමට කටයුතු කර තිබෙනවා. එසේම යුද්ධයේදී නොයෙකුත් ආබාධයන්ට ලක් වූ සිවිල් ජනතාව වෙනුවෙන් ද අප නොයෙකුත් ක්‍රියාමාර්ගයන් හා සුභ සාධක වැඩසටහන් ක්‍රියාත්මක කරනවා.

එල්ටීටීඊ සාමාජිකයන් වශයෙන් හඳුනා ගෙන දැනට පුනරුත්ථාපනය කරන ප්‍රධාන පෙළේ ත්‍රස්තවාදී සාමාජිකයන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය තව දුරටත් ඉදිරියට ගෙන යනවා.

පසු ගිය මාසය තුළ පූර්ණ පුනරුත්ථාපන කටයුතුවලින් පසු සමාජගත කරන ලද සාමාජික සංඛ්‍යාව 627ක් පමණ වෙනවා. එසේම උතුරු නැඟෙනහිර මෙන්ම මාතෘ භූමියේ සෑම ප්‍රදේශයකම ත්‍රස්තවාදී සාමාජිකයින් සහ පුපුරණ ද්‍රව්‍ය සෙවීමේ විමර්ශන කටයුතු නොකඩව ඉදිරියට කර ගෙන යනවා.

පුනරුත්ථාපනය වන සාමාජිකයින්ගේ තොරතුරු මත අවි ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය සෙවීමේ කටයුතු නොකඩව සිදු කරනවා. එසේම යුද මානුෂීය මෙහෙයුම්වල අවසන් කාල සීමාවේදී එල්ටීටීඊ සංවිධානය අත හැර දකුණු ප්‍රදේශවලට සංක්‍රමණය වී සිටි ත්‍රස්තවාදී සාමාජිකයන් විශාල ප්‍රමාණයක් අප අත් අඩංගුවට ගත්තා.

ඔවුන්ගෙන් ලබා ගත් තොරතුරු මත උතුරු නැඟෙනහිර මෙන්ම දකුණු ප්‍රදේශවලත්, නොයෙකුත් විනාශකාරී ක්‍රියාවන් සඳහා රැගෙන එන ලද අවි ආයුධ මෙන්ම පුපුරණ ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අත් අඩංගුවට ගැනීමට අප ක්‍රියා කර තිබෙනවා. තව දුරටත් මෙම විමර්ශන කටයුතුවලින් ලැබෙන තොරතුරු මත අවි ආයුධ මෙන්ම ප්‍රධාන පෙළේ ත්‍රස්තවාදී සාමාජිකයන් අත් අඩංගුවට ගැනීමට අප ක්‍රියා කරමින් සිටිනවා. එය රටේ ආරක්ෂාව සහ මහජන ආරක්ෂාව වෙනුවෙන් අප විසින් කළ යුතු ජාතික වග කීමක් බවට අප රජය හඳුනා ගෙන තිබෙනවා.

එල්ටීටීඊ සංවිධානයේ ක්‍රියාකලාපයන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක නොවුවත්, ජාත්‍යන්තර වශයෙන් ඔවුන්ගේ ක්‍රියාකාරීන් ඒක රාශි වෙමින් ඔවුන් පදිංචිව සිටින රටවල රජයන්ට නොයෙකුත් බලපෑම් සිදු කරමින් සිටිනවා. එල්ටීටීඊ සංවිධානයේ සිට දැනට විදේශගතව සහ දේශීය වශයෙන් නිදැල්ලේ හැසිරෙන බුද්ධි හා සන්නද්ධ සාමාජිකයින් නැවත ඒක රාශි වී පැරණි එල්ටීටීඊ සාමාජිකයින් සමඟ සම්බන්ධකම් පැවැත්වීමට නිරතුරු උත්සාහයක් දරන අතර, එල්ටීටීඊ සංවිධානයේ ක්‍රියාකාරකම් තව දුරටත් දියත් කිරීම සඳහාද උත්සාහයන් දරමින් සිටිනවා. මේ පිළිබඳව රජය සහ ආරක්ෂක අංශ නිරන්තරයෙන්ම පසු විපරම් සිදු කරන අතර, එසේ නැවතත් ඉහත සාමාජිකයන් සමඟ සම්බන්ධකම් පවත්වමින් එල්ටීටීඊ ක්‍රියාකාරකම්වල යෙදෙන බවට තොරතුරු ලැබුණහොත් ඒ සම්බන්ධයෙන්ද නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර තිබෙනවා.

[ගරු දි.මු. ජයරත්න මහතා]

මේ අයුරින් ඉතා නිවැරදිව විනිවිදභාවයකින් යුතුව ක්‍රියාකර, අපගේ මාතෘ භූමිය ලබා ඇති මේ නිදහස තවදුරටත් වර්ධනය කර පූර්ණ නිදහසක් භුක්ති විඳීම සඳහා උරුම කර දීම අප කාගේත් වගකීමකි.

ගරු කථානායකතුමනි, කුරිරු එල්ටීටීඊ ත්‍රස්තවාදය ශ්‍රී ලංකා භූමියෙන් මුළුමනින්ම අතුගා දමා තිරසාර සාමයක් කරා යැමට අප සැලසුම් කරන මේ අවස්ථාවේ ත්‍රස්තවාදය මුළු ලෝකයෙන්ම තුරන් කිරීමට ප්‍රබල රාජ්‍යයන් ක්‍රියාත්මක වීම අපට මහත් ධෛර්යයක් සහ සතුටට කරුණක් බව විශේෂයෙන්ම සඳහන් කරනවා.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන, සාමය අගය කරන ශ්‍රී ලංකාවාසී සියලු ජනතාව වෙනුවෙන් නීතිය හා සාමය, මහජන ආරක්ෂාව පවත්වා ගෙන යැම සඳහාත්, රාජ්‍ය දේපොළ ආරක්ෂා කිරීම සඳහාත් තවදුරටත් එක් මසක කාල පරිච්ඡේදයක් සඳහා දිවයින පුරා හදිසි තත්ත්වයක් නොකඩව පවත්වා ගෙන යැමට මෙම ගරු සභාවේ සියලු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ලබා දෙනු ඇතැයි මම විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, හදිසි නීතියේ තිබුණ නීති බොහොමයක් අද අපි ඉවත් කරලා, දැන් සුළු ප්‍රමාණයක් පමණයි තිබෙන්නේ. මේ හදිසි නීතිය ක්‍රියාත්මක කිරීම තුළින් කිසිම පුද්ගලයකුටවත්, සාමාන්‍ය සමාජයටවත් කිසිම හිරිහැරයක්, කරදරයක් ඇති වන්නේ නැහැ. මේක -

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Part II වල මොනවාද තිබෙන්නේ කියලා කියනවාද? දෙවන කොටස යටතේ ක්‍රියාත්මක වන්නේ මොනවාද කියලා මට කියනවාද?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
තියෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක අපට පැහැදිලි කරලා දෙනවාද?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මම දැන් කියාපු ටික තමයි තිබෙන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Part II එකේ තිබෙන දේවල් කිව්වේ නැහැ, ඔබතුමා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
සමහර ඒවා තිබෙනවා, ඒවා අපි ඉදිරිපත් කරන්නේ නැහැ. මොකද, ඒවා ඉදිරිපත් කරන්න පුළුවන්කමක් නැති නිසා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේකේ තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගැසට් එකේ තිබෙනවා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගැසට් එකේ තිබෙනවා. ළඟ නැද්ද ගැසට් එකක්?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මොනවාද Part II එකේ තිබෙන්නේ කියලා කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අගමැතිතුමා ගැසට් එක කියවන්නේ නැහැ නේ. ගරු මන්ත්‍රීතුමා කියවලා බලන්න, ගැසට් එක.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගැසට් එකේ තිබෙන කොටස තමයි තිබෙන්නේ. ගැසට් එක තමුන්නාන්සේලාට බලා ගන්න වේලාසනින් එවලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගැසට් එකේ දෙවන කොටසේ තිබෙන එක ක්‍රියාත්මක වන්නේ - [බාධා කිරීමක්]

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒක කියවලා බලන්න. ඒක ගැසට් එකේ තිබෙනවා. ඔබතුමා ළඟ ඒ ගැසට් එක නැද්ද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Emergency Regulationsවල Part II වල මොනවාද තිබෙන්නේ කියලා කියන්න කෝ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මේක ගැසට් කරලා තිබෙන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගැසට් කරලා තිබෙන්නේ. මම අහන්නේ දෙවැනි කොටසේ මොනවාද තිබෙන්නේ කියලායි.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒවා අපි කලින්ම ප්‍රකාශ කරලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
නැහැ, අද නේ කියන්නේ මේවායි කරන්නේ කියලා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මම මේ සභාවේ ගිය සැරේත් එය ප්‍රකාශ කළා. අනවශ්‍ය කොටස් අයින් කරලා කරදරයක් නොවන, කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැති කොටස් අපි ඇතුළත් කරලා සකස් කරපු ගැසට් නිවේදනයක් තිබෙනවා. ඒක මම ගිය වතාවේත් ප්‍රකාශ කළා. ඒකමයි මම මේ දැන් කියන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැන් කියන්නේ ඒක නොවෙයි.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
හදිසි නීතියේ සමහර කොටස් අපි ඉවත් කරලා තිබෙනවා. ඒ ඉවත් කරපු එක ගැනයි මම කිව්වේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැන් තිබෙන ඒවා කියන්න.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒකට ගැසට් එක බලන්න ඕනෑ. ඒක ගැසට් කරලා තිබෙනවා. ඒක වේලාසනින් අපි තමුන්නාන්සේලාට දීලා තිබෙනවා. [බාධා කිරීමක්] ඒ ගැසට් එක බලන්න ඕනෑ. ඒක බලන්න. ඒ ආපු ගැසට් එක ඔබතුමාගේ ගෙදර ඇති. ඒ කොටස් අත් ඇරලා තිබෙන ගැසට් එක වේලාසනින් ඔබතුමන්ලාට යැව්වේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පසුව ඉදිරිපත් කරන්න.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
අංකයත් එක්ක ඒක මම ගිය සැරේත් ප්‍රකාශ කළා. ඒක බලන්න. ගරු කථානායකතුමනි, ගැසට් කරලා තිබෙන ඒවා අද සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන්නේ නැති වෙන්න අපි අයින් කරලා තිබෙනවා. ඒ අයින් කරපු ඒවා ගැසට් කරලා මේ සභාවේ කියවලා තිබෙනවා. ඒ ගැසට් නිවේදනය තමුන්නාන්සේලා සියලු දෙනාටම බෙදා දී තිබෙනවා. පොඩ්ඩක් පසු ගිය දවස්වල ඒවා බැලුවා නම් ඒක බලා ගන්න පුළුවන් වෙනවා. සාමාන්‍යයෙන් යුද්ධය පවතින කාල පරිච්ඡේදය තුළ දී ඒ සියලුම කොටස් හදිසි නීතිය අනුව අවශ්‍ය වුණා. ක්‍රමක්‍රමයෙන් සාධාරණ සමාජ තත්ත්වයක් ඇති වන කොට, යුද්ධය අවසන් වීගෙන යන කොට ඒවා එකින් එක, එකින් එක අත් ඇරලා තිබෙනවා. දැන් තිබෙන්නේ අපේ අනාගත ආරක්ෂාව සඳහා, යම් කිසි වැරදි තත්ත්වයක් ඇති වුණොත් අන්න ඒකෙන් ප්‍රයෝජන ගැනීම සඳහා අවශ්‍ය කොටස් පමණයි. සාමාන්‍ය ජනතාවට කිසිම බලපෑමක් අපි සම්මත කරපු හදිසි නීතිය තුළින් ඇති වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඊ ළඟට කියන්න තිබෙන්නේ මේකයි. අපි බොහොම සන්තෝෂ වනවා, මේ රටේ පොදු මහ ජනතාව විශාල වශයෙන් මැයි මාසයේ පළමුවැනි දා කොළඹට ආපු එක ගැන. නොයෙක් විධියේ ජාතීන් හැටියට, ආගම් හැටියට, ප්‍රදේශ හැටියට, යාපනය කෙළවරේ ඉඳන් දෙවුන්දර තුඩුව දක්වා, කොළඹ ඉඳලා ත්‍රිකුණාමලය දක්වා සියලු ප්‍රදේශවලම කම්කරු ජනතාව, ගොවි ජනතාව, රජයේ සේවකයන් ආදී වශයෙන් විශාල පිරිසක් එමෙන්ම ආගමික නායකයන් කොළඹට රැස් වුණා. එහෙම රැස් වෙලා ජනතාවට පෙන්නුවා, ලෝකයට පෙන්නුවා, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සාධාරණ මාර්ග තුළින් 35 අවුරුද්දක් තිස්සේ පැවති යුද්ධය අවසන් කළාය කියන එක මේ රටේ ජනතාව පිළිගන්නා බව. ඒ අතරේ තමයි අපට චෝදනා ඉදිරිපත් කිරීමට ලෝකය සූදානම් වෙලා තිබෙන්නේ. බැන් කි මූන් වාර්තාව තුන් දෙනෙක් විසින් ඉදිරිපත් කරලා තිබෙනවා. බැන් කි මූන් තමයි ඒ සඳහා නියෝග කරලා තිබෙන්නේ. නමුත් ඒ වාර්තාවේ කියා තිබෙන කාරණා එකක්වත් මේ ලංකාවේ ජනතාව පිළිගන්නේ නැහැ කියන එක ඒ විධියට අපේ ජනතාවගේ ඒක රාශි වීම තුළින් බොහොම පැහැදිලි වෙලා තිබෙනවා. මම සන්තෝෂයි කියන්න විපක්ෂ නායකතුමාත් ඒ ගැන බොහොම පැහැදිලිව යමක් කියා තිබෙන බව. ඒ ගැන බොහොම තදින් ක්‍රියා කරන්න ඕනෑය, ඒක වැරදි ක්‍රියා මාර්ගයක්ය කියලා එතුමා ප්‍රකාශ කළ බව පත්තරවල පළ වෙලා තිබුණා. ඒක හරි ඇති කියලා මා විශ්වාස කරනවා.

ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ අනෙක් පැත්තේ ඉන්න සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාත් ප්‍රකාශයක් කරලා තිබුණා. ඒ දෙගොල්ලම ප්‍රකාශ කරලා තිබුණා මේක වැරදි වාර්තාවක් කියලා. ඒ ගැන අපි බොහොම සන්තෝෂ වෙනවා. නොයෙක් දේවල් නිසා එක්සත් ජාතික පක්ෂය දෙකට බෙදිලා තිබුණත් මේ අවස්ථාවේදී රට ගැන කල්පනා කරලා, ජාතිය ගැන කල්පනා කරලා ඒ විධියට ප්‍රකාශයන් නිකුත් කිරීම ගැන අපි එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. එක්සත් ජාතික පක්ෂයේ වුණත් කිහිප දෙනෙක් විතරයි මේ ගැන වැරදි ආකාරයට කල්පනා කරලා තිබෙන්නේ. තවම ඒ ගොල්ලන් හරියට කල්පනා කළේ නැහැ කියලා තමයි මා හිතන්නේ. ඒ අය මේ ගැන ඊට වඩා ගැඹුරු විධියට හිතනවා නම් මහ ජනතාව ඒ පිළිගත්ත තත්ත්වය හරියට හරිය කියලා පිළිගන්නවාට අනුමානයක් නැහැ.

ගරු කථානායකතුමනි, දැන් ලෝකයම ප්‍රකාශ කරලා තිබෙනවා, අල් කයිඩා නායකයා මරණයට පත් වුණා කියලා. අපි දන්නේ නැහැ ඔහු මරණයට පත් වුණාද, නැද්ද කියලා. මොකද, ෆොටෝ එකකින්වත් අපි දැක්කේ නැහැ. මැරුණාද, නැද්ද කියන මතයක් ඇති වෙලා තිබෙන බවකුත් පෙනෙනවා. කොහොම වුණත් එහෙම ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. මුළු ලෝකයම අවදානම් තත්ත්වයක තිබෙනවා. ඒ නිසා හැම රටක්ම වාගේ කල්පනාකාරී වෙන්න ඕනෑ. ඒ රටවල්වල ත්‍රස්තවාදී ක්‍රියා මාර්ග ඇති වෙන්න පුළුවන් කියන මතයක් අද ලෝකයේ ගොඩ නැඟිලා තිබෙනවා. ප්‍රභාකරන්ගේ මරණයත් සිද්ධ වුණා. අල් කයිඩා නායකයාගේ මරණයත් ඒ ආකාරයට සිද්ධ වුණා නම් ඒ ගැනත් කල්පනා කරලා බලන්න ඕනෑ. අද එහෙම සිද්ධ වෙලා තිබෙනවා කියලා ලෝකය කියනවා. නොයෙක් නොයෙක් රටවල රාජ්‍ය නායකයන් අපේ රට පිළිබඳව නොයෙක් නොයෙක් ප්‍රකාශ දැන් කරන බව පේනවා. අප ඒ ගැන සන්තෝෂ වෙනවා ගරු කථානායකතුමනි. ලෝකයේ දියුණුම රටවල්, චීනය, ඉන්දියාව, රුසියාව වාගේ රටවල් කෙළින්ම ප්‍රකාශ කර තිබෙනවා,

[ගරු දි.මු. ජයරත්න මහතා]

ශ්‍රී ලංකාව පිළිබඳව කරන මේ ප්‍රකාශන සම්පූර්ණයෙන්ම වැරදියි කියලා. ඒ වාගේම සාමාන්‍ය රටවල්, මධ්‍යම ආසියාවේ රටවල් ශ්‍රී ලංකාව සමඟ, ශ්‍රී ලංකා රජයත් එක්ක ඉඳිමින් මේ චෝදනා වැරදියි කියලා කියනවා. ඒ ගොල්ලෝ හුඟ දෙනෙක් කියන්නේ යුද්ධයක් ඇති වුණාට පස්සේ මේ තත්ත්වයන් ඇති වන බවයි. දෙපක්ෂයක් අතරයි යුද්ධයක් ඇති වන්නේ. මිනිසුන් අතරයි යුද්ධ ඇති වන්නේ. එහෙම ඇති වුණාට පස්සේ මිනිසුන්ට තුවාල ඇති වෙනවා. මිනිස්සු මැරෙනවා. නොයෙක් විධියේ ආපදාවලට පත් වෙනවා. නොයෙක් විධියේ හානිවලට පත් වෙනවා. ඒ තත්ත්වයට පත් වුණාට පස්සේ ඒවා නැති කර ගැනීමට, ඒ තුවාල සුව කර ගැනීමට අනෙක් අය උදවු උපකාර කරනවා මිස, ඒ තුවාල වැඩි කිරීමට සූදානම් වීම සුදුසු නැහැ කියන එක මුළු ලෝකයේම මතයක් බවට අද පත් වෙලා තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමා මේ රටේ උපන් යුග පුරුෂයෙකු හැටියට මේ ගත්තා වූ වෑයමෙන් අවුරුදු තිස්පහක් පමණ කාල සීමාවක් තුළ අපට තිබුණු මරණ භයෙන් අපව අද නිදහස් කර තිබෙනවා. ඒක පුද්ගලයකු වශයෙන් එතුමාට තිබෙන ප්‍රයෝජනයක් නොවෙයි. එක්කෝටි අනූහත්ලක්ෂයක් වූ මුළු ලංකාවාසී ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරලා, රටේ දූ දරුවන්ට මරණ භයෙන්, සැකයෙන් තොරව ජීවත් වන්නට මාර්ගය හරි ගැස්සුවා පමණක් නොවෙයි, අවුරුදු දෙදහස් පන්සියයක් ආරක්ෂා කර ගෙන ආපු මේ රට අනාගතයේදී ඒකීය ලංකාවක් හැටියට තබා ගැනීමත් ඒ යුග පුරුෂයාගේ බලාපොරොත්තුව වුණා. ඒක මේ ජාතිය ආරක්ෂා කර ගැනීමට බොහොම රුකුලක් වුණා. ඒ අවස්ථාවේදී අපි බොහොම සන්තෝෂ වුණා. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී මේ රටේ ජීවත් වන සෑම ජාතියක් වාගේම, බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, ඉස්ලාම් ආගම් අදහන සියලු දෙනාත් ඒ සඳහා සම්පූර්ණයෙන් සහයෝගය දීලා තිබෙනවා. බොහොම සුළු පිරිසක් විතරක් ඩොලර්වලට කථා කරනවාය කියලා ප්‍රසිද්ධියක් තිබෙනවා. මං දන්නේ නැහැ ඒක හැබෑද කියලා. ඩොලර් ගන්න කථා කරනවා කියලා ප්‍රසිද්ධියක් තිබෙනවා. මම දන්නේ නැහැ ඒක ඇත්තද කියලා. ඩොලර් ගන්න ඕනෑ නිසා ඒක හරි කියා ගෙන යනවාය කියන මතයකුත් කිහිප දෙනකු අතර තිබෙන බව පේනවා. ඩොලර්වලට වඩා, ඒකෙන් ලැබෙන වල ප්‍රයෝජනවලට වඩා, මාතෘ භූමිය ගැන කල්පනා කරලා ක්‍රියා කරන්න කියලා ඉතා ගෞරවයෙන් ඕනෑකමින් අපි ඉල්ලනවා. මාතෘ භූමිය ආරක්ෂා වුණේ නැත්නම් තමුන්නාන්සේලාට දේශපාලන පක්ෂ තියා ගන්න පුළුවන්කමක් නැහැ; ආණ්ඩු තියා ගන්න පුළුවන්කමක් නැහැ. දරුවන් එක්ක සන්තෝෂයෙන් ජීවත් වන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා පළමු වන කාරණාව හැටියට, අපේ මාතෘ භූමිය ආරක්ෂා කර ගෙන ජනතාවට භයෙන් සැකයෙන් තොරව ජීවත් වන්නට පුළුවන් භූමියක් සකස් කර ගැනීමයි කළ යුත්තේ කියන එක අපි විශේෂයෙන් කල්පනා කරන්නට ඕනෑ. ඒ ගැන මා විපක්ෂයෙන් විශේෂ ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ පොදු මහ ජනතාවගේ අදහස්වලටත්, ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද නොයෙක් විධියේ ප්‍රකාශන අතරේ ඉදිරිපත් වුණු හොඳ ප්‍රකාශනවලටත් අපේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ එක්කම මේ කාරණය ගැන වුවමනා නැති දේවල් ඉදිරිපත් කරලා මේ රට අපහාසයට පත් කරලා වැරදි තත්ත්වයක් ලෝකයට පෙන්වන්න එපා කියන ඉල්ලීමත් කරනවා. මේ මාතෘ භූමියේ උපන් මිනිසුන් හැටියට තමන්ගේ මවට සලකන්නා වාගේ, තමන්ගේ පියාට සලකන්නා වාගේ ජාතියට, රටට සලකන්න කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලනවා. තමන්ගේ මවු වැරදි විධියට ජීවත් වෙලා තිබෙනවා, වැරදි විධියේ ක්‍රියා කරලා තිබෙනවා කියලා කියන පුද්ගලයෝ තමයි තමන්ගේ රට ගැන, තමන්ගේ මාතෘ භූමිය ගැනත් ඒ විධියට කියන්නේ. ඒක ඒ ගොල්ලන්ගේ උත්පත්තියේ වරද කියන එක තමයි අපට කල්පනා කරන්න තිබෙන්නේ. ඒ නිසා යහපත් විධියට කල්පනා කරලා මේ රටත්, මේ ජාතියත් ආරක්ෂා කරලා, හොඳ අනාගතයක් ඇති දරු පරපුරක් ඇති කරලා ඉදිරියේදී ශ්‍රේෂ්ඨ ජාතියක් හැටියට ගොඩ නැඟීමට අපි කටයුතු කරමු.

ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා දැන් දසලක්ෂයක් පවුල් සංවර්ධනය කරන්න, ග්‍රාම නිලධාරි කොට්ඨාස සංවර්ධනය කරන්න වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්නේ කාලා බීලා හොඳට සැපවත්ව මේ රටේ ජනතාවට ඉන්න ඉඩ සලස්වන්නයි. දැන් අපට තිබුණු මරණ බය නැති කරලා තිබෙනවා. ඊට පස්සේ දැන් අපට වුවමනා කරන්නේ ආර්ථික දියුණුවක්. ඒ ආර්ථික දියුණුව සකස් කර ගැනීමට විපක්ෂයේ සහයෝගය පූර්ණ වශයෙන් දෙන්න කියලා අපි ඉල්ලනවා. අපි සාමයෙන්, සමාදානයෙන්, බයෙන් සැකෙන් තොරව අපේ ආර්ථිකය දියුණු කරලා ලෝකයේ දියුණු ජාතියක් බවට පත් වෙන්න උත්සාහ කරමු. තමුන්නාන්සේලාගේ මතවලට අපි විරුද්ධ වන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ දර්ශනයට අපි විරුද්ධ වන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ පක්ෂවලට අපි විරුද්ධ වන්නේ නැහැ. ඒවා එහෙම කර ගෙන යන්න. නමුත් මේ රට ආරක්ෂා කර ගැනීමේදීත්, ආර්ථිකය දියුණු කර ගැනීමේදීත් අපි එකට ක්‍රියා කරමු. අනික් දේශපාලන ප්‍රශ්නවලදී තමුන්නාන්සේලාට ආණ්ඩුව විවේචනය කරන්න පුළුවන්; කරුණු විවේචනය කරන්න පුළුවන්. ආණ්ඩුව හරි මහට ගන්න වුවමනා නම් ඒ වාගේ කථා කරන්න පුළුවන්. ඒකේ කිසි වරදක් නැහැ. ඒවා කරන්න. නමුත් ආර්ථිකය සහ රට ආරක්ෂා කර ගැනීමේදී අපි ඔක්කොම කිට් කිටියේ බැඳිලා ක්‍රියා කරමු. මේ වාගේ ශ්‍රේෂ්ඨ නායකයෙක් ඉන්න හින්දා අපිට එහෙම කටයුතු කර ගෙන ඉදිරියට යන්න පුළුවන් කියන එක ප්‍රකාශ කරමින්, ගරු කථානායකතුමනි ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ. භා. 2.21]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, අපේ ගරු අගමැතිතුමා අද ඉදිරිපත් කළා මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ II වැනි කොටසේ කටයුතු අද ඉඳලා ක්‍රියාත්මක වෙනවා කියලා. මා ළඟ තිබෙන එම 2 වැනි වගන්තියේ II වැනි කොටසේ ඒ කාරණා පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මෙහි සඳහන්ව තිබෙනවා, "Authorize and provide for the detention of persons" - ඕනෑ කෙනෙකුව රඳවා ගැනීමේ බලය. "The taking of possession or control, on behalf of the State, of any property or undertaking; the acquisition, on behalf of the State, of any property other than land; authorize the entering and search of any premises". මෙන්න මේවා ක්‍රියාත්මක කරන්න තමයි තමුන්නාන්සේලා බලය ලබා ගන්නේ මේ හදිසි නීති රෙගුලාසි යටතේ. ගරු කථානායකතුමනි, මා දැන් ඒ අනුව තමයි මේ කථා කරන්නේ.

ගරු අගමැතිතුමනි, ඔබතුමා ඔබතුමාගේ කථාව කර ගෙන ඇවිල්ලා ඔක්කෝම එකට එකතු කරලා අන්තිමට කිව්වේ, අපි එක රටක් විධියට ඉන්න ඕනෑ; එක රටක් විධියට වැඩ කරන්න ඕනෑ; අපේ රටට ඉදිරිපත් වෙලා තිබෙන මේ ප්‍රශ්නයේදී අපි එකා වන්ව රට වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ කියලායි. ඒ පිළිබඳව කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි එකට ඉන්නවා. වෙනත් රටවල් මේ

රටට බලපෑම් කරනවාට, අනිසි බලපෑම් කරනවාට එක්සත් ජාතික පක්ෂය හැටියට අප විරුද්ධයි කියන එක තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි. එයින් අදහස් කරනවා කාරණා කීපයක්. අප ජාත්‍යන්තර වශයෙන් බැඳුණු, එකඟ වුණු, පිළිගත්තු යම් යම් දේවල් තිබෙනවා. එක රටක් හැටියට ඉන්න නම්, එකට වැඩ කරන්න නම් රජය අප සියලු දෙනාටම එක ආකාරයට සලකන රජයක් වෙන්න ඕනෑ. මේක රජයේ, රටේ ප්‍රශ්නයක්. මේක ගරු අගමැතිතුමා අවුල් කර ගෙන තිබෙනවා. රට වෙනුවෙන් පෙනී සිටීම අපට ප්‍රශ්නයක් නොවෙයි. මේ අපේ රට, මේ අපේ ආණ්ඩුව කියන තත්ත්වයටත් ඒ පාලනය සකස් විය යුතුයි කියන එක අපි අවධාරණයෙන් මතක් කරන්න කැමැතියි. ඒ නිසා මේ කියන කාරණා උඩ අපට පෙනෙන්නේ නැහැ හදිසි නීතියේ සඳහන් මා මේ කිව්ව කරුණු, එනම් 2 වැනි වගන්තියේ II වැනි කොටසේ සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීම අදට අවශ්‍යයි කියලා. එම කොටසේ කරුණු කීපයක් මම කිව්වා. අනෙක් කරුණු ටික හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ මත ඉඳ ගෙන හදිසි නීතිය අවශ්‍ය නැහැ කියන පදනමට, මේ වගන්තිය අවශ්‍ය නැහැ කියන පදනමට ඇවිල්ලා තමයි මා මේ කථාව කරන්නේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීමේ අවශ්‍යතාවක් අද අපට පෙනෙනවා. ඒ තුළ ඉඳ ගෙන මේ කියපු කාරණා සියල්ලම කරන්නට රජයට පුළුවන්කම තිබෙනවා. මාධ්‍යවේදීන්ට බලපෑම් කිරීම, දේශපාලන වශයෙන් පළි ගැනීම, ඒ වාගේම වෘත්තීය සමිති පාලනය කිරීම් ආදි සියල්ලම කරන්න අද පනවන මේ රෙගුලාසි යටතේත් පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමනි, ගිය මාසයේ මැතිවරණ කල් දාලා තිබුණේ හදිසි නීතිය යටතේ. මේ Emergency එක යටතේ තමයි මැතිවරණ කල් දාලා තිබුණේ. ඒ පිළිබඳ වගන්තියක් මේ ගැසට් එකේ මට පෙනෙන්නේ නැහැ . එහෙම නම් මා අද ගරු අගමැතිතුමාගෙන් අහන්නේ,මැතිවරණ කල් දැමීම සම්බන්ධයෙන් වගන්තියක් මේ හදිසි නීති රෙගුලාසිවලට ඇතුළු වෙලා නැති නිසා මැතිවරණ පැවැත්වීමට තිබෙන පළාත් පාලන ආයතනවල - මැතිවරණ නොපැවැත්වූ පළාත් පාලන ආයතනවල- මැතිවරණ වහාම පවත්වනවාද, ඒ කවදා ඉඳලාද කියලායි. අපට මේක දැන ගන්න අවශ්‍යයි. මා හිතන්නේ අගමැතිතුමා ඒකට කන් දෙන්නේ නැහැ. වෙන කවුරු හරි අපට පිළිතුරු දේවි. මේ මැතිවරණ කල් දාන්න උපයෝගි කර ගත්තේ හදිසි නීතිය. අපි බොහොම පැහැදිලිව කිව්වා, මැතිවරණ කල් දාන්න හදිසි නීතිය පාවිච්චි කරන්න එපා කියලා. දැන් තමුන්නාන්සේලා ඒ බලය ඉවත් කර ගෙන තිබෙනවා. බලය ඉවත් කර ගත්තත් මම අහනවා, හදිසි නීතිය යටතේ මැතිවරණ කල් දැමීමට බලයක් රජයට දැන් නැති නිසා කවදාද මැතිවරණ තියන්නේ කියලා. ඒක අපට පැහැදිලිව කියන්න වෙනවා. මොකද මා එහෙම කියන්නේ? ඒ විශේෂ හේතුවක් නිසායි. මැතිවරණ පවත්වන නිලධාරින් ඒ මැතිවරණ පිළිබඳව තීන්දු තීරණ ගන්නේ එයට කාල වේලාවක්, දින නියමයක් දීලායි. මැතිවරණ පෙත්සම් විශාල ප්‍රමාණයක් දැන් උසාවියට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරපු - [බාධා කිරීමක්] ඒකයි මම මේ කියන්න යන්නේ. [බාධා කිරීම්] අනේ නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
උසාවියෙන් කල් දානවා.

---

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, ඒ පක්ෂයේ නාම යෝජනා පත්‍ර හරිද, වැරදිද කියලා ඒ නිලධාරියෙකුට පැයකින්, දවසකින් තීන්දුවක් දෙන්න පුළුවන්. මෙච්චර කල් එහෙමයි තිබුණේ. අද විශාල ප්‍රමාණයක් යම් කිසි හේතු නිසා -

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මගේ වෙලාව නේ යන්නේ. තමුන්නාන්සේ කථා කළා නේ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඉදිරිපත් කරන ලියකියවිලි සම්පූර්ණ නැත්නම් ඒක ප්‍රතික්ෂේප කරනවා. ඒ ප්‍රතික්ෂේප කළාට විරුද්ධවයි උසාවියට ගිහිල්ලා තිබෙන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මට ඒක තේරෙනවා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
නීතියේ හැටියට ඒක නිලධාරින්ට කරන්න බැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මට ඒක තේරෙනවා. තමුන්නාන්සේට ඒක තේරෙන්නේ නැති වුණාට මට ඒක තේරෙනවා. එතකොට මෙවැනි නඩුවක තීන්දුවක් දෙන්න -විසඳන්නට- කොච්චර කාලයක් ගත වෙයිද? අවුරුදු දෙකක්, තුනක්, හතරක්, පහක් යන කල් ඒ උසාවිවලට ඒක කරන්න පුළුවන්කම තිබෙනවාද? ඒක නීතියට අනුකූලද? යුක්ති සහගතද, සාධාරණද? නඩුකාරයෙක් නැති නිසා නඩු කල් දානවා. කාගේ අයිතියද මේ කල් දාන්නේ?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
එහෙම නම් ඔබතුමන්ලා ඉදිරිපත් කරන යෝජනාව තුනෙන් දෙකකින් සම්මත කරමු.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කරුණාකරලා තමුන්නාන්සේ පොඩ්ඩක් -

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
තුනෙන් දෙකකින් සම්මත කරමු. නැත්නම් අපට පුළුවන්කමක් නැහැ නේ තීරණ දෙන්න කියා උසාවියට කියන්න. එහෙම නම් තුනෙන් දෙකකින් උසාවියට බලපෑම් කරන්න පුළුවන්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කරුණාකරලා තමුන්නාන්සේ පස්සේ උත්තර දෙන්න කෝ. මගේ කථාවට ඇහුම් කන් දීලා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
එය තුළින් වැරදි මතයක් රටට යනවා. ඒකයි වෙන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ දැන් කිව්වෙත් වැරදි දෙයක්. මම ඒකට argue කරන්න ගියේ නැහැ. කරුණාකරලා මගේ කථාවට ඉඩ දෙන්න.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඔබතුමාත් දැන් ඔය පක්ෂයේ ඉන්නේ ලොක්කෙක් වාගේ නේ. එතකොට ඔය මතය වැරදි විධියට ගියාම රටේ අය හිතා ගන්නේ අපේ රජයේ වරදක්ය කියලායි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මිනිස්සු ඒක දන්නවා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
එහෙම එකක් නොවෙයි. මේක නීතිය.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මිනිස්සු ඒක දන්නවා. අධිකරණයට අත ගැසීම් කරනවා කියලා. ඒක රහසක් නොවෙයි. ජනතාවගේ ඡන්ද බලයට මේ විධියට කෙනහිලිකම් කරන්න -

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
අනෙක් එක ඔය නීතිය ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගත්තු එකක්. අපි නොවෙයි ඒක ගෙනාවේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
එහෙම නම් හොඳයි. ඒ ඔක්කෝම ක්‍රියාත්මක කරන්න ජේ.ආර්. ජයවර්ධන තමයි ආපසු ඇවිල්ලා තිබෙන්නේ. ඒ ක්‍රමය තමයි මේ ගෙන යන්නේ. ඒක තමුන්නාන්සේලා පිළිගන්නවා නම් ඒක තමුන්නාන්සේලාගේ කැමැත්ත.

ඒ වාගේම අපි දන්නවා, මේ රට පිළිගන්නා උත්තරීතර නීතිය අද ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මම තමුන්නාන්සේට කියන්නම්. නැත්නම් ඒක මහ කරදරයක් වෙනවා. තමුන්නාන්සේට කියන්නම්. මැතිවරණ පැවැත්වීම පිළිබඳව දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ඇවිල්ලා ඒකටත් පරිබාහිරව ගිහිල්ලා මැතිවරණ කොමසාරිස්වරයෙක් පත් කරනවා. එහෙම පත් කිරීමේ බලයක් කොහේවත් නැහැ. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙත් එහෙම නැහැ. මැතිවරණ කොමිසමක් පත් කරන්න පුළුවන්. මැතිවරණ කොමසාරිස් කෙනෙක් පත් කරන්න බැහැ. අද වෙලා තිබෙන්නේ මොකක්ද? කොමිසමක් නැහැ. කොමසාරිස්වරයෙක් පත් කරනවා. ඒ විතරක් නොවෙයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වන්නේ නැහැ. මුළු කාර්යාලයම ක්‍රියාත්මක වන්නේ නැහැ. මොකුත් වැඩක් නැහැ. එහි ඉන්න නිලධාරින් නිකම් ඉන්නවා. මේ, අද තිබෙන තත්ත්වය. මේක තමයි අද තමුන්නාන්සේලා ගෙන යන්නේ. මේ රටේ උත්තරීතර නීතිය කඩා වැටිලාය කියලා අපි පැහැදිලිව තමුන්නාන්සේලාට කියන්නේ ඒ නිසයි. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඊ ළඟට ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් අපි දැක්කා, ඊ-නිව්ස් ආයතනය වහලා දමා තිබෙන බව. මේක මාධ්‍ය නිදහසට ඇති වෙච්ච බලවත් -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
උසාවි නියෝගයක්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඔව්. මම අහන්නෙත් ඒක තමයි. කලබල වෙන්නේ නැතුව පොඩ්ඩක් ඉන්න කෝ. ගරු කථානායකතුමනි, එහෙම නම් හෙට මහේස්ත්‍රාත් උසාවියකට ගිහිල්ලා නියෝගයක් අරගෙන මේ රටේ තිබෙන ප්‍රවෘත්ති පත්‍ර ආයතන ඔක්කෝම වහන්න පුළුවන් නේ. අධිකරණයට එහෙම කරන්න පුළුවන්ද, බැරිද කියන එක තමයි අපි අධිකරණ ඇමතිතුමාගෙන් අහන්නේ. අධිකරණ ඇමතිතුමා මෙතැන ඉන්නවා නම් අපට උත්තර දෙන්න වටිනවා. පොඩි කරුණක් අල්ලා ගෙන, මේ රටේ තිබෙන ඕනෑම මාධ්‍ය ආයතනයක් වහන්න කියලා මහේස්ත්‍රාත් උසාවියකට පුළුවන් හෙට තීන්දුවක් දෙන්න.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
තුනෙන් දෙකක බලයෙන් පුළුවන්. අපි කවදාවත් එහෙම කරන්නේ නැහැ .

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක කරලා තිබෙන්නේ තුනෙන් දෙකක බලයෙන් නොවෙයි. එහෙම නම් හරි. Order එක දීලා තිබෙන්නේ මේ ගොල්ලෝ. තුනෙන් දෙකක බලයක් තිබෙන නිසා order එක දීලා තිබෙන්නේ මේ ගොල්ලෝයි කියන එක බොහොම පැහැදිලියි.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ව්‍යවස්ථාවත් වෙනස් කරන්න පුළුවන්. තමුන්නාන්සේ ඒක දන්නේ නැද්ද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු අගමැතිතුමා කියනවා නම් තුනෙන් දෙකක බලයක් තිබෙන නිසා ඒක කළාය කියලා, ඒකේ ප්‍රශ්නයක් නැහැ. මා කියන්නේ එය ඉදිරියට එන අනතුරු ඇඟවීමක් කියලායි. මීට පස්සේ මේ රටේ තිබෙන මාධ්‍ය ආයතන ඔක්කොම වහන්න කියලා උසාවිවලින් නියෝග ගන්න පුළුවන්. ඇයි? තුනෙන් දෙකක බලයක් තිබෙනවා නේ. ඒක නේ එතුමා කියන්නේ.

අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව අද මේ රටේ ජනතාවට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මෙය තවත් තහවුරු වුණේ ශ්‍රේෂ්ඨාධිකරණයේදී අග විනිසුරු ප්‍රකාශ කර තිබුණු කාරණා කිහිපයක් මතයි. නඩු පවරා නඩු නිමිත්තක් තිබෙනවා. නඩුව විභාග කර ගෙන යනවා. අවුරුදු ගණනක් ගත වුණා. එහෙම අවුරුදු ගණනක් ගිහින් දේශපාලන හේතු උඩ හදිසියේ එක වරටම නීතිපතිතුමා උසාවියට කියනවා, "අපි මේ නඩුව වැඩිදුර ගෙන යන්නේ නැහැ, අයින් කර ගන්නවා"යි කියලා. ශ්‍රේෂ්ඨාධිකරණයේදී අග විනිසුරු ප්‍රකාශ කරලා තිබුණා, මේක සම්පූර්ණයෙන්ම නීතිය අයුතු ලෙස පාවිච්චි කිරීමක් කියලා. මෙවැනි තත්ත්වයක් තුළ අද නීතිපති දෙපාර්තමේන්තුව ජනාධිපතිතුමා යටතට පවරා ගෙනයි තිබෙන්නේ. ජනාධිපතිතුමා කියන දෙයක් නීතිපති කරන්න ඕනෑ. ඒ අනුව නීතිපති ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් දැනට පවත්වා ගෙන යන නඩු ඉල්ලා අස් කර ගන්නවා. මා මේ සම්බන්ධතාව තමයි ඔබතුමාට කිව්වේ. එතැනින් එහාට ගිය තත්ත්වයක් අද "ලංකාදීප" පත්‍රයේ වාර්තාවක් පළ වෙලා තිබෙනවා අපි දැක්කා. ඒ පුවත් පත් වාර්තාවේ මෙහෙම සඳහන් වනවා:

"19 වැනි සංශෝධනය ළඟදීම පාර්ලිමේන්තුවට

අග විනිසුරු ධුර කාලය අවුරුදු 5යි

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනය ළඟදීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට රජය තීරණය කර තිබේ.

අග විනිසුරු ධුරයේ ධුර කාලය වසර 5කට සීමාකිරීමේ සහ අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයා පත්කිරීමේ බලතල ජනාධිපතිවරයා වෙත පැවරීමේ විධිවිධාන මෙම සංශෝධනයට ඇතුළත් වනු ඇතැයි රජයේ ආරංචි මාර්ග සඳහන් කරයි.

වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වැනි වගන්තියට අනුව අග්‍ර විනිශ්චයකාරවරයා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විශ්‍රාම යා යුතු වයස අවුරුදු 65කි. යෝජිත සංශෝධනය අනුව අග විනිසුරුවරයාගේ ධුර කාලය වසර 5ක් හෝ වයස අවුරුදු 65 යන දෙකෙන් කලින් එළඹෙන අවස්ථාවට සීමාවනු ඇතැයි වාර්තා වේ.

අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයා පත්කිරීමේ බලය දැනට අධිකරණ සේවා කොමිසමට හිමි වී ඇති අතර යෝජිත සංශෝධනය මඟින් එම බලය ජනාධිපතිවරයා වෙත පැවරීමට නියමිතය."

මා මේ කියන්නේ පත්‍රයේ තිබුණු වාර්තාවක්. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන කොට එහි ඇතුළත් වන ප්‍රධාන කාරණා මේවායි. දැන් මොකක්ද කියන්නේ? ප්‍රජාතන්ත්‍රවාදී නිදහස, මාධ්‍ය නිදහස, වෘත්තීය සමිතිවල නිදහස, කොටින්ම කියනවා නම් කෙනකුට අදහසක් ප්‍රකාශ කිරීමේ නිදහසවත් මේ රටේ නැහැ. දඬුවම් කිරීමේ, දඬුවම් කරන්න නියෝග කිරීමේ, නඩු පැවරීමේ සියලුම බලය ජනාධිපතිවරයාට පැවරෙනවා.

දැන් කොමිෂන් සභාව පත් කරන්නේ මෙහෙමයි. "දැන් කොමිෂන් සභාව අවශ්‍ය නැහැ. එම නිසා මම කොමසාරිස් පත් කරනවා" කියන ඒ බලය ජනාධිපතිතුමාට තිබෙනවා. "රාජ්‍ය සේවා කොමිෂන් සභාව අවශ්‍ය නැහැ. එහෙනම් පත් කරන්නේ නැහැ" කියන බලය එතැනට ගිහින් තිබෙනවා. "පවරා තිබෙන නඩු දැන් අවශ්‍ය නැහැ"යි කියලා නීතිපතිතුමාට කියනවා. මේවා පවත්වා ගෙන ගිය නඩු. ඒ බලය ජනාධිපතිතුමාට ගිහින් තිබෙනවා.

ඊ ළඟට විනිශ්චයකාරවරුන් පත් කිරීමේ, විනිශ්චයකාරවරුන්ගේ කාලය කෙටි කිරීමේ බලය ජනාධිපතිතුමා අතට ගිහින් තිබෙනවා. මෙයින් මොකක්ද කියන්නේ? මේ රටේ ඒකාධිපති වීමේ මහා භයානක ලක්ෂණ අද මේ රටේ ව්‍යවස්ථා තුළින්ම ඉස්මතු වී ගෙන යනවා. එම නිසා තමයි අපට ප්‍රශ්නයක් තිබෙන්නේ. එල්ටීටීඊ සංවිධානය මහා භයානක සංවිධානයක් විධියට ත්‍රස්තවාදය පතුරවමින් ගියා. එය විනාශ කිරීම පිළිබඳව අපේ කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒක උලුප්පලා පෙන්වමින් අද මේ රටේ සියලුම ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතිවාසිකම්, දේශපාලන අයිතිවාසිකම්, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම්, අධිකරණයේ ස්වාධීනත්වය -මේ ඔක්කෝම- අහකට වීසි කරන කොට, එය මේ රාමුව තුළ තිබෙන බලය, ශ්‍රේෂ්ඨාධිකරණයේ පවා තිබෙන බලය අහෝසි වන කොට මා තමුන්නාන්සේලාගෙන් අහනවා, ලෝකයා අපි දිහා බලන්නේ කොහොමද කියලා. ලෝකයාට අපි දිහා බලලා වචනයක් කියන්නට ඉඩ දෙන්නේ කවුද? එහෙම ඉඩ දීලා තිබෙන්නේ කවුද? ඒක අද අපේ රටේ තිබෙන බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙනවා. අපි එකට ඉන්න ඕනෑ. මේක අපේ රට. ප්‍රජාතන්ත්‍රවාදය අනුව මට මතයක් ප්‍රකාශ කරන්න පුළුවන් නම් තමයි මේ අපේ රටයි කියා කියන්න පුළුවන් වෙන්නේ. අධිකරණයේ නිදහස තිබෙනවා නම් ඒක මගේ රට. සාධාරණ මැතිවරණ ක්‍රමයක් පවතිනවා නම් ඒක මගේ රට. සාධාරණ රාජ්‍ය සේවයක් තිබෙනවා නම් එය රාජ්‍ය සේවකයන්ගේ රට. ගරු කථානායකතුමනි, එහෙම නොවෙනවා නම් මොකක්ද අපට කියන්න තිබෙන්නේ? සිංහල මිනිස්සු, මාධ්‍යවේදීන්, දේශපාලනඥයන් ඇතුළු ලංකාවේ මිනිස්සු මේ රටේ ඉන්න බැහැයි කියලා රට හැර යන යුගයට අද ඇවිල්ලා තිබෙනවා. ලෝකයා අපිට ඇඟිල්ල දිගු කරන්නේ ඒ නිසායි. බැන් කි මූන්ගේ වාර්තාවක් තිබෙනවා. "තමුන්නාන්සේලා දැන් විරුද්ධ වෙනවා නේ, ඒ Report එකේ මොනවාද තිබෙන්නේ" කියලා දවසක් අපි කෑමට ගිය වෙලාවේ එක්තරා ඇමතිවරයෙකුගෙන් මම ඇහුවා. එතැන තවත් මන්ත්‍රීවරු දෙදෙනෙක් සිටියා. "අනේ මම නම් දැකලා නැහැ" කිව්වා. එහෙම කියන්නේ ඇමතිවරු. දැකලා නැහැ, කියවලා නැහැ. මම හිතන්නේ දැන් ඒක එතුමා අතේ ඇති. ඒ නිසා කරුණාකරලා එය කියවා බලන්න. බැන් කි මූන් කියන නිසා නොවෙයි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට බලපාන යම් යම් කාරණා එතැන තිබෙනවාද කියලා කියවා බලන්න. එහෙම තිබෙනවා නම් අපි එයින් නිදහස් වීම වැදගත්. මා කල්පනා කරනවා, මෙන්න මෙය. මොනවා වුණත් අද අගමැතිතුමා ඉදිරිපත් කරපු හදිසි නීති රෙගුලාසිවල එක කොටසක් ඉවත් කිරීම මා විශ්වාස කරන විධියට මේ වාර්තාවල ඇතුළත් වුණ කරුණුවල එක කොටසක් කියලා. ඒ නිසා අද අපට මේ සභාවේදී ඉතා පැහැදිලිව කියන්න තිබෙන්නේ මෙයයි. අලුතෙන් එන දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක, නීතිපතිවරයාට අද පවතින නඩු හේතුවක් නොමැතිව අස් කර ගන්නට බල කරන වෙලාවක, නීතිපතිතුමා, එම දෙපාර්තමේන්තුව ජනාධිපතිතුමාගේ ග්‍රහණයට, යටතට අද පත් වෙලා තිබෙන වෙලාවක, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව අධිකරණය විසින්ම ප්‍රශ්න මතු කරන වෙලාවක, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව මැතිවරණ පවත්වන්නට මැතිවරණ කොමිසමක් තිබෙන්නට ඕනෑ අවස්ථාවක, ඒක නැතුව මැතිවරණ කොමසාරිස්වරයෙකු පමණක් පත් කරලා මැතිවරණ පවත්වන්නට යන ඒ වැඩ පිළිවෙළ තුළ මම ප්‍රශ්නයක් ඇහුවේ ලංකා-ඊ-නිවුස් ආයතනය තාවකාලිකව වහන්න කියලා කඩුවෙල උසාවියෙන් දීපු නියෝගය බැලුවාම ඒක උසාවියට කරන්න පුළුවන් නීතිමය බලයක් තිබෙනවාද කියායි. එහෙම බලයක් තිබෙනවා නම් මේ රටේ අනෙක් මාධ්‍යවලටත් අනාගතයේදී ඒක සිද්ධ වෙන්න ඉඩ තිබෙනවා. අගමැතිතුමා කියපු පිළිවෙළට තුනෙන් දෙකක් තිබෙනවා නම්, අපට තුනෙන් දෙකක බලයක් තිබෙනවාය කියලා උසාවියට නියෝගයක් දෙනවා නම්, එහෙම නම් එතුමාගේ වචනවලින්ම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට මොකක්ද වෙන්නේ කියලා මා අහනවා. මේ ප්‍රශ්න ටික අද අපි රජයට ඉදිරිපත් කරනවා. එකට ඉන්න, එකට වැඩ කරන්න ලැහැස්තියි. කිසිම ප්‍රශ්නයක් නැහැ. මොකද, මේ රටේ සියලු දෙනාටම එකට ජීවත් වෙන්න පුළුවන් සාධාරණ සමාජයක්, සියලු දෙනාටම ප්‍රජාතන්ත්‍රවාදීව තමුන්ගේ මත ප්‍රකාශ කරන්න පුළුවන් රාජ්‍යයක් මෙරට නිර්මාණය වෙන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, වැදගත් කාරණයක් මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. අද වන තුරු ගම්පහ දිස්ත්‍රික්කයේ විමධ්‍යගත ප්‍රතිපාදන සඳහා යෝජනා ඉල්ලා අපට ලියුමක් එවලා නැහැ. තවත් සමහර දිස්ත්‍රික්කවල මේ තත්ත්වය තිබෙනවා.

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

මේකයි මේ රට දුවන ක්‍රමය. එහෙම නම් මොකක්ද අපේ තිබෙන අයිතිය? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අය වැයෙන් වෙන් කරන විමධ්‍යගත ප්‍රතිපාදන මුදල රුපියල් ලක්ෂ පණහයි. ඒකෙන් හම්බ වෙන්නෙත් රුපියල් ලක්ෂ 48යි. ඒකත් අපට ලැබෙන්නේ නැත්නම් අපි කොහොමද කියන්නේ, "මේ අපේ මන්ත්‍රීවරුන්" කියලා; "මේ අපේ රට" කියලා. කවුද මේක කරලා තිබෙන්නේ? ගරු කථානායකතුමනි, මා තමුන්නාන්සේට මේ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. ඒක අපට තිබෙන වරප්‍රසාදයක්. මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාදයක්. එවැනි වරප්‍රසාදයකුත් අයින් කරලා තිබෙනවා.

අපට තමුන්නාන්සේට කියන්න කාරණා රාශියක් තිබෙනවා. තවත් කාරණයක් මා තමුන්නාන්සේගේ අවධානයට යොමු කරනවා. ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාවට මේ පාර්ලිමේන්තුවට එන්න බැහැ. එන්න පුළුවන් වෙන්නේ මතයක් අරගෙන ගරු මන්ත්‍රීවරුන්ට පමණයි. ඒ මන්ත්‍රීවරුන් පවා අද මෙතැනට ඇවිල්ලා කියන කථා දිහා බලපුවාම මේ රටේ මහ ජනතාවගේ අදහස් මොනවාද කියලා පැහැදිලියි. එවැනි ප්‍රකාශයක් හැන්සාඩ් වාර්තාවේ නොවෙයි, ප්‍රවෘත්ති පත්‍රයක පළ වී තිබෙනවා මා දැක්කා. එනම් අර හෙජින් ගිවිසුම පිළිබඳව අද දෝෂාරෝපණය කරලා තිබෙන්නේ බැංකුවලටයි. බැංකු එක්ක මේ ගනුදෙනු කරන කොට රජය මොකක්ද කළේ? අතිවිශාල මුදල් සම්භාරයක් වැරදි ක්‍රමයට, මේ රටට පාඩුවක් වන පිළිවෙළට ගිවිසුම්ගත වන කොට ගරු ඇමතිවරයෙක් විසින් අද ඒ වරද බැංකු පිට දානවා නම් මා හිතන්නේ ඒකේ සාධාරණත්වයක් නැහැ කියායි. මොකද, ඒ අයට මෙහේට ඇවිල්ලා කථා කරන්න බැහැ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)
ගරු කථානායකතුමනි, මා හිතන විධියට මෙතුමා සඳහන් කළේ ඊයේ මේ ගරු සභාවේදී හෙජින් ගනුදෙනුව සම්බන්ධයෙන් එක් එක් මන්ත්‍රීවරුන් කථා කළ අවස්ථාවේ මගේ පිළිතුරු කථාවේ සඳහන් වුණු දෙයක් පිළිබඳව වෙන්න ඕනෑ. හැබැයි ඒ අවස්ථාවේ මෙතුමා මේ ගරු සභාවේ හිටියේ නැහැ. එතුමා මගේ නම සඳහන් නොකර වුණත් මම කරපු ප්‍රකාශයට reference දෙන්න කලින් කරුණාකර හැන්සාඩ් වාර්තාව බැලුවා නම් හෝ ඊයේ විපක්ෂයේ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන හිටියා නම් ඔය කථාව මට කියන්නේ නැහැ. මොකද, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා කථා කළායින් පස්සේයි මම කථා කළේ. එතුමාගේ කථාවේ එතුමා ඉතා පැහැදිලිව කිව්වා: “This is one-winner agreement” කියලා. So, what do you mean by “one-winner agreement”?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, මම කාගේවත් නමක් සඳහන් සඳහන් කළේ නැහැ. මේක එතුමාට එතුමාගේ කථාවේදී කියන්න පුළුවන්.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මට අයිතියක් තිබෙනවා -

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම කියනවා නම් "තමුන්නාන්සේ නොවෙයි, කිව්වේ" කියලා, ඇයි තමුන්නාන්සේ කථා කරන්නේ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම නොවෙයි කියලා කියනවා නම් -

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හරි, ඉතින් වාඩි වෙන්නකෝ. එච්චරයි. වෙන කතන්දරයක් නැහැ නේ. නිකම් තොප්පිය දා ගන්න එපා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, නැහැ. තොප්පිය දා ගත්තේ නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හරි, හරි. එහෙනම් තොප්පිය ගලවා ගන්න. ප්‍රශ්නයක් නැහැ. මගේ කථාවට බාධා කරන්න එපා. ඒ විතරක් නොවෙයි. අද - [බාධා කිරීමක්] ඉංග්‍රීසිත් තිබෙනවා, සිංහලත් තිබෙනවා. ගරු කථානායකතුමනි, මම මේ කිව්වේ මෙවැනි මතයක් අද මේ ගරු ඇමතිවරුන්ගෙන්, මේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් පිට වන විට අද මේ රටේ ඇති වන තත්ත්වය කුමක්ද කියලායි.

මේ රටේ පෞද්ගලික අංශයේ, සංස්ථා අංශයේ වැඩ කරන ජනතාවට විශ්‍රාම වැටුපක් දෙන්න යනවා කියලා ඉතා ඉක්මනින්, හදිසියෙන්, බලහත්කාරයෙන් මේක මේ රටේ ජනතාව පිට පටවන්න යන කොට වෘත්තීය සමිති සියල්ලම -බැංකු සේවකයෝ, පෞද්ගලික අංශයේ සේවකයෝ- වාගේ "අපි විශ්‍රාම වැටුපකට අකමැත්තක් නැහැ, කැමැතියි. නමුත් මේ කරන යෝජනාව තුළ විශ්‍රාම වැටුප හැදුවොත් අපට විශාල අගතියක් වෙනවා. ඒ නිසා මේක අධ්‍යයනය කරන්න අපට ඉඩ දෙන්න" කියලා කිව්වාම ඒ අයිතිය ඒ අයට ලබා දීම අපේ යුතුකමක් වෙනවා. ඒක අපි මේ පනත් කෙටුම්පත ගෙනාපුවාම දීර්ඝ වශයෙන් කථා කරන්නම්. එහෙම නැතිව තුනෙන් දෙකක බලයක් තිබෙනවා කියලා අර එළියේ ඉන්න වැඩ කරන ජනතාව පිට අපි බලහත්කාරයෙන් යමක් පටවන්න යනවා නම් ඒක ප්‍රජාතන්ත්‍රවාදයයි කියලා කාටවත් පිළිගන්න බැහැ. එහෙනම් ඒ රාජ්‍යය අපේද කියලා ප්‍රශ්නයක් එනවා. අපි එළියේ කියනවා අපට විශාල අගතියක් වෙනවා; අපට විශාල ප්‍රශ්නයක් වෙනවා; ඒක නිසා අපට කථා කරන්න දෙන්න; මේක සංශෝධනය කරන්න; අපේ අදහස් දෙන්නම් කියලා. ඒවාට ඇහුම් කන් දීමක් කරන්නට ලෑස්ති නැත්නම් කොහේද ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙන්නේ? තුනෙන් දෙකක බලයක් තිබෙනවා කියලා ඕනෑ දෙයක් මේ පාර්ලිමේන්තුවට ගෙනවිත් නීතියක් හැටියට සම්මත කරන්න පුළුවන් කියන ඒ අදහස මම හිතන්නේ ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළ තර්ජනයක් වනවා.

ගරු කථානායකතුමනි, මේ කාරණා ටික විතරයි මම විශේෂයෙන් මතක් කරන්නේ. මා අද විශේෂයෙන්ම පැහැදිලි කරලා කියනවා මෙම ආඥාපනතේ දෙවැනි වගන්තියේ, II කොටසේ අතිභයානක තත්ත්වයක් තිබෙන බව. තවමත් ඕනෑම පුද්ගලයෙක් අත් අඩංගුවට ගන්න, රඳවා ගන්න පුළුවන්කම තිබෙනවා. ඕනෑම ගෙදරකට ගිහිල්ලා කෙනෙකුව පරීක්ෂා කිරීමේ බලයක් මේ රෙගුලාසිවලින් ලැබෙනවා. මේ තිබෙන තත්ත්වය උතුරේ දෙමළ ජනතාවට පමණක් නොව රටේ අනෙකුත් පළාත්වල ඉන්න වෙනත් දේශපාලන පක්ෂවල අයට, රජය විවේචනය කරන අයට ඉදිරියේදී ඇති වෙන්න පුළුවන් කියන කාරණය නිසා එක්සත් ජාතික පක්ෂය හැටියට මේ හදිසි නීතියට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන බව මතක් කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

[பி.ப. 2.48]

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**

(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ சபாநாயகர் அவர்களே, மீண்டும் ஒரு அவசரகாலச் சட்ட நீடிப்புத் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றும் இந்தச் சந்தர்ப்பமானது, முடிவே இல்லாமல் தொடர்கின்ற ஒரு வழக்கு விசாரணையில் விவாதிப்பதைப் போன்ற ஒரு மனநிலையைத் தருகின்றது. நாம் ஒருபோதுமே அவசரகாலச் சட்டத்தை விரும்பியதில்லை. ஆனால், இதுவரை நாட்டில் நிலவியிருந்த சூழல், அவசரகாலச் சட்ட நீடிப்பை ஏதோவொரு வகையில் அனுமதித்திருக்கின்றது. அவசரகாலச் சட்ட நீடிப்புத் தொடர்பான எமது தெளிவான நிலைப்பாட்டை நாம் பல தடவைகள் இந்த மன்றிலே தெளிவுபடுத்தியிருக்கின்றோம். முழுமையான அமைதியும் நிறைவான ஜனநாயக மலர்ச்சியும் ஏற்படும்போது, அதாவது இந்த இரண்டு முக்கிய விடயங்களும் வளர்ச்சியடையும்போது அவசரகாலச் சட்ட நீடிப்பு அவசியமற்ற தாகி, இல்லாமலே போய்விடும் என்பதைத் தெளிவாக விளக்கியுள்ளோம்.எனவே, முழுமையான அமைதிக்கும் நிறைவான ஜனநாயகத்துக்குமாக நாம் அனைவரும் கட்சி பேதங்களுக்கு அப்பால் சிந்திக்க வேண்டும் என்பதையும் வலியுறுத்திக் கேட்டிருக்கின்றோம். அமைதிக்கு எதிராகச் சிந்தித்துக்கொண்டு அவசரகாலச் சட்டத்தை நீக்குவதைப் பற்றிப் பேசுவதில் பயனில்லை. இதனை நான் இந்த மன்றிலே மீண்டும் அழுத்தமாகக் குறிப்பிட விரும்புகின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, அவசரகாலச் சட்டத்தை நீக்குவது தொடர்பாக, எமது கட்சியாகிய ஈழ மக்கள் ஜனநாயக் கட்சி - ஈ.பீ.டி.பீ. - தன்னுடைய நிலைப்பாட்டைக் கடந்த வாரம் அரசாங்கத் தரப்புப் பிரதிநிதிகளுடன் நடத்திய பேச்சுக்களின் போதும் தெளிவாக விளக்கியிருக்கின்றது. யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்ட காரணத்தினால் அவசரகாலச் சட்டத்தை விரைவில் நீக்குவதற்கான கால வரையறை ஒன்றை வகுத்துச் செயற்படுவது அவசியம் என்பதே எமது கோரிக்கையாகும். இதுவே நடைமுறைச் சாத்தியமானது. நாம் அரசில் முக்கியமான அங்கத்தை வகித்துக் கொண்டிருக்கின்றபோதிலும் தமிழ் பேசும் மக்களின் நியாயமான உரிமைகள் தொடர்பாக எமது நிலைப்பாட்டைத் தெளிவுபடுத்தி வருகின்றோம். அத்துடன் அந்த நிலைப்பாட்டில் நாம் உறுதிப்பாட்டுடனும் இருக்கின்றோம். அவசரகாலச் சட்டத்தை நீக்குவதுடன், நீண்ட காலமாக அரசியல் காரணங்களுக்காகச் சிறைகளிலும் மற்றும் புனர்வாழ்வு முகாம்களிலும் இருக்கும் அனைவரையும் விடுதலை செய்ய வேண்டும் என்றும் கேட்டிருக்கின்றோம். இதேவேளை புனர்வாழ்வு முகாம்களில் உள்ள விடுதலைப் புலிகளின் முன்னாள் உறுப்பினர்கள் அனைவரும் இந்த ஆண்டு இறுதிக்குள் விடுவிக்கப்படுவர் என்று புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சு அறிவித்திருப்பதாகச் செய்திகள் வெளியாகியுள்ளன. இதை நாம் வரவேற்கின்றோம். முடிந்தால் அவர்களின் விடுதலையை இன்னும் விரைவுபடுத்துவது நல்லது என்று நாங்கள் கருதுகின்றோம்.

இதேவேளை, இதுவரையில் 6,528 பேர் விடுவிக்கப்பட்டிருக்கின்றார்கள். இன்னும் 4,092 பேர் மட்டுமே விடுதலை செய்யப்படவுள்ளனர் என்பதையும் நாம் கவனத்திற் கொள்ள வேண்டும். இவர்களில் மேலும் 500 பேர் அடுத்து வருகின்ற *வெசாக்* பண்டிகைக் காலத்தில் விடுவிக்கப்பட வுள்ளதாகவும் நாங்கள் அறிகின்றோம். இதைவிட, தடுத்து வைக்கப்பட்டிருக்கும் அரசியல் கைதிகளின் விபரங்களை அவர்களுடைய பெற்றோருக்கும் உறவினர்களுக்கும் தெரியப் படுத்த வேண்டும். அத்துடன் அவ்வாறானவர்களை விடுவிப்பதற்கான நடவடிக்கைகளும் முன்னெடுக்கப்பட வேண்டும். அரசாங்கம் இதற்குரிய நடவடிக்கைகளை மேற்கொண்டு வந்தாலும் அதை விரைவுபடுத்த வேண்டுமென இவ்வுயரிய சபையிலே நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இவ்வாறான விடுதலைகளும் வடக்கு, கிழக்கில் உருவாகி வருகின்ற இயல்புநிலையும் தமிழ் மக்களின் மனதில் நம்பிக்கையை ஏற்படுத்தி வருகின்றன. இந்த நம்பிக்கையை மேலும் வளர்த்தெடுப்பதற்கு அங்கே நிலவுகின்ற குறைபாடுகளை நீக்குவதற்கும் மற்றும் பிரச்சினைகளைத் தீர்ப்பதற்கும் விசேட திட்டமொன்ற உருவாக்கிச் செயற்பட வேண்டும். நீண்ட காலமாகப் போர் நடைபெற்ற பிரதேசம் என்பதாலும் இதன் காரணமாகச் சிவில் நிர்வாக நடைமுறைகள் பலவீனமாகி இருந்த பகுதிகள் என்பதாலும் இந்தச் சிறப்பு நடவடிக்கை அங்கே அவசியமாக உள்ளது. முக்கியமாக சிவில் நடைமுறைகள் தொடர்பாக மக்களுக்கு ஏற்படவேண்டிய அறிவும் ஒழுங்கும் வளர்த்தெடுக்கப் பட வேண்டியுள்ளது. அத்துடன் காணி விவகாரம் மற்றும் சாரதி அனுமதிப்பத்திரம் பெறுதல், வளங்களைப் பேணுதல், சட்ட நடைமுறைகளைப் பின்பற்றுதல் தொடர்பான நடைமுறைகளை உருவாக்க வேண்டியிருக்கின்றது.

இதைவிட, அங்கே போரினால் ஏற்பட்ட பாதிப்புக்களை நிவர்த்திக்க வேண்டிய அவசியமும் உள்ளது. ஆயிரக்கணக் கானவர்கள் போரின் காரணமாக உடல் உறுப்புக்களை இழந்திருக்கின்றனர். இவர்களில் சிறு குழந்தைகள் முதல் பெண்கள், மாணவர்கள், உழைப்பாளிகள், முதியோர்கள் என பல வகையினரும் அடங்குகின்றனர். ஆகவே, இவர்களைப் பராமரிப் பதற்கும் இவர்களுக்கான நிரந்தர உதவிக்குமாக ஒரு திட்டம் உருவாக்கப்பட வேண்டும். போர் நடைபெற்ற நாடுகள் அனைத்திலும் இவ்வாறான பிரச்சினைகளை அந்தந்த நாடுகள் எதிர்கொண்டுள்ளன. ஆகவே, நாமும் இதைப் புரிந்துகொண்டு செயற்பட வேண்டும்.

மேலும், வடக்கு, கிழக்குப் பகுதியில் மேற்கொள்ளப்பட வேண்டிய பல அவசர உதவிப் பணிகளுக்குப் புலம் பெயர்ந்திருக்கும் மக்களிடமிருந்தும் பங்களிப்புக்களைப் பெற வேண்டியுள்ளது. அதற்குரிய சூழலொன்று உருவாக்கப்பட வேண்டியது மிக அவசியமாகும். இங்குள்ள மக்கள் தங்கள் நகரங்களை அபிவிருத்தி செய்ய விரும்புகிறார்கள்; தங்கள் ஊர்களையும் உறவுகளையும் மேம்படுத்த விரும்புகிறார்கள். இதற்குப் புலம்பெயர்ந்த மக்கள் முதலீடுகளைச் செய்ய வாய்ப்பளிக்க வேண்டும். மேலும், கலாசார உறவுப் பரிவர்த் தனையை இலகுவாக மேற்கொள்வதற்கும் வாய்ப்புக்களை உருவாக்கிக் கொடுக்க வேண்டும். போரின் காரணமாகச் சொத்துக்களை இழந்துள்ள மக்களே வடக்கு, கிழக்கில் அதிகமாக உள்ளனர். இவர்களில் பலருக்கு உழைப்போ, வேறு வருமானங்களோ இல்லை. ஆகையால் இந்தப் பிரதேசங்களில் தொழில் வாய்ப்புக்களை உருவாக்க வேண்டியுள்ளது. பல்லாயிரக் கணக்கான படித்த இளைஞர்களும் யுவதிகளும் வேலைவாய்ப்புக்காகக் காத்துக்கொண்டிருக்கின்றார்கள். போரை வெற்றிகொண்ட அரசாங்கம் போருக்குப் பின்னரான அமைதிக் காலத்தில் முன்னேற்றகரமான நடவடிக்கைகளை மேற்கொள்ளு மென்ற நம்பிக்கையோடு இருக்கின்றார்கள். மக்களின் நம்பிக்கையைப் பாதுகாப்பது மிகவும் அவசியமானது. இன்று நாம் செய்யவேண்டிய மிக முக்கியமான கடமையாகவும் இதனையே நான் கருதுகிறேன். போர்க் காலத்திற்கும் போருக்குப் பின்னரான காலத்திற்குமிடையில் வேறுபாடுகள் தெரிய வேண்டும். இந்த வித்தியாசத்தை உணர வைப்பதில் முக்கியமான பங்களிப்புச் செய்யவேண்டிய தேவை எமக்கு இருக்கின்றது. அதற்கான திட்டமிடலும், செயற்பாடும் அவசியமானதென்பது இங்கே கவனப்படுத்தவேண்டிய செய்தியாகும்.

கடந்த காலத்தில் நாம் அரசிடம் வலியுறுத்தி வந்த விடயங்கள் பலவும் நிறைவேற்றப்பட்டுள்ளன என்பதை இந்த மன்றிலே தெரிவிக்க விரும்புகின்றேன். அதற்காக நாம் மேதகு ஜனாதிபதி அவர்களுக்கும் சம்பந்தப்பட்ட அமைச்சர்களுக்கும் அரச அதிகாரிகளுக்கும் படைத்துறையைச் சார்ந்தவர்களுக்கும் எமது

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

நன்றியைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றோம். முக்கியமாக இடம்பெயர்ந்த மக்களை மீள்குடியேற்றம் செய்யவேண்டுமெனவும் புனர்வாழ்வு முகாமிலிருக்கும் முன்னாள் விடுதலைப் புலி உறுப்பினர்களை விடுவிக்க வேண்டுமெனவும் நாம் அரசாங்கத்திடம் வலியுறுத்தியிருந்தோம். எமது கோரிக்கையை ஏற்றுக்கொண்ட அரசாங்கம் அதைச் செயற்படுத்தி வருகின்றது. அரசாங்கத்தின் இந்த நடவடிக்கையானது தமிழ் மக்களிடத்தில் நல்லதொரு புரிந்துணர்வை எற்படுத்தியுள்ளது.

கௌரவ சபாநாயகர் அவர்களே, அபிவிருத்தியை நோக்கியும் அமைதியை நோக்கியும் முன்னேறிச் செல்லும் எமது நாட்டை நாம் மேலும் வளர்த்தெடுக்க வேண்டும். அவ்வாறு செய்ய வேண்டுமானால் எமது வளர்ச்சிக்கும் அமைதிக்கும் தடையாக இருக்கின்ற காரணிகளை நாம் இனங்கண்டு அவற்றை நீக்க வேண்டும். இதில் முக்கியமானது இன முரண்பாடாகும். இன்று உலகில் பல்லின, பன்மத, பல்சமூக இணக்க நிலைமைகள் வலுப்பெற்று வருகின்றன. விட்டுக்கொடுப்பதும் சேர்ந்திருப்பதும் மற்றவர்களின் கருத்துக்களை ஏற்றுக்கொள்வதும், எல்லோரையும் சமமாக மதித்தலும் உயரிய ஜனநாயக நடைமுறைகளாகப் பின்பற்றப்பட்டு வருகின்றன. ஒடுக்குமுறைகளும் அடக்கு முறைகளும் வலுவிழந்து வருகின்றன. உலகத்தின் நிகழ்ச்சிப் போக்கு மாறிவிட்டது. அதிதீவிர நிலைப்பாட்டையுடைய எத்தகைய அரசியல் வழிமுறையும் வெற்றியடைய முடியா தென்பதை அண்மைக்காலச் சம்பவங்கள் பலவும் எமக்குத் தெளிவுபடுத்தியிருக்கின்றன. ஆகவே, நாம் நடைமுறைச் சாத்தியமானவற்றைப்பற்றிச் சிந்திப்போம்; நீதியைப் பின்பற்றி அமைதியை உருவாக்குவதற்கு முயற்சிப்போம்; அவசரகாலச் சட்டத்தை மட்டுமல்ல, இந்த நாட்டிலே மக்களின் இயல்பு வாழ்க்கைக்கு நெருக்கடியைத் தருகின்ற அனைத்து விவகாரங் களையும் நீக்குவோம். இதற்கு அனைவருடைய பங்களிப்பையும் எதிர்பார்க்கின்றது, இந்த நாடு.

கௌரவ சபாநாயகர் அவர்களே, வவுனியா நகர சபை விவகாரம் தொடர்பாக நான் இந்தச் சபையின் கவனத்தை ஈர்க்க விரும்புகின்றேன். வவுனியா நகர சபையின் தமிழ்த் தேசியக் கூட்டமைப்பு உறுப்பினர் திரு. சுரேந்திரன், நகர சபைச் செயலாளர் திரு. வசந்தகுமாரை அவமதித்தமைக்கு எதிராக நகர சபைப் பணியாளர்கள் பணிப்புறக்கணிப்பில் ஈடுபட்டுள்ளனர். கடந்த செவ்வாய்க்கிழமை தொடக்கம் இந்தப் பணிப்புறக்கணிப் பானது காலவரையறையின்றி நடைபெறுகின்றது. இந்தப் பணிப்புறக்கணிப்பினை முடிவுக்குக் கொண்டுவருவது பற்றியோ அல்லது இந்தப் பிரச்சினைக்குக் காரணமாக இருக்கும் திரு. சுரேந்திரன்மீது நடவடிக்கை எடுப்பது பற்றியோ தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தலைமைப்பீடம் அக்கறை காட்டவில்லையென வவுனியா நகர சபைப் பணியாளர்களும் மக்களும் தெரிவிக் கின்றனர். கடந்த 28.04.2011 அன்று வவுனியா வேப்பங்குளப் பகுதியில் UNDP இன் அனுசரணையுடன் இடம்பெற்ற 'பிளாஸ்ரிக்' கழிவுப்பொருள் மீள்சுழற்சிச் செயற்பாட்டின் ஆரம்ப நிகழ்வின் போது, பலர் முன்னிலையில் நகர சபைச் செயலாளரை திரு.சுரேந்திரன் அவமதித்திருக்கின்றார். அங்கு அவர் செயலா ளரைத் தகாத வார்த்தைகளால் ஏசியும் மிரட்டியுமுள்ளார். திரு. சுரேந்திரன் இதற்கு முன்னரும் பல தடவைகள் செயலாளரை மிரட்டியிருக்கின்றார்; அவமதித்திருக்கின்றார். அதுமட்டுமல்ல, இவர் ஏனைய பணியார்களுடனும் இவ்வாறே நடந்துவருகின்றார். இவருடைய அடாவடித்தனங்கள் தொடர்பாகப் பல பணியாளர் களும் செயலாளரும் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் நாடாளு மன்ற உறுப்பினர்களிடம், குறிப்பாக கௌரவ மாவை. சேனாதி ராஜாவிடம், தெரிவித்திருக்கின்றனர். ஆனால், இவ்விடயம் தொடர்பாக இதுவரையில் எந்தவிதமான நடவடிக்கைகளும் எடுக்கப்படவில்லை. இதேவேளை கடந்த ஒன்றரை ஆண்டுகளுக்கு மேலாக வவுனியா நகர சபையின் நிருவாகம் மிகவும் சீரழிந்த நிலையிலுள்ளது. மேலும், கடந்த இரண்டு மாதங்களாக இந்தச் சபைக்கான தலைவரும் நியமிக்கப்படவில்லை. இந்த நிலையில் நகர சபையின் அபிவிருத்தி நடவடிக்கைகள் உட்பட மக்களுக்கான அவசியப் பணிகள் அனைத்தும் நெருக்கடி நிலைக்குத் தள்ளப் பட்டுள்ளன. இப்போது நகர சபைப் பணியாளர்களின் பணிப்புறக் கணிப்பினால் வவுனியா நகரம் சுகாதாரச் சீர்கேடுகளினாலும் பிற சேவைகளின் நெருக்கடிகளாலும் பாதிக்கப்பட்டுள்ளது. நகர சபையைக் கைப்பற்றுவதில் இருந்த நாட்டம், அதை ஒழுங்காக இயங்கவைப்பதில் இல்லாமல் இருப்பது கவலைக்குரிய விடயமாகும். செயற்றிறனும் மக்கள் நலனில் அக்கறையும் இன்மையே இந்நிலைமைக்குக் காரணம் என்பதை நான் இச்சபையின் கவனத்துக்குக் கொண்டுவந்து, சந்தர்ப்பமளித்த மைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඊ ළඟට ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා. [බාධා කිරීමක්] කරුණාකර, නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR ] *took the Chair.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. DEW Gunasekara, you may commence your speech.

[අ. භා. 3.01]

**ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාසයක් පාසා සම්ප්‍රදායානුකූලව කරනු ලබන හදිසි අවස්ථාව දීර්ඝ කිරීමේ විවාදයේදී වචන ස්වල්පයක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා. මා මිත්‍ර ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්න කිහිපයකට පිළිතුරු දීම අපේ වග කීමක් හා යුතුකමක්. මට පසුව කථා කරන ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු ඒවා සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරාවි.

එතුමා මතු කළා, විශේෂයෙන්ම මේ හදිසි නීතිය යටතේ අන්තර්ගත විධිවිධානයන්. මේක අලුතෙන් ප්‍රකාශයට පත් කරපු හදිසි අවස්ථාවක් නොවෙයි. මෙහි ආරම්භය සිදු වුණේ 1983 කාලයේයි. දිගටම යුද කටයුතු සිද්ධ වෙමින් පැවැති කාලය තුළ විවිධ ආණ්ඩු යටතේ මාසයක් මාසයක් පාසා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ නීති තමයි හදිසි නීතිය තුළින් අපි ඉදිරිපත් කරන්නේ. නමුත් 2009 මැයි මාසයේ 19 වන දා ඒ ගැටුම් අවසානයට පත් වූවායින් පසුව අපි ක්‍රමානුකූලව විධිමත්ව අනවශ්‍ය නීති එකින් එක අපේ නීති පද්ධතියෙන් ඉවත් කරමින් තමයි ඉන්නේ. මා හිතන්නේ අපි මුලදී ඉදිරිපත් කරපු යුද්ධයේ තියුණු අවස්ථාවේ තිබුණු දේවලින් අඩංගු කාරණා 30ක් විතර නීති පොතෙන් ඉවත් කර තිබෙනවා. තවත් කිහිපයක් ඉතුරුව තිබෙනවා. එතුමා මතු කළා සමහර කාරණා, සමහර විධිවිධාන

අදට අවශ්‍ය නැහැ කියා. එතුමාගේ විවේචනය අපි ආණ්ඩු පක්ෂය වශයෙන් සැලකිල්ලට ගන්නම්. ඊ ළඟ මාසයේ හදිසි නීතිය දීර්ඝ කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන කොට ඒවා අනවශ්‍යයි කියා අපි හිතනවා නම් ඒවා ඉවත් කිරීමට අපි සූදානම්. අපි දන්නවා, හදිසි නීතිය කියන එක හිතකර දෙයක් නොවන බව. ඒක අහිතකර දෙයක්. අපි කැමැත්තෙන් ඉදිරිපත් කරපු ඒවාත් නොවෙයි. 1983 ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා හිටපු කාලයේ ඉදිරිපත් කරපු එක තමයි ඊට පසු බලයට පත් වූ සෑම නායකයෙක් යටතේම, සෑම ආණ්ඩුවක් යටතේම දිගටම ක්‍රියාත්මක වුණේ. ඊළාම් යුද්ධ 4ක් තිබුණා. සාමාන්‍යයෙන් ජනමාධ්‍ය විසින් නම් කරන ආකාරයට යුද්ධය උත්සන්න වූ අවස්ථාවල නීතිය දැඩි වනවා. දැන් අවම වශයෙන් අවශ්‍යම රෙගුලාසි තමයි අද නීති පද්ධතියේ රඳවා ගෙන තිබෙන්නේ. සමහර දේවල් අනවශ්‍යයි කියා එතුමා කල්පනා කරනවා ඇති. හදිසි තත්ත්වයන් මතු වුණොත් කියා තමයි සමහර රෙගුලාසි දිගටම පවත්වාගෙන යන්නේ. කොහොම හරි එම විවේචනය අපි සැලකිල්ලට ගන්නා බව වැඩිදුරටත් ප්‍රකාශයට පත් කරන්න ඕනෑ.

මැතිවරණ කොමසාරිස්වරයා පත් කිරීම පිළිබඳත් එතුමා ප්‍රශ්නයක් මතු කළා. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණායින් පසුව ඒ යටතේ තමයි ජනාධිපතිතුමා ඒ පත්වීම කළේ. ජනාධිපතිතුමා බලාපොරොත්තු වුණා, නොබෝ දිනකින් අවශ්‍ය කොමිෂන් සභා සියල්ලක්ම පත් කරන්න. ඒ ක්‍රියාවලිය වැඩි කල් යන්නේ නැතුව නිමාවට පත් වෙයි. මම හිතන්නේ විශේෂයෙන් මැතිවරණ තිබුණ නිසා සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙක් වශයෙන් කටයුතු කළ එතුමා වහාම ඒ තනතුරට පත් කිරීමට කල්පනා කරන්න ඇති. අපි කවුරුත් දන්නවා හිටපු මැතිවරණ කොමසාරිස්තුමා දිගින් දිගටම විශ්‍රාම යෑමට අවශ්‍යයි කියන එක රටටත් කිව්වා. අප එක්කත් කිව්වා. පාර්ලිමේන්තු කාරක සභාවේදීත් කිව්වා. නිරන්තරයෙන්ම එතුමා ඒ පැමිණිල්ල ඉදිරිපත් කළා. ඒ අනුව එතුමාට විශ්‍රාම යන්න අවස්ථාවක් ලැබුණා. ඒ අනුවයි ඒ පත්වීම කළේ. සම්පූර්ණ කොමිෂන් සභාව යථා කාලයේදී පත් කරනු ඇතැයි කියා අපි කල්පනා කරනවා.

ඒ වාගේම ඔහු මතු කළ තවත් කාරණා කිහිපයක් මේ අතරේම මා විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි. ඊයේ විපක්ෂ නායකතුමා විශේෂ ප්‍රකාශයක් කළා, ආණ්ඩුව පැත්තෙන් අපේ ගරු ජී.එල්. පීරිස් අමාත්‍යතුමා කළ ප්‍රකාශයට අනතුරුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලේකම්වරයාගේ උපදේශක කමිටු වාර්තාව පිළිබඳව එක්සත් ජාතික පක්ෂයේ ස්ථාවරය ඉදිරිපත් කරමින්. සමස්තයක් වශයෙන් ඒ කාරණාවේදී එතුමා යහපත් ස්ථාවරයක් ගත්ත බව පෙනෙනවා. නමුත් අපට පිළිගත නොහැකි සමහර කාරණා තිබෙනවා. සමහර විට ගෝනුස්සාගේ වලිගය වාගේ විෂ තියෙන තැනුත් තිබෙනවා. සමහර විට අපි නොපිළි ගන්නා කාරණාත් තිබෙනවා. නමුත් සමස්තයක් වශයෙන් ගත්තාම එතුමා යහපත් ස්ථාවරයක් ගත්තා. අපි ඒක අගය කරනවා. මේ වාගේ අවස්ථාවක විපක්ෂයත්, ආණ්ඩු පක්ෂයත් එකට ඉඳ ගෙන කටයුතු කළ යුතුයි.

එතුමා ඒ අවස්ථාවේදී විශේෂ සිද්ධියක් මතු කළා. ඔහු කියා සිටියා, නිදහසින් පසු රාජ්‍ය තාන්ත්‍රික අර්බුදයක් ඇති වූ අවස්ථා දෙකක් තිබෙනවා කියා. ඒ එක් අවස්ථාවක් වන්නේ 1987 දී අහසින් ඇවිත් පරිප්පු දාපු අවස්ථාව. ඔහු කියා සිටියේ දෙවැනි අර්බුදය දැන් මේ අවස්ථාවේ පැන නඟිමින් තිබෙනවා කියලායි. මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, 1987 ඒ අර්බුදය ඇති වූ වෙලාවේ මමත් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කළ බව. ඒ සිද්ධිය ඇති වුණ වෙලාවේ රාත්‍රී 11.00ට පමණ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා විපක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් පක්ෂ තුනක සිටි අපි තුන් දෙනෙකුට කථා කළා. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාටත්, අනුර බණ්ඩාරනායක විපක්ෂ නායකතුමාටත්, මටත් දුරකථනයෙන් කථා කළා. අපි රජ මැදුරට ගියා. රාත්‍රී 11.00 ඉඳලා උදේ 3.00 වෙනකම් අපි කථා කළා. ඒ කථාව බොහෝ දෙනා දන්නේ නැහැ. පසු කාලයක පුවත් පත්වලින් ඒක ප්‍රකාශයට පත් වුණා. එතුමා දුරකථනයෙන් කථා කරලා මට කිව්වා, "හදිසි තත්ත්වයක් තිබෙනවා. ඒක මට දුරකථනයෙන් කියන්න බැහැ. කරුණාකර මාව හම්බ වෙන්න එන්න පුළුවන්ද?" කියලා. ඒ වෙලාවේ අපි ගියා. ඒ වෙලාව කැබිනට් මණ්ඩලය රැස්වුණ අවස්ථාවක්. මම හිතන්නේ ඒක නිදහසින් පසු ඇති වුණු සුවිශේෂ සිද්ධියක්. ඒ වෙලාවේ අග්‍රාමාත්‍ය ප්‍රේමදාස මැතිතුමා සිටියා. ගාමිණී දිසානායක මැතිතුමාත්, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාත්, එවකට විදේශ කටයුතු ඇමති ඒ.සී.එස්. හමීඩ් මැතිතුමාත් සිටියා. වෙන කවුරුවත් සිටියේ නැහැ. වෙන එකක් තියා අපට සංග්‍රහ කිරීමේ කටයුතු බාරව සිටියේ එච්. ඩබ්ලිව්. ජයවර්ධන මහතායි. ඒ තරමටම රහසිගතව තමයි ඒ රැස්වීම තිබ්බේ. ඉස්සෙල්ලාම ඒ රැස්වීමට ගියේ මමයි. එතකොට වෙලාව රාත්‍රී 11.00යි. ජනාධිපතිතුමා මට ලියුමක් දුන්නා. ඒක රජීව් ගාන්ධි මහතා එවාපු ලියුමක්. ඒ ලියුමේ සඳහන් කර තිබුණා, "උතුරු ප්‍රදේශයේ ඔබතුමාගේ පුරවැසියෝ කන්න නැතිව ඉන්නවා. කෑම යැවීම නතර කර තිබෙනවා. මේක ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය මට; දකුණේ තමිල්නාඩුවට බලපාලා තිබෙනවා. මට මෙහේ මිනිස්සු පාලනය කර ගන්න බැහැ. කරුණාකර මේකට මැදිහත් වෙලා ඒ මිනිසුන්ට කෑම දෙන්න. නැත්නම් මට කෑම යවන්න සිද්ධ වෙනවා." කියලා. ඉතින් ඒක අපටත් ප්‍රශ්නයක් වුණා. ඒ ලියුම කියවලා තේරුම් ගන්න අපට හුඟ වෙලාවක් ගතවුණා. වෙන එකක් තියා, ඇතුලත්මුදලි මැතිතුමා ශබ්දකෝෂය පවා ගෙනාවා, ඒ පාවිච්චි කර තිබුණු සමහර වචනවල තේරුම සොයා ගන්න; ඒ ලියුමේ තර්ජනයක් - threat in tone - එකක් තිබෙනවාද කියලා බලන්න. ඒ අවස්ථාවේ විපක්ෂ නායක අනුර බණ්ඩාරනායක මැතිතුමාත්, දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත්, මමත් ආණ්ඩුවත් එක්ක එකට සිටියා. අපි ආණ්ඩුවට කියා සිටියා,"ඉන්දියාවත් එක්ක ප්‍රශ්නයක් ඇති කර ගන්න එපා. ඉන්දියාව කියන්නේ අසල්වැසි රට. අපේ ප්‍රශ්නයට ඉන්දියානු සාධකයක් තිබෙනවා. විශේෂයෙන් ඉන්දියානු සාධකය කියන්නේ තමිල්නාඩු සාධකය. ඒක තේරුම් අරගෙන අපේ තිබෙන මිත්‍ර සම්බන්ධකම් පළුදු කර ගන්නේ නැතිව අපි මේක රාජ්‍ය තාන්ත්‍රික විධියට විසඳා ගනිමු." කියලා. ඒ අවස්ථාවේ රතු කුරුසය මාර්ගයෙන් ආහාර යැවීමට කටයුතු කරමුය කියා යෝජනා කළේ විපක්ෂයේ අපියි. ඒ වෙලාවේ අපි එතුමාට කියා සිටියා, "ආණ්ඩුවෙන් ඔබතුමා තමයි මුලින්ම වැරැද්ද කළේ. ඒ අපේම පුරවැසියෝ. උතුරු ප්‍රදේශයට කෑම යැවීම; කෑම සැපයීම නැවැත්තුවාට පස්සේ මෙවැනි තත්ත්වයක් උද්ගත වීම පුදුමයක් නොවෙයි." කියලා. එතුමා ඒක පිළිගත්තා. රජීව් ගාන්ධි අගමැතිතුමාට යවන්න අපි පිළිතුරක් හැදුවා. අපි ඔක්කොම සිටියදී තමයි ඒ පිළිතුර හැදුවේ. එතකොට වෙලාව පාන්දර 3.00යි. ඒ වෙලාවේම කථානායක ඊ.එල්. සේනානායක මැතිතුමාට telephone එකෙන් කථා කරලා කිව්වා, පසුව දාට පාර්ලිමේන්තුව කැඳවන්නය කියලා. ඊ ළඟට අගමැතිතුමාට කියවන්න ප්‍රකාශයක් හැදුවා. කිසිම වාද විවාදයක් නැහැ. විපක්ෂයෙන් අපි කිව්වා, "විවාද කරන්න යන්නේ නැහැ. අපි මේ වෙලාවේ එකට ඉඳිමු." කියලා. නමුත් ඒක ඒ ආකාරයට සිද්ධ වුණේ නැහැ.ඊට පස්සේ වෙච්ච දේ මොකක්ද? ගරු අග්‍රාමාත්‍යතුමා පැයක් විශාල වශයෙන් ඉන්දියාව විවේචනය කරලා දැඩි ප්‍රහාරාත්මක කථාවක් කළා. ඊට පස්සේ අපි පාර්ලිමේන්තුවෙන් පිට වන කොටම අහස් යාත්‍රාවලින් ඇවිල්ලා ආහාර දමන්න පටන් ගත්තා. එදා රාජ්‍ය තාන්ත්‍රික අර්බුදයක් ඇති වුණා. විපක්ෂ නායකතුමා ඒ කිව්ව කාරණාව ඇත්ත. එදා එවැනි තත්ත්වයක් මතු වෙච්ච වෙලාවේ විපක්ෂයේ අපි ආණ්ඩුවත් එක්ක එකට සිටියා. රටක් වශයෙන් අපි එකට සිටියා. මා හිතන්නේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාත් අප කෙරෙහි විශ්වාසයක් තැබුවා. අපි සාකච්ඡා කළා. නමුත් ඒක ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඒ වාගේ අර්බුදකාරී තත්ත්වයක් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් අද තිබෙනවා කියලා මා පිළිගන්නේ නැහැ. එදා ප්‍රශ්නයක් මතු වුණේ අප විසින් කරපු වරදක් නිසා. අද මතු වෙලා තිබෙන ප්‍රශ්නය වෙනත් ආකාරයේ ප්‍රශ්නයක්. ඒක මතු කරපු නිසා

[ගරු ඩිව් ගුණසේකර මහතා]

තමයි මම මේවා කියන්නේ. නැත්නම් මම ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වුණේ නැහැ. හදිසි නීති විවාදය පැවැත්වෙන අවස්ථාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයාගේ උපදේශක කමිටු වාර්තාව පිළිබඳව මා කථා කරන්න බලාපොරොත්තු වුණේ නැහැ. අනවශ්‍ය විධියට ඒ ගැන විවාදයකට පැටලෙන්න මා බලාපොරොත්තු වුණේ නැහැ. නමුත් ඒ ප්‍රශ්නය මතු කරපු නිසා මට ඒ ගැන පැහැදිලි කර දෙන්න වෙනවා.

අපේ විදේශ ඇමතිතුමා පැහැදිලිව ආණ්ඩුවේ ස්ථාවරය කියා සිටියා. ඒ වාර්තාව එක්සත් ජාතීන්ගේ සංවිධානය වාර්තාවක් වශයෙන් පිළිගන්නේ නැහැ. ඒක අලුත් දෙයක් නොවෙයි. 2010 ජූනි මාසයේ මේ ත්‍රිපුද්ගල කමිටුව පත් කරපු වෙලාවේ ආණ්ඩුවෙන් ප්‍රකාශයක් කළා, මේකට අපි විරුද්ධයි කියලා. මට මතකයි, අපේ පක්ෂය ජාතික සම්මේලනයේදී විශේෂ යෝජනාවකුත් අන්තර්ගත කළා, මේක කෙළින්ම කරන අනවශ්‍ය ඇඟිලි ගැසීමක්ය, මේක කරන්න එපාය කියලා. එවැනි දෙයක් කළාම අවසාන වශයෙන් ඒක කොයි ආකාරයෙන්ද වර්ධනය වෙන්නේ කියන එක තර්කානුකූලව අපට පෙනුණා. නමුත් එතුමාම කියන ආකාරයට ඒ වාර්තාව එතුමාට උපදෙස් ලබා ගැනීම සඳහා හදපු වාර්තාවක්. ඒ වාර්තාව ලබා දුන් දවසේම එතුමා ප්‍රකාශ කර තිබෙනවා, "I am going to review this" කියලා. ඒ review එක තවම නැහැ. කනගාටුවට කාරණාවක් තිබෙන්නේ review කරන්න ඉස්සර වෙලා එය මාධ්‍යයට ගියා. විපක්ෂ නායකතුමා කියන ආකාරයටම මමත් පිළිගන්නවා, අද ඒක public document එකක් බවට පත් වෙලා. මුළු ලෝකයම ඒ ගැන දන්නවා. මම හිතන්නේ තමන්ගේ review එකක් කරලා එක්සත් ජාතීන්ගේ සංවිධානය වැඩ කරන ක්‍රමය තුළින් - UN system එක තුළින්- ඒ ආකාරයෙන් කටයුතු කළා නම් ඒක සම්පූර්ණයෙන් වෙනත් තත්ත්වයක්. මේක අපි දන්නවා. මම මේ අවස්ථාවේදී ඒ ගැන දිගට කථා කරන්න යන්නේ නැහැ. ඒකට සම්බන්ධ වෙලා හිටිය තුන් දෙනාගේ තිබෙන සුදුසුකම් හා නුසුදුසුකම් කියන ඒවා මේ වෙලාවේ මම අවුස්සන්න යන්නේ නැහැ. රාජ්‍ය තාන්ත්‍රික අර්බුද තත්ත්වයක් තිබෙනවා නම් ඒවා සමථය කිරීමට තමයි අපි ඉන්නේ. අපි එක්සත් ජාතීන්ගේ සංවිධානයත් එක්ක දිගටම කටයුතු කරන්න සූදානම්. 2009 මැයි මාසයේ 23න් වැනි දා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා ලංකාවට පැමිණි අතර, එතුමා නැවත පිටත් වන වෙලාවේ මම තමයි උදේ 1.00ට එතුමා airport එකට රැගෙන ගිහිල්ලා අහස් යානාවට නැග්ගෙව්වේත්. ඒ අවස්ථාවේදී අපේ රාජ්‍ය තාන්ත්‍රික සමහර දූතයන් ඇවිල්ලා එතැන කථා කරපු ආකාරයෙනුත්, හැසිරුණු ආකාරයෙනුත් දැන් ආපහු හැරිලා බලන කොට සමහර විට මේ වාර්තාවේ මුල් උපත එතැනද කියලා නිකම් මට සැක හිතෙනවා. මොකද ඒ අවස්ථාවේදී එතුමා CNN එකට විශේෂ interview එකක් දුන්නා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Minister, please wind up. Your time is over.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

Sir, I have 15 minutes.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Yes, but you have already exhausted it.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

This is an important Debate, Sir. I am just developing a point. Please allow me to point it out.

ඒ අවස්ථාවේදී ඔහුත් එක්ක මම ළඟ වාඩි වෙලා සිටියා. දැන් ආපහු හැරිලා බලන්න, පත්තරේ එදා ඔහු කරපු ප්‍රකාශය දිහා. අද තිබෙන ස්ථාවරයේ ප්‍රකාශයක් නොවෙයි, එදා කරපු ප්‍රකාශය. 2009 ජනවාරි පළමුවැනි දා තමයි කිලිනොච්චිය වැටලුවේ. එදායින් පස්සේ මැයි මාසයේ 19 වැනි දා දක්වා කාලය තුළ ඇති වුණු සිද්ධීන් පිළිබඳව ක්‍රමානුකූලව සියලු කරුණු අඩංගු කරලා විස්තරයක් අපි කළා. මේ සම්බන්ධයෙන් අපේ ස්ථාවරය අපි කෙළින්ම කිව්වා. ඔබතුමා උතුරේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ වාර්තාව නිසා ඇති වුණු අයහපත් තත්ත්වය පිළිගන්නවා ඇති. මේක ජනතාව තුළ යළිත් වරක් බියක් සැකයක් ඇති කරන්න හේතු වුණා. සිංහල ජනතාව හා දෙමළ ජනතාව අතර යම් මිත්‍රශීලී තත්ත්වයක් වර්ධනය වෙමින් තිබුණා නම් ඒක නතර කිරීමට මේ වාර්තාව දායක වුණා. සාමකාමී අයුරින් මේ ප්‍රශ්න විසඳීමට යන ක්‍රියාදාමය තුළට මේ වාර්තාව බලපාන්න පටන් ගත්තා. මේක අපේ මුළු කලාපයටම බලපාන්න පටන් ගත්තා. මෙය ජාත්‍යන්තර ප්‍රශ්නයක් බවට පත් කළා. මේ සියල්ලක්ම ඇති වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙත් පසු ගිය මැයි මාසයේ පළමුවැනි දා පාකිස්තානයේ ඇති වූ සිද්ධියෙන් අප ආණ්ඩුවට විරුද්ධව එල්ල කරපු චෝදනා සියල්ලක්ම යටපත් වෙලා ගියා පමණක් නොවෙයි, ඔසාමාගේ දේහය අරාබි මුහුදට දමන කොට ඒ වාර්තාවත් එතැනදීම මුහුදට දැම්මා කියලා හිතන්න පුළුවන්. අද මුළුමහත් ලෝක මතය මුළුමනින්ම වෙනස් වෙලා තිබෙනවා. ඔවුන් අපට විරුද්ධව ගෙනාපු චෝදනා සියල්ලම හැම අතින්ම "එහෙයි" නම්, මහා රාජ්‍යයන් සියල්ලටම ඒක ඒ ආකාරයටම apply කරන්න පුළුවන් වෙනවා. ඒ නිසා මම හිතන්නේ නැහැ මේක තව දුරටත් ප්‍රශ්නයක් වෙයි කියලා.

[අ. භා. 3.18]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි මම සන්තෝෂ වෙනවා, බොහොම ජ්‍යෝෂ්ඨයෙක් විධියට, ඒ වාගේම වාමාංශික ව්‍යාපාරයේ මහා විශාල අත් දැකීම් තිබෙන නායකයෙක් විධියට අපේ ඩිව් ගුණසේකර මැතිතුමා කළ කතාවෙන් පසු මට කතා කරන්නට ලැබීම ගැන. එතුමා බොහොම වැදගත් කතාවකුයි කළේ, එදා ඇති වුණු තත්ත්වය සහ අද ඇති වී තිබෙන තත්ත්වය අතර සමාන අසමානකම් ගැන.

මම විශේෂයෙන්ම අද ප්‍රකාශ කරන්න කැමැතියි, දරුස්මාන්ගේ වාර්තාව, එහෙම නැත්නම් මූන්ගේ වාර්තාව, එහෙමත් නැත්නම් බූන්ගේ වාර්තාව කියා එක එක විධියට කියන ඒ වාර්තාව හරහා ජාත්‍යන්තර වශයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වයන්, ඒ වාගේම රට ඇතුළේ අභ්‍යන්තර වශයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වයන් පිළිබඳව. මේ විවාදයේදී ඒ සම්බන්ධයෙන් අපි විටින් විට කතා කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ඒ වාගේම රටේ යහ පාලනය, ඒ වාගේම ලියන්න කියන්න තිබෙන අයිතිය, මිනිසුන්ට නිදහසේ උද්ඝෝෂණය කරන්න තිබෙන අයිතිය යන මේ අයිතීන් වෙනුවෙන් තමයි රටක් විධියට විපක්ෂයේ සිටින හැම කෙනෙක්ම කතා කළේ. එදා 88/89 දී මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්සත් ජාතීන්ගේ සංවිධානයට - UNO එකට - ගිහිල්ලා මේ රටේ සිද්ධ වෙච්ච අපරාධ, මේ රටේ සිද්ධ වෙච්ච තරුණ ඝාතනයන් ගැන කතා කළා. එතුමා අපට මාර්ගය පෙන්වා දුන්නා, ප්‍රජාතන්ත්‍රවාදය

ආරක්ෂා වෙන්නේ නැත්නම් ලංකාවෙන් බේරා ගන්න බැරි නම් කොතැනකට හරි ගිහිල්ලා, යකාගෙ කම්මලට හරි ගිහිල්ලා මේක කර ගන්න ඕනෑය කියා. ඉතින් අදත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය වෙනවා. එය මූන්ගේ කමිටුවට අදාළව වෙනවාද, නැද්ද කියා අපි දන්නේ නැහැ. දරුස්මාන්ගේ වාර්තාවට අදාළද, නැද්ද කියා අපි දන්නේත් නැහැ. හැබැයි ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය වන කොට ඒක මොන කමිටුවට අදාළ වුණේ නැතත් මේ රටේ ඉන්න පුරවැසියන් විධියට, විපක්ෂයක් විධියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට අපි ඒ ගැන කතා කරන්න ඕනෑ. අද සමහරුන් කතා කරනවා, ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවාය කියා. ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවාය කියා පුවත් පත් සාකච්ඡාවලදී අපේ ඇමතිවරු පුනපුනා කියනවා. හැබැයි ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වන එක ගැන දැන් ඒ ගොල්ලන්ට තේරෙන්නේ නැහැ. මොකද, ආණ්ඩුවේ ඉන්න නිසායි. විපක්ෂයේ ඉන්න කොට තමයි ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වීමේ නීරස අත් දැකීම් ලැබෙන්නේ. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා, අද මේ ආණ්ඩුවට එරෙහිව උද්ඝෝෂණය කරන විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට පහර දෙනවා නම්, පාරවල් දිගේ ඇදගෙන ගිහින් හාමුදුරුවරුන්ට පහර දෙනවා නම්, සාමාන්‍ය පුද්ගලයන්ට ලියන්න කියන්න තිබෙන අයිතිය, නිදහසේ කතා කරන්න තිබෙන අයිතිය අහෝසි වෙනවා නම්, යුද්ධය අවසන් වුණාට පසුවත් පාර්ලිමේන්තුවේ දෙමළ ජාතික මන්ත්‍රීවරුන් යාපනයේ ඉඳලා කොළඹට එන කොට පාර දිගේ වෙඩි තියනවා නම් එතැන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒක තමයි මම මේ කියන්නේ. බලන්න අද සිද්ධ වෙලා තිබෙන දෙය. දැනට සතියකට විතර කලින් Lanka-e-News website එක පිළිබඳව අපි දිගින් දිගටම කතා කළා. පසු ගිය කාලයේදී Lanka-e-News කාර්යාලයට ගිනි තිබ්බා. ඒ ගිනි තියපු "භූතයෝ" අල්ලන එක පැත්තකින් තියලා පොලිසිය Lanka-e-News website එකේ කර්තෘ පිටුපස එළෙව්වා. එතුමාට ආපු තත්පර 20ක call එකක්, නැත්නම් එතුමා දුන්නු තත්පර 20ක call එකක් ගැන සොයා පොලිසිය බෙනට් රූපසිංහ මහත්මයාව අත් අඩංගුවට ගත්තා. එතුමා බොහොම වයෝවෘද්ධ පුද්ගලයෙක්. වයස අවුරුදු 68කට වැඩි කෙනෙක්. වාමාංශික අදහස් දරපු කෙනෙක්. "ඇත්ත" පත්‍රයේ හිටපු කර්තෘ කෙනෙක්. "දිනමිණ" පුවත් පතේ හිටපු කර්තෘ කෙනෙක්. මහින්ද රාජපක්ෂ මැතිතුමාට බලයට එන්න මහා දැවැන්ත සේවයක් කරපු පත්‍ර වාර්තාකාරයෙක්. [බාධා කිරීමක්] ඔබතුමන්ලා ඒවා දන්නේ නැහැ නේ. ඊයේ පෙරේදා ආවාම කොහොමද බෙනට් රූපසිංහ ගැන දන්නේ? උඩතලවින්න ගැන නම් දන්නවා.

ඒ විධියට වැඩ කරපු බෙනට් රූපසිංහ මැතිතුමාව අරගෙන ගිහින් හිරේ දැම්මා. තව දින 14ක් එතුමා ඇතුළේ තියා ගන්නය කියා පොලිසිය යෝජනා කළා. මහේස්ත්‍රාත්තුමිය ඒක ප්‍රතික්ෂේප කරලා ඔහුව එළියට දැම්මා. Lanka-e-News website සිද්ධියට සම්බන්ධ තවත් දෙදෙනෙක් චෝදනා නැති නිසා නිදහස් කරන්නය කියා නීතිපතිතුමා කිව්වත්, මහේස්ත්‍රාත් ඒ ගැන සලකා නැහැ කියා Lanka-e-News website එකේ 19 වැනි දා පළ කළා. ඊට පසුව 21 වන දා මේ ප්‍රවෘත්තිය නිවැරදි නොවන බවට ප්‍රකාශ කරලා, මේ ප්‍රවෘත්තිය වැරදි ප්‍රවෘත්තියක් විධියට ඔවුන් හඳුන්වා දී ඒකට සමාව ඉල්ලා, "අපගේ බලවත් කනගාටුව" කියා නැවත ඒ website එකේ පළ කළා. ආපසු 22 වන දාත් "ඒ ප්‍රවෘත්තිය අසත්‍යායි අධිකරණයෙන් සමාව අයදිමු" කියා මේ වෙබ් අඩවියේ නැවත මේක සඳහන් කළා. හැබැයි මේකට විරුද්ධව, මේ ප්‍රවෘත්තිය ලිව්ව පුද්ගලයා -journalist- අර ගෙන ගිහින් අද වන කොට දවස් ගණනාවකට හිරේ දමා තිබෙනවා.

මා මේ කාරණය කියන්නට කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය තුළ දිගින් දිගටම සිදු වන්නේ මොකක්ද? ඊයේ ඒ ජනමාධ්‍යවේදියාට පහර දී තිබෙනවා, ඒ prison එක ඇතුළේ. ඔහුව අරගෙන ගිහින්. සාමාන්‍ය සම්ප්‍රදාය අපි දන්නවා. පත්තරවල මේ වාගේ ප්‍රවෘත්ති පළ වෙනවා. ඒවා පත්තරවල පළ වුණාම පසුව දා උදේට ඒවා පිළිබඳව සමාව අයදිනවා; කනගාටුව ප්‍රකාශ කරනවා. "ඒක සිදු වුණේ වැරදීමකින්" කියා ලංකා ඉතිහාසයේ ඕනෑ තරම් පුවත් පත්වල ඇති තරම් පළ වී තිබෙනවා. හැබැයි ඒ පළ කිරීම්වලින් පස්සේ ඒවාට විරුද්ධව කටයුතු කිරීම නතර කර තිබෙනවා. Lanka-e-News website එකට විතරක් මේ කාරණයට එරෙහිව අද උසාවියෙන් දඬුවම් කරන තත්ත්වයට පත් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ශාන්ත විජේසූරිය කියන මාධ්‍යවේදියාව අද මහර බන්ධනාගාරයේ සිර කර ඉන්න කොට බන්ධනාගාර නිලධාරියකු විසින් ඔහුට පහර දෙනවා. අප දන්නේ නැහැ, මේ සියල්ල එකට එකතු වී සිදු වන සිද්ධීන් ද කියා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තියෙනවාය කියා පුවත් පත් සාකච්ඡා පවත්වන මහ ලොකු ඇමතිවරුන්ගෙන් මා අහනවා, මොකක් ද ප්‍රජාතන්ත්‍රවාදය කියා. සාමාන්‍ය පුවත් පතක වැරදි ප්‍රවෘත්තියක් පළ කළාම ඒකට සමාව ඉල්ලා වෙබ් අඩවියේ පළ කළාම - මේක දෙපාරක් නොවෙයි තුන් වන පාරත් පළ කළායින් පස්සේ - තමයි අද මේ තත්ත්වය ඇති කර තිබෙන්නේ. මේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කළාම කට්ටිය කියනවා, "දරුස්මාන්ගේ වාර්තාවට සහයෝගය දී කතා කරනවා"ය කියා. මේ රටේ මාධ්‍යවේදීන් අරගෙන ගිහින් තවමත් අතුරුදහන් වෙලා. ප්‍රගීත් එක්නැලිගොඩ මහත්මයා අතුරුදහන් වෙලා දින 500කට වැඩියි. [බාධා කිරීමක්] අතුරුදහන් වෙලා තිබෙන්නේ. ඔබතුමාම දන්නවා ඒ පැත්තට තමයි අරගෙන ගිහින් තිබෙන්නේ; යාපනය පැත්තට කියලා. ඔබතුමන්ලාගේ ගෙවල් පැත්ත, ඔය ගෙවල් දිහායින් අරගෙන ගිහින් තිබෙන්නේ. මා දන්නේ නැහැ කවුද අරගෙන ගියේ කියා. ඒ පැත්තට අරගෙන ගිහින් දවස් 500ක්. දැන් තවම නැහැ. දැන් එතුමා ගැන හොයපුවාම ඒක ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි. ඒක සුපිරි ප්‍රජාතන්ත්‍රවාදය. මේ ඇමතිවරුන්ට එක්කෝ වෙනත් මොකක් හෝ අමාරුවක් තිබෙනවා නැත්නම් ඇත්ත කථාව නොදැන තමයි මේ කථා කරන්නේ.

එම නිසා විශේෂයෙන් මා කියන්නට කැමැතියි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදීව ලියන්නට කියන්නට තිබෙන අයිතිය අහෝසි කරනවා නම්, ඒ වෙනුවෙන් මහින්ද රාජපක්ෂ මහත්මයා අපට පෙන්වා දුන් පාර දිගේ යන්න අප සූදානම්, කිසි ගැටලුවක් නැතිව කියලා. එම නිසා දරුස්මාන්ගේ වාර්තාවේ තිබෙන කාරණා එක පැත්තකින් ජාත්‍යන්තර වශයෙන් එන කාරණා විධියට අප ප්‍රතික්ෂේප කරන අතරම, අනෙක් පැත්තෙන් අපට සිද්ධ වෙලා තිබෙනවා, මේ රට ඇතුළේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්නය කියලා කියන්න. ඒක ලංකාවේ ආණ්ඩුවෙන් කර ගන්න බැරි නම් අර මහින්ද රාජපක්ෂ මහත්මයා පෙන්වා දුන්න පාර දිගේ ගිහින් එක්සත් ජාතීන්ගේ සංවිධානයට කියන්නට අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒකේ වැරද්දක් තිබෙනවාය කියා කවුරු හෝ කියනවා නම්, ඒකේ වැරැද්ද මොකක්ද කියා මට කරුණාකර කියා දෙන්න.

මෙන්න මේක තමයි අද සිද්ධ වෙමින් තිබෙන්නේ. Lanka-e-News කියන වෙබ් අඩවියේ විතරක් නොවෙයි, පසු ගිය කාලයේ සිද්ධ වෙච්ච දේවල් තමයි අප හැම දාම හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයේ දී කථා කරන්නේ. දැන් අප කථා කරනවා නේ හදිසි නීතිය ඉවත් කරන්න. තමුන්නාන්සේලා මහ ලොකුවට දරුස්මාන්ගේ වාර්තාව ප්‍රතික්ෂේප කළාට දරුස්මාන්ගේ වාර්තාවේ තිබෙන ඒවා දැන් පොඩ්ඩ පොඩ්ඩ, හොරෙන් හොරෙන් ක්‍රියාත්මක කරනවා. දැන් හදිසි නීතිය ලිහිල් කරන්න හොරෙන් හොරෙන් කටයුතු කරනවා. ඊ ළඟට, එල්ටීටීඊ හිරකාරයෝ නිදහස් කරන්න - මා දන්නේ නැහැ, ඒකෙ දරුස්මාන්ගේ වාර්තාවට කැමැති කට්ටිය ද, අකැමැති කට්ටිය ද කියා. - වැඩ කටයුතු කර ගෙන යනවා. ඒ නිසා අපි කියන්න කැමැතියි, මෙන්න මෙය. රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන අපට ඇඟිල්ලෙන් ඇනලා දරුස්මාන්ම පෙන්වන තුරු ඉන්න ඕනෑ නැහැ, බෑන් කී මූන් පෙන්වන තුරු ඉන්න ඕනෑ නැහැ. අපේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගන්න ලංකාව දැන ගත්තා නම් ආණ්ඩුවක් විධියට දරුස්මාන්ලා අපට ඇඟිල්ල දික් කර කියන්නට ඕනෑ නැහැ,

[ගරු දයාසිරි ජයසේකර මහතා]

"මෙන්න මේක කරපල්ලා, අරක කරපල්ලා" කියා. එම නිසා මතක තියා ගන්න. මා අපේ ඇමතිවරුන්ගෙන් කරුණාකර ඉල්ලනවා, මෙන්න මෙය. වැඩක් පොළක් නැතිව ජ්‍යෙෂ්ඨ ඇමතිවරු මෙතැන ඉන්නවා. ඒ ඇමතිවරුන්ට මා කියන්නට කැමැතියි කරුණාකර ඔබතුමන්ලාගේ වැඩ විධියට පවරා ගන්න අඩුම තරමින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හදා ගන්නා වැඩ පිළිවෙළ. දැන් ලබන වාරයේ ඉල්ලන්න දෙන්නේ නැහැ. විශ්‍රාම යවලා ඉවරයි, ඒ ගොල්ලන්ව. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන වැඩ කටයුත්ත අඩුම තරමින් විශ්‍රාමික ඇමතිවරුන්ටවත් භාර දෙන්න.

අනෙක් කාරණය බලන්න. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශාධිපති ටෙරන්ස් පුරසිංහ මහත්මයා "මැයි දිනයේ සැබෑ අරුත" කියලා ලිපියක් පසු ගිය සතියේ 2011.05.01 වැනි ඉරිදා "ලංකාදීප" පත්‍රයට ලිව්වා. "මැයි දිනයේ සැබෑ අරුත" මොකක්ද කියලා එතුමා ලිව්වා. ඒ ලිපිය පටන් ගන්නේ "කොහොමද මැයි දිනය කරන්නේ" කියලායි. මේක කියවන්නේ නැතිව ආණ්ඩුව කරන විකාර වැඩවල ප්‍රතිඵලය තමයි මේ සිද්ධ වන්නේ. එම පුවත් පතේ මෙසේ සඳහන් කර තිබෙනවා:

"උතුරු නැඟෙනහිර රැඩිකල් තරුණ ව්‍යාපාරයට අත් වූයේ ද දකුණේ රැඩිකල් තරුණ ව්‍යාපාරයට අත් වූ ඉරණම විය. එනම් පරාජයෙන් කෙළවර විමයි. ඇත්ත වශයෙන්ම මෙම විනාශය සිදු වූයේ කම්කරු පන්තිය කෙරෙහි නොතිබූ විශ්වාසය හේතු කොට ගෙනය."

ඉතින් මේ කියා ගෙන එන්නේ ජනතා විමුක්ති පෙරමුණ කම්කරු ව්‍යාපාරය ගැන විශ්වාසය තැබුවේත් නැහැ, එල්ටීටීඊ සංවිධානය කම්කරු ව්‍යාපාරය ගැන විශ්වාසය තැබුවේත් නැහැ, ඒකේ ප්‍රතිඵලයක් විධියට අද මේ සංවිධාන දෙකම පරාජයට පත් වෙලා තිබෙනවා කියන එකයි. ඒක තමයි එතුමා කියන්නේ. මේ "රැඩිකල් තරුණ ව්‍යාපාරය" කියලා ලියූ ප්‍රකාශයට ආණ්ඩුව කළේ මොකක්ද? පසු ගිය සතියේ දවස් දෙකක් තුනක් ජාතික රූපවාහිනිය, අයිටීඑන් එක -මේ හැම එකේම- දිගින් දිගටම ටෙරන්ස් පුරසිංහ අධ්‍යයනාංශාධිපතිතුමාට එරෙහිව එතුමා ද්‍රෝහියකු විධියට හංවඩු ගැහුවා. ඒ විතරක් නොවෙයි. මේ පත්තරවල දමන්න වෙනත් දේවල් නැතිව අලුත් කථා හදනවා. දැන් ද්‍රෝහියෝ මවනවා. උදේ ඉඳන් රෑ වන තෙක් බිල්ලෝ මවනවා. 2011.05.05 "දිනමිණ" පුවත් පතේ මේ විධියට කියා තිබෙනවා.

"ටෙරන්ස් පුරසිංහ සරසවියෙන් එළවන්න

ජ'පුර සිසුහු විරෝධතාවයක

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන අංශ ප්‍රධානී ටෙරන්ස් පුරසිංහ මහතා ජාති ද්‍රෝහියකු ලෙස හඳුන්වමින් ඔහු විශ්වවිද්‍යාලයෙන් ඉවත් කරන ලෙස ඉල්ලා ඊයේ එම විශ්වවිද්‍යාල සිසුන් විසින් උද්ඝෝෂණ ව්‍යාපාරයක් අරඹා තිබිණි. ටෙරන්ස් පුරසිංහ මහතා සති අන්ත පුවත්පතකට කර ඇති ප්‍රකාශයක් හේතුවෙන් මේ උද්ඝෝෂණය ආරම්භ කර ඇත.

එල්ටීටීඊ සංවිධානය උතුරේ විමුක්තිකාමී රැඩිකල් තරුණ ව්‍යාපාරයක් ලෙස හඳුන්වා දෙමින් රාජපක්ෂ ආණ්ඩුව එය ඉතා මිලේච්ඡ ලෙස මර්දනය කළ බවට පුරසිංහ මහතා සති අන්ත පුවත්පතක් සමඟ කළ සාකච්ඡාවකදී සඳහන් කළ බව එම පුවත්පත පෙන්වා දී තිබේ."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහි කිසිම තැනක "රැඩිකල් තරුණ ව්‍යාපාරය" කියලා මිසක, විමුක්තිකාමී ව්‍යාපාරයක් විධියට එතුමා ලියලා නැහැ. හැබැයි අද ආණ්ඩුව මේකේ උද්ඝෝෂණ තියලා මේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයා හරහා අලුත් අර්බුදයක් මවන්න හදනවා. ඊයේ පෙරේදා ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ කිසිම උද්ඝෝෂණයක් තිබුණේ නැහැ. ඊට මෙහා පැත්තේ නම් ආණ්ඩුවේ කට්ටිය එකතු වෙලා කළු කොඩි දමලා තිබුණා. හැබැයි මේකට විරුද්ධව කිසිම දෙයක් කරලා තිබුණේ නැහැ. අද ජයවර්ධනපුර සරසවියේ ශිෂ්‍යයෝ සියලු දෙනාම එකට එකතු වෙලා තිබෙනවා, මේ අසාධාරණ කටයුත්තට විරුද්ධව පෙළගැහෙන්න. නැති ප්‍රශ්න තමයි මේ ඇති කරන්නේ. ඒකයි මම කියන්නේ. දරුස්මාන්ලා කියන එක හරි නේ. මේ රට ඇතුළේ මිනිහෙකුට පත්තරයකට ලියන්න බැරි නම්, අඩුම තරමින් සති අන්ත පුවත් පතක මෙතරම් පිටුවක් පුරා තිබෙන මුළු කථාවේම එක පොඩි වචනයක් අල්ලා ගෙන ගහන්න හදනවා නම්, මනුස්සයකුගේ ජීවිතය විනාශ කරන්න පුළුවන් තැනකට ගේන්න පුළුවන් නම්, බලා ගෙන ගියාම දරුස්මාන්ලා කියන එක හරි. ඇයි, ප්‍රජාතන්ත්‍රවාදය මේක ඇතුළේ නැහැ. ලියන්න දෙන්නේ නැහැ. අර ගෙන ගිහිල්ලා අත් අඩංගුවට ගන්නවා. කථිකාචාර්යවරුන්ට තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් නැහැ. විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු කියන දේට ආණ්ඩුව කතා කරන්නේ ඔවුන්ව ද්‍රෝහියෝ ගණනට දමලායි. හෙට අනිද්දා ඔහුව අර ගෙන ගිහිල්ලා ත්‍රස්තවාදී පනත් යටතේ හිර කරන්න පුළුවන්. එතකොට මොකක්ද වන්නේ? ප්‍රජාතන්ත්‍රවාදය ඉවරයි. ඉතින් මේ ආණ්ඩුව කරමින් ඉන්නේ දරුස්මාන්ලාට අපේ රටට විරුද්ධව ලියන්න පුළුවන් වාතාවරණය හදන එකයි. අපි කරන්න ඕනෑ, දරුස්මාන්ලාට අපේ රටට අත තියන්න බැරි වන තැනට පත් කරන කටයුත්තයි. දරුස්මාන්ලාට අපට විරුද්ධව ලියන්න අදාළ කාරණා හදලා දෙන්නේ මේ ආණ්ඩුව කියන එකයි අපි කියන්නේ. දරුස්මාන්ලාට විරුද්ධව කථා කරන්නේ නැහැයි කියලා අනෙක් පැත්තෙන් අපට බණිනවා. දරුස්මාන්ලාට ලියන්න තැන් මේ ගොල්ලෝ හදනවා. ඒකයි මම කියන්නේ.

ඊ ළඟට තිබෙනවා, Sri Lanka Computer Emergency Response Team - SLCERT. මේක තිබෙන්නේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ. මේකට කියන්නේ "ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර කණ්ඩායම" කියලායි. ඒක පරිගණක අපරාධ සොයා බැලීම සඳහා පත් කර තිබෙන විශේෂ කමිටුවක්. මේකෙන් කරන්නේ පරිගණක අපරාධ සොයා බැලීම සඳහා අවශ්‍ය කරන කටයුතු ටික ලැහැස්ති කරන එකයි. දැන් මේ ගොල්ලෝ මොනවාද කරන්නේ? මේ ගොල්ලෝ දැන් කරන්නේ මොකක්වත් නොවෙයි, හරි නම් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර කණ්ඩායම කියන මේ ආයතනය වග කියන්න ඕනෑ, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයටයි. හැබැයි දැන් මේ ආයතනය වග කියන්නේ කාටද? ආරක්ෂක අමාත්‍යාංශය යටතටයි මේ ආයතනය දමා ගෙන තිබෙන්නේ. දැන් මේ ගොල්ලෝ මොනවාද කරන්නේ? මේ ගොල්ලෝ කරන්නේ උදේ ඉඳන් රෑ වෙනකම් අපේ මන්ත්‍රීවරුන්ගේ සහ ඇමතිවරුන්ගේ e-mails check කරන එකයි. ආණ්ඩුවට විරුද්ධව ඉන්න ඇමතිවරුන්ගේ e-mails ටික check කරනවා අද. ඇමතිවරු මොනවාද කථා කරන්නේ කියලා හොයලා බලනවා. පරිගණක ටික tap කරනවා. මේක සාමාන්‍යයෙන් අපි දන්නවා ජාත්‍යන්තර අපරාධ නීතිය යටතටත් ගන්න පුළුවන් එකක් බව. පරිගණක අපරාධ සම්බන්ධව ගත්තොත් මේකට විරුද්ධව හරි නම් නඩු දමන්න ඕනෑ. හැබැයි ආණ්ඩුවේම ආයතනයක් අද තියා ගෙන මේ රටේ ආණ්ඩුවට විරුද්ධව කථා කරන ආයතන මොනවාද, ආණ්ඩුවට විරුද්ධව කථා කරන පුද්ගලයෝ කවුද, ඔවුන් යවන e-mails මොනවාද, ඔවුන් යවන පණිවුඩ මොනවාද, ඔවුන්ගේ වැඩ කටයුතු මොනවාද කියලා හොර රහසේ හොයලා බලනවා. හොයලා බලලා ඔවුන්ට විරුද්ධව කටයුතු කරන්න තමයි මේ කථා කරන්නේ. ඉතින් මොකක්ද මේ ප්‍රජාතන්ත්‍රවාදය? ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරනවා කියලා, ප්‍රජාතන්ත්‍රවාදය හදනවා කියලා මෙහේ කථා කරන අස්සේ, අද වන කොට ආණ්ඩුවට විරුද්ධව කටයුතු කරන ඇමතිවරුන්ගේ දුරකථන ඇමතුම්වලට හොරෙන් සවන් දෙනවා. ආණ්ඩුවට විරුද්ධව කවුද කථා කරන්නේ කියලා හොරෙන් සවන් දෙනවා. මේවා ඒ කාලෙත් කරන්න ඇති. හැබැයි ඒ කාලේ කෙරුවා නම් ඒකත් වැරැදියි, අද කාලේ කරන එකත් වැරැදියි. අපට නිදහසේ කථා කරන්න තිබෙන අයිතිය නැති කර තිබෙනවා. දැන් මෙතැන ඉන්න සමහර ඇමතිවරු අපිට ඇවිල්ලා දුක

කියනවා. ඇයි? කියන්න කවුරුත් නැහැ. ජනාධිපතිතුමාට කිව්වාට වැඩක් නැහැ. එතුමාගේ ගෝල බාලයින්ට කිව්වාට වැඩක් නැහැ. ජනතාවට කියන්න බැහැ. ඉතින් අපිට ඇවිල්ලා කියනවා දුක. දුක කියන ගමන් සමහර වෙලාවට telephone එකෙන් කථා කරනවා අපිට. සමහර වෙලාවට එක එක ඒවා emailsවලින් ලියනවා ඇති. ඉතින් ඒකට ඒ ගොල්ලන්ට අයිතියක් තිබෙනවා. ඒ කාලයේ තමුන්නාන්සේලාගේ කට්ටිය එකතු වෙලා අපේ ආණ්ඩුව පෙරළලා දැම්මා. ඒවා කරන්න හොඳයි. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය. ඒ ප්‍රජාතන්ත්‍රවාදය අනුව තමයි අපි ඒ කටයුතු ටික ලෑස්ති කරන්න ඕනෑ. හැබැයි මේ කරන්නේ දවස ගණනේ එහෙම පිටින්ම ආරක්ෂක අමාත්‍යාංශය යටතට ඒ වැඩ කටයුතු ටික ගන්න එකයි. ඒකයි මේ කරන්නේ. මේවාට විරුද්ධව අප ගන්නා ක්‍රියාදාමය අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහ පෙන්වීම අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගිහිල්ලා හරි ඉෂ්ට කරන්න සූදානම් කියන එක අපි මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. මොකද ඒ අඩි පාර එතුමා පෙන්වා දීලා තිබෙන නිසා. ඒ වාගේම අද බලන්න. [බාධා කිරීමක්] ඒ විතරක් නොවෙයි. එතුමා ගිහින් UN එකට කිව්වා, ඒ සංවිධානවලට කිව්වා, "බොලාට බැරි ඇයි, මේ ආණ්ඩුවට දෙන ආධාර ටික නතර කරන්න?" කියලා. මා ළඟ තිබෙනවා පත්තර කැල්ල. 1989-90 කාලයේදී ගිහින් කිව්වේ. දැන් අද අපිට කෑ ගහනවා පිට රට ගිහිල්ලා අපි ආධාර නතර කරනවා කියලා. මම එදාත් ඇහුවා. ඇමතිවරු නිකම් බොරුවට කිව්වාට වැඩක් නැහැ. අපේ නායකතුමා මෙන්න මේ තැන්වලට ගිහිල්ලා කිව්වා කියලා කරුණාකරලා ඔප්පු කරලා පෙන්වන්න, නිකම් තැන් තැන්වල අවලාද කථා කියන්නේ නැතිව. මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ ඉඳ ගෙන කියලා තිබෙනවා මේ රටට දෙන්න තිබෙන ආධාර නවත්වන්න බැරි ඇයි කියලා එතුමා ජාත්‍යන්තර සංවිධානවලින් ඇහුවා කියලා.

මේ ආණ්ඩුව 2011 වර්ෂයේ අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් කිව්වා හමුදාවේ සාමාජිකයකුගේ පවුලේ ඉපදෙන තුන්වැනි දරුවාට ආධාර මුදලක් දෙනවා කියලා. හමුදාවේ සහෝදරවරු තුන්වැනි දරුවා හදා ගෙන මට ඊයේත් කථා කෙරුවා, "අනේ සර් පොඩ්ඩක් කියන්න පාර්ලිමේන්තුවේ, අපි දැන් තුන්වැනි දරුවාත් හදා ගෙන ඉන්නවා, තවම මොකුත් හම්බ වුණේ නැහැ" කියලා. තුන්වැනි දරුවෝ හදා ගත්ත සෑහෙන තොගයක් ඉන්නවා දැන් හමුදාවේ. හැබැයි තවම ආධාරයක් නැහැ. ඒ හින්දා ඒ ගොල්ලෝ කියනවා, තව හදන්නද, එපාද කියලා පොඩ්ඩක් ආණ්ඩුවෙන් අහලා කියන්න කියලා. ඉතින් මම ඒ අයට කිව්වා මම පාර්ලිමේන්තුවේදී මේ ගැන කියන්නම් කියලා. වෙන කොහේද මේ ගැන කියන්නේ? ඉතින් මේ වාගේ විහිළු සහගත තැනකට අද මේ රට පත් කරලා ඉවරයි.

දරුස්මාන්ගේ වාර්තාව බැරි නම් කාගේ වාර්තාව පිළිගෙනද දන්නේ නැහැ ආණ්ඩුව හදිසි නීතියේ තිබෙන කෑලිබෑලි පොඩ්ඩ පොඩ්ඩ දැන් අයින් කරමින් ඉන්නවා. අගමැතිතුමා ඒක කියලා තිබුණා. ඒක එතුමාගේ මතයක්ද නැත්නම් වෙන කාගේ හරි මතයක්ද, ආණ්ඩුවේ මතයක්ද මම දන්නේ නැහැ. අගමැතිතුමා කියලා තිබුණා, හදිසි නීතියේ තිබෙන සියලු කාරණා, බොහොම දරදඬු නීති රීති ඉක්මනින් අහෝසි කරනවා කියලා. ඉතින් මම කියන්නේ තමුන්නාන්සේලාට දැන් හදිසි නීතිය වුවමනා නැහැ කියන එකයි. හදිසි නීතිය වුවමනා වෙලා තිබුණේ ත්‍රස්තවාදය තිබුණු කාලයේයි. අපි කියන්නේ කරුණාකරලා මේ රෙගුලාසි අහෝසි කරන්න කියලායි. තවදුරටත් අපේ මාධ්‍යවේදීන්ව තළන්න පෙළන්න, අපේ පුද්ගලයින්ව අත් අඩංගුවට ගන්න, එහෙම අරගෙන පැය 48, පැය 72 තියා ගෙන ඉන්න නීති ක්‍රම අහෝසි කරන තැනකට ගේන්න. එතකොට දරුස්මාන්ලාගේ වාර්තා අයින් කර ගන්න පුළුවන් ඒ ගොල්ලන්ට. මේ කථාව විශේෂයෙන් මම ප්‍රකාශ කරන්නේ අන්න ඒ කාරණාත් එක්කයි. ඒ නිසා තමුන්නාන්සේලාට මම කියනවා, ආණ්ඩුවක් හැටියට හරිහමන් විධියට ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් මේ රටේ ස්ථාපිත කරන්න කියලා.

ඒ වාගේම අපි දන්නවා, අද දෙමළ ජනතාවගේ ප්‍රශ්නය පිළිබඳව ආණ්ඩුව එක එක කථා කියනවා කියලා. යුද්ධය දිනලා, එල්ටීටීඊ සංවිධානය ඉවර කරලා ගිහිල්ලා ඉන්දියාවත් එක්ක පළමුවැනියෙන්ම කිව්වේ මොකුත් නොවෙයි, thirteenth plus plus දෙනවාය කියලායි. දහතුනේ plus එකක් දෙනවාය කියලායි කිව්වේ. Thirteenth double plus දාලා තිබුණා. මම ඒක දැක්කා. මම වෙලාවක ඒක ගෙනැල්ලා ඔබතුමාට පෙන්වන්නම්. Thirteenth plus එක minus කර ගන්න තමුන්නාන්සේලාට පුළුවන්. [බාධා කිරීම්] Thirteenth plus, කිව්වාම ඉතින් plus තමයි. Thirteenth plus plus දෙනවාය කියලා තමයි කථා කළේ. මේ ද්‍රවිඩ ජාතික සන්ධානය දවස ගණනේ අරගෙන ගිහිල්ලා කථා කරනවා. කථා කරලා තේ දෙනවා. තේ දීලා කියනවා අරක දෙන්නම්, මේක දෙන්නම්, වැඩ කරන්න දෙන්නම්, සල්ලි දෙන්නම් කියලා. ඒ අස්සේ ඩග්ලස් දේවානන්ද මහත්තයා ලව්වා තව තව කට්ටියට ගස්සවනවා. පාරවල් දිගේ එන්න දෙන්නේ නැහැ, සමහර කට්ටිය උස්සවනවා. මම කියන්නේ නැහැ එතුමා කරනවාය කියලා. නමුත් දැන් සන්නද්ධ කල්ලි හරහා එහෙම කරවනවා. ඒවා කරන ගමන් දෙමළ ජාතික සන්ධානය අද දෙකට තුනට කැලිවලට කඩලා ආණ්ඩුව හදන්නේ ඒකෙනුත් පොඩි කොටසක් ඒකට එකතු කර ගන්නයි. ඒක තමයි අද ආණ්ඩුවේ කල්පනාව වෙලා තිබෙන්නේ. දෙමළ ජනතාවගේ ප්‍රශ්නය අපේ ජාතික ප්‍රශ්නයක් විධියට සලකලා ඒකට විසඳුම දෙන එක පැත්තකින් තියලා ආණ්ඩුව හැම වෙලාවේම කළේ මේ දෙමළ ජනතාවගේ ප්‍රශ්නය දඩම්මා කර ගෙන විවිධ රටවල් එක්ක විවිධ සම්බන්ධතා පවත්වා ගත්ත එක විතරයි. ඉන්දියාවට ගිහිල්ලා එක කථාවක් කියනවා. ඇමෙරිකාවට ගිහිල්ලා තව කථාවක් කියනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගිහිල්ලා තව කථාවක් කියනවා. Thirteenth plus කියනවා. ඊ ළඟට minus කියනවා. සමහර සිංහල අන්ත ජාතිවාදී ඇමතිවරු ඇවිල්ලා කියනවා, "බලය බෙදන්න දෙන්න බැහැ"යි කියලා. සමහරු කියනවා, "බලය බෙදුවොත් බලා ගන්න පුළුවන්" කියලා. සමහර කට්ටිය කියනවා, බෙදන්න ඕනෑ plus නොවෙයි, ඊටත් වැඩිය දෙන්න ඕනෑය කියලා. ඒ ජාත්‍යන්තර ප්‍රජාව ඉස්සරහ. ඒ නිසා මම කියන්න කැමැතියි, මේ සියලු කාරණා සිද්ධ වෙලා තිබෙන්නේ එල්ටීටීඊ සංවිධානය පරාජය කරලා අපේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් හොයන්න දවස ගණනේ කල් මරන ආණ්ඩුවක ක්‍රියාදාමය නිසාය කියලා. වහාම මැදිහත් වෙලා දවස ගණනේ දෙමළ ජනතාව රවටන එක නතර කරලා ඔවුන්ට තියෙන ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරලා බලය බෙදීමේ ක්‍රියාදාමය ආරම්භ කරලා මේ රට දෙමළ ජනතාවගේ විතරක් නොවෙයි, සිංහල ජනතාවගේ විතරක් නොවෙයි, මුස්ලිම් ජනතාවගෙත් බලය පිළිබඳ ප්‍රශ්නය බේරන්න අවශ්‍ය කටයුතු ටික කරන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.41]

**ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**

(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு, எரிசக்தி அமைச்சர்)

(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින හදිසි නීති විවාදයට සහභාගි වන අවස්ථාවේදී විශේෂයෙන්ම ජාතික හෙළ උරුමය හැටියට අපි කැමැතියි කරුණු කීපයක් අවධාරණය කරන්න. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්තුමාට උපදෙස් දීමට යැයි කියමින් පළ කළ දරුස්මාන් වාර්තාව හා එයින් පැන නැඟී ඇති තත්ත්වය පිළිබඳව අපේ මේ ගරු සභාවේ අවධානය මේ අවස්ථාවේ යොමු කරවන්න කැමතියි.

අපි පළමුවෙන්ම කියන්න ඕනෑ, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුව ස්වෛරී රාජ්‍යයක අභ්‍යන්තර කටයුතු පිළිබඳ

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

පර්යේෂණ කරන්න, කටයුතු කරන්න, විමර්ශනය කරන්න එක්සත් ජාතීන්ගේ මහ ලේකම්තුමාට කිසිම අයිතියක් නැහැ කියලා. එවැනි සම්ප්‍රදායකුත් නැහැ. ඒ සඳහා එතුමාට බලය ලැබෙන්න ඕනෑ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයෙන්, මානව හිමිකම් කොමිසමෙන්, එසේත් නැත්නම් මහා මණ්ඩලයෙන්. එවැනි කිසිම බලය ලැබීමක් නැතුව, කිසිම සම්ප්‍රදායකින් තොරව එතුමාගේ බලය අයුතු ආකාරයට පාවිච්චි කරලා තමයි මේ කමිටුව පත් කළේ. ඒ කමිටුවේ සාමාජිකයන්ගේ සංයුතිය දෙස බැලුවාම, දරුස්මාන් මහතා, සූකා මැතිනිය, රට්නර් මහතා යන අයගේ ඉතිහාසය දෙස බැලුවාම අපට පෙනී යනවා, මේ අය සියලු දෙනාම එක්තරා කාලවල විවිධ බටහිර රාජ්‍යයන්ගේ අවශ්‍යතාව අනුව කටයුතු කරපු ආවතේවකරුවන් පිරිසක් කියලා. ඒ අය අපක්ෂපාත විද්වත් පිරිසක් හැටියට හඳුනා ගන්නට කිසි සේත්ම හැකියාවක් නැහැ. දෙවනුව මේ පිරිස තමන්ට උපදෙස් දීමට යැයි පත් කරපු ඒ උපදේශක ක්‍රියාවලියෙන් ඔබ්බට ගිහිල්ලා ශ්‍රී ලංකාව පිළිබඳව ඒක පාර්ශ්වික විග්‍රහයක් කරලා, ගවේෂණයක්, විමර්ශනයක් කරලා අද වන කොට ඒ සඳහා චෝදනා පත්‍රයකුත් සකස් කරලා තිබෙනවා. එහෙම නම් ඒ ගොල්ලන්ට ලබා දීපු බලය ඉක්මවා ගිහිල්ලා -මහ ලේකම්තුමාත්, මහ ලේකම්තුමා විසින් අනුමත කරන ලද කමිටුවත් තමන්ගේ බලය ඉක්මවා ගිහිල්ලා- කටයුතු කරලා තිබෙන බව අපි මේ අවස්ථාවේදී අවධාරණය කරන්න ඕනෑ. කුමක්ද මේ වාර්තාවෙන් ඇති වන හරය? ප්‍රධාන කරුණු තුනක් මේ වාර්තාව නිසා පැන නඟිනවා. පළමුවෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහි වුණේ ලොකු, කුඩා වෙනසකින් තොරව ලෝක සාමය, ලෝකයේ පිළිවෙළ, ලෝකයේ නීතිය ආරක්ෂා කර ගැනීමේ පරමාර්ථයෙනුයි. එතැනදී ඒ ඒ රාජ්‍යයන්ගේ ස්වෛරීත්වය ආරක්ෂා කර ගැනීමේ පසු බිම, පදනම තමයි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ පදනම වුණේ. ඒක කිසියම් එක රටකට, දෙකකට ඕනෑ ආකාරයට හැසිරෙනවා නම් එතැන එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඒ බලාපොරොත්තු වෙච්ච ලෝක සාමය, ලෝකයේ චිරස්ථායී පැවැත්ම අභියෝගයට ලක් වෙනවා. ඒ රාජ්‍යයන් තමන්ට කැමැති, කැමැති ආකාරයට කටයුතු කරන්න පෙලඹෙනවා. මේ නිසා එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහි කරපු ඒ පදනමටම මේ වාර්තාවෙන් එල්ල වෙලා තිබෙන්නේ මරු පහරක්. ඒ වාගේම දෙවනුව ලෝකයේ ගෝලීය ත්‍රස්තවාදයට එරෙහිව ලෝකයේ යම් යම් රාජ්‍යයන් ගෙන ගිය අරගලයට මෙයින් සිදු වෙලා තිබෙන්නේ මරු පහරක්. මේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මේ නියෝජිතයන් තුන් දෙනා -දරුස්මාන් මහත්මයා ඇතුළු මේ කට්ටිය - අපට කියන්නේ නැහැ, යම් හෙයකින් මේ සටනින් වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ නව දෙමළ නාසිවාදය ජය ගත්තා නම් මොන විදියේ තත්ත්වයක් මේ රටේ ඇති වෙනවාද කියලා; කී දෙනෙක් ඝාතනය කරයිද, මොන විදියේ පාලනයක් මේ රටේ ඇති වෙයිද, ඔහුගේ ඒ විජයග්‍රහණයත් එක්ක ඒකෙන් ඇති වන ක්‍රියා පටිපාටියේ ප්‍රතිඵලයක් හැටියට ඉන්දියාවේ බෙදුම්වාදය, ත්‍රස්තවාදය කොච්චර බලවත් වෙයිද, ගෝලීය ත්‍රස්තවාදය කොච්චර බලවත් වෙයිද කියලා. අපි බොහොම පැහැදිලිව දන්නවා, එල්ටීටීඊ සංවිධානයේ තාක්ෂණය ගෝලීය ත්‍රස්තවාදීන් අතට ගිය බව. 1993 දී පළමුවෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයේ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයට පිලිපීන ත්‍රස්තවාදියෙක් පහර දුන්න අවස්ථාවේදී ඔහුට අවශ්‍ය කරන සියලුම ලිපි ලේඛන හා passport හදලා දීලා තිබුණේ එල්ටීටීඊ සංවිධානයෙනුයි. ඒ වාගේම යේමනයේ ඒඩන් වරායේ තිබුණු "USS Cole" කියන ඇමෙරිකා එක්සත් ජනපදයේ දැවැන්ත නෞකාව අල්කයිඩා ව්‍යාපාරයෙන් පහර දීලා ගිල්ලවපු වෙලාවේ සූසෙයි -මුහුදු කොටි නායකයා- බොහොම ආඩම්බරයෙන් කිව්වා, "අපේ තාක්ෂණය තුළින් තමයි මේ කටයුත්ත කළේ." කියලා. එහෙම නම් ඔවුන්ගේ ත්‍රස්තවාදී තාක්ෂණය, ත්‍රස්තවාදී ක්‍රියා කලාපය පැතිරෙමින් තිබුණා. ඔවුන් පරාජය වුණා කියන්නේ ලෝක ත්‍රස්තවාදයට විරුද්ධව අප ලබා ගත් විශාලම ජයග්‍රහණයක්; අපි ලෝකයට ඉටු කළ ලොකු වග කීමක්. කාලතුවක්කු තිබිච්ච, ගුවන් යානා තිබිච්ච, නාවික යාත්‍රා -සබ්මැරීන්- තිබිච්ච, ලෝකය පුරා ජාලයක් තිබිච්ච වෙනත් ත්‍රස්තවාදී සංවිධානයක් නැහැ. ලෝකයේ සුපිරි බලවතෙකුගේ කිසිම අනුග්‍රහයකින් තොරව මහ ජන ඡන්දයෙන් -නිදහස් ඡන්දයෙන්- බලයට පත් වෙච්ච රජයක් එවැනි බලගතු ත්‍රස්තවාදී සංවිධානයක් මුලෝත්පාටනය කළා කියලා කියන්නේ ඒක ලෝකයට ලබා දීපු විශාල ආදර්ශයක්;විශාල ජයග්‍රහණයක්. ඒ නිසා එයට එරෙහිව, ඒ ප්‍රජාතන්ත්‍රවාදී රජයට එරෙහිව තීන්දු තීරණ ගන්න යනවාය කියන්නේ මොකක්ද? අනිවාර්යයෙන් ඒක ලෝක ත්‍රස්තවාදයට දීපු ලොකු උඩ ගෙඩියක්; ලොකු ශක්තියක්. ලෝක ත්‍රස්තවාදීන්ට තමන්ගේ කටයුතු කර ගෙන යන්න තව අවියක් ලැබුණා. අපි ඇමෙරිකා එක්සත් ජනපදයෙන් මෙහෙම අහන්න කැමැතියි. ඔවුන් පාකිස්ථානයේ ඇබොටාබාද්වලදී ඔසාමා බින් ලාඩන් ඝාතනය කළා. යම් හෙයකින් බින් ලාඩන් නිරායුධව ඔහුගේ පවුලත් එක්ක එතැන හිටියේ නැතුව, තුන්ලක්ෂයක් ඇෆ්ගනිස්ථාන ජනතාව වටකර ගෙන, හිර කර ගෙන, ප්‍රාණ ඇපකරුවන් බවට පත් කර ගෙන සිටින බව ඇමෙරිකා එක්සත් ජනපදය දැන ගෙන හිටියා නම් ඇමෙරිකා එක්සත් ජනපදය ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? බින් ලාඩන්, අල්- ස්වාහිරි ඇතුළු ඔහුගේ මුළු කණ්ඩායම ලක්ෂ තුනක් ප්‍රාණ ඇපයට අරගෙන එතැන ඉන්නවාය කියා ඇමෙරිකා එක්සත් ජනපදය හොඳින් දැන ගෙන හිටියා නම් ඇමෙරිකා එක්සත් ජනපදය ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? ඒ නිසා අපේ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව ඉතාම විනය ගරුකව, ඉතාම කල්පනාකාරී ක්‍රියාදාමයක් තමයි කර ගෙන ගිහින් තිබෙන්නේ.

මේ රටේ යුද අපරාධ පිළිබඳ පරීක්ෂණයක් කරනවා නම් එය කරන්න ඕනෑ එල්ටීටීඊය සහ එල්ටීටීඊයට ඇප උපකාර කරමින් අදටත් පවතින කල්ලි, කණ්ඩායම්වලට විරුද්ධවයි. හිට්ලර්ගේ නාසිවාදය පරාජය කළාට පස්සේ එය පරාජය වුණාය කියලා හිටියේ නැහැ. සැබෑ හිටපු, යටින් ඇප උපකාර කරපු සියලු දෙනාට අන්තර්ජාතික යුද අධිකරණවලට යන්න සිද්ධ වුණා. පොල්පොට්ගේ පොල්පොට්වාදය පරාජය වුණාය කියලා කාම්පුචියාවේදී පොල්පොට්ගේ ආධාරකාරයන්ට, ඔහුට උපකාර කරපු අයට, ඔහුට න්‍යාය සපයපු අයට, ඔහුට නීතිය උගන්වපු අයට කිසිම දඬුවමක් නොදී අත ඇරියේ නැහැ. ඒ සියලු දෙනාටම දඬුවම් දුන්නා. මේ රට තුළ තිස් අවුරුද්දක් ජන ඝාතනයේ නියැලුණු, ප්‍රභාකරන්ට දේශපාලන නායකත්වය දීපු, නීතිමය සහාය ලබා දීපු, ඇප උපකාර කරපු ලෝකය පුරාත්, මේ රටේත්, මේ පාර්ලිමේන්තුවෙත් සිටින ඒ සියලු කල්ලි, කණ්ඩායම්වලට විරුද්ධව යුක්තිය ඉටු කිරීමේ අවශ්‍යතාව අද ඇති වෙලා තිබෙනවා. අපිත් කල්පනා කළා, මේක අමතක කරලා අපි ඉදිරියට යන්නට ඕනෑයි කියලා. නමුත් ඇතැමුන් කල්පනා කරනවා නම්, ලේ වැගිරුණු අතීතයට ගිහිල්ලා නැවත පළි ගැනීමේ ක්‍රියාවලියක නියැලෙන්න, මේ රටේ එල්ටීටීඊ සංවිධානය විසින් ඝාතනය කරපු, පළවා හරින ලද, විනාශ කරන ලද ජන ජීවිත වෙනුවෙන් ඒ පිරිස්වලට යුක්තිය ඉටු කිරීමේ ක්‍රියා දාමයකට මැදිහත් වන්නට අපටත් සිදු වනවා. අන්න ඒක අපි මේ අවස්ථාවේ අවධාරණය කරන්නට ඕනෑ. ඒ වාගේම තුන්වනුව, මේ රටේ යම් කිසි සමාජ සමගියක්, සාමූහිකත්වයක් ඇති වෙමින් තිබුණා නම් මේ ක්‍රියා දාමය විසින් ඒකට මරු පහරක් එල්ල වෙලා තිබෙනවා. මේ රටේ බහුතර සිංහල ජනතාව අතීතයේ කොටි සංවිධානයේ සාමාජිකයන් තමන්ට කළේ මොනවාද කියන එක ගැන අමතක කරලා අලුත් අනාගතයක් ගැන හිතන්නට කල්පනා කළා. තමන්ගේ බදු මුදල්වලින් උතුරේ පාරවල්, උතුරේ විදුලිය, උතුරේ ජනාවාස ඇති වන තත්ත්වයට ඇප උපකාර කරන්නට ඉදිරිපත් වුණා. ඒ අතරින් එල්ටීටීඊ සන්නද්ධ සේනාංකවල සිට භාර වුණු දසදහසකට අධික අය පුනරුත්ථාපනය සඳහා තමන්ගේ බදු මුදල් වියදම් කළා. දැන් කවුරු හරි අතීතයට ගිහිල්ලා මේ වාර්තාවට උඩ ගෙඩි දෙමින් අපේ ආරක්ෂක හමුදාවල අයට දඬුවම් දෙන්නට උත්සාහ කරනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදීව නිදහස් ඡන්දයෙන් පත් වුණු ආණ්ඩුවට දඬුවම් කරන්නට උත්සාහ කරනවා නම්,

එහෙනම් අනෙක් අයටත් පුළුවන් අතීතයට ගිහිල්ලා කියන්න, "එල්ටීටීඊ සැකකරුවන් සහ ඔවුන්ට උදවු කළ පිරිස්වලට අපි තවදුරටත් නිදහසේ ඉන්නට ඉඩ දිය යුතු නැහැ. ඔවුන්ට යුක්තිය ඉටු කළ යුතු"යි කියලා. ඒ ලෙස ක්‍රියා කරනවා නම් මේ රටේ සාමය ඇති වන්නේ නැහැ. මේ දරුස්මාන් වාර්තාව ශ්‍රී ලංකා රජය කෙරෙහි ඒක පාර්ශ්විකව ක්‍රියා කිරීම නිසා, ශ්‍රී ලංකා රජයට දඬුවම් කිරීමට ඉදිරිපත් වීම නිසා සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? ඇති වෙමින් තිබුණු සමාජ සංහිඳියාව, ජාතික සංහිඳියාව, ජාතික සමගිය බරපතළ අභියෝගයකට ලක් වීමක් තමයි සිදු වෙලා තිබෙන්නේ. එම නිසා අපි මෙතැන් සිට බලන්නට ඕනෑ, ඉදිරියේදී සිදු වෙමින් තිබෙන්නේ කුමක්ද කියලා. මේ වාර්තාව පසු බිම් කර ගෙන හෝ වෙන යම් ආකාරයකට හෝ ආකාර ගණනාවකින් ශ්‍රී ලංකා රජයට තර්ජනයක් එල්ල වෙලා තිබෙනවා. අපේ ස්වෛරීත්වයට තර්ජනයක් එල්ල වෙලා තිබෙනවා. රාජ්‍ය අස්ථාවර කිරීමේ ක්‍රියා දාමයක් ඇරඹිලා තිබෙන විත්තිය අපි පැහැදිලිව දැන ගත යුතු යි. මේ වාර්තාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයන් 191කින් යම් පමණකට හෝ අනුමත කර තිබෙන්නේ තවමත් රාජ්‍යයන් දෙකක් පමණයි. ඒ, ඇමෙරිකා එක්සත් ජනපදයයි, එක්සත් රාජධානියයි. අනෙක් කිසිම රටක් මේක අනුමත කරලා නැහැ. මේ පිළිබඳව බොහෝ රටවල් අදහස් පළ කරලා නැහැ. ඒ අනුව ශ්‍රී ලංකාවට ඔවුන්ගේ සක්‍රිය සහයෝගයක් ලැබිලා තිබෙනවා, අපේ ප්‍රශ්න අපේ රට ඇතුළේ විසඳා ගෙන ඉදිරියට යාමට. බාහිර ඇඟිලි ගැසීමක්, බාහිර මැදිහත් වීමක්, බාහිර විමර්ශනයක් අවශ්‍ය නැතෙයි කියන තැනට ඒ රටවල් යම් කිසි ශක්තියක් අපට ලබා දීලා තිබෙනවා. ඒ ශක්තිය අපි මෙතැන ඉඳන් ඉදිරියට මෙහෙයවා ගත යුතුයි. ඒ සඳහා විධිමත්, කාර්යක්ෂම, ඒ වාගේම ඒක මතික ක්‍රියා දාමයක් අපි මෙතැන් සිට ඉදිරියට ගෙන යා යුතු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි සියලු දෙනාම දන්නවා අපට පසු ගිය කාලයේ දේශපාලන ප්‍රහාරයක් එල්ල කළ බව. පසු ගිය මැතිවරණවලදී මේ රජය වට්ටවන්න පුළුවන්ද කියලා බැලුවා. තානාපති කාර්යාලවලින් මුදල් කුට්ටි බෙදුවා. විවිධ පිරිස් දඩමීමා කර ගෙන මේ රජය වට්ටවන්න නොයෙක් ආකාරයෙන් උත්සාහ කළා. අද ලිබියාවේ, සිරියාවේ, ඉරානයේ, නොයෙක් රටවල විරුද්ධ පක්ෂ කල්ලි කණ්ඩායම්වලට උදවු කරලා ඒ රාජ්‍යයන් පෙරළා දමන්නට උත්සාහ කරනවා වාගේ මේ රටේත් පසු ගිය මැතිවරණවලදී යම් යම් උත්සාහයන් දැරුවා. අර WikiLeaks වෙබ් අඩවියේ තිබෙනවා, ඇතැම් පක්ෂවලට මැතිවරණය කර ගෙන යන්න සල්ලි ගෝනි ගණන් ගියේ කොහොමද කියලා. අද ඒ නඩු විභාග පැවැත්වෙනවා, මිලියන ගණන් ධනය ගණන් කරලාවත් නැතිව කොහොමද බැංකුවල vaultවලට ගියේ කියලා. මේවා පිටුපස සිටියේ කොයි රාජ්‍යයන්ද කියන එක අපි අද හොඳටම දන්නවා. ඒ උත්සාහය වැරැදිලා ගියා. හැබැයි මේක අනාගතයේත් අත් හරින්නේ නැහැ. අනාගතයේදීත් තමන්ගේ ක්‍රියාධරයෝ හරහා, තමන් විසින් මෙහෙයවන ඔත්තුකරුවෝ හරහා -රූකඩ හරහා- මේ රජයේ ශක්තිමත්භාවය පෙරළා දමන්නට විරුද්ධ පක්ෂයේ සිටින ඇතැම් දේශ මාමක නොවන බලවේග පාවිච්චි කරන්නට පුළුවන්. ඒ නිසා මේක ස්වෛරීත්වය පිළිබඳ ප්‍රශ්නයක්. මේක අතිගරු ජනාධිපතිතුමා පිළිබඳ ප්‍රශ්නයක් විතරක් නොවෙයි. මේක මේ රටේ ස්වෛරීත්වය පිළිබඳවත් ප්‍රශ්නයක් නිසා, පක්ෂ පාට භේදයෙන් තොරව රට ගැන විශ්වාසය තිබෙන සියලු දෙනාම මේ අවස්ථාවේ එකමුතුව, එක්සත්ව, මෙයට මුහුණ දිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

අපි දන්නවා, මිලිටරි ප්‍රහාරයකින් රාජ්‍ය අස්ථාවර කරන්න එල්ටීටීඊ සංවිධානය කාලයක් තිස්සේ උත්සාහ කළ බව. විවිධ රටවල් විවිධ විධියට එල්ටීටීඊ සංවිධානය ඒ සඳහා යොදවා ගත්තා. අපේ හිටපු රාජ්‍ය නායකයන් ඝාතනය කළා. හිටපු විපක්ෂ නායකවරයකු ඝාතනය කළා. ඒ වාගේම තවත් රාජ්‍ය නායකයන් ඝාතනය කරන්නට උත්සාහ කළා. දේශපාලන නායකයන් ඝාතනය කළා. මේ විධියට කටයුතු කළා. අපි කියන්නට ඕනෑ, අප්පාපිල්ලේ අමිර්තලිංගම්, යෝගේෂ්වරන් ඇතුළු දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේ නායකයන් ඝාතනය කළේ මේ රටේ සිංහල ජාතිවාදයෝ නොවෙයි කියලා. ඒ ඝාතනය කළේ එල්ටීටීඊ ත්‍රස්තවාදයයි. 1977 මැතිවරණයේ දී යෝගේෂ්වරන් කිව්වේ, සන්නද්ධ දෙමළුන් 5,000ක් ඉන්නවා නම් සිංහලයින් දණ ගස්වන්නට පුළුවන් කියලායි. නමුත් අවසානයේ ඔහු ඇතුළු සියලුම දේශපාලන නායකත්වයට අත් වුණේ මොකක්ද? එල්ටීටීඊ සංවිධානයේ මරණයේ සොහොන් බිමට ඔවුන් කැඳවා ගෙන යාම තමයි සිදු වුණේ. ප්‍රජාතන්ත්‍රවාදය වළලා දැමීම තමයි සිද්ධ කළේ.

අපේ ආරක්ෂක හමුදා ජීවිත පූජා කරලා තමයි අද උතුරෙයි, නැඟෙනහිරෙයි නැවතත් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය කරන්න අවස්ථාව මේ සියලු දේශපාලන පක්ෂවලට ලබා දීලා තිබෙන්නේ. අපට පෙනෙනවා අද නැවත වතාවක් එල්ටීටීඊ සංවිධානයේ කල්ලි, කණ්ඩායම් විවිධ රටවල -විශේෂයෙන්ම අප්‍රිකාවේ රටවලත්, වෙනත් රටවලත්- සංවිධානය කරන්න බලනවා කියලා. ඒ යුද කල්ලි කණ්ඩායම් නැවත වතාවක් මේ රට පැරණි ලේ වැගුරුණු අතීතයට රැගෙන යෑමට පුළුවන්ද කියලා බලනවා. එම නිසා අපි සියලු දෙනාම විමසිලිමත් විය යුතුයි. නැවතත් ලේ වැගුරුණු අතීතයට මේ රට ගෙන යන්න ඒ කල්ලි කණ්ඩායම්වලට අපි ඉඩ දිය යුතු නැහැ. ඔවුන්ට ඇප-උපකාර කරන පිරිස් මේ රට ඇතුළේ ඉන්නවා. ඒ කල්ලි කණ්ඩායම් සංවිධානය වන ඒ මොහොතේදීම ඒ අය සම්බන්ධයෙන් අපි දැඩිව, සෘජුව නීතිය ක්‍රියාත්මක කළ යුතු වනවා. ඒ උත්සාහය දැන් දරමින් තිබෙනවා. සන්නද්ධ කල්ලි කණ්ඩායම්වලට උදවු උපකාර කරලා සිරියාවේ සිදු වුණා වාගේ, දකුණු සුඩානයේ සිදු වුණා වාගේ -හෙට අනිද්දා වන කොට ලිබියාවේත්- රාජ්‍යයන් කැබලි කරන්න, රාජ්‍යයන් අස්ථාවර කරන්න ඒ මැදිහත් වීම සිදු විය හැකියි. අපි එයට ප්‍රවේශමෙන් මුහුණ දිය යුතුයි.

ඒ විතරක් නොවෙයි. තාක්ෂණික පැත්තෙන් මොනවාද වුණේ කියලාත් අපි දන්නවා. විශේෂයෙන්ම වෙබ් අඩවි හරහා, සයිබර් අවකාශය හරහා, රට ගැන ඉතාම වැරැදි ප්‍රවෘත්ති සහ අසත්‍ය තොරතුරු පුදුමාකාර ලෙස පතුරුවා හැරියා. ඇත්ත, නැත්ත තෝරා ගන්න බැරි තත්ත්වයට පත් වුණා. අද වන කොට ඒක තව පියවරක් ඉදිරියට ගෙන ගිහින් තාක්ෂණික ප්‍රහාර එල්ල කරන තැනට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වන කොට ඉරානයේ සියලුම න්‍යෂ්ටික බලාගාර පාලනය කරන්න බැරි තත්ත්වයට පත් කරලා තිබෙනවා. බටහිර රටක පෞද්ගලික සමාගමක් විසින් ඒ පරිගණක පද්ධතියට වෛරසයක් ඇතුළු කරලා සම්පූර්ණයෙන් ඒවා පාලනය කරලා තිබෙනවා. අපි දන්නවා, ඉරාකයේ ආරක්ෂක හමුදාවලට ඔය සිද්ධියම සිද්ධ වුණු බව. ඔවුන් පාවිච්චි කරපු වර්ණ photocopy යන්ත්‍රවලට, පරිගණක පද්ධතියට වෛරසයක් ඇතුළු කරලා සම්පූර්ණයෙන්ම ඉරාක හමුදාව අක්‍රිය කළා. මේ ලෙසට තාක්ෂණික ප්‍රහාර මඟින් අපේ බැංකු පද්ධතියට, අපේ විදුලිබල පද්ධතියට, අපේ සන්නිවේදන පද්ධතියට ඉදිරි කාලයේදී අභියෝග කරන්න පුළුවන්. එය අපි බරපතළ අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතුයි. අද ලෝකයේ ඇතැම් රටවලට සිදු කරලා තිබෙන ක්‍රියාදාමයන් දිහා බලන කොට මෙවැනි තත්ත්වයන් අනාගතයේ ඇති විය හැකියි. අපි එයට සූදානම් විය යුතුයි.

ඒ විතරක් නොවෙයි. අපි දැක්කා, අපට ආර්ථික ප්‍රහාරයක් එල්ල කරලා අපව කොටු කරලා, වට කරලා විනාශ කරන්න හැදුව බව. GSP Plus සහනය උදුරා ගෙන අපව වට්ටන්න පුළුවන් කියලා හිතුවා. බොහෝ දෙනෙක් අපව භය කළා. ලක්ෂ ගණනකට රැකියා අහිමි වෙයි, රටේ ආර්ථිකය කඩා වැටෙයි කියලා කල්පනා කළා. එක්සත් ජනපදය GSP Plus සහනය අයින් කරන කොට කල්පනා කළා, ඒක අපට අහිමි වෙලා යයි, ඒ තුළින් අපේ ආර්ථිකය ඇද වැටෙයි, අපේ ඇඟලුම් කර්මාන්තය සියයට 60ක් පමණ මේ රාජ්‍යයන් මත යැපිලා තිබෙන නිසා අපි ඇද වැටෙයි කියලා. ඒ සියල්ල පසු කර ගෙන අපි ආවා. GSP Plus සහනය නැති වුණා කියලා අපේ ඇඟලුම් කර්මාන්තයේ ආදායම අඩු වෙලා නැහැ. යුරෝපයෙන් අපේ ඇඟලුම්වල ආදායම සියයට තුනකින් වැඩි වෙලා තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Minister, please wind up your speech.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඒ ආර්ථික ප්‍රහාර ඉදිරි කාලයේදීත් තවත් සංවිධානාත්මක ලෙස ඉදිරිපත් විය හැකියි. අපි සියලු දෙනාම දේශපාලන වශයෙන් විවිධ මතවල ඉන්න පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදය ගැන අපට විවිධ අදහස් තිබෙන්න පුළුවන්. මනුෂ්‍ය නිදහස පිළිබඳ අපට විවිධ ආකල්ප තිබෙන්න පුළුවන්. නමුත් රටේ ස්වෛරීත්වයට අභියෝග කරලා තිබෙන මොහොතේ, රටේ සතුරන් කවුද, මිතුරන් කවුද කියා හඳුනා ගෙන අපි සියලු දෙනාම කටයුතු කළ යුතු වනවා. අතීතයේ එල්ටීටීඊ සංවිධානයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සහ ඔවුන්ට ඇප උපකාර කරපු සියලු දෙනා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න වාගේම, යුද අපරාධ සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් වන අයට යුක්තිය ඉටු කරන්න රටේ ජනතාවගේ පැත්තෙන් ඉදිරිපත් විය යුතු කාලය එළැඹ තිබෙන බව අවධාරණය කරමින් මා නිහඬ වනවා.

[பி.ப. 3.56]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, யுத்தம் முடிவடைந்து இரண்டு வருடங்கள் கடந்துகொண்டிருக்கின்ற இவ்வேளையில், தொடர்ந்தும் இந்த நாட்டில் அவசரகாலச் சட்டம் நீடிக்கப்பட்டுக்கொண்டு இருக்கின்றது. இதனை நீடிப்பதற்காகப் பல்வேறு காரணங்களும் வியாக்கியானங்களும் இங்கு சொல்லப்படுகின்றன. அதிலும் குறிப்பாக, இன்று புதைகுழிகளில் இருக்கக்கூடிய தமிழீழ விடுதலைப் புலிகளைக்கூட மீட்டெடுத்து, இந்தச் சட்டத்தை நீடிக்கவேண்டிய தேவை அரசாங்கத்துக்கு இருக்கின்றது. உண்மையில் அரசாங்கத்துக்கு இந்தச் சட்டத்தை நீடிப்பதற்கான காரணங்கள் வேறுள்ளன. அதாவது, இந்த அவசரகாலச் சட்டம் நீக்கப்படுமாக இருந்தால், இந்த நாட்டிலே மக்கள் புரட்சி அல்லது போராட்டம் ஏற்படக்கூடிய ஒரு சூழ்நிலை உருவாகலாம்; ஏனெனில் அந்தப் போராட்டங்களுக்குரிய காரணங்களாகப் பொருட்களின் விலைவாசி ஏற்றம், வேலையில்லாப் பிரச்சினை உட்பட பல பிரச்சினைகள் காணப்படுகின்றன. எனவே, அவசரகாலச்சட்டம் நீக்கப்பட்டால் மக்கள் வீதிக்கு இறங்கிப் போராடக்கூடிய ஒரு நிலைவரம் உருவாகி, இந்த அரசாங்கமானது ஆறு மாதங்களுக்குமேல் தொடர்ந்து ஆட்சியை நீடிக்க முடியாமல்போகும் என்பதுதான் உண்மை.

இங்கு எனக்கு முன்பு உரையாற்றிய EPDP கட்சியைச் சேர்ந்த கௌரவ பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு சந்திரகுமார் அவர்கள், வவுனியா நகர சபையில் தமிழ் தேசியக் கூட்டமைப்பு உறுப்பினர்களால் ஏற்பட்டிருக்கின்ற பிரச்சினைகள் தொடர்பாக நடவடிக்கை எடுக்கவேண்டும் என்று குறிப்பிட்டார். அங்கு ஏற்பட்டிருக்கின்ற நிலைவரம் தொடர்பாக நான் என்னுடைய கருத்தைத் தெரிவிக்கவிருக்கின்றேன். அதற்கு முன்பு யாழ்ப்பாண மாநகர சபையில் ஏற்பட்டிருக்கின்ற ஊழல், மோசடிகள் தொடர்பான பல பிரச்சினைகளுக்கு இன்னும் தீர்வு காணப்படவில்லை. அதுவும் EPDPயின் ஆளுகைக்குட்பட்ட மாநகர சபையில், முதல்வரின் தலைமையில் ஒரே கட்சியில் போட்டியிட்ட EPDPயின் சில உறுப்பினர்கள் ஒரு பக்கமும் அதேகட்சியின் இன்னும் சில உறுப்பினர்கள் மறுபக்கமும் இருக்கக்கூடிய சூழ்நிலையில் அங்கு ஊழல், மோசடிக்கு எதிராகக் குரலெழுப்பப்பட்டுள்ளதன் பின்னணியில் பாரிய பிரச்சினைகள் ஏற்பட்டிருக்கின்றன. ஆகவே அந்த நிலைமையையும் கவனத்தில் கொள்ள வேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன். மேலும், யாழ் மாநகர சபையில் இடம்பெற்றுள்ள ஊழல், மோசடியில் அரசாங்கத்தைச் சார்ந்துள்ள கட்சியைச் சேர்ந்த மாநகர முதல்வர் சம்பந்தப்பட்டிருக்கின்றார். அதேபோன்று வவுனியாவில் ஏற்பட்டுள்ள பிரச்சினைகளுடன் அங்கு அரசாங்கத்தினுடைய வலது கையாகச் செயற்படுகின்ற ஓர் அதிகாரி - பிராந்திய உள்ளூராட்சி உதவி ஆணையாளர் - சம்பந்தப்பட்டிருக்கிறார். அவரின் தலைமையிலே பல ஊழல், மோசடிகள் இடம்பெற்றிருக்கின்றன. இவ்வாறான ஊழல், மோசடிகளை வெளிக்கொண்டு வந்துள்ள எமது உறுப்பினர்களுக்கு எதிரான போராட்டத்தில் ஈடுபடுமாறு அந்த நகர சபை ஊழியர்களைத் தூண்டிவிட்டதும் அவரே. ஆகவே இத்தகைய நிலைமையை எமது மக்களுக்கும் இச்சபைக்கும் தெரியப்படுத்த வேண்டியது என்னுடைய பொறுப்பும் கடமையுமாக இருக்கின்றது.

கடந்த 28.05.2011ஆந் திகதியன்று நகர சபைச் செயலாளர் திரு. வசந்தன் அவர்களால் நகர சபைக்கு வெளியிலே வேப்பங்குளம் என்னுமிடத்தில் ஒழுங்கமைக்கப்பட்டுள்ள பிளாஸ்ரிக் கழிவுகளை மீள்சுழற்சி செய்வதற்கான இயந்திரங்களை நிர்மாணிக்கும் ஆரம்ப நிகழ்வில் செயலாளருக்கும் நகர சபை உறுப்பினர் எஸ்.எஸ். சுரேந்திரன் அவர்களுக்கும் இடையில், உறுப்பினர்களுக்கு முக்கியத்துவம் வழங்கப்படாமை சம்பந்தமான சர்ச்சை எழுந்துள்ளது. இந்தச் சர்ச்சையைத் தொடர்ந்து நகர சபை உத்தியோகத்தர்களும் சிற்றூழியர்களும் 03.05.2011ஆம் திகதியிலிருந்து பணிப்புறக்கணிப்பில் ஈடுபட்டுள்ளதுடன் நகர சபை நுழைவாயிலும் பூட்டப்பட்டுள்ளது. மேலும், நகரின் மையத்தில் அமைந்துள்ள பொது மலசலகூடங்கள், குளியலறைகள் என்பனவும் பாவனைக்குத் தடைசெய்யப்பட்டுள்ளதுடன், பொது நூல் நிலையமும் பூட்டப்பட்டுள்ளது. நகரத்திலுள்ள குப்பைகூளங்கள் அகற்றப்படாமையினால் வர்த்தக நிலையங்களின் வாயில்களில் அசுத்தங்கள் நிறைந்து துர்நாற்றம் வீசுகிறது. இதன் பின்னணியில் உள்ளூராட்சி நிர்வாகத்தை நெறிப்படுத்துகின்ற பிராந்திய உள்ளூராட்சி உதவி ஆணையாளர் அவர்கள் செயற்படுவதனைக் காணக்கூடியதாக உள்ளது. இவரது தூண்டுதலின்பேரில் ஒரு சில ஊழியர்கள் வர்த்தகர்களிடம் கடைகளைப் பூட்டித் தமக்கு ஆதரவு வழங்குமாறு வற்புறுத்துகின்றனர். இந்தச் சம்பவம் தொடர்பில் நகரசபை உறுப்பினர் எஸ்.எஸ்.சுரேந்திரன் தவறிழைத்திருக்கும்பட்சத்தில் கட்சி அதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ளும். அவர்களுக்கு எமது கட்சியின்மீது நம்பிக்கையில்லாவிடில் காவல்துறையை அல்லது நீதிமன்றத்தை நாடியிருக்க வேண்டும். அதனைவிடுத்து, ஒரு சில அதிகாரிகள் அதிகாரத்தைத் தமது கையில் எடுத்துச் செயற்படுவதானது மக்களுக்குச் செய்யும் துரோகமாகும். ஏற் கெனவே இருந்த பிரச்சினைகளுக்கு நகர சபை மற்றும் உள்ளூராட்சி அதிகாரசபை அலுவலகத்தினால் எந்தவிதமான தீர்வும் எட்டப்படாத நிலையில், குறித்த சம்பவம் இன்று விஸ்வரூபம் எடுத்துள்ளது. அதிலும் முக்கியமாக வவுனியா நகர சபைக்கு அதிகளவு வருமானத்தை ஈட்டிக்கொடுத்து வந்த வவுனியா சந்தைச் சுற்றுவட்டத்தில் அமைந்துள்ள ஆட்டிறைச்சிக்கடை, மாட்டிறைச்சிக் கடை என்பன எவ்வித கேள்விப்பத்திரமும் கோரப்படாமல் 2009ஆம் ஆண்டிலிருந்து இன்றுவரை தனிநபர் ஒருவருக்கு மிகக் குறைந்தளவு தொகைக்குக் குத்தகைக்கு விடப்பட்டுள்ளது. இதனால் நகர சபைக்கு இலட்சக்கணக்கான ரூபாய் வருமான இழப்பு ஏற்பட்டுள்ளமை தெரியவந்துள்ளது. இதேவேளையில் குருமண்காட்டுச் சந்தையில் அமைந்துள்ள மாட்டிறைச்சிக்கடை பகிரங்கக் கேள்வியின்மூலம் 29 இலட்சம் ரூபாய் வருடாந்த குத்தகைக்குக் கொடுக்கப்பட்டுள்ளது. இதே போன்றே பூந்தோட்டச் சந்தையில் அமைந்துள்ள மாட்டிறைச்சிக்கடை பகிரங்க கேள்விப்பத்திரத்தின்மூலம் 19 இலட்சம் ரூபாய் வருடாந்த குத்தகைக்கு விடப்பட்டுள்ளது. மேற்படி இரண்டு நடவடிக்கைகளினாலும் வவுனியா சந்தையிலிருந்து நகர சபைக்கு முன்னரைவிட 3-4 மடங்கு அதிகமான வருமானம் கிடைக்கும்.

நான் முன்னர் குறிப்பிட்டதுபோல், அங்கு ஏற்கெனவே தீர்க்கப்படாதுள்ள சில பிரச்சினைகளை இங்கு குறிப்பிட விரும்புகின்றேன். அதாவது, டெங்கு ஒழிப்பு செயற்றிட்டத்தின்கீழ் மோசடிகள் இடம்பெற்றுள்ளதாகத் தெரியவருகிறது. ஆளுநரினால் இச்செயற்றிட்டத்துக்கென நகர சபைக்கு எண்பத்திரண்டு இலட்சம் ரூபாய் நிதி வழங்கப்பட்டுள்ளது. ஆனால், பணம் வழங்கப்பட்டு பதினைந்து மாதங்கள் கடந்துள்ளபொழுதிலும் இன்றுவரையில் அது சம்பந்தமான வரவு செலவுக் கணக்குகளோ அல்லது மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளின் விபரங்களோ சபைக்கு அறிவிக்கப்படவில்லை.

அவ்வாறே, கோவிற்குளம் பாலர் பாடசாலைக் கட்டிடம் கட்டி முடிக்கப்பட்டதாகக் கூறி, சபையில் பணக் கொடுப்பனவுக்கான அனுமதி பெறப்பட்டு, எவ்.ஜி.வி. என்னும் ஒப்பந்தக்காரருக்கு 1,77,180 ரூபாய் 66 சதம் வழங்கப்பட்டுள்ளதாகத் தெரியவருகிறது. ஆனால், குறிப்பிடப்பட்ட இடத்தில் பாலர் பாடசாலைக் கட்டிடம் எதுவும் அமைக்கப்படவில்லை என்பது கவனிக்கத்தக்கது.

வட மாகாண ஆளுநரினால் வீதிகளில் மின்விளக்குப் பொருத்துவதற்கென 5.5 மில்லியன் ரூபாய் வழங்கப்பட்டது. இதற்கான கணக்கறிக்கை சபையில் சமர்ப்பிக்கப்படவில்லை. வேலை முன்னேற்றம் தொடர்பாகவும் தரவு இல்லை.

வவுனியா குளத்தினை அழகுபடுத்துவதற்காக அரசாங்க அதிபரினால் 75 இலட்சம் ரூபாய் வழங்கப்பட்டது. குளம் அழகு படுத்தப்படவுமில்லை; அதற்கான கணக்கறிக்கை சபையில் சமர்ப்பிக்கப்படவுமில்லை.

இவ்விடயங்களை அம்பலப்படுத்தி, நீதியான தீர்வைப் பெற்றுக்கொள்வதற்காகவும் நகர சபையின் வளர்ச்சிக்காகவு மெனச் சபையின் ஏனைய ஏழு அங்கத்தவர்களுடன் திரு. எஸ்.எஸ். சுரேந்திரன் ஒன்றாக செயற்பட்டதனால்தான் சில உயரதிகாரிகள் தங்களது அதிகாரங்களைப் பயன்படுத்தி, உண்மையை விளங்கிக் கொண்ட நேர்மையான உத்தியோகத்தர்களையும் ஊழியர் களையும் தங்களின் பிடியில் வைத்துக்கொண்டு, அவருக் கெதிராகப் பணிப்புறக்கணிப்பினை மேற்கொள்ளுமாறு அவர்களைத் தூண்டிவிட்டுள்ளனர். இதில் பிராந்திய உள்ளூராட்சி உதவி ஆணையாளரின் பங்கு முக்கியமானது. கடந்த 3 தினங்களாக நகர சபையில் இடம்பெற்ற பணிப்புறக்கணிப்புக்கு இந்த உதவி ஆணையாளர் பின்னணியிலுள்ளார். ஆகவே, ஊழியர்களைத் தூண்டிவிடும் குறிப்பிட்ட உள்ளூராட்சி ஆணையாளரின் செயற்பாட்டைத் தடுத்து நிறுத்தி, அங்கு இடம்பெற்ற ஊழல், மோசடிகளை விசாரிப்பதற்கான விசாரணைக் குழுவை நியமித்து, இது தொடர்பான நிலைமையை மக்களுக்குத் தெளிவுபடுத்துமாறு இந்தச் சபையில் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், இந்த அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தி ஒருசில அமைச்சர்களும் அதிகாரிகளும் மக்கள் விரோத செயற்பாடுகளில் ஈடுபடுகின்றார்கள்; அவர்கள் தங்களுடைய கையிலே அதிகாரத்தை எடுத்திருக்கிறார்கள். யாழ் மாநகர சபையிலும் ஆளுங்கட்சியைச் சேர்ந்தவர்கள்தாம் இத்தகைய ஊழல், மோசடி களில் ஈடுபட்டிருக்கிறார்கள். வவுனியாவை எடுத்துக் கொண்டா லும் அரசாங்கத்துக்கு மிகவும் வேண்டப்பட்ட ஓர் அதிகாரிதான் ஊழல், மோசடிகளுக்குப் பின்னால் இருக்கின்றார்; பொலிஸ் மற்றும் நீதிமன்றம் இருக்கத்தக்கதாக சட்டத்தைத் தம்முடைய கையிலே எடுத்து வவுனியா நகரமே ஸ்தம்பிக்கின்ற அளவுக்கு அடாவடித்தனமாகச் செயற்படுகின்றனர். ஆகவே, இத்தகைய செயற்பாட்டை உடனடியாக நிறுத்துவதற்கு இந்தச் சபை நடவடிக்கையெடுக்க வேண்டுமென்று இந்த நேரத்திலே கேட்டுக் கொள்கின்றேன்.

அதேநேரத்திலே, வன்னி மாவட்டத்திலே ஆளுங்கட்சியின் இன்னொரு அமைச்சர் அங்கிருக்கின்ற உயரதிகாரிகளைத் தன்னுடைய இஷ்டம்போல் பழிவாங்குகின்ற வேலைகளில் ஈடுபட்டிருக்கின்றார். குறிப்பாக, மன்னார் அரசாங்க அதிபர் அந்த மாவட்டத்தைவிட்டு வெளியேற்றப்பட்டிருக்கிறார். அதேபோல், இவரால் பாதிக்கப்பட்ட மடு வலயத்தினுடைய கல்விப் பணிப்பாளர் ஒருவரும் அந்த மாவட்டத்தைவிட்டு வெளியேறி யிருக்கிறார். மன்னார் பிரதேச செயலாளர் ஒருவர்கூட இவருடைய அடியாட்களால் தாக்கப்பட்டிருக்கிறார். தாக்கியவர்களைப் பொலிசார் கைது செய்த பிற்பாடு இந்த அமைச்சர் பொலிஸ் நிலையத்துக்குப் போய் அவர்களை வெளியே கொண்டு வந்திருக்கிறார். மேலும் மாந்தை மேற்கு மற்றும் முசலியிலுள்ள தற்போதைய பிரதேச செயலாளர்களை இடமாற்றம் செய்வதற் கான முயற்சிகளில் குறித்த அமைச்சர் ஈடுபட்டிருப்பதாக நாங்கள் அறிகின்றோம். அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தி அமைச்சர் களும் ஒருசில அதிகாரிகளும் இவ்வாறான மக்கள் விரோதச் செயல்களில் தொடர்ந்தும் ஈடுபட்டுக்கொண்டிருக் கிறார்கள். ஆகவே, இந்த நிலைவரத்தை மாற்ற வேண்டும்.

தற்சமயம் ஐக்கிய நாடுகள் செயலாளர் நாயகத்தின் நிபுணர் குழுவினால் ஓர் அறிக்கை சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. எங்களைப் பொறுத்தவரை நாங்கள் அந்த அறிக்கையை மிகவும் வரவேற்கின்றோம். இந்த அறிக்கையானது வெறுமனே ஐக்கிய நாடுகள் சபையின் ஓர் அறிக்கையாக இருக்கக்கூடாது. கடந்த 60 வருட காலமாக இந்த நாட்டிலே தமிழ் மக்களுக்கு இழைக்கப் பட்டிருக்கின்ற அநீதிகள், கொடுமைகள், மனித உரிமை மீறல்கள் போன்ற பல்வேறுபட்ட சம்பவங்களுக்கு இந்த அறிக்கை சான்றாக இருப்பது எங்களுக்கு ஓரளவு ஆறுதலைத் தருகின்றது. இருந்தாலும் கூட, நிரந்தர சமாதானத்தையும் தீர்வையும் நாங்கள் எட்ட வேண்டும். ஐக்கிய நாடுகள் சபையினுடைய இந்த அறிக்கை வெளிவருவதற்குப் பல்லாயிரக்கணக்கான தமிழ் மக்களின் உயிர்த் தியாகமும் ஒரு காரணமாக இருக்கின்றது. போரின்போது பல்லாயிரக்கணக்கானவர்கள் அங்கவீனர்களாக்கப்பட்டிருக் கிறார்கள்; கோடிக்கணக்கான பெறுமதியுடைய அவர்களுடைய சொத்துக்கள் அழிக்கப்பட்டிருக்கின்றன. முள்ளிவாய்க்காலில் தமிழ் மக்கள் 'ஐயோ' என்று கதறிய மரண ஓலம்தான் இன்றைக்கு ஐக்கிய நாடுகள் சபையினுடைய அறிக்கையாக வெளிவந்திருக் கின்றது. ஆகவே, இந்த அறிக்கைக்கு எதிராக அல்லது ஐக்கிய நாடுகள் சபைக்கு எதிராக வெறுமனே கையெழுத்து வாங்குவத னூடாகவோ, ஆர்ப்பாட்டம் செய்வதனூடாகவோ இந்தப் பிரச்சினைக்குத் தீர்வு காண முடியாது. இந்த அரசாங்கமானது, கடந்த காலங்களில் விட்ட தவறுகளைத் திருத்திக்கொண்டு, எதிர்காலத்தில் இந்த நாட்டிலுள்ள சிங்கள மக்களும் தமிழ் மக்களும் ஒற்றுமையாக வாழ்வதற்கான ஒரு சூழ்நிலையை ஏற்படுத்த வேண்டும். அவ்வாறு ஏற்படுத்துவதினூடாகத்தான் இந்த நாட்டிலே எல்லோரும் ஒற்றுமையாக வாழ முடியும். அதனைவிடுத்து, நீங்கள் மீண்டும் தமிழீழ விடுதலைப் புலிகள் இருக்கின்றார்கள்;

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**

(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(Mr. Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு ஒதுக்கியுள்ள நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**

(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)

(The Hon. Sivasakthi Ananthan)

அவர்களுடைய ஆதரவாளர்கள் இருக்கின்றார்கள்; அவர்க ளுக்கு எதிராக நடவடிக்கை எடுக்கவேண்டும் என்று வரிந்து கட்டிக் கொண்டிருந்தால் எதுவுமே நடக்காது. உண்மையும் தருமமும் என்றைக்கும் வெல்லும். தமிழ் மக்கள் வடித்த கண்ணீர் மற்றும் அவர்கள் சிந்திய இரத்தம் காரணமாகத்தான் இன்று ஐ.நா. சபையின் இவ்வாறானதோர் அறிக்கை வெளிவந்திருக்கின்றது. எனவே, அந்த அறிக்கையை நாங்கள் வரவேற்கின்றோம் என்று கூறி, இப்பொழுதாவது தமிழ் மக்களின் பிரச்சினைகளுக்கான ஒரு தீர்வைப் பெற்றுத் தாருங்கள்! என்று கேட்டு, விடைபெறு கின்றேன். நன்றி.

[අ. භා. 4.10]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හදිසි නීතිය තවත් මසකින් දීර්ඝ කිරීමේ යෝජනාව සාකච්ඡා කරන මේ අවස්ථාවේ මේ ගරු සභාවේදී විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් සඳහන් කළ කාරණයක් තමයි, කාරණා කිහිපයක් පෙන්වලා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා රජය හදිසි නීතිය පවත්වාගෙන යනවාය කියන එක. මම හිතන්නේ අපට මතක් කර ගන්න සිද්ධ වෙනවා ලෝකයේ ඕනෑම රටක ත්‍රස්තවාදයක් තිබුණු හැම අවස්ථාවකදීම ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න ලොකු සටනක් කරන්න සිද්ධ වුණාය කියලා. ඒ නිසා මේ හදිසි නීතියේ ඉතිහාසය අරගෙන බැලුවාම ඒ ඉතිහාසය තුළ මේ රටේ ජනතාවට මොන තරම් පීඩනයක් ඒ හදිසි නීතිය තුළ විඳින්නට සිදු වුණාද කියන එක අපි සියලු දෙනාටම අමතක කරන්න බැහැ. නමුත් ක්‍රමක්‍රමයෙන් අරගෙන බැලුවාම මොකක්ද පෙනෙන්නේ?

අද හදිසි නීතිය පිළිබඳව විවාද කරන මේ අවස්ථාව වන විට මේ හදිසි නීතිය තුළින් සාමාන්‍ය ජනතාවට පීඩනයක් තිබෙනවාද? අපි කියනවා හදිසි නීතියේ ඉතිරි කොටසත් ඉවත් කරන්න අවශ්‍ය කටයුතු රජය විසින් කරනවා කියලා. නමුත් අද ක්‍රියාත්මක වන, මේ වන විට ක්‍රියාත්මක වන, දශක තුනක් තිස්සේ මේ රටේ තිබුණු හදිසි නීතියත්, අද ක්‍රියාත්මක වන හදිසි නීතියත් තුළ මේ රටේ ජනතාවට එයින් පීඩනයක් තිබෙනවාද? අද මේ රටේ ජනතාවට රටේ ඕනෑම තැනක නිදහසේ ගත කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. මැයි දින පෙළපාළියට උතුරේ ඉඳලා, නැඟෙනහිර ඉඳලා තුන් හාරදහසක් ජනතාවට කොළඹට ඇවිල්ලා නිදහසේ තමන්ට මැයි දිනය සමරන්න පුළුවන් නම්, වතුකරයේ ජනතාවට ඒ මැයි දිනය නිදහසේ සමරන්න පුළුවන් නම්, දකුණු ප්‍රදේශයෙන් උතුරට ගිහිල්ලා මිනිසුන්ට නිදහසේ උතුරේ ඇවිදින්න පුළුවන් නම්, උතුරේ අයට දකුණට ඇවිල්ලා ඇවිදින්න පුළුවන් නම් මේ හදිසි නීතිය තුළ මොකක්ද තිබෙන පීඩනය? නමුත් මා අදහස් කරන්නේ කියන්න, ඇයි මේ රජය තවමත් පොඩි හදිසි නීතියක් තියා ගෙන කටයුතු කිරීමේ ඇති අවශ්‍යතාව කියන එකයි. මා හිතන්නේ ඒක නොදැන නොවෙයි සමහර අය කථා කළේ. අපි කල්පනා කරන්න ඕනෑ, පසු ගිය වකවානුව ඇතුළත අපට මේ හදිසි නීතිය ක්‍රියාත්මක කරන්න සිද්ධ වුණේ ඇයි කියලා. පසු ගිය මාස කිහිපය ඇතුළත උතුරේ අත් අඩංගුවට ගත් ත්‍රස්තවාදීන් විසින් ලබා දුන් තොරතුරු අනුව අත් අඩංගුවට ගැනීම්, සෝදිසි කිරීම් තව දුරටත් මේ රටේ සිද්ධ වෙමින් පවතිනවා. ඒක අපි නැහැයි කියන්නේ නැහැ. බිම් බෝම්බ ඉවත් කිරීම, ඒ වාගේම සමහර අවස්ථාවලදී ලැබෙන තොරතුරු අනුව අවි ආයුධ සොයා ගැනීම් නැඟෙනහිර ප්‍රදේශයේ හා උතුරු ප්‍රදේශයේ තවමත් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ වාගේම අපි අමතක කළ යුතු නැහැ, ත්‍රස්තවාදී ක්‍රියාවලට තවමත් උදවු දෙන කොටස් ලෝකයේ විවිධ ප්‍රදේශවල, විවිධ තැන්වල සිටින බව. විශේෂයෙන්ම එල්ටීටීඊ සංවිධානයේ බුද්ධි අංශ සාමාජිකයන් මේ රටින් විදේශ රටවලට ගිහිල්ලා තවමත් ක්‍රියාත්මක වන අවස්ථා තිබෙන බව මා මතක් කළ යුතුයි. ඒ වාගේම මේ රටේ සිටින අභිංසක ද්‍රවිඩ තරුණයන් සමඟ තවමත් ඒ සම්බන්ධතාවන් පවත්වාගෙන කටයුතු කරන්න උත්සාහ කරන බව අපි පසු ගිය වකවානුවල දැක්කා. ඒ වාගේම එල්ටීටීඊයේ බුද්ධි අංශයේ හිතවාදීන් සමඟ පැවැති සම්බන්ධතා තවදුරටත් පවත්වාගෙන ගිය බවට තොරතුරු රජයේ ආරක්ෂක අංශවලට ලැබිලා තිබුණා. රුද්‍රකුමාරන්, නෙදුමාරන් ප්‍රමුඛ එල්ටීටීඊයේ විදේශ ඒජන්තකරුවන් තවමත් ඊළම් රාජ්‍යයේ සිහිනය අතහැර නැති බව අපි අමතක කරන්න නරකයි. ඒ වාගේම ලෝක ද්‍රවිඩ පෙරමුණ -GTF එක- බ්‍රිතාන්‍යයේ ද්‍රවිඩ පෙරමුණ - BTF එක- තවමත් දෙමළ ජනතාවගේ ඩයස්පෝරාවෙන් මුදල් එකතු කරන බව ඔබතුමන්ලා සියලු දෙනාම දන්නවා. ඒ මුදල් වියදම් කරන්නේ ද්‍රවිඩ ජනතාවගේ යහපතටද? ඒ මුදල් වියදම් කරන්නේ ද්‍රවිඩ ජනතාවගේ සුබසිද්ධිය සඳහාද? එහෙම නැත්නම් තවත් බලාපොරොත්තුවක් ඇතුව ඉදිරියේදී තවදුරටත් මේ ත්‍රස්තවාදය ක්‍රියාත්මක කරන්න තමන්ගේ මුදල් යොදා ගන්නවාද? ඒ මුදල්වලින් පෝෂණය වන්නේ කවුද කියන එක බොහෝ දෙනෙකුගේ හෘදය සාක්ෂිය දන්නවා. ඒ එකතු කරනු ලැබූ කෝටි සංඛ්‍යාත මුදල්, පසු ගිය වකවානුවල යුද්ධය කාලයේ එකතු කළ කෝටි සංඛ්‍යාත මුදල් කොහේටද ගියේ? ඒවා ද්‍රවිඩ ජනතාවගේ යහපත වෙනුවෙන් ගියාද? අවි ආයුධ මිලදී ගන්න, තමන්ගේ සහෝදර ද්‍රවිඩ ජනතාව ඝාතනය කරන්න, ඒ වාගේම සිංහල ජනතාව ඝාතනය කරන්න, මේ වගේ අහිංසක මිනිසුන්ගේ ජීවිත නාස්ති කරන්න ඒ මුදල් යොදවපු ආකාරය අපි දන්නවා. ඒ නිසා නිකම්ම නිකම් ත්‍රස්තවාදයක් නොවෙයි තිබුණේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් තවමත් රජයට යම් කිසි යුතුකමක් තිබෙනවා. මේ රටේ නිදහස ලබා ගත්තේ සිංහල ජනතාව විතරක් නොවෙයි. මේ රටේ නිදහස ලබා ගත්තේ ද්‍රවිඩ, මුස්ලිම් ඇතුළු මේ රටේ සියලුම ජාතීන්. ඒ නිසා අපි සියලුම ජාතීන් මේ රටේ නිදහස ලබා ගත්ත ජාතියක් හැටියට එකට හිටපු බව අපි දන්නවා. නමුත් රජයක යුතුකමක් තමයි ඒ සියලුම ජනතාවගේ ආරක්ෂාව සලසා දීම. ඇයි, රජය යුද්ධ කළේ? රජය යුද්ධය කරලා, මානුෂික මෙහෙයුම කරලා මේ නිදහස ගත්තේ ද්‍රවිඩ ජනතාවට විමුක්තිය ලබා දීමේ ක්‍රියාදාමයේ එක අංශයක් ලෙසයි. ඒක සිංහල ජනතාවට විතරක් ලබා දුන් දෙයක් නොවෙයි. සිංහල ජනතාව, මුස්ලිම් ජනතාව වාගේම ද්‍රවිඩ ජනතාවගෙන් විශාල පිරිසක් මේකෙන් පීඩනයට පත් වුණා. ද්‍රවිඩ ජනතාව තමයි වඩාත්ම පීඩනයට පත් වුණේ. අද ගරු සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා ද්‍රවිඩ ජනතාවගේ ජීවිත, දේපොළ විශාල ප්‍රමාණයක් විනාශ වුණාය කියලා. ඒකට පළි මේ රජයද? රජය විතරක්ද? අපි අපේ හෘද සාක්ෂියෙන් අහමු. එවැනි තත්ත්වයකට මේ අවි ආයුධ පාවිච්චි කරන්න රජයේ ආරක්ෂක හමුදාවට සිදු වුණේ ඇයි? ඒ පැත්තෙන් ආපු ත්‍රස්තවාදය නිසායි. ත්‍රස්තවාදය ඒකේ වගකීම භාර ගන්න ඕනෑ. විශාල ප්‍රමාණයක් ජීවිත විනාශ වුණා නම්, ඒ දේපොළ විනාශ වුණා නම් ඒ සියලු දේවල් විනාශ වීමේ වග කීමෙන් වැඩිපුර කොටසක් ත්‍රස්තවාදය භාර ගන්න ඕනෑ. ත්‍රස්තවාදයක් තිබුණේ නැත්නම් එවැනි තත්ත්වයක් රටේ ඇති වෙන්නේ නැහැ. ඒ ත්‍රස්තවාදය මර්දනය කරන කොට අද ලෝකයේ හුඟක් රටවලට අමතක වෙලා තිබෙනවා, මේ රටේ තිබුණු ත්‍රස්තවාදය ලෝකයේ කිසිම තැනක තිබුණේ නැහැ කියන එක. අද පාකිස්තානයේ අභ්‍යන්තරයට ගිහිල්ලා බින් ලාඩන්ව ඝාතනය කරන්න පුළුවන්. ඒකට නීතියක් නැහැ. අප්‍රේල් මාසයේ 25 නැත්නම් 29 දින ඔබාමා ජනාධිපතිතුමා අත්සන් කළේ බින් ලාඩන්ව ඝාතනය කරන්නයි. ඒ අත්සන් කරන කොට ලිපිගොනුව නීති පද්ධතියට ඇතුළත් කරගෙන අත්සන් කළා. අත්සන් කරලා රටක අභ්‍යන්තරයට ගිහිල්ලා ගැහුවා. නමුත් මෙහේ එහෙම දෙයක් නොවෙයි සිද්ධ වුණේ. අපේ රටේ අභ්‍යන්තරයේ එකට ඉඳපු ජාතීන් දෙකක සහෝදර තරුණ පිරිසක් මේ සටනට ඉදිරිපත් වුණේ. ඒකෙදී අපට වග කීමක් තිබුණා සාමාන්‍ය ද්‍රවිඩ ජනතාවට හානියක් නොවන්න මේක මර්දනය කරන්න. ඒකටයි පසු ගිය වකවානුව ඇතුළත රජය උත්සාහ කළේ. ඒ උත්සාහයේදී තමයි අපි පුළුවන් තරම් මහන්සි ගත්තේ රජයක් හැටියට සාමාන්‍ය ද්‍රවිඩ ජනතාව මේ පීඩනයට ලක් නොවන ආකාරයෙන් කටයුතු කරන්න. ඒ පීඩනයට ද්‍රවිඩ ජනතාව ලක් වුණා නම් ඒකේ වගකීම රජයට පමණක් නොවෙයි. ඒකේ වග කීමෙන් වැඩි කොටසක් ත්‍රස්තවාදය මෙහෙයවූ ත්‍රස්තවාදී සංවිධාන භාර ගන්න ඕනෑ.

අද දෙමළ ජාතික සන්ධානය මේ වන විට රජයත් එක්ක සාකච්ඡා කරනවා. අද ඒ අයට හොඳම අවස්ථාව ඇවිල්ලායි තිබෙන්නේ. අද ද්‍රවිඩ ජනතාවට සේවය කරන්න තිබෙන්නේ රජයත් එක්ක එකතු වෙලායි. වෙන විකල්පයක් නැහැ. ප්‍රධාන ද්‍රවිඩ පක්ෂයක් හැටියට, අද මේ පාර්ලිමේන්තුවේ වැඩි බලයක්

තිබෙන සන්ධානයක් හැටියට, ද්‍රවිඩ ජනතාව නියෝජනය කරන එක කොටසක් හැටියට තමුන්නාන්සේලාට විශාල වග කීමක් තිබෙනවා අවුරුදු 30කට වැඩි කාලයක් ද්‍රවිඩ ජනතාවට නොලැබුණු වරප්‍රසාද ලබා දීමට කටයුතු කරන්න. ඒ වාගේම මේ රජයත් එක්ක එකතු වෙලා ඒ අයගේ දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු ප්‍රශ්න ටික විසඳන්න. රජයේ උදවු අරගෙන ඒ ක්‍රියාදාමය කරන්න තමුන්නාන්සේලාට විශාල වග කීමක් තිබෙනවා. ඒ වාගේම පසු ගිය වකවානුවල ද්‍රවිඩ ජනතාවට ගැටලු තිබුණු බව අපි කොයි වෙලාවකවත් අමතක කළේ නැහැ. හැබැයි අපි මතක් කරන්න ඕනෑ, යුද්ධය අවසන් වෙලා මේ වන කොට අපි දෙලක්ෂ විසි අටදහස් දෙසිය හැටහතරක් උතුරේ පදිංචි කර තිබෙන බව. දැනට පදිංචි නොකර තිබෙන එල්ටීටීඊ සංවිධානයේ සාමාජිකයින් හයදහස් පන්සිය තිහක් පුනරුත්ථාපනය කරලා තිබෙනවා. ඒ වාගේම ඒ ගොල්ලන් ආර්ථිකයේ කොටස්කරුවන් බවට පත් කරගෙන තිබෙනවා. අවතැන් වූවන්ගෙන් විසිදහස් හත්සිය හැටහයක් තවමත් නැවත පදිංචි කරලා නැහැ. විසිදහස් හත්සිය හැටහයක් නැවත පදිංචි කරන්න බැහැ. බිම් බෝම්බ බාධා තිබෙනවා. නොයෙකුත් ගැටලු තිබෙනවා. ඒ විසිදහස් හත්සිය හැටහයෙනුත් අද වන කොට -අද 05 වැනි දා- එකොළොස්දහස් නවසිය තිහක් ඒ තමන්ගේ කඳවුරුවලින් කෘෂිකාර්මික කටයුතු සහ අනෙක් කටයුතුවලට පිට වෙලා ගිහිල්ලා ආපසු එනවා, මධ්‍යස්ථානවලට. අපට පදිංචි කරන්න බැරි වුණේ විසිදහස් හත්සිය හැටහයයි. එයින් යාපනය දිස්ත්‍රික්කයේ කොඩිකාමම් හා රාමාවිල් මධ්‍යස්ථානවල ඉන්නවා එක්දහස් එකසිය හැටහයක්. ඒ වාගේම මුත්තූර්වල දෙදහස් හයසිය අනූ අටක් ඉන්නවා. වන්නි ආනන්දපුරම් හා කදිරගාමන්පුරන්වල මධ්‍යස්ථානවල දහසයදහස් නවසිය දෙකක් ඉන්නවා. නමුත් කෙටි කාලයක් තුළ දෙලක්ෂ හැට අටදහසක් පදිංචි කරවන්න මේ ආණ්ඩුවට පුළුවන්කමක් ලැබිලා තිබෙනවා, පසු ගිය වකවානුවල මොන තරම් ප්‍රශ්න තිබුණත්. අද ඔවුන්ගෙන් වැඩි දෙනෙක් කෘෂි කර්මාන්තයේ යෙදෙන්න උත්සාහ කරනවා.

ඒ වාගේම මේ හදිසි නීතිය ක්‍රියාත්මක වන අවස්ථාවේ කිසිදු ජන කොට්ඨාසයක් එය ක්‍රියාත්මක වන බවක් නොදන්නා තත්ත්වයකට මේ රට අපි පත් කරලා තිබෙනවා. ඒ වාගේම අපි හොඳින් අවධාරණය කරන්න ඕනෑ මේ රටේ ප්‍රභාකරන් ප්‍රධාන ත්‍රස්තවාදී නායකයා හැටියට මිය ගියත් රටට විවිධ බලවේග අදත් නොයෙක් ආකාරයෙන් ක්‍රියාත්මක වන බව. මේ බලවේගවලට උදවු දෙනවා නම් මේ රටේ පුරවැසියන් හැටියට හැම දෙනකුම තේරුම් ගත යුතු එක දෙයක් තිබෙනවා. ඒ තමයි මොන සංවිධානය වුණත්, මොන දේශපාලන පක්ෂය වුවත් විසඳුම තිබෙන්නේ රට තුළ විතරයි. රටෙන් පිට කිසිම විසඳුමක් නැහැ කියන එක. අප ඒක අමතක කරලා ක්‍රියා කළොත් මොකද වෙන්නේ? අනෙක් රටවලට කරපු දේ බලන්න. හැම රටකටම යුද ආධාර දෙනවා. යුද ආධාර දීලා මොකද කරන්නේ? ඒ රටවල නායකයන් සමාජයෙන් පිළිකුල් වන කොට, වෙනත් රටවලින් ප්‍රශ්න ඇති වන කොට, රට අභ්‍යන්තරයේ ප්‍රශ්න ඇති වන කොට ඒ උදවු කරපු කණ්ඩායමම අනෙක් පැත්ත අර ගෙන ඒ නායකයන්ට විරුද්ධව අවි ආයුධ ප්‍රහාර එල්ල කරන්න පටන් අරන් තිබෙනවා. ඒක තමයි ලෝකයේ තිබෙන ස්වභාවය. ඒ නිසා මේකට විසඳුම සොයා ගත යුත්තේ අපම මිසක් විදේශීය රටකින් උදවු අර ගෙන නොවෙයි. ඒ නිසා ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන හැම වෙලාවකම අප අනෙක් සියලු දේවල් අමතක කරන්න ඕනෑ. අප අද අපේ රටේ ප්‍රශ්නය බේරා ගෙන ඉදිරියට යන කොට රටේ ආරක්ෂාවට ජාත්‍යන්තර තර්ජනයක් නොපෙනී හෝ අපට තිබෙනවා. ඒ තර්ජනය ඇයි ආවේ කියලා කල්පනා කරන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ රජය යටතේ වෙච්ච එකම වෙනස තමයි මේ බලවේගවලට යටත් නොවුණු එක. තීන්දු ගැනීමේදී අනෙකුත් හැම අවස්ථාවකටම වඩා රටේ අනන්‍යතාව ගැන කල්පනා කරලා මේ රජය තීන්දු ගත්තා. ඒ නිසා අප කල්පනා කරන්න ඕනෑ පසු ගිය වකවානුව ගැන. අද අපට නොයෙකුත් වාර්තා ඉදිරිපත් කරනවා. දරුස්මාන් වාර්තාව වෙන්න පුළුවන්, වෙනත් වාර්තා වෙන්න පුළුවන්. නමුත් ඒ හැම එකකටම වඩා ඔවුන්ට අමතක වෙලා තිබෙනවා මෙන්න මේ කාරණය. ලෝක ආහාර සංවිධානයේ -WFO එකේ-, ලෝක සෞඛ්‍ය සංවිධානයේ -WHO එකේ-, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ -UNICEF එකේ- සාමාජිකයන්, ඒ වාගේම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ආයතනයේ, Joint UN Rapid Needs Identification Mission කියන සංවිධානයට අයත් සියලුම නියෝජිතයෝ 2008 ඔක්තෝබර් මාසයේ 17 වැනි දා උතුරේ නිරීක්ෂණ චාරිකාවක යෙදුණා. ඊට අදාළ වාර්තාවේ ඔවුන් මොකක්ද කිව්වේ. ඔවුන් මේ රජයට දුන්නා සහතිකයක්. අමතක කරන්න එපා ඒක. ඒ යුද්ධය අස්සේත් අවතැන් වූවන්ට, උතුරේ ජනතාවට ආහාර සැපයීම මේ ආණ්ඩුව සාර්ථකව කරනවා කියලා සහතිකයක් දුන්නා. හැබැයි අද වාර්තාවල ඒ එකක්වත් සඳහන් වෙලා නැහැ. ඒ අර්බුදය අස්සේ අප සාර්ථකව ඒ කටයුතු කර ගෙන යන බවට ඔවුන් එදා අපට සහතිකයක් දුන්නා. යුද්ධය පවතින ප්‍රදේශවල ජනතාවට හදිසි අවශ්‍යතාවක් ඇති වුණා නම් ඒ වෙලාවේ අප ළඟ සංචිතය වශයෙන් තිබුණා රුපියල් මිලියන 47ක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2008 ඔක්තෝබර් මුල් සතියේ යුද්ධයේ පැවැති බිහිසුණු තත්ත්වය හේතුවෙන් ලෝක ආහාර සංවිධානය උතුරට ආහාර යැවීම නතර කළා. තමුන්නාන්සේලාට ඒක මතක ඇති. ඒත් මේ ආණ්ඩුව නතර කළාද උතුරට ආහාර යැවීම? උතුරට ආහාර යැවීම මේ ආණ්ඩුව නතර කළේ නැහැ. උතුරට ආහාර යැව්වා විතරක් නොවෙයි. රුපියල් මිලියන 67ක සංචිතයක් අපි හැම තිස්සේම තියා ගත්තා. උතුරට යවපු ආහාර මලු බංකර්වල භාවිතයට ගත්තු බව මේ ආණ්ඩුව නොදැන සිටියාද? හාල් ගෝනි බංකර්වල තියා ගෙන ඒවායෙන් ආරක්ෂා වූ බව මේ ආණ්ඩුව නොදැන සිටියේ නැහැ. නමුත් ආණ්ඩුව කළේ, "මේ අපේ රටේ ජනතාව, අපට මේ සිවිල් ජනතාව ඊට වැඩිය වටිනවා" කියන එක කල්පනා කරලා කටයුතු කිරීමයි. ඒ නිසා ඒ ක්‍රියා දාමයේදී මොනම හේතුවකටවත් සිවිල් ජනතාවට හානියක් කරන්න මේ ආණ්ඩුව බලාපොරොත්තු වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මෙතැන තිබෙන්නේ වෙන කිසි දෙයක් නොවෙයි. අපට නොයෙක් උපදෙස් දුන්නු විදේශීය රටවල් තිබුණා. ඒ හැම රටකින්ම අපට උපදෙස් දුන්නා ලෝකයේ ත්‍රස්තවාදය පරාජය කරපු ආකාරය පිළිබඳව. කොහොමද ලෝකයේ රටවල් ත්‍රස්තවාදය පරාජය කළේ? රුසියාවට බැරි වුණා නම් චෙච්නියානු ගරිල්ලන්ට ගහන්න, බ්‍රිතාන්‍යයට බැරි වුණා නම් අයර්ලන්ත ගරිල්ලන් මර්දනය කරන්න, ලංකාව වාගේ පොඩි රටක් ලෝකයේ ප්‍රබලම ත්‍රස්තවාදය මර්දනය කරන්නේ කොහොමද කියලා අපෙන් ඇහුවා. ඒ වෙලාවේ අතිගරු ජනාධිපතිතුමා කිසිම දේකට සැලෙන්නේ නැතිව ඒ තීන්දුව ගත්ත නිසා ඒ තීන්දුවේ ජයග්‍රහණය අන්තිමට මේ රටේ ජනතාවට ලැබුණා. ඒ නිසා දැන් වෙනත් ක්‍රමයකින් මේ බලවේග ක්‍රියාත්මක වනවා. ඒ නිසා අපට විශේෂයෙන්ම මේ වෙලාවේ යුතුකමක් තිබෙනවා. වසර 500කට පසුව ආසියාව ලෝකයේ බලවත්ම මහාද්වීපය බවට පත් වෙලා තිබෙනවා. එහිදී ලංකාවේ ආර්ථිකය ඉදිරියට වර්ධනය වී ගෙන යනවා. ඒ ආර්ථික වර්ධන වේගයත් එක්කම අපි ස්ථාවර බවක් ලබා තිබෙනවා. මේ දරුස්මාන් කමිටු වාර්තාවේ අපේ සමාජ ආර්ථික රටාව පිළිබඳව පොඩ්ඩක්වත් සඳහන් කරලා නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Deputy Minister, please wind up now.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ලංකාවේ අනාගතය, අපි ආපු ආර්ථික ගමන පිළිබඳව සඳහන්

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

කරලා නැහැ. සඳහන් කරලා තිබෙන්නේ කාරණා කිහිපයක් පමණයි. අවුරුදු එකහමාරකට, දෙකකට පසුව උතුරේ මානව හිමිකම් ගැන කථා කරනවා. ඉරාකයේ රසායනික අවි තිබෙනවා කියලා සොයා ගෙන ගිහින් ගැහුවා. රසායනික අවි තිබුණේ නැහැ. ඒ වාගේ ක්‍රියාදාමයන් පිළිබඳව කිසිම කමිටුවක් පත් කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගඩාෆිගේ මුණුපුරන් කළ වරද මොකක්ද? ගඩාෆි වරද කරන්න ඇති. පුතා වරද කළා කියලා සිතුවත් මුණුපුරන්ගේ මානව අයිතිවාසිකම් ගැන කවුද කථා කරන්නේ? මේක අපි දිහාම බලපු කෝණයක්. මෙය ත්‍රස්තවාදය පරාජය කිරීමට ස්වාධීන, අහිංසක රටක් ගත්ත තීන්දුවකට එරෙහිව එන බලවේගයක්. ඒ නිසා අපි සියලු දෙනා ඒ බලවේගය පරාජය කරන්න එකතු විය යුතුයි කියා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 4.27]

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉතාමත්ම වැදගත් අවස්ථාවක හදිසි නීති විවාදයට සහභාගි වන්න ලැබීම ගැන මම සතුටු වනවා. අද මගේ කථාව ආරම්භ කරන්නේ ජාතික හෙළ උරුමයේ අපේ හිතවත් අමාත්‍ය පාඨලී චම්පික රණවක ඇමතිතුමා මේ සභාව අමතා මට ප්‍රථම කරන ලද කථාව ආශ්‍රිතවයි. එතුමා අද ඉතාමත්ම වැදගත් කථාවක් කළා. එතුමා රජයේ කැබිනට් ඇමතිවරයෙකු හැටියට පැහැදිලිව කිව්වා, තත්ත්වය -තරමතිරම- කිසි දෙයක් සලකන්නේ නැතිව එල්ටීටීඊ යුද අපරාධකරුවන්ට විරුද්ධව ශ්‍රී ලංකා රජය කටයුතු කළ යුතුයි කියලා. එතුමා ඒක මේ උත්තරීතර සභාවේදී පැහැදිලිව කිව්වා.

මම එතුමාට මතක් කරන්න කැමැතියි, වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ ඝාතනයෙන් පසුව එල්ටීටීඊ සංවිධානයේ නායකත්වය භාර ගත්ත නායකයා බවට පත් වුණේ කුමරන් පද්මනාදන් කියන එල්ටීටීඊ ත්‍රස්තවාදියා බව. ජාත්‍යන්තර වශයෙන් මේ කුමරන් පද්මනාදන් අවුරුදු 35ක් තිස්සේ එල්ටීටීඊ සංවිධානය පෝෂණය කරන්නට අවි ආයුධ ලබා දුන්නු හැටි, බැංකු කඩපු හැටි, මං කොල්ල කෑම් කළ හැටි පිළිබඳව අද තොරතුරු ඉදිරිපත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මම පැහැදිලිව කියනවා කුමරන් පද්මනාදන් කියන්නේ ජාත්‍යන්තර යුද අපරාධකරුවෙක් බව. එල්ටීටීඊ සංවිධානයේ වර්තමාන නායකයා, එදා එල්ටීටීඊ සංවිධානයේ ජාත්‍යන්තර නායකයා, අපේ රටේ අහිංසක සිංහල, දෙමළ, මුස්ලිම් මිනිස්සු මරන්න අවි ආයුධ ලබා දුන්නු, එල්ටීටීඊ සංවිධානය පෝෂණය කළ එල්ටීටීඊ යුද අපරාධකරුවා තමයි කුමරන් පද්මනාදන්. අද කුමරන් පද්මනාදන්ට විරුද්ධව ජාත්‍යන්තර පොලීසිය - Interpol එක - විවෘත වරෙන්තුවක් නිකුත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රසිද්ධ විවෘත වරෙන්තුව මම අද **සභාගත*** කරනවා.

මොකක්ද ඒකේ තිබෙන්නේ? ඒකේ තිබෙනවා මෙන්න මේ ආකාරයට.

I quote:

"Categories of offences: Crimes involving the use of weapons/ explosives, criminal conspiracy, terrorism".

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ඔය ලේඛනය කොහෙන්ද කියා කියන්න.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මා මේක Interpol වෙබ් අඩවියෙන් ලබා ගත්තා, ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමනි.

මේ වරෙන්තුව නිකුත් කර තිබෙන්නේ ඉන්දියාවේ චෙන්නායිවලදී. අද කුමරන් පද්මනාදන්ව ඉන්දියා රජය ඉල්ලනවා. එහෙම ඉල්ලන්නේ ඇයි? රජීව් ගාන්ධි ඝාතනය පිළිබඳව. He is implicated both directly and indirectly for several terrorist attacks in Sri Lanka. He is also wanted by India's law enforcement agencies in connection with the assassination of former Indian Prime Minister, Rajiv Gandhi in 1991, and for violation of the Terrorist Act and the Indian Explosive Act.

අද Interpol ආයතනයෙන් -ජාත්‍යන්තර පොලීසියෙන්- විවෘත වරෙන්තුවක් නිකුත් කර තිබෙන ජාත්‍යන්තර යුද අපරාධකරුවෙක් වන කුමරන් පද්මනාදන් ජාත්‍යන්තර යුද අධිකරණයකට ගෙන යන්නට එසේ නැත්නම් ඔහුට විරුද්ධව ජාත්‍යන්තර නීතිය ක්‍රියාත්මක කරන්නට ඉඩ නොදෙන්නේ ඇයි කියන එක පිළිබඳව අපිට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. අද කුමරන් පද්මනාදන්ට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැ. ඔහුට විරුද්ධව හදිසි නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැ; ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක වන්නේ නැහැ. අද ඔහු වවුනියාවට, එහෙම නැත්නම් යාපනයට යන්නේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෙලිකොප්ටරයෙන්. ඔහුගේ අනෙකුත් සගයන්ට අද ඔහු කථා කරන්නේ අපේ වීරෝදාර හමුදා නිලධාරින් ඉදිරිපිටදීයි. අද මේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ යුද අපරාධකරුවන් පිළිබඳව රජය මේ අවස්ථාවේදී අවංකව ක්‍රියා කරන්න ඕනෑ. ජාත්‍යන්තර වරෙන්තුවක් තිබෙන කුමරන් පද්මනාදන් නමැති ජාත්‍යන්තර යුද අපරාධකරුවා, එල්ටීටීඊ ත්‍රස්තවාදියා ආරක්ෂා කරන්නේ මොකද, රැක බලා ගන්නේ මොකද කියන එක පිළිබඳව අද අපිට ප්‍රශ්නයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකු හැටියට පැහැදිලිව මා එක ප්‍රතිඥාවක් දෙනවා. ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවට, ස්වෛරීභාවයට, ස්වාධීනත්වයට කිසිම ආකාරයක තර්ජනයක් වනවා නම් ඒ වෙනුවෙන් පෙනී සිටින්න, ඊට එරෙහිව පෙනී සිටින්න විරුද්ධ පක්ෂයේ ප්‍රධාන දේශපාලන පක්ෂය හැටියට එක්සත් ජාතික පක්ෂය සූදානම් බව එක්සත් ජාතික පක්ෂයේ නායක -විපක්ෂ නායක- රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී ප්‍රතිඥාවක් දුන්නා. අන්න එහෙමයි එක්සත් ජාතික පක්ෂය වග කීමෙන් යුතුව කටයුතු කරන්නේ. අපි ත්‍රස්තවාදයට සහ ත්‍රස්තවාදීන්ට විරුද්ධයි. නමුත් අපි ජාතිවාදීන් නොවෙයි. අපි ජාති හිතෙෂීන්. මේ රටේ ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් හැම ජන කොටසකටම එක හා සමාන අයිතීන්, එක හා සමාන උරුමයන්, එක හා සමාන අවස්ථාවන් තිබිය යුතු බව 1994 මේ පාර්ලිමේන්තුවට පත් වූ දා ඉඳලා එදා මෙදා තුර හැම දාම මා කථා කළා. වාසුදේව නානායක්කාර ඇමතිතුමා ඒ බව දන්නවා. හැබැයි මට කොච්චර අපහාස උපහාස කළත් නින්දා කළත්, ද්‍රෝහියා කිව්වත්, රට පාවා දෙන්නා කිව්වත් ඒ ස්ථාවරයේ මා හැම දාම හිටියා; ඉදිරියටත් ඉන්නවා කියන එක මා පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි.

අපි දැන් කථා කරමු දරුස්මාන් වාර්තාව නැත්නම් බැන් කී මූන් මහත්මයාගේ වාර්තාව පිළිබඳව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ යුදමය ක්‍රියා දාමයෙන් පසු, ඒ වකවානුවේ අවසාන කාල සීමාව තුළ සිදු වුණු යම් යම් ප්‍රශ්න පිළිබඳව එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විවිධ අදහස් උදහස් ප්‍රකාශ කර තිබුණා. යුද්ධය නිම වීමෙන් පසුව එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා අන්තර්ජාතික මානව හිමිකම් හා මානුෂික අයිතිවාසිකම් පිළිබඳ නීතිරීති උල්ලංඝනය වීම පිළිබඳව සොයා බැලීමට ක්‍රමවේදයක අවශ්‍යතාව අවධාරණය කරනු ලැබුවා. ශ්‍රී ලංකා ආණ්ඩුව ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට එකඟ වුණා. මෙන්න මේක තමයි පසු බිම. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එල්ටීටීඊ එක ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානුෂික අයිතීන් උල්ලංඝනය කළ බවට පිළිගත හැකි චෝදනා ඇති බව මහ ලේකම්වරයා විසින් පත් කළ උපදේශක කමිටුවේදී සඳහන් කර තිබෙනවා. ඒ වාගේම මානුෂික මෙහෙවරක් සිදු කළ බවට ආණ්ඩුව කළ ප්‍රකාශය මේ කමිටුව විසින් පිළිගෙන නැහැ. ඒ වාගේම ඉහත සඳහන් මූලික කරුණු සාවද්‍ය දැයි සොයා බලන්නට ශ්‍රී ලංකා ආණ්ඩුව එම වාර්තාව අභියෝගයට ලක් කර තිබෙනවා. අද ඒක තමයි සිදු වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම සඳහා රජය ගන්නා ඕනෑම අවංක, අවංක, අවංක -මම මේ "අවංක" කියන වචනය තුන් පාරක් කියනවා.- උත්සාහයන්ට එක්සත් ජාතික පක්ෂය හැටියට අපගේ පූර්ණ සහයෝගය ලබා දෙන බව මා පැහැදිලිව කියන්නට කැමැතියි. ඒ වාගේම ජාත්‍යන්තර වශයෙන් අද අප පත්ව තිබෙන්නේ එදා 1987 එක්සත් ජාතික පක්ෂ රජයේ කාල සීමාව තුළ ඉන්දියාවෙන් බලහත්කාරයෙන් ඇවිල්ලා අපට ආහාර දමනකොට අප මුහුණපෑ කනගාටුදායක සහ අවදානම්කාරී තත්ත්වයටමය කියන එකත් මා පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තිය, සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ඇතුළු ගිවිසුම් ගණනාවකට ශ්‍රී ලංකාව පසු ගිය කාලයේදී අත්සන් කර පිළිගෙන තිබෙනවා. ඒවා ආරක්ෂා කිරීම අපේ වගකීමක් සහ යුතුකමක් බවත් මේ අවස්ථාවේ මා පැහැදිලිව කියන්නට ඕනෑ. අපේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ආරක්ෂා කරන්නට විදේශ සම්බන්ධතාවලට පමණක් අද සීමා වන්නට බැහැ. විදේශ අමාත්‍යාංශ අතර කරන සාකච්ඡා පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. ඇයි, මම එහෙම කියන්නේ? අද ගෝලීය මාධ්‍ය ආවරණයක් ගැන අපට කථා කරන්න සිද්ධ වෙනවා. ඒ වාගේම අද ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානවලට බැණලා ඒවා රූකඩ කියලා පුච්චලා ආවේගශීලීව කථා කරලා මේ ප්‍රශ්නයට අපට විසඳුමක් සොයා ගන්න බැහැ. ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන වහාම මෙය සැලකිල්ලට ගත යුතුයි කියන එක මා පැහැදිලිව කියන්නට ඕනෑ. ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන විසින් කරන නිර්දේශ, කරන ප්‍රකාශන පිළිගැනීම නොවෙයි අවශ්‍ය වන්නේ. ඒවා නොසලකා හැරීම, ඒවා පිළිබඳව පහත් ලෙස කථා කිරීම නොවෙයි වැදගත් වන්නේ. මානව හිමිකම් සංවිධානවලින් ඒ කරන ප්‍රකාශන පිළිබඳව අපේ දැඩි අවධානය අප යොමු කළ යුතුව තිබෙනවා. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලය සමඟ දිගින් දිගටම සංවාදයක් ඇති කර ගන්නට වහාම ක්‍රියා කළ යුතුයි කියන එක මා පැහැදිලිව කියන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම 2010 මැයි 23 වන දින එක්සත් ජාතීන්ගේ මහ ලේකම් සහ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ නිවේදනයේ ජාත්‍යන්තර මානව හිමිකම් තත්ත්වයන්ට හා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකීම් අනුව මානව හිමිකම් ආරක්ෂා කිරීමටත්, වර්ධනය කිරීමටත් ශ්‍රී ලංකාව ඇප කැප වන බව ප්‍රකාශ කර තිබෙනවා. මෙය වැදගත් ප්‍රකාශයක්. ඒ අනුව ක්‍රියා කිරීම අපේ වග කීමක් සහ යුතුකමක් වෙනවා. ඒ වාගේම මේ වාර්තාව පිළිබඳව අප ද්වේෂයෙන් කථා කළාය කියලා, බැන් කී මූන්ගේ පඹයන් පුච්චලා බැන් කී මූන්ට විරුද්ධව උද්ඝෝෂණය කළාය කියලා බැන් කී මූන්ට විරුද්ධව ආවේගශීලීව ජාතිවාදීව කථා කළාය කියලා අපට මේ ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් ලැබෙන්නේ නැහැ. මේ පිළිබඳව බුද්ධිය පාවිච්චි කරන්නට ඕනෑ. බුද්ධිමත්ව හැසිරෙන්නට ඕනෑ. ආවේගශීලී වෙලා මේ ප්‍රශ්නය විසඳා ගන්නට පුළුවන්කමක් ලැබෙයි කියා මා හිතන්නේ නැහැ. මේ වාර්තාව සම්බන්ධයෙන් ආණ්ඩුව සමඟ සාකච්ඡා කරන බව අද ඉන්දියාව ප්‍රකාශ කර තිබෙනවා. එය ඉතාමත්ම හොඳ ප්‍රවණතාවක්. මේ වාර්තාව පිළිබඳව අනෙකුත් රාජ්‍යයන් සමඟ ශ්‍රී ලංකාවේ රජය වහාම සාකච්ඡා ආරම්භ කරන්නට ඕනෑ. අපත් එක්ක මිත්‍ර රජයන් සමඟ පමණක් නොවෙයි -චීනය, රුසියාව සමඟ පමණක් නොවෙයි- බටහිර ජාත්‍යන්තර ප්‍රජාව, එක්සත් රාජධානිය, පොදු රාජ්‍ය මණ්ඩලය සමඟ අප වහාම සාකච්ඡා ආරම්භ කරන්නට ඕනෑ. ඒක අපේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත් පිළිගන්නවා ඇති. Even to disagree, we have to agree. එකඟ නොවෙන්නත් අපි එකඟ වන්නට ඕනෑ. මෙන්න මේ බුද්ධිමත් දේශපාලන දර්ශනය අපි අනුගමනය කරන්නට ඕනෑ. එසේ නැතිව මේ පිළිබඳව ධනාත්මක විවේචන ඉදිරිපත් කරන අපට ජාති ද්‍රෝහීන්ය, රට පාවා දෙන්නන්ය කේළම්කරුවන්ය කියලා මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් නම්, විසඳෙනවා නම්, ශ්‍රී ලංකාවට සුගතියක් වෙනවා නම් කමක් නැහැ, ඒක කරන්න. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා එහෙම කරන්නේ නැහැ. එතුමා කවදාවත් එහෙම කරන්නේ නැහැ. එතුමා වැදගත් ඇමතිවරයෙක්. නමුත් එවැනි ආකාරයට හැසිරිලා මේ ප්‍රශ්නය තවත් අනා ගන්නවා; ඔඩු දුවා ගන්නවා. පිළිකාවක් වගේ මේ ප්‍රශ්නය තව දුරටත් පැතිරෙනවා.

ඒ වාගේම මම පැහැදිලිව කියන්න ඕනෑ, එක්සත් ජාතික පක්ෂයේ නායක, වර්තමාන විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා එදා 2002 දී අග්‍රාමාත්‍යවරයා හැටියට යුද අධිකරණය සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර රෝම ප්‍රඥප්තියට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ බව. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, ඒ නිසා ලංකාවේ කිසිම වීරෝදාර රණ විරුවෙක් හෝ ලංකාවේ කිසිම කෙනෙක් ජාත්‍යන්තර යුද අධිකරණයට ගෙන යන්නට හැකියාවක් ලැබෙන්නේ නැහැයි කියන එක මම පැහැදිලිව කියනවා. එයට හේතුව එදා 2002 තිබුණු රජයේ අග්‍රාමාත්‍යවරයා ලෙස රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගත් දූරදර්ශී තීන්දුවයි. ඒ නිසා තමයි "කපටි නරියා" කියලා එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමාට එල්ටීටීඊ නායකයෝ කිව්වේ. "කපටි නරියා" කිව්වා. එතුමා ඒ ජාත්‍යන්තර රෝම ප්‍රඥප්තියට අත්සන් නොකළ නිසා අද ජාත්‍යන්තර අධිකරණයට -යුද අධිකරණයට- [බාධා කිරීමක්] "කපටි නරියා" - "cunning fox" - [බාධා කිරීමක්] "cunning fox" කියලා කිව්වේ කොටි. අද කිසි කෙනකුව ජාත්‍යන්තර යුද අධිකරණයට ගෙන යන්න බැරි වන්න එකම හේතුව එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ ජාත්‍යන්තර රෝම ප්‍රඥප්තියට අත්සන් නොකිරීමය කියන එක මම පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යුද ජයග්‍රහණයෙන් පසුව ත්‍රස්තවාදය, එහෙම නැත්නම් මේ ජාතික ප්‍රශ්නය සියයට 100ක් අවසන් වුණාය කියලා අප කිසි කෙනකුට කියන්න බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාත් ද්‍රවිඩ ජාතිකයෙක්. අපි ද්‍රවිඩ ජාතික ප්‍රශ්නයට සාමකාමී දේශපාලන විසඳුමක් ලබා දිය යුතුව තිබෙනවා. අපේ රට තුළ ජීවත් වන සියලුම ජන කොටස්වලට සාධාරණය ඉටු කිරීමේ වග කිව යුතු වැඩ පිළිවෙළක් අපට ආරම්භ කරන්නට තිබුණා. දැන් අවුරුදු දෙකක් ගත වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2009 මැයි මාසයේ 18 වැනි දා සිට දැන් අවුරුදු දෙකක් ගත වෙලා තිබෙනවා. රජය ද්‍රවිඩ ජාතික සන්ධානය සමඟ සාකච්ඡා කරන බව මම පිළිගන්නවා. ඒක ඇත්ත. නමුත් අවුරුදු දෙකක් ගත වෙලා ඉවරයි. කිසිම සාධනීය වැඩ පිළිවෙළක් අපි දකින්නේ නැහැ. විපක්ෂයක් හැටියට එවැනි කිසිම සාධනීය වැඩ පිළිවෙළක් ගැන අපිට කියලාත් නැහැ, අපි දැකලාත් නැහැ. මේ ද්‍රවිඩ ජාතික සන්ධානය සමඟ සාකච්ඡා කරද්දී ඒ සඳහා වැඩසටහනක්, ඒ සඳහා කාල සීමාවක්, කාල රාමුවක් තිබෙනවාද

[ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා]

යන්න පිළිබඳවත් අද බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම ද්‍රවිඩ ජාතික සන්ධානය සමඟ සාකච්ඡා කරන ගමන්, ද්‍රවිඩ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරයකු ඝාතනය වෙන්න කටයුතු කරනවා නම්, වෙඩි තියන්න ක්‍රියා කරනවා නම් මේ දෙබිඩි පිළිවෙත මොකක්ද කියන එක පිළිබඳවත් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ද්‍රවිඩ ජාතික මන්ත්‍රීවරයා ඝාතනය කරන්න ගියේ කවුද කියන එක පිළිබඳව මම කියන්නේ නැහැ. ඒ ගැන අද බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. එය සොයා බලන එක රජයේ වග කීමක් සහ යුතුකමක් වනවා. පසු ගිය වකවානුව තුළ ද්‍රවිඩ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ටී. මහේස්වරන් මැතිතුමා, ඒ වාගේම රවිරාජ් මන්ත්‍රීතුමා, ජෝශප් පරරාජසිංහම් මන්ත්‍රීතුමා ඝාතනය වුණා. ඒ අයගේ ඝාතනය වීම් පිළිබඳව අද වන තුරු පරීක්ෂණ අවසන් වෙලා නැහැ. මේ පිළිබඳව අපි දැඩි අවධානයක් යොමු කරන්නට ඕනෑ. විශ්වාසය ගොඩ නඟන්නට නම්, විශ්වාසය පිළිබඳව අඩු තරමින් යම් ප්‍රමාණයක ක්‍රමවේදයක් තිබෙනවා නම් ඒ පිළිබඳව විමර්ශනය කළ යුතුව තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have only one more minute.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ දරුස්මාන් වාර්තාව පිළිබඳව අද රජය ගත යුතු පියවර මොනවාද කියන එක විපක්ෂය හැටියට අපි කියන්න කැමැතියි. ඔබතුමා ඒ සඳහා මට අවස්ථාවක් ලබා දෙයි කියලා මම විශ්වාස කරනවා. යුද්ධය අවසන් වීමත් සමඟ අපේ රටේ සිදු වුණාය කියන බරපතළ ප්‍රශ්න පිළිබඳව කථා කරන අවස්ථාවේ වහාම රටේ නීතිය - rule of law - ක්‍රියාත්මක විය යුතුයි කියලා මම හිතනවා. අදත් සිරගත වෙලා සිටින ද්‍රවිඩ සැකකරුවන් වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අපේ රටේ නීතිය ක්‍රියාත්මක විය යුතුයි. ඔවුන්ට දඬුවම් දෙන්න ඕනෑ නම් දඬුවම් දෙන්නට, අධිකරණ ක්‍රියා මාර්ග අනුව කටයුතු කරන්නට කඩිනම් ව්‍යාපෘතියක් ඇති කරන්නට ඕනෑ.

අපේ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා අවතැන් වූවන් පදිංචි කරවීම පිළිබඳව කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවතැන් වූවන් පදිංචි කළාට ඔවුන්ට අවශ්‍ය කරන මූලික පහසුකම් ටික ලබා දෙන්න ඕනෑ. ජලය, සෞඛ්‍ය, අධ්‍යාපනය, ජීවනෝපාය මාර්ග පිළිබඳව ක්‍රමවත් වැඩ පිළිවෙළක් තවමත් රජය ක්‍රියාත්මක කරලා නැහැ. ඒ අය අභිකුණ්ටිකයෝ වාගේ, හිඟන්නෝ වාගේ, යාචකයෝ වාගේ ජීවත් වන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අන්න ඒ නිසා -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, තමුන්නාන්සේ ඔහොම කිව්වාට - [බාධා කිරීම්] මේ පිළිබඳව විපක්ෂයේ හඬටත් කන් දෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අසත්‍ය කියන්න එපා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. (Dr.) Jayalath Jayawardana, please wind up your speech now.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
කරුණාකරලා විපක්ෂයේ අපි කියන දේවල් අහ ගෙන ඉන්න පුරුදු වෙන්න. [බාධා කිරීම්]

අන්න ඒ නිසා මම පැහැදිලිව කියනවා, මේ පිළිබඳව රජයේ අවධානය වහාම යොමු කරන්නය කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම කියනවා, ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ නැඟී සිටීමට අපේ රටට තිබෙන එකම ආයුධය "ජාතික සමඟිය" කියලා. විපක්ෂය ගෙනෙන සාධනීය විවේචන මර්දනය කරන්න, එසේ නැත්නම් ඒවා විනාශ කරන්න උත්සාහ කිරීම නොවෙයි කළ යුත්තේ. රටේ ජාතික සමඟිය ඇති කරන්න නම් ආණ්ඩුවත්, විපක්ෂයත්, සියලුම සිවිල් සංවිධානත්, ඒ වාගේම මානව හිමිකම් සංවිධානත් කියන මේ සියල්ලම දරන ස්ථාවර පිළිබඳව විමර්ශනය කරලා ගත හැකි දේ අර ගෙන, ඒ අයත් සමඟ සුහදත්වයෙන් ක්‍රියා කරලා මේ රටේ ජාතික ප්‍රශ්නයට, සිංහල, දෙමළ, මුස්ලිම් හැම ජන කොටසකටම එක රටක් තුළ ජීවත් වන්න පුළුවන් වාතාවරණය ඇති කරන ජාතික දේශපාලන විසඳුමකට අපි යා යුතුයි කියන එක නැවත වරක් ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you. The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle will speak next. Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M AZWER *took the Chair.*

[අ. භා. 4.46]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)
මූලසුන හොබ වන ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ විවාදයේදී අදහස් ප්‍රකාශ කිරීමට ලැබීම ගැන මම මුලින්ම

සන්තෝෂ වනවා. අපි දන්නවා, අවුරුදු 30ක් තිස්සේ තිබුණු මේ භයානක ත්‍රස්තවාදය අවසන් කිරීම සඳහා හදිසි නීතිය පාවිච්චි කිරීමට සිද්ධ වුණා කියලා. දැන් යුද්ධය අවසන් වෙලා අවුරුදු දෙකක් ගියා, ඇයි මේ හදිසි නීතිය තවමත් පාවිච්චි කරන්නේ කියන චෝදනාව විපක්ෂයෙන් නැගුණා. නමුත් අපි දන්නවා, යුද්ධය අවසන් වෙලා අවුරුදු දෙකක් ගියාට අවි ආයුධවලින් කරන යුද්ධය විතරයි අද අවසන් වෙලා තිබෙන්නේ කියලා. ඊළාම් සිහිනය දකින දෙමළ ඩයස්පෝරාව, ත්‍රස්තවාදයට උඩ ගෙඩි දීපු අය අළු යට ගිනි පුපුරු වාගේ තවමත් සක්‍රියව මේ රජය අස්ථාවර කිරීමට කටයුතු කරන බව අපි දන්නවා. ඒ වාගේම තමයි ත්‍රස්තවාදය නිසා මේ රටේ විශාල පිරිසක් ඝාතනය වුණා. ඔවුන් පිළිබඳ පරීක්ෂණ විධිමත්ව කිරීම සඳහා මේ හදිසි නීතිය ලිහිල් කරමින් තව දුරටත් පවත්වා ගැනීම අවශ්‍ය බව මේ අවස්ථාවේදී මා සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම විශේෂයෙන්ම අපේ රටේ ස්වෛරීභාවයට තර්ජනයක් වෙලා තිබෙන බැන් කී මූන් වාර්තාව ගැන මේ විවාදයේදී යමක් සඳහන් කරන්න ඕනෑ. මේ බැන් කී මූන් වාර්තාව ඉතාමත්ම නීති විරෝධී ආකාරයට විද්වත් කමිටුවක් කියලා පත් කරපු තිදෙනෙකු විසින් ඉදිරිපත් කරපු වාර්තාවක්. මේ සඳහා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සලයේ අනුමැතිය ලැබී තිබුණේ නැහැ. ඒ අනුමැතිය දෙන්නේ නැහැ කියන එක ප්‍රකාශ කරලා තිබුණා. ඒ වාගේම තමයි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය මේ කමිටුව පත් කරලා ශ්‍රී ලංකාවට විරුද්ධව පරීක්ෂණ පවත්වන්න කොයිම වෙලාවකවත් අනුමැතිය ලබා දුන්නේ නැහැ. ඒ වාගේම මේ කමිටුව හරහා පරීක්ෂණ පැවැත්වීම එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ දෙවැනි ව්‍යවස්ථාවට පටහැනි බව මම සඳහන් කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අදාළ ලේඛනය මා **සභාගත*** කරනවා.

අපි දන්නවා, යුගොස්ලෝවැකියාව හා එරිත්‍රියාව සම්බන්ධයෙනුත් විද්වත් මණ්ඩලයක් පත් කරන කොට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලැබුණු බව. නමුත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්තුමාගේ තනි කැමැත්ත උඩ පත් කරපු මේ කමිටුව පිළිබඳව අපට විශාල සැකයක් මතු වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි එම කමිටුවට පත් කරපු විද්වතුන් තිදෙනාත් අද විශාල වශයෙන් සැකයට තුඩු දී තිබෙනවා. බටහිර රටවල ගැත්තන් හැටියට සමහර මාධ්‍ය මොවුන් හඳුන්වා දීලා තිබෙනවා. ඒ වාගේම දරුස්මාන්, යස්මින් සූකා, රට්නර් කියන මේ තිදෙනා යම් අවස්ථාවල කොටි හිතවාදී පිළිවෙතක් අනුගමනය කරපු බවත් අපි කවුරුත් දන්නවා.

ඒ වාගේම තව ප්‍රශ්නයක් තිබෙනවා. එනම් මොවුන් අනුගමනය කරපු ක්‍රමවේදය. මේ ක්‍රමවේදයේදී තොරතුරු රැස් කිරීමට පාවිච්චි කරපු ලේඛන, තොරතුරු ගත්ත අය පිළිබඳව සැකයක් මතු වෙලා තිබෙනවා. ජාත්‍යන්තර සහ රාජ්‍ය නොවන සංවිධානවල යම් යම් වාර්තා, කොටි හිතවාදී සංවිධානවලින්, කොටින්ට සහයෝගය දීපු සමහර මාධ්‍ය ආයතනවලින්, ඒ වාගේම දෙමළ ඩයස්පෝරාවට සම්බන්ධ යම් යම් පුද්ගලයන්ගෙන් ලබා ගත් තොරතුරු පදනම් කර ගෙන තමයි මොවුන් මේ වාර්තාව සකස් කරලා තිබෙන්නේ. ඒ නිසා මේ වාර්තාව සම්පූර්ණයෙන්ම ඒක පාර්ශ්වික වාර්තාවක් හැටියට අපට හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම මේ වාර්තාව ගැන කථා කරන කොට මෙහි හැඳින්වීමේම මෙසේ සඳහන් වෙලා තිබෙනවා, “The war in Sri Lanka ended tragically amidst controversy” යනුවෙන්.

එදා මේ රටේ ප්‍රභාකරන් ඇතුළු ත්‍රස්තවාදීන් ඝාතනය වෙච්ච වෙලාවේ ජාති, ආගම්, කුල භේදයෙන් තොරව මේ රටේ අපි සියලු දෙනාම සන්තෝෂයට පත් වුණා. අද ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිතුමා ප්‍රමුඛ ඇමෙරිකා එක්සත් ජනපදයේ සියලු දෙනාම ඔසාමා බින් ලාඩන්ගේ ඝාතනයෙන් සන්තෝෂයට පත් වනවා වාගේ, උද්දාමයට පත් වනවා වාගේ එදා සියලුම ශ්‍රී ලාංකිකයෝ සන්තෝෂයට පත් වුණා.

අපි දන්නවා, අවුරුදු තිහක කාලයක් මේ රටේ තිබුණු යුද්ධයේදී සිවිල් වැසියන්ට එල්ල වූ ප්‍රහාර ගැන. ඊට අදාළ ලැයිස්තුව මම කියවන්න යන්නේ නැහැ. මම එය **සභාගත*** කරනවා, මූලාසනය හොබ වන ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම 1985 සිට ත්‍රස්තවාදය අවසන් වන තුරු බස් රථවලට එල්ල වූ ප්‍රහාර පිළිබඳ ලැයිස්තුවක් මම මෙම අවස්ථාවේදී **සභාගත*** කරන්නට කැමැතියි. ඒ වාගේම 2002 සිට 2007 ජනවාරි දක්වා විශේෂයෙන්ම සටන් විරාම කාලයේදී කොටින් පැහැර ගත් සිවිල් වැසියන්ගේ නම් ලැයිස්තුවත් මම **සභාගත*** කරන්න කැමැතියි.

අතිගරු ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ යුගයේදී භාර වෙච්ච පොලීසියේ 600ක් එදා අමු අමුවේ ත්‍රස්තවාදීන් විසින් ඝාතනය කරපු හැටි අප කාටත් මතකයි කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

ඒ වාගේම 1987 සිටම මරාගෙන මැරෙන ප්‍රහාර පිළිබඳ ලැයිස්තුවකුත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා. අපි මතක තියා ගන්න ඕනෑ, එදා සිට කොටි ත්‍රස්තවාදීන් විසින් දෙමළ සහ දකුණේ සිංහල දේශපාලනඥයන් රාශියක් ඝාතනය කළ බව. 1975 දී යාපනයේ ඇල්ෆ්‍රඩ් දොරේඅප්පා මහත්මයාගෙන් පටන් අරගෙන, 2008 අප්‍රේල් 06 වන දා ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේගේ - මගේ ආදරණීය ස්වාමි පුරුෂයාගේ - ඝාතනය දක්වා ඝාතන විශාල සංඛ්‍යාවක් මේ රටේ සිද්ධ වුණා. අවසාන වශයෙන් මහින්ද විජේසේකර ඇමතිතුමා ප්‍රමුඛ කණ්ඩායමක් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකට ලක් වුණා. ඒ ආකාරයට ඝාතනයට ලක් වුණු දේශපාලනඥයින්ගේ නම් ලැයිස්තුවත් මම **සභාගත*** කරන්න කැමැතියි.

අපි අද සන්තෝෂයෙන් ඉන්නේ අපේ රටේ නායකතුමා - අතිගරු ජනාධිපතිතුමා- සියලුම රණ විරුවන්ගේ සහායෙන් මේ රටේ ත්‍රස්තවාදය සම්පූර්ණයෙන්ම අයින් කරලා, මේ රටේ අපට නිදහස ලබා දුන්න නිසායි.

Then, I would like to quote from the speech by President Barack Obama made on Sunday, 1st of May, 2011, which has been reproduced in the "Daily Mirror" of Tuesday, 3rd May, 2011, under the caption, "Justice has been done".

"The death of bin Laden marks the most significant achievement to date in our nation's effort to defeat al Qaeda."

He further says, I quote:

"After nearly 10 years of service, struggle and sacrifice, we know well the costs of war. These efforts weigh on me every time I, as Commander-in-Chief, have to sign a letter to a family that has lost a loved one, or look into the eyes of a service member who's been gravely wounded. So Americans understand the costs of war."

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

මේ විධියට තමයි ශ්‍රී ලාංකීය අපත් දුක් වන්නේ කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි.

දරුස්මාන් වාර්තාවෙන් අපට විරුද්ධව චෝදනා කීපයක් එල්ල වෙලා තිබෙනවා, අපේ හමුදාව පාවිච්චි කරපු උපකරණ, ෂෙල් ප්‍රහාර නිසා සාමාන්‍ය ජනතාවත් විශාල වශයෙන් මිය ගියායි කියලා. ඒ මානුෂීය මෙහෙයුමේදී අපේ හමුදාව ඉතාමත්ම වග කීමෙන් මේ උපකරණ පාවිච්චි කෙරුවායි කියන එක අපි මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. නමුත් මේ වාර්තාවේම කියනවා, එල්ටීටීඊ ත්‍රස්තවාදීන් අහිංසක, අසරණ, ජනතාව human shield එකක් හැටියට පාවිච්චි කෙරුව බව. ඒ නිසා මෙවැනි අවස්ථාවල -ඔවුන් සාමාන්‍ය ජනතාව අතරට ගොස් සිටින අවස්ථාවේදී- ත්‍රස්තවාදීන් ඉලක්ක කර වෙඩි තැබීම නිසා අහිංසක අසරණ ජනතාව ඝාතනයට ලක් වන්න ඇති. ඒ ගැන අපේ කනගාටුව අපි ප්‍රකාශ කරනවා. ඒ වාගේ සිද්ධීන් අද ඇෆ්ඝනිස්ථානයෙන්, ලිබියාවෙන් වාර්තා වනවා. මා ළඟ තිබෙනවා, 2001 සිට 2011 අප්‍රේල් 19 වන තෙක් ඇමෙරිකා එක්සත් ජනපදය එල්ල කළ බෝම්බ ප්‍රහාර නිසා මිය ගිය civiliansලාගේ ලැයිස්තුවක්. මම ඒ ලැයිස්තුවත් **සභාගත*** කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතැනදී මේක හඳුන් වන්නේ "collateral damage" කියලා. මොකක්ද "collateral damage"කියලා කියන්නේ? Wikipedia gives its definition as "Collateral damage is damage that is unintended or incidental to the intended outcome." අපේ රටේ සිදු වන විට එය අහිංසක ජනතාව "ඝාතනය" කිරීමක්. බලවත් රටවල් කරන කොට එය "collateral damage" එකක්. එතැනදී ඒක සාධාරණීකරණය කර තිබෙනවා. එම වෙබ් අඩවියෙන් ලබා ගත් ඊට අදාළ ලියවිල්ල—"U.S. Military Works to Avoid Civilian Deaths, Collateral Damage" යනුවෙන් සඳහන් වන ලියවිල්ල- මා **සභාගත*** කරනවා. ඩොනල්ඩ් රම්ස්ෆිල්ඩ් මාධ්‍ය සාකච්ඡාවකදී මෙසේ කියලා තිබෙනවා. I quote:

"It's important to remember, he noted, that it's nearly impossible to eliminate collateral damage.

That means, during a war. Further, he goes on to say, I quote:

Weapon systems malfunctions, human error and "the fog of war" all contribute.

That is, to collateral damage.

මානුෂීය මෙහෙයුමේදී අපේ අහිංසක, අසරණ ජනතාවට යම් කිසි හානියක් සිදු වුණා නම් ඒ සිදු වුණේ ඒ මෙහෙයුමේ ප්‍රතිඵලයක් හැටියට මිසක් අහිංසක ජනතාව එල්ල කරගෙන නොවන බවත් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම තමයි ඉරාකයේ යුද්ධයේදී ඉරාකයේ සංවිධාන ලියලා තිබෙනවා, ජාත්‍යන්තර අපරාධ අධිකරණයට; they have written to the International Criminal Court and its Chief Prosecutor has responded to those organizations. He has mentioned in his letter, which I table*, about their request to investigate the war crimes. It states, I quote:

"1. Allegations concerning the targeting of civilians or clearly excessive attacks"

"…Under international humanitarian law and the Rome Statute, the death of civilians during an armed conflict, no matter how grave and regrettable, does not in itself constitute a war crime. International humanitarian law and the Rome Statute permit belligerents to carry out proportionate attacks against military objectives."

අපේ ශ්‍රී ලංකාවට මීට වඩා වෙනස් ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ ඇයිද කියන එක මේ අවස්ථාවේදී ප්‍රශ්න කරන්න සිද්ධ වනවා.

දෙවැනි චෝදනාව වන්නේ රෝහල්වලට ෂෙල් ප්‍රහාර එල්ල කළ බවයි. මම වග කීමෙන් කියනවා, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කිසිම රෝහලකට අවසන් භාගයේදී ෂෙල් ප්‍රහාර එල්ල වුණේ නැහැ කියලා. ඒ වාගේම ෂෙල් ප්‍රහාර එල්ල වුණේ මුලතිව්වල පුදුකුඩිඉරුප්පු මූලික රෝහලටයි. හැබැයි ඒත් ඒක රෝහලක් හැටියට ක්‍රියාත්මක වන කොට නොවෙයි; මේකේ සිටින රෝගීන් සියලු දෙනාම ඉවත් කරලා එය එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් ඔවුන්ගේ ග්‍රහණයට ලක් කර ගෙන සිටින විටයි. ඔවුන්ගේ ආරක්ෂාවට තිබෙන රෝහලක් නිසා ඔවුන් හිතුවා, ඔවුන්ට කරදරයක් වෙන්නේ නැහැ කියලා. ඒත් ත්‍රස්තවාදීන් ඒ රෝහලේ ඉන්න කොට තමයි ඒ ෂෙල් වෙඩි ප්‍රහාරය එල්ල කළේ. අපේ හමුදාව දැන ගෙන හිටියා, එතැන ත්‍රස්තවාදීන් ඉන්න බව. ඔය කියන වාර්තාවේ සඳහන් කිසිම රෝහලකට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වුණේ නැහැ කියන එක මම අවධාරණයෙන් යුතුව මේ අවස්ථාවේ මතක් කරනවා. මේ තොරතුරු දුන්නේ කවුද? එල්ටීටීඊයෙන් පාලනය වෙච්ච කිලිනොච්චිය, මුලතිව් රෝහල්වල වෛද්‍යවරු හතර පස් දෙනෙක් හිටියා. ඔවුන් ක්‍රියා කළේ එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ අවශ්‍යතාවටයි. ඔවුන් අනවශ්‍ය තැන්වලට වැරදි වාර්තා යැව්වා. වෛද්‍යවරු වුණාම යම් කිසි protocol එකක් තිබෙනවා, ලියුමක් ලියන්න. ලේකම් හරහා ලියන්න ඕනෑ. ඔවුන් කෙළින්ම විවිධ විදේශ තානාපති කාර්යාල හරහා බොරු තොරතුරු සැපයුවා. යුද්ධයෙන් අපේ ප්‍රදේශ මුදා ගත්තායින් පස්සේ ඔවුන් කිව්වා, එවැනි ප්‍රකාශ කළේ ත්‍රස්තවාදීන්ගේ බල කිරීමට කියලා. ඔවුන් උසාවි දාලා නඩුවලින් නිදහස් වෙලා promotions අරගෙන අද හොඳට සෞඛ්‍ය අමාත්‍යාංශයේම රජ කරනවා. මේ වාගේ වැරදි තොරතුරු මූලික කරගෙන තමයි මේ වාර්තා සකස් වෙලා තිබෙන්නේ කියන එක මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම තමයි කියනවා, ඖෂධ, ආහාර ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ කාලය නම් අවසානයි.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)
තව විනාඩි දෙකක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩියක්. හොඳයි.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

---

*** *පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ඒ වාගේම ඖෂධ, ආහාර ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය යැව්වේ නැහැ කියනවා. නමුත් සති දෙකෙන් දෙකට එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලාංකීය නේවාසික නියෝජිතතුමාත්, රතු කුරුස සංවිධානය, ලෝක ආහාර සංවිධානය, සෞඛ්‍ය අමාත්‍යාංශය එකතු වෙලා ක්‍රමානුකූලව අවශ්‍ය කරන ඖෂධ, විශේෂයෙන්ම ත්‍රිපෝෂ, මන්ද පෝෂණය සඳහා ලබා දෙන අධිපෝෂ බිස්කට් යැව්වාය කියන එකත් මම වග කීමෙන් කියනවා. නමුත් ඒ අධිපෝෂ බිස්කට් බංකර්වල තිබිලා අහු වුණාය කියලාත් අපි මාධ්‍යවල දැක්කා. ඒ වාගේම තමයි සරණාගත කඳවුරුවල කරපු සමීක්ෂණයකින් හොයා ගත්තා, ඒ ආපු දරුවන්ගෙන් සියයට 82කට ළමා සංවර්ධන කාඩ්පත තිබුණාය කියා. ඒ අම්මලා යුද්ධයෙන් අවතැන් වෙලා, පීඩාවට පත් වෙලා කඳවුරට ගියත් ඒ දරුවොත් එක්ක ඒ කාඩ් එකත් අරගෙන ගියා. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල - UNICEF fund - කරපු සමීක්ෂණයකින් කියලා තිබෙනවා, සියයට 82කට ඒ කාඩ් එක තිබුණාය කියලා. ඒ කියන්නේ මේ දරුවන් එදා කොටි පාලනයේ හිටියත් ඔවුන්ට ඖෂධ, එන්නත් ආදී ඒ සියලුම පහසුකම්, අධ්‍යාපනය, ඒ වාගේම රැකියා කරන සියලුම නිලධාරින්ට රජය පඩි ගෙවීමටත් කටයුතු කළ බව මතක් කරනවා. මේ වාගේම වග කීමෙන් තමයි රජය වැඩ කළේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)
අවසාන වශයෙන් මම ඉල්ලා සිටින්නේ මෙයයි. සියලු දෙනාම එකතු වෙලා අපේ රට මුල් කරගෙන, දේශීයත්වය මුල් කරගෙන මේ ප්‍රශ්නය විසඳා ගැනීමට එකතු වෙමු කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

[අ. භා. 4.59]

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Mr. Presiding Member, thank you very much for giving me the opportunity to participate in the Debate on the extension of the state of Emergency. According to the Public Security Ordinance, only when there is an emergency situation or chaos in the country, you can declare a state of Emergency, not otherwise. I ask the Hon. Prime Minister to inform this House whether there is any emergency situation or chaos in the country. Recently, at a press conference, the Hon. Prime Minister stated, "We have also noted some controversial persons arriving in the country under cover. We have to retain Emergency Regulations to track such persons". The normal law is quite sufficient to arrest those people the Hon. Prime Minister has in mind. Just to arrest those people, you do not need Emergency Regulations.

It is when Emergency Regulations were in force that extortions of money took place in Colombo. Two or three police officers and the co-ordinating secretary of a Minister were caught red-handed extorting money at the Peliyagoda Fish Market. Earlier, there were similar extortions at the Kotahena Fish Market as well. Now, I understand, they have been released on bail. Why could the Emergency Regulations not be used to detain such persons who extorted money? About three weeks ago, a person who had been studying in the United Kingdom came to Jaffna on holiday and he was taken into custody by people who came in a white van, manhandled and released later.

Sir, the real problem the country is facing is the rising cost of living. The prices of almost all consumer items - milk food, wheat flour, petrol and gas - have gone up. But, we do not find anybody protesting about the rise in prices. When I was in New Delhi sometime back, the Indian Government increased the price of petrol only by Rs. 2 and there was a mass protest and the whole of India came to a standstill. What are our Members in the Opposition doing now when the prices of all consumer items are going up?

When I joined the Government Service in 1953, I was paid only Rs. 150 and I needed only Rs. 65 for my expenses for a month. I used to wear John White shoes at that time. But, what is the position now? Is the salary enough at least for one week? The Government servants were promised a salary increase of Rs. 2,500. Has that been paid? When are you going to pay that?

Recently, the Hon. Keheliya Rambukwella, Minister of Mass Media and Information and Cabinet Spokesman, stated in a press conference that the TNA accepted the Report of the Panel of Experts appointed by the UN Secretary General, Ban Ki-moon, as we are representing the LTTE in Parliament. This only shows that he has not read the Report. There were 40 pictures attached to the Report and further they have faulted the LTTE as well. What is said in the Report is not new to us. We all knew that these things happened. I want to inform the Hon. Keheliya Rambukwella and the other Hon. Members of this House that we are not representing the LTTE but we are representing the people of North and East, who sent us here.

More than 20 people who were in army custody remain missing. The Government must inform the names of the people who are in custody now. A database of the persons in custody was promised but it is not forthcoming.

"The Sri Lankan Government needs to respond to all allegations of disappearances with more than a ritual blanket denial," said Brad Adams, Asia Director of Human Rights Watch. He further said, "Family Members of those disappeared have the right to know if their loved ones are alive or dead".

[ගරු ඒ. විනායගමූර්ති මහතා]

Sir, another issue is, between Mavattapuram and Keerimalai on either side of the road, a mass scale of quarrying is being done by V.V. Karunaratne & Company and these stones are crushed, and the crushed stones are kept there in several heaps. Then, these crushed stones are being taken by this company to some other place. The army says that this area is a high-security zone; I do not know who has given this contract to V.V. Karunaratne & Company. When you go to that place, you can see the machineries and tippers. As I said before, there are several heaps of crushed stones on either side of the road. This has caused very deep pits near the cement factory and hence the sea water might come in at any time. You can make the cement factory functional and use these limestone to make cement. The wealth of that place is being taken out to somewhere else. I have brought this to the notice of the GA and the Commander of the Security Forces there.

Finally, I also want to refer to the question of Privilege raised by the Hon. Suresh Premachandran, MP in this House, about two days ago, as to how he and his private secretary were treated by army personnel. These things happen in Jaffna as there is no civil rule. Therefore, we, the TNA, oppose the extension of the state of Emergency. Thank you.

[අ. භා. 5.06]

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින පැවැත්වෙන හදිසි නීතිය තවත් මසකින් දීර්ඝ කිරීමේ විවාදයේදී අදහස් දක්වන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අද TNA මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා, දරුස්මාන් වාර්තාවේ තිබෙන්නේ සාමාන්‍ය දෙමළ ජනතාවගේ අදහසය කියන කාරණය. රජය විධියට අපි ඒ වාර්තාව ප්‍රතික්ෂේප කරනවා. ඒ වාගේම අපි ඒ වාර්තාව හෙළා දකිනවා. එය සාමාන්‍ය ජනතාවගේ අදහසක්ය යන්න ප්‍රකාශ කිරීම ඇත්තටම පිළිගන්න බැරි කාරණයක්. මොකද, දරුස්මාන් වාර්තාවට ඇතුළත් කර තිබෙන්නේ සාමාන්‍ය දෙමළ ජනතාවගේ අදහස් නොවෙයි, එල්ටීටීඊ සංවිධානයේ අදහස්ය කියන කාරණය විශේෂයෙන්ම මම කියන්න කැමැතියි.

දෙමළ ජනතාවට සැලකීම ගැන කතා කළා. උතුරු නැඟෙනහිර දෙමළ ජනතාව වෙනුවෙන් අද මේ රජය කොච්චර යටිතල පහසුකම් සංවර්ධනය කර තිබෙනවාද, ඒ අයගේ පෞද්ගලික ආර්ථිකය නංවා ගන්න කොච්චර උදවු උපකාර කරලා තිබෙනවාද කියන කාරණය අද මේ මුළු රටම, මුළු ලෝකයම දන්නවා. ඒ වාගේම යුද්ධයේදී ඔවුන් මුදා ගත්තේ කොහොමද කියන කාරණයත්, ද්‍රවිඩ ජනතාවට විතරක් නොවෙයි මේ යුද්ධයට මුහුණ දුන් සියලුම ජනතාවට අපේ රජය කොහොමද උපකාර කළේ කියන කාරණයත් විශේෂයෙන්ම අපිත්, මුළු ලෝකයමත් දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ දරුස්මාන් වාර්තාව තුළින් ගෙන හැර දක්වන්න කටයුතු කර තිබෙන්නේ වසර දෙකකට කලින් කරපු මේ මානුෂීය මෙහෙයුම ද්‍රවිඩ ජනතාවට එරෙහිව කරන ලද මෙහෙයුමක් විධියටයි. ඒක විශේෂයෙන්ම කියන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා ඒ මානුෂීය මෙහෙයුම මෙහෙයවන ලද්දේ මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් කියන සියලුම ජන කොටස්වල අයිතිය ආරක්ෂා කරන්නයි. ඒක ද්‍රවිඩ ජනතාවට එරෙහිව කරන ලද මෙහෙයුමක් හෝ සටනක් නොවෙයි කියන කාරණය විශේෂයෙන්ම මා සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම අපට යුද්ධයෙන් පසු ලැබුණු නිදහසත් එක්ක අද මේ රටේ ඉන්න සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව කොච්චර සතුටින්, සමාදානයෙන් සංවර්ධනය කරා යමින් තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගනිමින් ජීවත් වෙනවාද කියන එක ජනමාධ්‍ය දිහා බලන කොට, රටේ ජනතාව ජීවත් වෙන්නේ කොහොමද කියන එක දකින කොට අපි කාටත් අවබෝධ කර ගන්න පුළුවන් වෙනවා.

අද අපට මුහුණ දෙන්නට වෙලා තිබෙන තවත් වැදගත් කාරණයක් තිබෙනවා. දැන් අපි එල්ටීටීඊ ත්‍රස්තවාදයෙන් මිදිලා අපේ රට නිදහස් කර ගෙන තිබෙනවා. අපි මේ ලබා ගත්තු නිදහස රැක ගැනීමේ අවශ්‍යතාව අද තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා තමයි යම් යම් කොන්දේසිවලට යටත්ව අපට මේ හදිසි නීතිය මේ දක්වා පවත්වා ගෙන යන්න සිදු වෙලා තිබෙන්නේ. හදිසි නීතියෙන් සාමාන්‍ය ජනතාවට හෝ වැරදි නොකරන මිනිසුන්ට කිසි කරදරයක්, කිසි ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. වැරදිවල යෙදෙනවා නම්, අපරාධවල යෙදෙනවා නම් ඒ අයට තමයි මේ හදිසි නීතියෙන් බලපෑමක් වෙන්නේ. ඒ නිසා නීතිය අනුව වැඩ කරන, නීත්‍යනුකූලව ජීවත් වන ජනතාවට මේ හදිසි නීතිය හානිකර වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම විශේෂයෙන්ම මේ ගරු සභාවේ අවධානයට මා මේ කාරණය යොමු කරන්නට කැමැතියි. අපේ රටට මේ විධියේ චෝදනා එල්ල කරන්න දේශීය විදේශීය බලවේග ඉදිරියට එන්න හේතු තිබෙනවා. ඒවා මොනවා ද කියනවා නම්, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ත්‍රිවිධ හමුදාවත් එක්ක එකතු වෙලා, සිවිල් ආරක්ෂක බල කාය ඇතුළු පොලීසියේ උදවු ඇතිව මේ රට ත්‍රස්තවාදයෙන් නිදහස් කර ගත්තාට ඔවුන් කැමැති නැහැ. ඒ වාගේම මේ කුරිරු එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සමඟ මුහුණට මුහුණ දී සටන් කරද්දී කවුරුවත් බලාපොරොත්තු නොවුණු විධියට යුද්ධයේදීයි එල්ටීටීඊ නායකයා විනාශ වුණේ. අල්කයිඩා නායක බින් ලාඩන් ආයුධ නැතිව හැංගී සිටියදී මැරුවා වාගේ නොවෙයි, යුද පිටියේදී තමයි එල්ටීටීඊ ත්‍රස්තවාදී නායකයා මිය ගියේ. එහෙම නම් සංසන්දනය කර බලන්න පුළුවන් කවුද, මොකක් ද හරි, මොකක් ද නීත්‍යනුකූල තත්ත්වය කියන එක.

දරුස්මාන් වාර්තාවෙන් අද මේ රජයට විරුද්ධව කරුණු කියන්න බලාපොරොත්තු වන්නේ ඇයි? අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් මේ රට නිදහස් කර ගත් කාරණය ඔවුන්ට පිළිගන්න කැමැති නැහැ. ඔවුන්ගේ සිතුවිලි, චේතනා දුෂ්ටයි. මේ කාරණය පිළිගන්න තරම් ඔවුන් පිරිසිදු නැහැ. ඒක එක කාරණයක්. ඒ වාගේම ද්‍රවිඩ ජනතාවට තියෙන අයිතියක් අහිමි කළාය, ඔවුන්ට අසාධාරණකම් කළාය කියන හැඟීමක් ඇති කර නැවත වරක් මේ රටේ යුද්ධයක් ඇති කරන්න, අපේ රජය අපහසුතාවට පත් කරන්න තමයි මේ වාගේ වාර්තාවලින් ඔවුන් උත්සාහ කරන්නේ. ඒ වාගේම අපේ රට ප්‍රබල රාජ්‍යයක් වීම නවත්වන්නත් ඔවුන්ගේ අදහසක් තිබෙනවා. බටහිර අධිරාජ්‍යවාදය ශ්‍රී ලංකාවටත් ගෙනැවිත් යටත් කර ගැනීමයි අනෙක් බලාපොරොත්තුව. මේ වාගේ විවිධ දුෂ්ට චේතනාවන් ඇතිවයි මෙවැනි වාර්තාවක් ඉදිරිපත් කර තිබෙන්නේ.

මේ රටේ ජනතාව යුද්ධය නිසා කොච්චර දුක් වින්දාද කියා අප දන්නවා. මා නැඟෙනහිර පළාතේ අම්පාරේ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට ආ මන්ත්‍රීවරියක්. අප යුද්ධයට මුහුණ දුන්නා. ජනතාව කොච්චර දුක් වින්දා ද කියා අප දන්නවා. මේ සියල්ල අමතක කර ද්‍රවිඩ ජනතාවට මෙච්චර සලකද්දී, මෙච්චර උදවු කරද්දී -සිංහල ජනතාවට වඩා ඇත්තටම මේ රජය ද්‍රවිඩ ජනතාවට සලකනවා. එහෙම තත්ත්වයක් තිබෙද්දී- මේ වාගේ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම ඉතාමත් අසාධාරණයි. අප එය හෙළා දකිනවා. අප ඒ වාර්තාව ප්‍රතික්ෂේප කරනවා වාගේම තව කාරණයක් දකිනවා. ජාත්‍යන්තරය, එක්සත් ජාතීන්ගේ සංවිධානය අප මේවාට සම්බන්ධ කර ගන්නට ඕනෑ. අපට මේ බලවේගයන්ට මුහුණ දෙන්නට වෙන්නේ අන්තර්ජාතික සංවිධාන හරහායි. අන්තර්ජාතික වශයෙන් අපේ රටට මිත්‍ර රටවල්, ඒ වාගේම අනෙකුත් විදේශීය රටවල් එකතු කර ගෙන ශක්තිමත්ව අපට එරෙහිව තිබෙන මේ එල්ටීටීඊ සංවිධානයේ බළල් අත්වලට විරුද්ධව කටයුතු කරන්නට අප සූදානම් විය යුතුය යන යෝජනාව කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

[අ. භා. 5.14]

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

Hon. Presiding Member, I am compelled to express my views over the Emergency law which is in existence for the last 25 years and get its life span extended every month. Although it is going to be a bitter experience for me, it is my duty and responsibility to comment on it on behalf of the people who had elected me to this Parliament.

Today, the Advisory Board appointed to advise the UN Secretary-General, which consists of powerful countries like America and Britain had collectively created a grave situation in which the sovereignty and the good image of the country is being seriously threatened. Their interference in our internal matters is not healthy for us. As a passionate citizen of this country, I believe that it is my utmost duty to point out that the Emergency law and the related violations are the principal causes to set out a base for this bitter situation. This law justifies the violation of human rights and threatens the media freedom. On many occasions, it did not allow to express objections even in a democratic manner. This law allows to keep anyone detained for any period of time without the consent or order of a court of law. Totally, this law is used as a main weapon to violate and confiscate the democratic rights provided to the people of this country.

During my recent visits to the Anuradhapura, Vavuniya, Jaffna and Welikada Prisons, I could see the impression of the cruelty of this law and I also looked at the living Tamil prisoners who had fallen victims to its fierce grip without any justice or humanity. I also listened to the grievances of the Tamil prisoners who had been detained for as long as 5 to 18 years making them virtually losing any hope for survival. Recently, the Chief Justice, the supreme authority of justice in this country, ordered to file action against those who were charged and to release the others forthwith. As the Attorney-General has not given his permission up to now, those who can be released are yet kept under detention. I wonder whether the democracy of this country has been pushed to a pathetic state in which even the order of the Chief Justice is just neglected.

I wish to ask this respectful august Assembly, one question. If the Attorney-General's Department is unable to file action against a suspect, does it mean that the Department is inefficient or functioning with mean communal views? You maybe aware and admit that a 18-year period bears a very considerable portion in human life. How cruel is it to detain a person for 18 years in a prison without any justification? According to law, a prisoner sentenced to life imprisonment is supposed to spend 20 years in jail. From this, five years will be deducted if his performance is satisfactory. Then, on account of further allowances, leave et cetera, a life-sentenced prisoner could come out in 10 to 12 years. But, how cruel is it to keep a prisoner for 18 long years without an order from a court of law. When a person is detained in jail, he is completely isolated from his parents, brothers, sisters, community et cetera. He is totally separated from his traditional ethics and related functions and also from the roots of his culture. This is a serious violation of human rights.

I met a prisoner in the Anuradapura Prison, who was suffering from grave agony for not getting permission to attend his mother's funeral. Similarly, every prisoner I met there was in the extreme edge of agony and has virtually lost hopes for survival. It is appropriate to point out that the suspect charged for the attempted suicide attack on the ex-President, Mrs. Chandrika Kumaratunga, had admitted his charges and was sentenced to imprisonment. But, the Hindu Priest and his wife in Batticaloa arrested in this case have been detained in jail for the last eight years leaving their two children in an orphanage. Cases are filed against some suspects with certain charges, but they have become just "postponement" cases. No witnesses or lawyers are present, no documents are submitted and the routine manner is just to call the cases for the sake of calling and then postpone them. The Chief Justice's order to release the suspects on bail while the cases are being called, has also been ignored. I wish to point out that this Emergency law paves the way for violations to be made by the Attorney- General's Department.

Hon. Speaker, respectful Members, we were informed that the list of the detained Tamil prisoners would be released during discussions between the Government and

[ගරු ඊ. සරවනපවන් මහතා]

the TNA. We appreciated and welcomed it. But, even after three rounds of discussions and even after indicating three dates for their release, what we faced was only sheer disappointment. How pathetic and grave it is for the wives of the ex-fighters to keep on wondering for years if their husbands are still living or dead. Similarly, can anyone simply ignore the pathetic situation of the parents who live in anxiety without knowing the fate of their disappeared children for so long? Many wives are still struggling to decide whether to erase the *kunkumam* supposed to be the *pottu* in red from their foreheads and whether to remove their *thali* for good. What a great sorrow it is for a woman. In a democratic country, can we allow any citizen to live in an atmosphere without knowing if his or her beloved ones are simply missing, detained or dead?

If the promises given at the initial stage of the discussions are not executed, can we believe that the decisions to be made at the oncoming discussions will be fruitful to solve the ethnic issue? Our expectation is that. The initial failure must not end up as a total failure. However, nobody can deny the fact that this Emergency law allows total permission to the Attorney-General's Department and to the related parties for violation of the law.

Under these circumstances, we have no other alternative but to vote against the extension of the state of Emergency.

[අ. භා. 5.22]

**ගරු එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය පැවැත්වෙන මේ වෙලාවේ කරුණු කීපයක් පිළිබඳව සඳහන් කරන්න මා බලාපොරොත්තු වෙනවා. අපි ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අවුරුදු 30ක් යුද්ධයට මුහුණ දීලා ඉතා අමාරුවෙන් ජීවිත බේරා ගත්තේ. අරන්තලාවේ හාමුදුරුවරු විසිහත් නමක්, රුහුණු සෝමාවතියේ හාමුදුරුවරු හත් නමක්, පදවි ශ්‍රීපුර නායක හාමුදුරුවෝ, ඒ වාගේම ශ්‍රී මහා බෝධි ශාඛාව ඉදිරිපිට වෙඩි තියලා එතැන හාමුදුරුවරු, දස සිල් මෑණියෝ හා උවසු උවැසියන් 160 දෙනෙක්, කල්මුණේ, කාත්තාන්කුඩි මුස්ලිම් පල්ලිවල ආගම අදහමින් හිටපු විශාල සංඛ්‍යාවක් -180කට වැඩි සංඛ්‍යාවක්- ඒ වාගේම 25,000කට වැඩි රණ විරුවෝ කොටි ත්‍රස්තවාදීන් විසින් මැරුවා. සිංහල, ද්‍රවිඩ හා මුස්ලිම් අහිංසක ජනතාව, පාසල් දරුවෝ, කිරි දරුවෝ දසදහස් ගණනක් ලේ ගංගාවල පා කරලා හැරියා. ඒ අතරේ මගේ ගෙදරට දෙසැරයක් වෙඩි තිබ්බා. මගේ මස්සිනා මැරුවා. ඒ, මගේ. පිට අය විශාල ගණනක් මරලා දැම්මා. මෙහෙම කරපු මිනී මරු කොටි නායකයා ඝාතනය කළා කියලා බැන් කි මූන් ඉදිරිපත් කරපු කාලකණ්ණි වාර්තාව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජනතාව භේදයකින් තොරව පිළිකුල් සහගතව ප්‍රතික්ෂේප කරනවා. අපි එයට දැඩි විරෝධය දක්වනවා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාට යමෙක් දොස් කියනවා නම් ඔහු 21 වන ශත වර්ෂයේ පළමු ජාති ද්‍රෝහියා වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය ක්‍රියාත්මක කරන විශේෂ කොට්ඨාස වශයෙන් ශ්‍රී ලංකා පොලීසිය හා ත්‍රිවිධ හමුදාව ඒ කටයුතුවලට සහභාගි වෙනවා. පොලීසියේ හිටපු නිලධාරියෙක් හැටියට පොලීසියේ සහෝදර නිලධාරීන්ගේ දුක් වේදනා මට සඳහන් කරන්නට වෙනවා. ඒවාට සහන සැලසිය යුතුව තිබෙනවා. ශ්‍රී ලංකා පොලීසියේ උසස්වීම් දීම ක්‍රමානුකූල නැහැ කියලා ඒ නිලධාරීන්ගේ ලොකු චෝදනාවක් තිබෙනවා. ඒකට හේතුව මේකයි. පොලීසියට බැඳිච්ච රාළහාමිට, සාජන්ට් මහත්තයාට, SI මහත්තයාට, අනිකුත් සියලු නිලධාරීන්ට නියමිත කාලයක් තිබෙන්න ඕනෑ බැඳීලා මෙච්චර කාලෙකින් promotion එක හම්බ වෙනවා කියලා. ඒ නිලධාරීන්ගේ දරුවන්ට කියන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ, "මගේ තාත්තා අවුරුදු 10කින් සාජන්ට් වෙනවා" කියලා. සාජන්ට්ගේ දරුවාට කියන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ, "මගේ තාත්තා අවුරුදු 8කින් SI මහත්තයෙක් වෙනවා" කියලා. SI මහත්තයාගේ දරුවාට කියන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ, "මගේ තාත්තා අවුරුදු 8කින් පොලිස් පරීක්ෂක වෙනවා" කියලා. මේ ආදී විධියට ක්‍රමවත් වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ කියන එක පිළිබඳව මේ වෙලාවේදී පොලීසියේ විශේෂයෙන්ම උනන්දුවක් තිබෙනවා; වුවමනාවක් තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමා පසු ගිය කාලය තුළ ඉතා විශේෂ වූ උසස්වීම් ක්‍රමයක් හඳුන්වලා දුන්නා. ඒ උසස්වීම් ක්‍රමය හඳුන්වලා දෙන කොට සමහරුන්ට ඒ නියමිත දින ගණනට එක දවසයි අඩු. සමහරුන්ට දවස් දෙකයි අඩු. සමහරුන්ට දවස් තුනයි, හතරයි, මාසයයි -ඔය විධියට තමයි- අඩු. නමුත් දැන් ඒ නියමිත කාලය පහු වෙලා හුඟක් කල් ගිහින් තිබෙනවා. ඒ නිසා ඒ නියමිත කාලයේදී දෙන උසස්වීම් නැවත ලබා දීමට පොලීසියේ උසස් නිලධාරීන් සියලු දෙනාම කටයුතු කරන්න ඕනෑය කියලා මම මේ වෙලාවේ ඉල්ලා හිටිනවා. එහෙම නැති වුණොත් පොලීසියේ නිලධාරීන් දුර්මුඛ වෙනවා; රාජකාරියට එච්චර උනන්දුවක්, වුවමනාවක් දක්වන්නේ නැති වෙනවා. සේවයට පමණක් යන්තම් හිස නමනවා විතරයි වන්නේ. ඔවුන් වුවමනාවෙන් සේවය කරන්නේ නැති වුණොත් මුළු රටේම ක්‍රියාකාරිත්වය වෙනස් වෙනවා, නොමඟ යනවා කියන එක මම කියන්න ඕනෑ.

ඊ ළඟට පොලීසියේ වේතනය හමුදා තුනේ වේතන සමඟ එක හා සමාන කරන්න ඕනෑය කියලා ඉල්ලීමක් තිබෙනවා. බොහෝ අතින් බැලුවාම පොලීසිය කරනු ලබන්නේ අනිකුත් හමුදාවන්ට වඩා දුෂ්කර සේවාවක්. ඒක ඒ සේවාවේ හිටපු කෙනෙක් හා සේවය කරන අය හැර ඒ සේවය දකින කෙනෙකුට තේරුම් ගන්නට අමාරු වෙනවා. ඒ නිසා හමුදාවන්ට හා සමාන පහසුකම් ඒ අයටත් ලබා දෙන්න ඕනෑය කියන එකත් ඉල්ලා සිටිනවා.

ඊ ළඟට පොලිස් දෙපාර්තමේන්තුවේ නිල ඇඳුම් මැසීම පිළිබඳවත් මා යමක් කියන්න ඕනෑ. ඒවා කොළඹින් මහලා ඉවර වෙලා ඒ ප්‍රදේශවලට යවන්න කටයුතු සිද්ධ වෙනවා. එහෙම වුණාම දුර බැහැර ප්‍රදේශවල ඉන්න නිලධාරීන්ට නැවත ඒවායේ අඩු පාඩු හදා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ වෙනුවෙන් නැවත තමන්ගේ පඩියෙන් මුදල් දීලා වෙනම මහ ගන්නටයි සිද්ධ වෙන්නේ. ඒ නිසා ප්‍රාදේශීයව සිටින ඇඳුම් මහන අය ලවා ඒවා මහලා දෙන්න කියලා ඒ ගොල්ලෝ ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා තදබල විධියට බලපාන කාරණයක් මේ ළඟදී සිද්ධ වුණා. ඒ තමයි පොලීසියේ මොනම නිලධාරියකුවත් කොට්ඨාසය භාර නිලධාරියාට මාරු කරන්න බැරි වීම. ඉස්සර පොලීසියේ රාළහාමි කෙනකු, සාජන්ට් කෙනකු, උපපොලිස් පරීක්ෂකවරයකු, පරීක්ෂකවරයකු,

ස්ථානාධිපතිවරුන්ගෙන් ඉහළ අය හැර අනෙක් ඕනෑම කෙනකු හදිසියේ මාරු කරන්න ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිට හෝ කොට්ඨාසය භාර පොලිස් අධිකාරිට පුළුවන්කම තිබුණා. දැන් ඒක ආරක්ෂක අමාත්‍යාංශය මඟින් නතර කළාය කියන ආරංචියක් තිබෙනවා. එහෙම වුණාම ඒක විනය කෙරෙහි තදින් බලපානවා. දරුණු චෝදනාවකට ලක් වූ නිලධාරියකු පරීක්ෂණවලින් තොරව එවෙලේම මාරු කළාම ජන අරගල, උද්ඝෝෂණ, බලපෑම් සහ පොලිසි වට කරන එක අඩු වෙනවා. ඒ නිසා ස්ථානාධිපතිවරුන්ගෙන් පහළ නිලධාරින්ව මාරු කිරීමේ අයිතිය ඒ කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාට හෝ පොලිස් අධිකාරිවරයාට හෝ ලබා දෙන්න කියලා අපේ ආරක්ෂක ලේකම්තුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

ඊ ළඟට අපි පාර්ලිමේන්තුව ගැන කථා කරන්නට ඕනෑ. මෙතැන රට හදන තැන කියලා හැම තැනම කියෑ වෙනවා. එහෙම නම් මෙතැන duty කරන පොලිස් නිලධාරින්ට විශේෂ සේවාවක් රට හදන තැනින් වෙන්නට ඕනෑ. මම කීප වතාවක් ඉල්ලීම් කළා, ජයන්තිපුර ආරුක්කු ගේට්ටුවක් ඉදි කිරීම ගැන. වැස්ස වෙලාවක පාර්ලිමේන්තුවට ඇතුළු වන, මේ ගරු සභාව නියෝජනය කරන තමුන්නාන්සේලා ඕනෑම කෙනකුට පේනවා එතැන ඉන්න පොලිස් නිලධාරින් වැස්සට තෙමෙන හැටි. Raincoats තිබුණාය කියලා වැස්සෙන් බේරෙන්න බැහැ. අපේ වාහනවලින් එන අය එතැන බස්සවන්න ඕනෑ. එතකොට අපේ නෑදෑයන්, දූ දරුවන් ගෙනාවත් ඒ ගොල්ලෝත් වැස්සට තෙමෙනවා; අව්වට වේළෙනවා. ඒ නිසා මම කරුණාකර ඉල්ලනවා එතැන ආරුක්කු ගේට්ටුව හරි ගස්වන්න කියලා. කවුරුන් හෝ වග කිව යුතු අය මේ අහිංසක රාළහාමිලා දිහා මානුෂිකව කල්පනා කරලා බලන්න කියලා ඉල්ලනවා. එහෙම නැති වුණොත් රාජකාරිය හදවතට එකඟව කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

ඊ ළඟට පාර්ලිමේන්තු පොලිසියට අනෙක් කාර්ය මණ්ඩලවලට දෙන මොනවා හරි දීමනා ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. කාටත් බැලුවාම පෙනෙන්නේ නැතුවාට පාර්ලිමේන්තු පොලිසිය ඉතා විශාල වග කීමකින් කටයුතු කරනවා. පොඩ්ඩක් එහේ මෙහේ වුණොත් මොන තත්ත්වයක් උදා වෙනවාද කියලා තමුන්නාන්සේලාට හිතා ගන්නට පුළුවන් වෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුවට ඇතුළු වන සියලුම මැති ඇමතිවරුන්ගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සියලු ආරක්ෂාව සහ සියලු කටයුතුවලට උදවු උපකාර කරන පොලිසිය කෙරෙහි අප දයානුකම්පිකව කටයුතු කරන්නට වෙනවා. අනෙක් සේවකයන්ට වාගේ ඔවුන්ට overtime නැහැ, විශේෂ දීමනා නැහැ. ඒ වාගේම රාජකාරි වේලාවේ නිශ්චිත කාලයක් නැහැ. ඉහළ නිලධාරියා කිව්වොත් තව පැය දෙකක් ඉන්න කියලා තව පැය දෙකක් ඉන්න ඕනෑ. තව පැයක් ඉන්න කිව්වොත් තව පැයක් ඉන්න ඕනෑ. ඒ නිසා කරුණාකර මානුෂිකව කල්පනා කරලා යම් කිසි දීමනාවක්, විශේෂිත වූ දීමනාවක් මේ විශේෂිත ආයතනය ආරක්ෂා කරනවාට, එයට එන අය ආරක්ෂා කරනවාට පාර්ලිමේන්තු පොලිසියට ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මම 1989 දී කථා කරලා රුපියල් 500ක් ලබා දුන්නා. නමුත් ඉන් පස්සේ ඒක වැඩි වුණේ නැහැ. කරුණාකර ඒ ගැන අවධානය යොමු කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

ඊ ළඟට පොලිස් නිලධාරින්ට අඩු තරමින් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවෙන් යතුරු පැදියක් ණයට ලබා ගන්න පහසුකම, තමන්ගේ පඩියෙන් කොටස් වශයෙන් කපා ගන්නා පදනමින් රජයේ අනෙක් සේවකයන්ට දෙන පහසුකම ලබා දෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. පසු ගිය කාලයක එහෙම කටයුතු කරලා නමුත් ඉහළ නිලධාරින්ගේ මැදිහත් වීම නිසා ඒක ලබා දුන්නේ නැහැ. මේ තත්ත්වය ඉතාම අසාධාරණයි කියන එක මා කියන්න ඕනෑ.

ඒ වාගේම පැය 24ම රාජකාරි කරන පොලිස් නිලධාරින්ට, අවංකව රාජකාරි කරන හැම කෙනකුටම සේවයෙන් විශ්‍රාම යන කොට ගෙයක් හදා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා සේවයට බැඳුණු දා ඉඳන් නිවාස යෝජනා ක්‍රමයකට වෙනම මුදලක් ඒ නිලධාරියාගේ පඩියෙන් අයින් කරලා -පඩියෙන් කපා ගෙන- ඔහු පැන්ෂන් යන කොට ඒකෙන් නිවාසයක් හදා ගෙන යන්න ඉඩ ප්‍රස්ථාව ලබා දීමට පොලිස් දෙපාර්තමේන්තුවේ ඉහළ අය කටයුතු කරන්න කියලා මම ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ඒ අතරතුර ආරක්ෂක ලේකම්තුමාගේ උපදෙස් මත සිවිල් ආරක්ෂක සේවය අද කාර්යක්ෂමව වැඩ කටයුතු කරනවා. කෘෂි කර්මාන්තය ඇතුළු ඵලදායී සේවාවල යොදවනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. 1983 ඉඳන් ග්‍රාමාරක්ෂක සේවයේ ඉන්න වැඩිහිටි සිවිල් ආරක්ෂක භටයන් වයසට සරිලන රාජකාරිවල යොදවන්න, ඒ ගොල්ලන්ගේ වයස අනුව කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් ඉල්ලීමක් කරනවා. 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තිය සාර්ථක කර ගන්න ත්‍රිවිධ හමුදාවට, පොලිසියට හා සිවිල් ආරක්ෂක සේවයට විශේෂයෙන්ම ආරාධනය කරමින් සියලුම රජයේ සේවකයන්ට ඒ සඳහා පිළිවෙතින් පෙළ ගැසෙමු කියන ආයාචනය කරනවා. ස්තුතියි!

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. තමුන්නාන්සේ පාර්ලිමේන්තුවේ පොලිසියේ හඬ. බොහොම හොඳයි. මී ළඟට ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මන්ත්‍රීතුමා.

[අ. භා. 5.32]

**ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு லக்ஷமன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයට එක් වීමට ලැබීම ගැන මා පළමුවෙන්ම මගේ සතුට ප්‍රකාශ කරනවා.

අද විපක්ෂය විසින් මෙම හදිසි නීතිය මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන, මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් විනාශ කරන, වැඩ කරන ජනතාවගේ වෘත්තීය සමිති අයිතිවාසිකම් විනාශ කරන නීති පද්ධතියක් හැටියට හැඳින්වීමට උත්සාහ කළා. හදිසි නීතිය කියන්නේ මේ ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ පවත්නා රටවල් ගණනාවක් විසින් ක්‍රියාත්මක කරන නීතියක්. ප්‍රජාතාන්ත්‍රික රටක ජනතාවගේ අයිතිවාසිකම් අවම වශයෙන් හරි ලබා දෙන ක්‍රමවේදයක් වශයෙන්, පවත්නා නීතියෙන් ඔබ්බට ගිහිල්ලා ක්‍රියාත්මක කිරීමට ලැබිලා තිබෙන එකම නීතිය තමයි හදිසි නීතිය. අපි දන්නවා අද ඕස්ට්‍රේලියාව, ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය, කැනඩාව, ඩෙන්මාර්කය ආදී මේ සා විශාල රටවල් ගණනාවක් මේ වන විටත් මෙම හදිසි නීතිය පාවිච්චි කරන බව. 2001 සැප්තැම්බර් 11 වැනි දා ඇමෙරිකාවට එල්ල කළ අල්කයිඩා ප්‍රහාරයෙන් පසුව ජෝර්ජ් බුෂ් ජනාධිපතිතුමා එදා ඇමෙරිකාවට හදිසි නීතිය ප්‍රකාශයට පත් කළා. ඒ හදිසි නීතිය වත්මන් ජනාධිපති බැරැක් ඔබාමා ආවාට පස්සේ අදත් ඇමෙරිකාව පුරා ක්‍රියාත්මක කරනවා. ඒ විතරක් නොවෙයි, ඕස්ට්‍රේලියාව වාගේ රටවල ප්‍රාන්ත ආණ්ඩුකාරවරුන්ට බලය දීලා තිබෙනවා, තමන්ගේ ප්‍රදේශවල මෙම හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීමට. එහෙම නම් මෙම හදිසි නීතිය තුළ මේ දකින මහා විශාල භයානක තත්ත්වයක් ඇත්තේ නැහැ කියන එකයි අපි විශ්වාස කරන්නේ.

[ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා]

ඒ එක්කම අපි දන්නවා මේ හදිසි නීතිය වසර 25කට අධික කාලයක් තුළ මේ රටේ පැවත ගෙන ආපු බව. එදා 1982 දී වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් ඒ වැඩ වර්ජනය කරපු අයගේ අයිතිවාසිකම් විනාශ කිරීම සඳහා, ඔවුන්ව අත් අඩංගුවට ගැනීම සඳහා තමයි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ හදිසි නීතිය ප්‍රථම වරට උපයෝගී කර ගත්තේ. ඒ කාලයේ සිට මෙම හදිසි නීතිය පවත්වා ගෙන එනවා. මෙතෙක් පැවැති හැම රජයක්ම හදිසි නීතිය මෙතෙක් පවත්වා ගෙන ආවේ කිසිම සංශෝධනයක් නැතුවයි. මෙම හදිසි නීතිය තුළ තිබුණු රෙගුලාසි ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන ආපු ක්‍රමවේදයක් තමයි මෙතෙක් පැවතියේ. නමුත් වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට අපි ස්තුතිවන්ත වන්න ඕනෑ, රටේ ආරක්ෂක තත්ත්වය අනුව මේ හදිසි නීතියේ යම් යම් රෙගුලාසි සංශෝධනය කරලා, ඉවත් කරලා අද ක්‍රියාත්මක කර ගෙන යන එක ගැන. ඒ නිසා මේ හදිසි නීතියේ ඇති සියලුම රෙගුලාසි අද එහි අඩංගු වෙලා නැහැ. මේ හදිසි නීතියේ අඩංගු වෙලා තිබෙන්නේ රටේ වත්මන් තත්ත්වයට මුහුණ දීමට අවශ්‍ය වන්නා වූ යම් කිසි රෙගුලාසි කිහිපයක් විතරයි.

මෙම හදිසි නීතිය මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නා වූ, ඒ සඳහා යම් කිසි ශක්තියක් දෙන නීතියක් බවට පත් වන්නේ කොහොමද කියලා අපි විමසා බලන්න ඕනෑ. අපි හිතමු ආපදා තත්ත්වයක් රටේ ඇති වෙනවා කියලා; ස්වාභාවික විපතක් ඇති වෙනවා කියලා. ඒ වේලාවට අත්‍යවශ්‍ය සේවා ලබා ගන්නට කැඳවීමක් කිරීමට තිබෙන නීතිය හදිසි නීතියයි. හදිසි නීතිය නැතුව සාමාන්‍ය නීතිය අනුව ගමන් කළොත් අපට එවැනි කටයුතු කිරීමට හැකියාවක් නැහැ. අපි කියන්නේ නැහැ මේ හදිසි නීතිය හැම වෙලාවේම පවතින්න ඕනෑ කියලා. නමුත් අපි විශ්වාස කරනවා ක්‍රමක්‍රමයෙන් යම් යම් රෙගුලාසි ඉවත් කරමින් ගෙන යන මෙම නීති ක්‍රමය අපේ රටට වර්තමානයේ අවශ්‍ය වෙලා තිබෙනවා කියලා.

විපක්ෂය ගෙනාපු තර්ක විතර්ක අපි දැක්කා. විශාල වශයෙන් අද ඉදිරිපත් කළ තර්කයක් තමයි බෑන් කි මූන්ගේ වාර්තාව නැත්නම් දරුස්මාන් වාර්තාව. අද අපි ලෝකයට පාඩමක් දීලා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පිළිවෙතෙහි හොඳට ගමන් කරපු රටක් වශයෙන්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ගරු බුහුමන් ලබපු රටක් වශයෙන් ශ්‍රී ලංකාව ප්‍රධාන තැනක් ගන්නවා කියලා මා හිතනවා.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ ඉන්දීය සාගර සාම කලාප සම්මුතිය සඳහා යෝජනාව ගෙනෙන කොට එදා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අපේ නිත්‍ය නියෝජිතයා වශයෙන් සිටියේ ෂර්ලි අමරසිංහ මහත්මයායි. මේ ඉන්දීය සාගර සාම කලාප සම්මුතිය සඳහා යෝජනාව ගෙනාවේ බටහිර අධිරාජ්‍යවාදීන් ඉන්දියන් සාගරයේ යුද පර්යේෂණ සිදු කිරීම සඳහා තමන්ගේ බලය පාවිච්චි කිරීමට තැත් කරපු මොහොතකයි. නමුත් ඒ අවස්ථාවේ දී -ඇමෙරිකාව, බ්‍රිතාන්‍ය වාගේ රටවල් හැරුණු කොට- අපිත් එක්ක රටවල් 64ක් හිටියා. රටවල් 52ක් අපට විරුද්ධව ඡන්දය දුන්නා. අපි ඒ යෝජනාව සම්මත කරලා අපේ රටේ ගරුත්වය ඇති කර ගත්තා. ඉන් අනතුරුව මොකක්ද කළේ? ඇමෙරිකාවෙන් මේකට දුන්නු උත්තරය වශයෙන් ඩියෙගෝ ගාසියා හරහා ඉන්දියන් සාගරයට නාවික හමුදාවක් එව්වා, ලංකා මුහුදු වෙරළ ආක්‍රමණය කරන්න කියලා. නමුත් අපේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඒ අවස්ථාවේ නියෝගයක් දුන්නා, මොන රටක වුණත් කමක් නැහැ, අපේ මුහුදු වෙරළ ආක්‍රමණය කරනවා නම් අනිවාර්යෙන්ම ඒ හමුදාවට වෙඩි තියන්න කියලා. අපේ රට පරාධීන රටක් බවට පත් වෙලා තිබුණේ නැහැ. අපේ රට ස්වාධීන රටක් වශයෙන්, ස්ථාවර රටක් වශයෙන් හොඳ ගෞරවයක් තබා ගෙන සිටින රටක්.

බෑන් කි මූන්ගේ දරුස්මාන් වාර්තාවෙන් වුන් වෙලා ඉන්න කට්ටිය අද ඉන්නවා. අද මහ ලොකුවට මේ ගැන කථා කරලා තමන්ගේ නැති වුණු බලය නැවත ලබා ගැනීමේ උපක්‍රමයක් වශයෙන් මේ වාර්තාව යොදා ගන්නට කටයුතු කරනවා. නමුත් අද ඒ කියන එක්සත් ජාතීන්ගේ සංවිධානයම පිළිගෙන තිබෙනවා, අපේ හමුදාව විනීත හමුදාවක් හැටියට. ඒ නිසා තමයි අද හයිටිය වාගේ රටවල්වලට අපේ හමුදාවේ සේවය ලබා ගෙන තිබෙන්නේ. මේ වාගේ උතුම් මනුෂ්‍ය ගුණාංගවලින් පිරිපුන්, ඒ වාගේම විනයෙන් උතුම් ලෙස පිරිපුන් අපේ හමුදාව වාගේ හමුදාවක් සම්බන්ධයෙන් මේ වාගේ වාර්තා ඉදිරිපත් කරලා මේ රට යම් කිසි අසීරුතාවකට පත් කරන්නට කටයුතු කරන අවස්ථාවක් අද ඇති වෙලා තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ වාගේ වාර්තා උපයෝගී කරගෙන රටක් පවතින්නේ නැති බව අපි දන්නවා. ස්වාභාවික නීතියේ මූල ධර්මයක් තිබෙනවා, "තමන්ගේ විනිශ්චයකාරයා තමන් නොවිය යුතු යි" කියලා. අද මේ දරුස්මාන් වාර්තාව ඉදිරිපත් කරන්නේ කවුද? ඒ මහ ලේකම්වරයා විසින්ම ඒ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරලා, ඔහු විසින්ම කමිටුවක් පත් කරලා, ඒ කමිටුව විසින් විමර්ශනයකුත් කරවලා ඔහුම කියනවා, "මෙන්න මේකට දැන් අපිට උත්තර දෙන්න" කියලා. නමුත් අපි විශ්වාස කරනවා, ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීති පද්ධතියක් තිබෙන බව; ජාත්‍යන්තර ක්‍රමවේදයක් තිබෙන බව; ජාත්‍යන්තරව පිළිගත යුතු සිද්ධාන්තයක් තිබෙන බව. ඒ සිද්ධාන්ත තුළ අද අපට හැසිරෙන්න සිදු වෙලා තිබෙනවා.

අපි දන්නවා, එල්ටීටීඊ ත්‍රස්තවාදී සංවිධානය මොන තරම් විනාශයක් මේ ලංකාවට කළාද කියන එක. ඒ මානුෂික මෙහෙයුමේ දී දින ගණනාවක් ඇතුළත අපේ හමුදාවේ විතරක් 5,000ක් මැරුවා. 28,000කට වැඩි පිරිසක් ආබාධිත තත්ත්වයට පත් කළා. අවුරුදු 25ක් තිස්සේ පැවැති යුද්ධයෙන් අපේ හමුදාවේ 23,000ක් පමණ මරා දැම්මා. සිවිල් ජනතාව මරා දැම්මා. එහි දී සිංහලද, දෙමළද, මුස්ලිම්ද කියලා බැලුවේ නැහැ. ඒ සියලු දෙනාම මරලා දැම්මා. නමුත් අඩුම ගණනේ දරුස්මාන් වාර්තාව ඉදිරිපත් කරන කොට හෝ බෑන් කි මූන්ට තිබුණා, මේ රටේ අනෙකුත් ජාතීන්ද මේ විමර්ශනයට එක් කරගෙන, ඔවුන්ගේ අදහසුත් අරගෙන මොකක්ද තමුන්ගේ රටේ සිද්ධ වුණේ කියන එක දැන ගන්න. නමුත් ඔවුන් එක පිරිසක් ගැන විතරයි බැලුවේ. මේ රටේ ත්‍රස්තවාදී සංවිධානයක් නියෝජනය කරපු, ත්‍රස්තවාදීන් විසින් කරන ලද ප්‍රකාශ විතරයි ඔවුන් අද තමන්ගේ වාර්තාවට ගොනු කරගෙන තිබෙන්නේ. ඒ නිසා අද ජාත්‍යන්තර වශයෙන් විහිළුවකට ලක් වෙලා තිබෙන මේ වාර්තාව ලෝකය ප්‍රතික්ෂේප කරන දිනය වැඩි ඈතක නොවෙයි කියන එකත් අපි මේ අවස්ථාවේ දී මතක් කර දෙන්න ඕනෑ. මේ වාර්තාවෙන් කියන අනෙක් කාරණය තමයි, තමන්ට තොරතුරු ලබා දුන් පුද්ගලයන් සම්බන්ධව වසර 20ක් යන තෙක් හෙළිදරව් කිරීමක් කරන්න අයිතියක් ඇත්තේ නැහැ කියන එක. මොකක්ද මේ වාර්තාව? එහෙම නම් මේ වාර්තාව අපේ රට ජාත්‍යන්තර වශයෙන් අපකීර්තියට ලක් කිරීම සඳහා සැලැස්මක් ඇතිව කරන ලද කුමන්ත්‍රණයක්. අතිගරු ජනාධිපතිතුමාගේ රජය යටතේ මේ රටේ දියුණුව අනිවාර්යෙන්ම සිද්ධ වන බව දන්නා නිසා, අපේ රටට විනාශයක් කරන්න තමයි මේ වාගේ වාර්තා අරගෙන ඇවිල්ලා, මේ බොරු කරුණු කාරණා ඉදිරිපත් කරලා මේ රට අසීරුවට පත් කරන්න කටයුතු කරලා තිබෙන්නේ.

එල්ටීටීඊ ත්‍රස්තවාදීන් කියලා අපි අත් අඩංගුවට ගත්ත පුද්ගලයන් විශාල පිරිසක් අද නිදහස් කරලා තිබෙනවා. කඳවුරු නවයක සිටින 4,343ක පිරිසක් සමාජගත කිරීම සඳහා පුනරුත්ථාපනය කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේ 6,500ක පිරිසක් අද වන විට අපි සමාජගත කරලා

තිබෙනවා. ඒ වාගේම අනාථ කඳවුරුවල හිටපු ලක්ෂ ගණන් පිරිසක් පෝෂණය කරලා තිබෙනවා. ඔවුන්ට ආහාර, නිවාස, යනාදී සියලුම දේවල් ලබා දීලා ඒ කඳවුරුවලින් ඉවත් කර තිබෙනවා. එහෙම නම් අපි ජාත්‍යන්තරයේ සියලුම රටවල්වලට ආරාධනා කරනවා, මේ වාර්තාවලින් විමසීමට ඉස්සෙල්ලා ලංකාවට ඇවිල්ලා, අඩුම ගණනේ ලංකාවේ සිටින ජනතාවගෙන් මේ පිළිබඳව කරුණු කාරණා අහලා, අනෙකුත් සියලුම ජාතීන්ගෙනුත් මේ පිළිබඳව කරුණු කාරණා අහලා, සිදු වුණු විනාශය ගැනත්, එල්ටීටීඊ සංවිධානය ජාත්‍යන්තර නීතියට පටහැනිව සිදු කළ යුද්ධය පිළිබඳවත් කරුණු කාරණා එක් රැස් කරන්න කියලා. අපේ රටේ ජනතාවට, අපේ අතිගරු ජනාධිපතිතුමාගේ කීර්තියට, අපේ රටේ කීර්තියට, අගෞරවයක් නොවන ආකාරයෙන් ඔවුන් කටයුතු කරයි කියලා විශ්වාස කරමින් මම මේ අවස්ථාවේ දී නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. இப்பொழுது, உரை நிகழ்த்துபவர் மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள்!

[අ. භා. 5.42]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Mr. Presiding Member, in this House today, again we are going through the unfortunate process of extending the state of Emergency. Two years after the war has ended, at a time when we should be going for reconciliation, we are having a Debate today on the extension of the state of Emergency.

Every Member representing the Government who spoke today made it a point to reject the UN Secretary-General's advisory Panel of Experts' Report. I think they believe that rejecting the Report, speaking against it and denouncing the UN Secretary-General and the Chairman of the Panel is the only way to establish their patriotism to this country and their loyalty to the Government. This is very unfortunate.

Today, we are living in a civilized society. When civilization started, step by step, so many rules, so many laws and so many regulations emerged, evolved. They all evolved because the right of one man should not infringe on the right of another. In a society, there is a way we are supposed to live and to enable that, the civilized society evolve so many laws and rules. Similarly, in the international world, in the global society, we have created an institution called the United Nations. All nations which joined the United Nations signed the UN Charter; they accepted the rules and regulations of the United Nations and they pledged their acceptance and agreement to abide by the regulations of it.

We, Sri Lanka, are one of the founder members of the United Nations movement. The United Nations Organization has its own rules and regulations. Under that, the Secretary-General of the United Nations has a right to appoint a panel to advise him. The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle, while speaking, said that this Panel is illegal, that it did not have the approval of the Security Council of the United Nations or the members of the United Nations. The Secretary-General has every right to appoint anybody to advise him and that does not need the sanction of the United Nations General Assembly or the Security Council. This Panel of Experts has issued a Report. If the Secretary-General is to act on this Report, then he has to get the endorsement of the Security Council or the members of the United Nations before he proceeds further.

At this stage, what should the Government be doing? The Government should address the issues that have been raised in this Report of the Panel, deal with those and also pursue this in a diplomatic manner so that the international community can be convinced that there were no issues in Sri Lanka or that we are doing our best to make good whatever losses that took place during the war or during the last phase of the war and that we will reconcile the issues that have arisen during the end of the war. Without doing that, what are we doing? We are arousing the people; we are making rhetorical statements; we are only making things worse again. We are creating a fear psychosis; we are creating a phobia in this country and we are using the media to the extremes.

Soon after the Report came out, there was a private media institution which aired a programme to start their news each day called "Rata Wenuwen 8." On the first day, they showed the atrocities the LTTE committed, killing civilians in this country. We never approved it; we are not a part of it and we do not approve the killing of any person.

In fact, when the al-Qaeda leader was killed on the 2nd of May, there was euphoria in the US. A friend of mine sent me a message. He said, "I will not rejoice over the death of any man. I will only mourn the death of one or even many. I cannot rejoice over the death of any person". That is the humanity; that is how we should be. But, what do we do? We are arousing the people. That particular TV programme I was speaking about showed on the second day that the Tamil people in this country are being treated equally. Maybe, the laws say that but in fact, is it happening? There are grievances of the minorities; there are grievances of the Tamil people. All governments in this country, right from the late President J.R. Jayewardene up to President Mahinda Rajapaksa, have accepted that there are grievances of the Tamils and the minorities. That had been acknowledged when His Excellency the President appointed the All Party Representative Committee and also the All Party Conference.

He said that there are differences and they have to be reconciled, they have to be addressed through our own

[ගරු ආර්. යෝගරාජන් මහතා]

mechanism and set up the APRC to evolve a solution, a home-grown solution, to the ethnic conflict in this country. What has the Government done with it? They have just thrown it away into the wastepaper basket. The Chairman, who was shown to all foreign visitors as the symbol of the peace process, is today not talked about. So, this is the reaction of this Government to reconciliation, which is very unfortunate.

While the Hon. (Dr.)(Mrs.) Sudharshini Fernandopulle was speaking, she mentioned about collateral damage. Our good Friend, the Deputy Minister of Economic Development, the Hon. Lakshman Yapa Abeywardena, in his speech said, "We did everything to minimize the deaths during the last phase of the war but still there may have been casualties. We regret it." That is exactly what the UN Panel, the United Nations and the whole world is expecting from Sri Lanka. The Report of the United Nations Secretary-General's Panel of Experts on accountability in Sri Lanka states this so well and clearly. It states that there are five core categories of potential serious violations committed by the Government. They have been listed as, I quote:

"(i) killing of civilians through widespread shelling; (ii) shelling of hospitals and humanitarian objects; (iii) denial of humanitarian assistance; (iv) human rights violations suffered by victims and survivors of the conflict, including both IDPs and suspected LTTE cadre; and (v) human rights violations outside the conflict zone, including against the media and other critics of the Government."

These are the accusations against the Government and at the same time, in the next paragraph, they list the atrocities and the accusations against the LTTE.

"(i) using civilians as a human buffer; (ii) killing civilians attempting to the flee LTTE control; (iii) using military equipment in the proximity of civilians; (iv) forced recruitment of children; (v) forced labour; and (vi) killing of civilians through suicide attacks."

Here, it is so clearly stated that the LTTE used civilians as a buffer and the Government can accept this fact and that civilians did really die not due to their own action but due to the circumstances of the war in the last phase.

The Government should reconcile the minds of those people who are suffering today because they lost their loved ones. The Hon. E. Saravanapavan, in his speech said that today the women are in a dilemma. They do not know whether their husbands are alive or dead. They are unable to wipe off the *pottu* on their foreheads because they are not certain that their husbands are dead and they are fearing to keep that *pottu* also because it is considered wrong to have the *pottu* if their husbands are dead. Similarly, they are unable to decide whether to have their *thali* around their neck or whether to remove it because they do not know whether their husbands are alive or dead.

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)

Hon. Member, why do you not talk about Osama bin Laden as well?

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Osama bin Laden? What has Osama bin Laden to do with our country? - [*Interruption.*]

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

Why not? - [*Interruption.*]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

I am talking about our country. I am talking about reconciliation between the Tamils and the Sinhalese so that we can live unitedly in this country. - [*Interruption.*] You also do not get carried away. You are a good lawyer. - [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! - [*Interruption.*]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Do not behave like this.—[*Interruption.*]

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

You are a

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

- [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please!

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

I do not mind you calling me that. My heart knows that I am not a

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

I am a faithful citizen of this country. - [*Interruption.*]

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
You are supporting terrorism.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Never, I have never been. I have never been and will never be a supporter of terrorism. I have never taken to arms. I do not believe in violence. I do not believe in winning my beliefs through violence. I can never support a terrorist. I have sat with the Hon. (Prof.) Tissa Vitarana to create a peace agreement between our people so that we can live unitedly forever.

You always say that the war was not against the Tamils but against the terrorists. Today, we have people in the prisons. Our former Minister of Rehabilitation and Prison Reforms is present here. Why do we allow people to visit those criminals who have been convicted? I believe and you believe that they are criminals. They are people who have done wrong: they may be murderers; they maybe rapists; they maybe rogues. They could be put in prison for several reasons. During the period they are in prison, though you and I think they are criminals, for their family members, they are brothers, they are fathers, they are sons, daughters or a sisters. What do these people do? They make every occasion possible to go and visit them, to buy something for them, to make at least one day of the month somewhat happy for them, even though they are in prison. Why do we do this? Because human relationships are beyond what a man does or does not do. What did this Government first do? There were cemeteries built by the LTTE. Maybe there are terrorists who are lying under those tombs. But, the families of those terrorists still think of them as brothers, fathers, sons or sisters. For them, once a year, they take an opportunity to go there and worship for their souls. This Government used bulldozers to destroy all these cemeteries and put up army camps and cantonments over them. This cannot lead to reconciliation. You have to sympathize with your enemy, understand him and address his issues. Only that will lead to reconciliation. Are we willing to do that? Only when we do that, we can get rid of not only the UN Panel, but no panel can take action against our country if we are willing to face realities. To take up the issue that we are facing today in a realistic manner, we have to reconcile.

Recently, the TNA went to Vavuniya. They were promised that they will be given lists of persons who are presently in custody. My Friend, the Hon. Sajin De Vass Gunawardena was supposed to go with them and get the names. Do you know that one newspaper had questioned as to why Sajin De Vass Gunawardena was put to discuss this when he is only a backbencher. But, I thought that was a very good thing. He has the direct ear of His Excellency the President and he can do something useful and his being in that discussion will be very effective, I thought. And, when I read in the newspapers that the TNA is going to be having access to the TID's database, I was very happy that the Hon. Sajin De Vass Gunawardena had succeeded in convincing the powers that be, to give or disclose this information. Unfortunately, they did not get it this time also. It is very good if you do that. That will destroy the Panel Report to some extent. That is reconciliation.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have to wind up now.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Sir, please give me two more minutes.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is too long.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
So, for reconciliation, you disclose those names. Then, as the Hon. E. Saravanapavan said, if those persons, the families, are unable to reconcile themselves whether a person is dead or alive, those wives who are still in a dilemma as to whether they should wipe off their *pottu*, remove their *thali* or not, will be able to do it. Then, we can have true accountability, the account of the number of people who would have died during the war as collateral damage. I do not call it the killing of people willingly by any government or any forces or anybody. It is collateral damage caused partly by the LTTE because they held them as human buffers and partly by the Government which overlooked them and went on with the war. So, those people who are found dead after that have to be compensated. Those families, those relatives have to reconcile themselves to the realities. So, there has to be an opportunity given to those people. Only then we can have reconciliation and true peace in this country.

Sir, I will not speak for a long time. I have just one sentence to add. True reconciliation can come only if the cause for the war is eliminated from our society. That is equal treatment to all communities and meeting the political aspirations of the Tamil people of this country. Only then, we can reach true reconciliation and permanent peace in this country and I hope the Hon. Sajin De Vass Gunawardena can contribute towards that.

Thank you.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Can I ask you one question?

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Go ahead, please.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Reconciliation is a process that is definitely taking place step by step. But, in the same spirit, you being a Member of the Tamil community, the elite Tamil community, - if I may say so - why can you not think about reconciliation of your differences with the Hon. S.Thondaman also? Let us start there. Let us start reconciliation between the same community first and we will approach reconciliation most certainly.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
This is not reconciliation between persons - [*Interruption*.]

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
His Excellency the President will definitely approach that.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Thank you.

[අ. භා. 6.03]

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ විවාද කරන මේ වෙලාවේ කරුණු කිහිපයක් ගරු සභාව හමුවේ තබන්න මා බලාපොරොත්තු වෙනවා.

මේ හදිසි නීති විවාදයේ අවධානයට ලක් වෙච්ච කාරණා කිහිපයක් තිබෙනවා. එකක් තමයි අද "ලංකාදීප" පුවත් පතේ මුල් පිටුවේ පළ වී තිබූ වාර්තාව. එම වාර්තාව ගැන කරුණු කියමින් ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා උත්සාහයක් දැරුවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් හා ආණ්ඩුව අතර යම් කිසි අර්බුදයක් නිර්මාණය කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම වාර්තාවේ සඳහන් වන ආකාරයේ ක්‍රියා මාර්ගයක් ගන්න ආණ්ඩුව මේ දක්වා තීරණයක් අරගෙන නැහැ. ඒ ප්‍රවෘත්තිය පදනම් කර ගෙන බොරු භීතියක් නිර්මාණය කරන්න එතුමා දරපු උත්සාහය අපි ඉතාමත්ම පිළිකුලෙන් හෙළා දකිනවා.

ඒ වාගේම අපි දන්නවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය අවසන් වෙලා ක්‍රමානුකූලව මේ රටේ සාමකාමී වාතාවරණය තහවුරු වෙමින් පවතින මේ කාලයේ ඉතාමත්ම බලවත් අභියෝග අපි ඉස්සරහ පිට නිර්මාණය වෙමින් එන බව. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා යුද්ධයෙන් පසු එම ප්‍රදේශවල ජනතාව යථා තත්ත්වයකට ගෙන ඒමේ අවශ්‍යතාව ගැන, ඒ වාගේම එම ජනතාව සහ සෙසු ජනතාව සමඟි සම්පන්න කිරීමේ අවශ්‍යතාව ගැන කථා කළා. නමුත් අපි තේරුම් ගන්න ඕනෑ, එතුමන්ලා මේ හැම කථාවකින්ම වක්‍රාකාරයකින් කොටි ත්‍රස්තවාදය සාධාරණීකරණය කරනවාය කියන එක. අද අපි ඉතාම පැහැදිලිව දන්නවා, මේ රටේ දෙමළ ජනතාවට නැවත ඔවුන්ගේ ජීවිත යථා තත්ත්වයකට පත් කර ගන්න බාධා කරන, විශේෂයෙන්ම උතුරේ ජනතාවට බාධා කරන ප්‍රධාන සාධකය බවට ජාතිවාදී පදනමක ඉඳ ගෙන ක්‍රියාත්මක වන දෙමළ දේශපාලන ව්‍යාපාර පත් වෙලා තිබෙන බව. එසේ ජාතිවාදී පදනමක ඉඳ ගෙන ක්‍රියාත්මක වන දෙමළ දේශපාලන ව්‍යාපාරවලට ඒ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න ඕනෑ නැහැ. ඒ ජාතිවාදයම වපුරලා බොහොම පහසුවෙන් ඊ ළඟ මැතිවරණවලදී ජය ගන්න තමයි ඒ අයට ඕනෑ. සමහර මන්ත්‍රීවරුන්ට ඕනෑ නම් එක පාරක් ත්‍රිකුණාමලයට ගිහිල්ලා ඡන්දය දිනන්න පුළුවන් මේ ජාතිවාදය ඇවිළෙව්වොත්. හැබැයි ජාතිවාදය නැත්නම් ඒ ජනතාව අතරට ගිහිල්ලා වැඩ කරන්න වෙනවා, ඔවුන්ගේ සංවර්ධනය වෙනුවෙන් කැප වෙන්න වෙනවා, ඔවුන් වෙනුවෙන් මහන්සි වෙන්න වෙනවා. නමුත් ජාතිවාදය අවුළුවලා, වපුරලා ඒ විෂබීජ ටික තිබෙනවා නම් ඒ අවශ්‍යතාව පැන නඟින්නේ නැහැ, කොළඹට වෙලා ඉඳලා ඒ අයට දිනන්න පුළුවන්. කොළඹට වෙලා ඉඳලා, නැත්නම් වෙන රටකට වෙලා ඉඳලා ඒ අයට දිනන්න පුළුවන්. ඉතින් ඒ අයගේ ආත්මාර්ථකාමී අරමුණු වෙනුවෙන් තමයි අද ඒ දෙමළ ජනතාව දේශපාලන වශයෙන් අවාසනාවන්ත අගාධයකට ඇද ගෙන යමින් තිබෙන්නේ. මේක තමයි අද උතුරේ සහ නැඟෙනහිර දෙමළ ජනතාවගේ ජීවිත වෙනස් කරන්න, අලුත් කරන්න තිබෙන ප්‍රධාන බාධාව. ඒ අයට ඕනෑ දෙමළ ජනතාවගේ ජන ජීවිතය උසස් කරන එකට වඩා ඒ තිබෙන ජාතිවාදය, ඒ සමාජයේ කාලයක් තිස්සේ වපුරපු ජාතිවාදය අවුළුවන්න විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා අද අන්තර්ජාතික වුවමනාවත් ඒක බව. මේ පැරුණු තුවාලය නැවත පාරවන්න විවිධ ආකාරයෙන් බලනවා. සනීප වෙන්න යන තුවාලය නැවත පාරන්න උත්සාහ කරනවා. විවිධ ආකාරයෙන් නැවත ශ්‍රී ලංකාවේ සමාජ අර්බුදයක්, ගැටුමක් නිර්මාණය කරන්න බලනවා. දෙමළ ජනතාව අතර එල්ටීටීඊය වැනි විසකුරු ව්‍යාපාරයකට නැඟී සිටින්න අවශ්‍ය කරන වාතාවරණය හදන්න බලනවා. බෑන් කි මූන්ගේ උපදේශක කමිටු වාර්තාව ආවට පස්සේ රුද්‍රකුමාරන් මොකක්ද කිව්වේ? "මේක තමයි අපේ පළමුවැනි පියවර" කියා කිව්වා. "අපි මේ වැඩේ පටන් ගත්තා විතරයි" කියලා කිව්වා. ඒක රුද්‍රකුමාරන් සලකන්නේ තමන්ගේ ක්‍රියාන්විතයේ කොටසක් හැටියටයි. සම්පන්දන් මැතිතුමාත් ඒ වාර්තාවෙන් ඉමහත් චිත්ත ප්‍රීතියට පත් වෙලා ප්‍රකාශයක් කළා. ඒක ඔවුන් සලකන්නේ තමන්ගේ දේශපාලන ව්‍යාපෘතියේ කොටසක් හැටියටයි.

බෑන් කි මූන්ගේ උපදේශක කමිටුව දැම්මේ ශ්‍රී ලංකාවේ යුද්ධයේ අවසාන කාල පරිච්ඡේදයේ වෙච්ච දේවල් හොයන්න; ඒ ගැන එයාට උපදේශයක් දෙන්න. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්ට තමන් කැමැති අයගෙන් උපදේශ ගන්න පුළුවන්. හැබැයි ඒ උපදේශ මොකටද ප්‍රසිද්ධියට පත් කරන්නේ? ඒ උපදේශ මොකටද ලෝකයට දෙන්නේ? ඒ උපදේශ මොකටද අපට දෙන්නේ? ඒ උපදේශය අයිති එතුමාට. එතුමාට කැමැති නම් ඒක පිළිගන්න පුළුවන්. නැත්නම් නොපිළිගන්න පුළුවන්. ඒක එතුමා බලලා තමන්ගේ මේසය උඩ තියා ගත්තාට වරදක් නැහැ. හැබැයි ඒක ප්‍රසිද්ධ කළේ ඇයි? ඒක ලෝකයට දුන්නේ ඇයි? වෙන මොකටවත් නොවෙයි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිල ව්‍යූහයක් පාවිච්චි කරලා ඒ වාගේ වාර්තාවක් හදලා ලංකාවට ගහන්න බැරි හන්දා උපදේශයට දාගත්ත කමිටුවකින් හදා ගත්තු හොර වාර්තාවක්, පක්ෂග්‍රාහී වාර්තාවක් පාවිච්චි කරලා කොටි සංවිධානයට ඕනෑ කරන, රුද්‍රකුමාරන්ලාට ඕනෑ කරන වුවමනාව ඉටු කරලා ඒ මඟින් ශ්‍රී ලංකා රාජ්‍යයට ගහන්නයි ඒක කළේ. මේකේ බලපෑම අඩුයි කියලා පෙන්වන්න පස්සේ බෑන් කි මූන්

කියනවා, "මට මේකට බලයක් නැහැ. දඬුවම් කරන්න මට එහෙම හැකියාවක් නැහැ" කියලා. ඒක එයාට නැහැ තමයි. හැබැයි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිල ව්‍යුහයක් පාවිච්චි කරලා කරන්න බැරි වැඬේ තමයි මේ ව්‍යුහය පාවිච්චි කරලා කළේ. ඒකෙන් චිත්ත ප්‍රීතියට පත් වුණේ කවුද? උතුරේ අසරණ දෙමළ ජනතාවද? නැහැ. ලෝකය පුරා විසිරිලා කොටි සංවිධානයට නැවත පණ දෙන්න බලා ගෙන ඉන්න ඒ රුද්‍රකුමාරන් ඇතුළු ඒ සමඟ නියමින් හා අනියමින් පෙළ ගැහිච්ච කල්ලි කණ්ඩායම් විතරයි ඒකෙන් චිත්ත ප්‍රීතියට පත් වුණේ. අර අවතැන් වූ ජනතාව චිත්ත ප්‍රීතියට පත් වුණාද? ඔවුන්ට ඒකෙන් සතුටක් ආවාද? ඔවුන්ගේ ජීවිත උසස් වුණාද? ඒ වාර්තාවෙන් ඔවුන් වෙනත් අනාගතයකට අරන් ගියාද? නැහැ. ඒ සුවපත් වෙමින් තිබෙන තුවාල පාරලා, රුද්‍රකුමාරන්ලාට "ඔන්න අපි පටන් ගත්තා විතරයි" කියලා බොහොම ආස්වාදජනක ප්‍රකාශයක් කරන්න අවශ්‍ය වාතාවරණය විතරයි හැදුවේ. මහත්වරුනි, තමුන්නාන්සේලා කොහොම කිව්වත් මේක පෙනෙනවා. එදා කොටි සංවිධානයට ආයුධ බලය පාවිච්චි කරලා කර ගන්න බැරි වෙච්ච වැඬේ රුද්‍රකුමාරන්ලා අද බලනවා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්ව පාවිච්චි කරලා, උන්නැහේලාගේ වාර්තා පාවිච්චි කරලා, ජිනීවා මානව හිමිකම් කවුන්සිලය පාවිච්චි කරලා කර ගන්න; ශ්‍රී ලංකා රාජ්‍යයට විරුද්ධ ප්‍රහාර ඒ විධියට ක්‍රියාත්මක කරන්න. ඉතින් අපට මේක නොතේරෙනවා නම් මේ රටේ දේශපාලනය කරන්න පුළුවන්කමක් නැහැ. අනෙක, එහෙම නම් මේ වාර්තාවෙන් චිත්ත ප්‍රීතියට පත් වෙච්ච අය දැන් බැන් කි මූන් මහත්මයාට යෝජනා කරන්න ඕනෑ, කරුණාකරලා ඔසාමා බින් ලාඩන්ව ඝාතනය කරපු ආකාරය ගැනත් සොයන්න වහාම උපදේශක කමිටුවක් පත් කරන්නය කියලා. ඔසාමා බින් ලාඩන්ව මැරුවේ කොහොමද? අනුන්ගේ රටකට ගිහිල්ලායි. ඒ රට පවා දැනුවත් නොකර ගිහිල්ලායි. මැරුවාය කියන විධිය ඒකයි. දැන් ඔවුන්ම කියනවා ආයුධ නැතුවයි හිටියේ කියලා. ගිහිල්ලා මරා දැම්මා. ඒ හිටපු දරුවන්ට, බිරින්දෑවරුන්ට පවා වෙඩි තිබ්බා. අනෙක, එක්සත් ජනපද ජනාධිපති බැරක් ඔබාමා කියනවා, "මම නියෝග කළේ මරන්න" කියලා. ශිෂ්ට සම්පන්න නීතියක්, අධිකරණ ක්‍රියාදාමයක් පවතින රටක ත්‍රස්තවාදියකුව මරන්න නියෝග කළා කියලා එළිපිට කියන්නේ කොහොමද? පිරබාහරන් මැරුණේ යුද්ධයේදී; දෙපාර්ශ්වය අතර පැවැති සටනේදී. ඒක මුළු ලෝකයම දන්නවා. කොටි සංවිධානයේ පිරබාහරන්ගේ අම්මා, තාත්තා රැක බලා ගත්තේ අපේ හමුදාව. කොටි නායකයන්ගේ බිරින්දෑවරු බේරලා රැක බලා ගත්තේ අපේ හමුදාව. සිවිල් ජනතාව ආරක්ෂා කර ගත්තේ අපේ හමුදාව. අද එහෙම නම් මේ බැන් කි මූන් ගේ වාර්තාවෙන් සතුටට පත් වෙච්ච උදවිය කරුණාකරලා යෝජනා කරන්න, බැරැක් ඔබාමා ඔසාමා බින් ලාඩන්ට එල්ල කළ ප්‍රහාරය ගැනත් වාර්තාවක් නිකුත් කරන්නය කියලා.එහෙම යෝජනා කරන කවුරුවත් නැහැ. තමුන්නාන්සේලා ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ රැට, රැට රවුම් ගහලා මොනවාද කියන්න ඕනෑ කියලා එහෙන් අහලා ඉල්ලා ගන්නවා න්‍යාය පත්‍රය. ඒ ටික මෙහේ ඇවිල්ලා කියනවා. ඒ ටික ගිහිල්ලා දෙමළ ජනතාවගේ ඔළුවලට දානවා. දාලා මේ ඇති වෙමින් පවතින සමඟිය නැති කරන මාර්ගය බලනවා. නැවත භේදය වපුරන මාර්ගය බලනවා. ඒකටයි මේ දේශපාලන ක්‍රියා දාමය ආරම්භ කරලා තිබෙන්නේ. ඒකට තමයි බැන් කි මූන්ගේ වාර්තාවෙන් උඩ ගෙඩි දෙන්නේ. රුද්‍රකුමාරන්ලා චිත්ත ප්‍රීතියට පත් වෙන්නේ ඒකෙන්. ඒ නිසා මේ ක්‍රියාදාමය අපි තේරුම් අර ගෙන තිබිය යුතුයි. මේ කරන්න හදන්නේ මොකක්ද? සමහරු හදනවා බැන් කි මූන්ගේ උපදේශක කමිටුවේ "Three Idiots" වාර්තාව හැල්ලු කරන්න; ඒක ශ්‍රී ලංකා රජයට එරෙහි මහා ප්‍රහාරයක් නොවෙයි කියලා පෙන්වන්න; ඒක ජනතාව ගණන් ගත යුතු නැහැ කියලා කියන්න; ඒක මහින්ද රාජපක්ෂගේ පෞද්ගලික ප්‍රශ්නයක් හැටියට පෙන්වන්න. අපි අවධාරණය කරනවා, රුද්‍රකුමාරන්ලා චිත්ත ප්‍රීතියට පත් වෙන්නේ ඒ බව දන්න හින්දාය කියන එක. යුගෝස්ලාවියාවෙන් කොසෝවෝ ප්‍රදේශය කඩන්න පටන් ගත්තේ මේ වාගේ වාර්තා පදනම් කර ගෙන තමයි.

යුගෝස්ලාවියාවේ ජනාධිපතිට යුද අපරාධ චෝදනා ගෙනෙන්න මූලාරම්භක පියවර තැබුවේ මේ වාගේ වාර්තා හරහා තමයි. අන්තිමට ජනාධිපතිවරයාව යුද අධිකරණයට ගෙන යෑමෙන් විතරක් ප්‍රශ්නය ඉවර වුණේ නැහැ. කොසෝවෝ ප්‍රදේශයත් කඩලා තමයි නේටෝ එක ඒ ප්‍රශ්නය ඉවර කළේ. එල්ටීටීඊ එක වැනි බල සම්පන්න ත්‍රස්ත ව්‍යාපාරයක් එතැන තිබුණේත් නැහැ. මේ අන්තර්ජාතික බලවේගත් එක්ක එකතු වුණු මෙහෙයුමක් ශ්‍රී ලංකාවට එරෙහිව පණ ගන්වා දියත් කරලා තිබෙන වෙලාවක, මේ රටේ දේශපාලන බලවේග, මේ රටට ආදරය කරන බලවේග, මේ රටේ වැසියන් මේ අවදානම, අන්තරාය හරියට දැකලා, ඊට විරුද්ධව ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව අද මතු වෙලා තිබෙනවා. නමුත් සමහරු බැන් කි මූන්ගේ වාර්තාව මඟින් එන ප්‍රහාරය පෙන්වා මෙතැන තව තවත් අවුල් කරන්න, භේද භින්නතා නිර්මාණය කරන්න පුළුවන්ද කියා බලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අවශ්‍ය වන්නේ, දශක තුනක් විනාශ වුණු, දශක තුනක් උතුරු හා නැඟෙනහිර දෙමළ ජනතාව ඇතුළුව සිංහල, මුස්ලිම් සියලු ජනතාවට සියල්ල අහිමි කරපු ඒ අතීතයට නැවත මේ රට අරගෙන යන එක නොවෙයි. අද අවශ්‍ය වන්නේ, මේ රටේ ජනතාව අතර සහජීවනය ඉතාමත්ම වේගයෙන් ගොඩ නඟන එකයි. ඒ වෙනුවෙන් රජය ගන්නා මහන්සිය, පියවර මදි නම්, ඒ වෙනුවෙන් තව ගන්න ඕනෑ පියවර මොකක්ද කියලා තමුන්නාන්සේලා යෝජනා කරන්න. ඒ සඳහා එකතු වන්න. ඒ සඳහා දායක වන්න. ඒක නොකර, තව තවත් ජාතිවාදය අවුළුවා, අන්තර්ජාතික බලවේගවලින් එන වාර්තා ඇතුළු දේවල් යොදා ගෙන මේ ගෙන යන ක්‍රියාදාමය මේ රට තව තවත් අර්බුදයට පත් කිරීමක් හා මේ රටින් පළි ගැනීමක් හැරෙන්න වෙන දෙයක් වන්නේ නැහැ.

අපි කවුරුත් දන්නවා, අද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් කියන්නේ මොන තරම් පක්ෂග්‍රාහීව කටයුතු කරන කෙනකුද කියලා. ඇමෙරිකා එක්සත් ජනපදය අද බින් ලාඩන් නමැති ත්‍රස්තවාදියා මරා දැමීම පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. කොටි සංවිධානයට ජාතික ආවේග තිබුණා. දෙමළ ජනතාව පිළිබඳ ආවේගයකින් තමයි කොටි සංවිධානය පණ පෙවුණේ. නමුත් එවැනි ආවේගයක් තිබුණාය කියලා ත්‍රස්තවාදය සාධාරණීකරණය කරන්න බැහැ. බින් ලාඩන්ට තිබුණා, ආගමික ආවේගයක්. ඉස්ලාමීය ආගමික ආවේගයක් බින් ලාඩන්ට තිබුණා. ඔසාමා බින් ලාඩන් ඉස්ලාමීය ආගමික ආවේගයකින් අනූන වුණාය කියලා ඒ ත්‍රස්තවාදය සාධාරණීකරණය කරන්න බැහැ.

විශේෂයෙන් මේ රටේ කොටි සංවිධානය සමඟ හිතවත්ව කටයුතු කරපු දෙමළ දේශපාලන සංවිධාන කොටි සංවිධානය බලවත්ව හිටපු කාලයේ මේ සභාව ඇතුළේ මොන වාගේ කථාද කළේ කියලා අපි අහ ගෙන සිටියා. හමුදාවේ රණ විරුවන්ගේ බෙලි කපලා මේ ප්‍රදේශවලට එවන හැටි මෙතැන පාරම් බෑවා. මේ සභාවේ අපි කවුරුත් ඒවා අහගෙන හිටියා. නමුත් අපට අවශ්‍ය නැහැ, ඒ අතීතය නැවත සාකච්ඡාවට අරගෙන ඇවිත් මේ ගොඩ නැඟෙන සහජීවනය විනාශ කිරීම සඳහා කටයුතු කරන්න. අද ඕනෑ කරන්නේ ඒක නොවෙයි. අපේ ආරක්ෂක හමුදා කටයුතු කරපු ආකාරය වැරැදියි කියලා බැන් කි මූන් උන්නැහේලාගේ ඊනියා වාර්තාවලින් කියනවා නම්, ඇමෙරිකා එක්සත් ජනපදය අද ඔසාමා බින් ලාඩන්ට එරෙහිව කටයුතු කර තිබෙන ආකාරය හරිද, වැරැදිද කියා කියන්න ඕනෑ නැද්ද? ඒ ගැන තමුන්නාන්සේලාගේ මතය දක්වන්න ඕනෑ නැද්ද? සුදු කොඩි අරගෙන ආපු අයට වෙඩි තැබුවාද, නැද්ද කියලා අහනවා. ඇමෙරිකා එක්සත් ජනපදයත් උන්නැහේලාගේ වාර්තාවලින් කියලා තිබෙනවා නේ, "ලංකාවේ මානව හිමිකම් උල්ලංඝනය වනවා. අරක නැහැ. මේක නැහැ"යි කියලා. රොබට් ඕ. බ්ලේක් මහත්මයා ඊයේ කියා තිබුණා, ඔසාමා බින් ලාඩන් හා වේළුපිල්ලේ පිරබාහරන් සමානයි කියලා. ඉතින් එහෙම නම්, මේ ත්‍රස්තවාදී නායකයන් දෙදෙනා එක හා සමාන

[ගරු විමල් වීරවංශ මහතා]

නම්, ඉන් එක ත්‍රස්තවාදියකු විනාශ කරපු නායකයාට යුද අපරාධ චෝදනා ඉදිරිපත් කරන්නේ කොහොමද? අනික් ත්‍රස්තවාදියා විනාශ කරපු නායකයා කියනවා, යුක්තිය ඉටු කළා කියලා. ඔසාමා බින් ලාඩන්ව මරා දැමීම යුක්තිය ඉටු කිරීමක්ය කියනවා. කාටද? ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු ඒ ගොඩනැගිලිවලට එල්ල වුණු ප්‍රහාරයෙන් දරුවන් අහිමි වුණු ඒ පවුල්වලට. නමුත් වේළුපිල්ලේ පිරබාහරන් පරාජයට පත් කිරීම, ඉවර කිරීම වැරැද්දක්ය කියනවා. ඒක යුද අපරාධයක්, ඒක නීතියට පිටින් ගනු ලැබූ බලය පාවිච්චි කිරීමක් කියලා කියනවා. ඒක අර්ථ කථනය කරන්නේ එහෙමයි. මේ රට ඇතුළේ මේ ගැටුම තිබුණේ. වෙන රටකට ගිහින් පිරබාහරන්ව මැරුවේ නැහැ. මේ රට ඇතුළේයි යුද්ධය තිබුණේ. එය මුහුණට මුහුණ තිබුණු සටනක්. ඒ සටන වැරැදියි, ඒක යුද අපරාධයක් කියලා කියනවා. නමුත් බින් ලාඩන් ඝාතනය කිරීම ඔබාමාට යුක්තිය ඉටු කිරීමක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දෙබිඩිභාවය මොකක්ද? දැන් මෙතුමන්ලා බින් ලාඩන් ඝාතනය ගැන කථා කරන්නේ නැත්තේ ඒකයි. කොටි සංවිධානය මර්දනය කිරීම සහ ඊට අදාළ කරුණු සාකච්ඡා කරන අය, බින් ලාඩන් ඝාතනය හා ඇමෙරිකා එක්සත් ජනපදය කටයුතු කරපු ආකාරය ගැන මුනි වත රකිනවා. මොකද, මේ ගොල්ලන්ට රටේ ඇමෙරිකානු තානාපතිතුමා එක්ක සාකච්ඡා කරන්න තිබෙනවා; ඒ උපදෙස් අනුව වැඩ කරන්න තිබෙනවා; එහෙන් හම්බ වෙන පණම් අටෙන් ජීවත් වන්න තිබෙනවා. ඉතින් ඒ ගැන කථා කරන්නේ නැහැ. එම නිසා අපි කියන්නේ තමුන්නාන්සේලා සැබෑ ලෙසම මේ රටේ දෙමළ ජනතාවට ආදරය කරනවා නම්, මේ රටේ දෙමළ ජනතාව නැවතත් යුද්ධයකට ඇද ගෙන යන්න අවශ්‍ය නැහැයි කියලා අවංකවම කල්පනා කරනවා නම්, අවුරුදු තිහක් විඳපු වේදනාව ඇතියි කියලා හිතනවා නම්, ඊ ළඟ පරපුරටත් ඒ පාප කර්ම අතීතයම නැවත භාර දෙන්න ඕනෑ නැහැයි කියලා විශ්වාස කරනවා නම්, කරුණාකරලා මේ වෙලාවේ අන්තර්ජාතිකව එන ද්‍රෝහී ක්‍රියාමාර්ගයත් එක්ක පෙළ ගැහෙන්නේ නැතුව, සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව එක ධජයක් යටතේ, එක අනාගතයක් කරා රැගෙන යෑම වෙනුවෙන් ක්‍රියාත්මක වන්නය කියන ආයාචනය කරමින් මා මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. இப்பொழுது மாண்புமிகு ஹுனைஸ் பாறூக் அவர்கள் உரை நிகழ்த்துவார்.

[பி.ப. 6.18]

**ගරු හුනෛයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அவசர காலச் சட்டத்தை நீடிப்பது தொடர்பான விவாதத்தில் கலந்து கொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்காக முதலில் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இன்றைய சூழ்நிலையில் இந்த அவசரகாலச் சட்ட நீடிப்பு அவசிய மானதாக இருக்கின்றபொழுதிலும், எதிர்வரும் காலங்களில் அவசரகாலச் சட்ட விதிகள் தொடர்பாகக் கூடிய கவனம் செலுத்தப்பட்டு, அவற்றில் சில தளர்வுகளை மேற்கொள்வது பொருத்தமாக இருக்குமென்பது எனது கருத்தாகும். ஏனெனில் கடந்த மூன்று தசாப்த காலமாக நிலவிய யுத்த முடிவுக்குப் பின்னர் குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களில் வாழ்கின்ற மக்களின் இன்றைய தேவை சமாதான சூழ்நிலையும் அபிவிருத்தியு மேயாகும். எனவே, நாங்கள் இவற்றைக் கருத்திற்கொண்டு அவசரகாலச் சட்டம் தொடர்பாக இன்னும் ஆழமாகச் சிந்திக்க வேண்டியவர் களாக இருக்கின்றோம்.

மேலும், வன்னி மாவட்டத்தின் தற்போதைய நிலைமைகளை எடுத்துக்கொண்டால், கடந்தகால யுத்தத்தினால் பல அழிவுகளுக் குள்ளாக்கப்பட்டு இன்று சாதாரண சூழ்நிலையை எதிர்நோக்கிக் கொண்டிருக்கின்ற எமது பிரதேசங்களில் உள்ள அரசாங்கத் திணைக்களங்களை மீள்நிர்மாணம் செய்ய வேண்டிய அவசியம் ஏற்பட்டுள்ளது. ஏனெனில் யுத்தகால சூழ்நிலைக்குப் பழக்கப் பட்டுள்ள அரசாங்க உத்தியோகத்தர்கள், யுத்தத்தினால் அங்குள்ள கட்டிடங்களும் வளங்களும் மோசமாகப் பாதிக்கப்பட்டுள்ள நிலையில், அப்பிரதேசங்களில் தொடர்ந்தும் கடமையாற்றிக் கொண்டிருக்கிறார்கள். எனவே, அப்பிரதேசங்களைப் புனர் நிர்மாணம் செய்ய வேண்டிய பொறுப்பு சம்பந்தப்பட்ட தரப்பின ரின் கடமையாகும் என்பதை இந்தச் சந்தர்ப்பத்தில் தாழ்மையுடன் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், 1990ஆம் ஆண்டில் வன்னிப் பிரதேசங்களிலிருந்து பலவந்தமாக வெளியேற்றப்பட்ட முஸ்லிம் மக்கள் இன்று மீண்டும் அப்பிரதேசத்தில் குடியமர்த்தப்படும்பொழுது இரண்டு வகையாகக் கையாளப்படுவது மிகவும் கவலைக்குரிய விடயமாகும். முன்னாள் மீள்குடியேற்ற அமைச்சர் மாண்புமிகு மில்ரோய் பெர்னான்டோ அவர்கள் அகதிகளைப் 'பழைய அகதிகள், புதிய அகதிகள்' என இரண்டு விதமாகக் கையாளும்வகையிலான நிவாரண ஒப்பந்தம் ஒன்றில் கைச்சாத்திட்டிருந்தார். அதன் பின்னர் அந்த விடயம் மாண்புமிகு றிஸாத் பதியுதீன் அவர்களாலும் என்னாலும் மேதகு ஜனாதிபதி அவர்களின் கவனத்துக்குக் கொண்டுவரப்பட்டது. ஜனாதிபதி அவர்கள் "எதிர்வரும் காலங்களில் அந்தப் பிரதேசங்களில் உள்ள அரச மற்றும் அரச சார்பற்ற நிறுவனங்களி னால் அவ்வாறான பிரிவினைகள் எதுவும் மேற்கொள்ளப் படக்கூடாது" என்று உத்தரவு பிறப்பித்திருந்தார். இருப்பினும் தற்பொழுது உள்ள மீள்குடியேற்ற அமைச்சர் மீண்டும் இத்தகைய தொரு ஒப்பந்தத்தில் கைச்சாத்திட்டிருப்பது உண்மையிலே வன்னிப் பிரதேசத்தில் வாழ்கின்ற பழைய அகதிகள், குறிப்பாக முஸ்லிம் மக்களுக்குப் பெரும் சவாலாகவும் நிவாரணப் பணிகளில் பெரிய தாக்கத்தையும் ஏற்படுத்தியுள்ளது. எனவே, தொடர்ந்தும் இவ்வாறான நிலைமைகளை நீடிக்கவிடாது, யார் அகதிகளாக்கப் பட்டார்களோ அல்லது மீண்டும் சொந்த இடங்களில் யார் மீள்குடியேறுகிறார்களோ, அவர்களுடைய தேவைகளை அறிந்து அங்குள்ள அரச, அரச சார்பற்ற நிறுவனங்கள் அவர்களுக்குரிய நிவாரண உதவிகளை வழங்கவேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

அதுமட்டுமன்றி, அப்பிரதேசத்திலுள்ள காணிப் பிரச்சினை களை எடுத்துக்கொண்டால், 1990ஆம் ஆண்டுக்கு முற்பட்ட காலங்களில் அப்பிரதேசங்களிலுள்ள காணிகளுக்கு உறுதிகள் இல்லாதநிலையில் அரச உத்தரவின் பெயரில் காணிக ளைப் பயன்படுத்தி வந்தவர்களை 1990ஆம் ஆண்டில் அவர்களின்

காணிகளிலிருந்து வெளியேற்றியதன் நிமித்தம் அவர்களுக்கு 20 வருட காலம் தமது காணிகளைக் கைவிட வேண்டிய நிலைமை ஏற்பட்டது. ஆனால், இடைப்பட்ட யுத்த சூழ்நிலைக்காலங்களில் அப்பிரதேசத்தில் வாழ்ந்த மக்களில் சிலர் முஸ்லிம் மக்களுடைய காணிகளையும் சிங்கள மக்களுடைய காணிகளையும் பலவந்த மாகக் கைப்பற்றிய நிலைமை காணப்படுகிறது. எனவே, இந்த நிலைமை பரிசீலிக்கப்பட்டு 1990ஆம் ஆண்டுக்கு முன்னர் அந்தக் காணிகளை யார் பயன்படுத்தினார்களோ அல்லது யாருக்கு வழங்கப்பட்டிருந்ததோ அவர்களுக்கு அக்காணிகள் சொந்தமாக மீளளிக்கப்பட வேண்டும் அல்லது உரித்து மாற்றம் செய்யப்பட வேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன்.

அதுமட்டுமன்றி, 1990ஆம் ஆண்டில் வெளியேற்றப்பட்ட மக்கள் ஒரு குடும்பமாக வெளியேறும்போது அன்றைய காலகட்டத்தில் அவர்களுக்கு ஒரு துண்டு வசிப்பிடக் காணி மட்டுமே சொந்தமாக இருந்தது. ஆனால், 20 வருட காலத்தின் பின்னர் இன்று அவர்கள் மீண்டும் மீள்குடியேறச் செல்லும்பொழுது அவர்களுடைய குடும்பம் 4-5 குடும்பங்களாக விஸ்தரித்திருப்பதனால் அவர்களுக்கு மேலதிகமாக 4-5 காணித்துண்டுகள் தேவையாக இருக்கின்றன. புத்தளம் மாவட்டம் மற்றும் ஏனைய மாவட்டங்களில் இடம்பெயர்ந்து வாழ்ந்த முஸ்லிம் மக்கள் மீண்டும் தமது சொந்தக் கிராமங்களில் மீள்குடியேறும்பொழுதுதான் காணியில்லாப் பிரச்சினை ஏற்படுகின்றது. அவர்களுக்கு இருப்பதற்குக் காணியில்லை. அவ்வாறு காணிகள் இருந்தாலும், அங்கு ஒரு வீடு அமைப்பதற்கான வசதிகள் எதுவும் ஏற்படுத்திக் கொடுக்கப்படவில்லை. இதன் நிமித்தம் அவர்கள் யுத்த காலத்தில் எந்த அகதி முகாம்களில் இருந்தார்களோ அதனை நோக்கி மீண்டும் செல்லக்கூடிய நிலைமையை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது.

இவ்வாறான ஒரு சூழலில் இன்று வாக்காளர் இடாப்புப் பதிவு நடவடிக்கைகள் இடம்பெறுகின்றன. குறிப்பிட்ட பிரதேச மக்கள் அப்பிரதேசத்தில் இருக்கின்ற பட்சத்தில்தான் தங்களால் அவர்களுடைய பெயர்களை வாக்காளர் இடாப்பில் பதிவுசெய்ய முடியும் என்று அப்பதிவுகளை மேற்கொள்கின்ற அதிகாரிகள் கடுமையாக நிபந்தனைகளை விதிக்கின்றார்கள். மீள்குடியேறுகின்ற மக்களுக்குப் போதுமான வாழ்வாதார வசதிகளை இந்த அரசாங்கம் செய்து கொடுக்காததன் காரணத்தினால்தான் இன்று அந்த மக்கள் மீண்டும் அகதி முகாம்களை நோக்கி அல்லது ஏற்கெனவே இருந்த இடங்களை நோக்கிச் செல்கின்றார்கள். இவ்வாறு அவர்கள் மீண்டும் செல்கின்ற ஒரு சூழலில் இந்த நடைமுறைகளைப் பின்பற்றுகின்றபொழுது அதிகமான மக்களுக்கு வாக்களிக்க முடியாத ஒரு துர்ப்பாக்கிய நிலை ஏற்படுகின்றது. எனவே, நாங்கள் இது தொடர்பாக தேர்தல் ஆணையாளர் அவர்களைச் சந்தித்து, சில ஏற்பாடுகளைச் செய்திருக்கின்றோம். அவ்வேற்பாடுகள் மேலும் விரிவுபடுத்தப்பட்டு, வாக்காளர்களின் பெயர்களை வாக்காளர் இடாப்பில் பதியும் நடவடிக்கைகளைச் சீர்படுத்த வேண்டுமென நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, முக்கியமாக பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர் மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன அவர்களுக்குத் தமிழ்பேசும் மக்கள் சார்பாக நான் நன்றியைக் கூறக் கடமைப்பட்டிருக்கின்றேன். ஏனென்றால், கடந்த வருடம் நடைபெற்ற - SLAS - இலங்கை நிருவாக சேவைக்கு ஆட்சேர்ப்புச் செய்யும் திறந்த போட்டிப் பரீட்சையில் தமிழ்மொழிமூலம் தோற்றிய எவரும் சித்தியடையவில்லை. இது தொடர்பாக கௌரவ அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவந்து, அதற்குரிய விசேட ஏற்பாடுகளைச் செய்து தருமாறு நாங்கள் கேட்டிருந்தோம். அவர் பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பற்றிய ஆலோசனைக் குழுக்கூட்டத்தில் தமிழ் மொழிமூல உத்தியோகத்தர்களுக்கென ஒரு விசேட பரீட்சையொன்றை நடத்துவதற்கு ஏற்பாடு செய்வதாக உறுதிமொழி அளித்தார். அதற்காகத் தமிழ் பேசும் மக்கள் - தமிழ், முஸ்லிம் மக்கள் - சார்பில் நான் அவருக்கு மீண்டும் நன்றியைக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் மாத்திரம் இருக்கின்றது.

**ගරු හුනෙයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon.Hunais Farook)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அதனுடன் இன்னும் மேலதிகமாக ஒரு நிமிடம் தருமாறு கேட்கின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ஒரு நிமிடத்துக்குள் உங்களுடைய உரையை முடித்துக் கொள்ளுங்கள்!

**ගරු හුනෙයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon.Hunais Farook)

இன்று இச்சபையில் தமிழ் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு சிவசக்தி ஆனந்தன் அவர்கள் உரையாற்றும்பொழுது, வன்னி மாவட்டத்தில் சில அடாவடித்தனங்கள் இடம்பெறுவதாகச் சுட்டிக்காட்டினார். அதேநேரம் இன்று கௌரவ அமைச்சர் மாண்புமிகு விமல் வீரவங்ச அவர்கள் கூறியதுபோன்று, இந்த நாட்டிலுள்ள பாராளுமன்ற உறுப்பினர்களில் சிலர் அல்லது அமைச்சர்களில் சிலர் உண்மையாகவே கஷ்டப்பட்டு மக்களுக்காக சேவையாற்றி, மீண்டும் பாராளுமன்றத்துக்கு வருவதற்கான ஏற்பாடுகளைச் செய்கின்றார்கள். ஆனால், இன்னும் சிலரைப்பொறுத்தமட்டில் அவர்கள் கொழும்பிலோ அல்லது வெளிநாடுகளிலோ இருந்து இனவாதத்தைக் கக்கிக்கொண்டும் தூண்டிக்கொண்டும் தொடர்ந்தும் இந்தச் சபையில் அங்கத்துவம் பெறுவதற்கான ஏற்பாடுகளைச் செய்கின்றார்கள். மாண்புமிகு சிவசக்தி ஆனந்தன் அவர்கள் கூறிய கருத்துக்களை நாங்கள் பார்க்கும்பொழுது, அது தெளிவாகப் புலனாகின்றது. அவர் ஓர் அமைச்சர் பொலிஸ் நிலையம் சென்று அடாவடித்தனம் செய்ததாகக் கூறினார். ஆனால், அதற்கு அடுத்த நாள் அவர்களின் இனவாதத்தைத் தூண்டுகின்ற அறிக்கைக்கு எதிராக அப்பொலிஸ் நிலையப் பொறுப்பதிகாரி மறுப்பறிக்கை விடுத்திருந்தார். அதாவது "இவ்வாறான சம்பவங்கள் இங்கு இடம்பெறவில்லை; குறித்த அமைச்சர் சமாதானத்தைத்தான் ஏற்படுத்தினாரேயொழிய, அங்கு பிரச்சினையை ஏற்படுத்தவில்லை" என்று அதில் தெரிவித்திருந்தார். இருந்தபொழுதிலும் உண்மையில் பல்லின மக்கள் வாழ்கின்ற அல்லது இரண்டு இன மக்கள் வாழ்கின்ற அந்த மன்னார் பிரதேசத்தில் இவ்வாறு மீண்டும் மீண்டும் இனவாதத்தைத் தூண்டுவது எதிர்காலத்தில் உசிதமாக இருக்காது என நான் இந்தச் சந்தர்ப்பத்தில் கூறுகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அதே சந்தர்ப்பத்தில் இன்னுமொரு விடயத்தையும் நான் இங்கு கூறி என்னுடைய உரையை முடித்துக்கொள்ள விரும்புகின்றேன். அதாவது, அங்குள்ள ஓர் உதவி அரசாங்க அதிபர் பற்றிய ஒரு பிரச்சினை தொடர்பாகவும் அவர் இங்கே கூறினார். அதே உதவி அரசாங்க அதிபரிடம் நான் நேரடியாகச் சென்று கதைத்தபொழுது, "பிச்சைக்காரன் எவ்வாறு புண்ணைக் காட்டிப் பிச்சை

[ගරු හුනෙයිස් ෆාරූක් මහතා]

எடுக்கின்றானோ, அதேபோன்று சில தமிழ் அரசியல்வாதிகள் இந்தப் பிரச்சினையைக் காரணம் காட்டி மன்னார் மாவட்டத்தில் ஒற்றுமையாக இருக்கின்ற தமிழ், முஸ்லிம் சமூகங்களுக்கிடையில் இன முறுகலையும் இன முரண்பாட்டையும் பிரிவினையையும் ஏற்படுத்துவதற்கு முயல்கின்றார்கள்" என்று அவர் கூறினார். எனவே, இதற்குப் பிறகு இவ்வாறு இன முரண்பாடுகளை ஏற்படுத்தாமல் அழிந்திருக்கின்ற அந்த வன்னிப் பிரதேசத்தைக் கட்டியெழுப்புவதற்குக் கட்சி பேதமின்றி ஒன்றுசேர்ந்து உழைக்குமாறு ஏனைய தரப்பினரிடமும் கேட்டு, விடைபெற்றுக் கொள்கின்றேன். நன்றி.

[අ. භා. 6.29]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කරන හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කිරීමේ විවාදයේදී විශේෂයෙන්ම මෑතකදී ඉදිරිපත් වූ බෑන් කි මූන් වාර්තාව ගැන මේ සභාවේ සාකච්ඡාවට ලක් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, එහෙම නැත්නම් බෑන් කි මූන් ලා ගේ විදේශ අත පෙවීම් ගැන අපට අලුතින් ඉගෙන ගන්න දෙයක් නැහැ. එදා සිට මෙදා දක්වා මේ අධිරාජ්‍යවාදි මැදිහත් වීම කළේ අපේ රටේ අභ්‍යන්තර ප්‍රශ්න දඩමීමා කර ගෙනයි කියන එක මේ රටේ කාටත් පැහැදිලියි. අදත් සිද්ධ වන්නේ ඒක. ඒ බෑන් කි මූන් මැදිහත් වීමේ දේශපාලන අරමුණ ඉතා පැහැදිලියි. ඒ වාගේම ඒ දේශපාලන අරමුණ අපි ප්‍රතික්ෂේප කරනවා; ප්‍රතික්ෂේප කළ යුතුයි.

අද රොබට් ඕ. බ්ලේක් හෝ ඔබාමා හෝ ඔසාමා බින් ලාඩන්ව ලෝකයේ ඉහළම, අග්‍ර ගණ්‍යයේ ත්‍රස්තවාදියකු විධියට නම් කළත්, ඉතිහාසයේ ඇමෙරිකානු එක්සත් ජනපදය ඇතුළු බටහිර රාජ්‍යයන්ම තමයි සෝවියට් දේශයට එරෙහිව මුජහිදීන් ගරිල්ලා සටන් සංවිධානය නිර්මාණය කරලා ඔසාමා බින් ලාඩන්ව එහි නියෝජ්‍ය නායකත්වයට පත් කළේ කියන එකත් අපි දන්නවා. ඔසාමා බින් ලාඩන්ට කිරි දීලා, හදලා වඩලා, පෝෂණය කළේ වෙන කවුරුවත් නොවෙයි ඇමෙරිකා එක්සත් ජනපදය. ඇමෙරිකා එක්සත් ජනපදය විසින් හදලා වඩලා, පෝෂණය කළ බින් ලාඩන් පෙරළා ඇමෙරිකාවට එරෙහිව ඇමෙරිකාවෙන්ම දීපු ආයුධ සහ ඒ සන්නද්ධ පුහුණුව භාවිත කරමින් නැඟී සිටින කොට තමයි ඇමෙරිකාවට ඔසාමා බින් ලාඩන්ව ත්‍රස්තවාදියකු වුණේ. ඒ නිසා ඒ දෙබිඩි පිළිවෙත ඉතා පැහැදිලියි.

එදා ප්‍රභාකරන් සම්බන්ධයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු බටහිර රටවල් සහ ඉන්දියාව අනුගමනය කළ ප්‍රතිපත්තිය අපට මතකයි. ඒ සන්නද්ධ ව්‍යාපාරය පෝෂණය කරන්න, ශක්තිමත් කරන්න, වැරදි පාරකට දෙමළ ජනතාව, දෙමළ තරුණයන්ව ඇදලා දාන්න උදවු දුන්නේ මේ බටහිර රාජ්‍යයන් කියන එක ඉතා පැහැදිලියි. ඒක මුළු රටම දන්නවා. ඒක අලුතින් ඉගෙන ගන්න දෙයක් නැහැ. අද රොබට් ඕ. බ්ලේක් විසින්ම ප්‍රභාකරන්වත් ත්‍රස්තවාදියකු විධියට හඳුන්වද්දී ඒ දෙබිඩි පිළිවෙත ඉතා පැහැදිලියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ මේ දෙබිඩි පිළිවෙත, මේ විදේශ මැදිහත් වීම, බෑන් කි මූන් ලා ගේ මැදිහත් වීම පරාජය කරන්න අපි රටක් විධියට, ආණ්ඩුවක් විධියට ගත්ත පියවර කොයි තරම් සාර්ථකද, අසාර්ථකද කියන එකයි.

එදා 2009 මැයි මාසයේ 19 වන දා යුද්ධය අවසන් වුණාට පස්සේ මේ රටේ අලුත් පරිච්ඡේදයක් ආරම්භ වුණා. සියලුම පරණ දේවල්, විශේෂයෙන් යුද්ධයේ බිහිසුණු අත් දැකීම් සහිත දශක තුනක ඉතිහාසය අමතක කරලා අලුත් දේශපාලන පරිච්ඡේදයක් ආරම්භ වුණා. ඒ අලුත් දේශපාලන පරිච්ඡේදය ආරම්භ වුණාම ආණ්ඩුවක් විධියට කළ යුතුව තිබුණේ ඒ අලුත් දේශපාලන පරිච්ඡේදයට ගැළපෙන ලෙස අපේ රටේ ජාතික සමඟිය ගොඩ නැඟීම ඉලක්ක කර ගත්ත කඩිනම් වැඩ පිළිවෙළකට වහා අවතීර්ණ වීමයි. අපේ අභ්‍යන්තර බෙදීම පාවිච්චි කරලා මුළු රටම යුද්ධයක් දක්වා ඇද දැමූ බටහිර අධිරාජ්‍යවාදීන්ගේ මැදිහත් වීම නැවත ඇති නොවෙන්න අපි කොහොමද කටයුතු කරන්නේ කියන වගකීම් සහගත මැදිහත් වීමකට මේ ආණ්ඩුව එළැඹිය යුතුව තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අපි දකින විධියට එතැනදී තමයි මේ ආණ්ඩුව වරද්දා ගත්තේ. කවුරුත් දන්නා විධියට මැයි මාසයේ 19 වන දා යුද්ධය අවසන් වුණා. මැයි මාසයේ 23 වන දා ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආරාධනාව පරිදි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් බෑන් කි මූන් මහත්මයා ලංකාවට ආවා. ලංකාවට ඇවිල්ලා හෙලිකොප්ටර් එකෙන් මුලතිවු, කිලිනොච්චි නිරීක්ෂණය කළා. මහනුවරදී ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාත් එක්ක අවබෝධතා ගිවිසුමක් අත්සන් කළා. ඒ අවබෝධතා ගිවිසුමෙන් තමයි පළමු වතාවට එක්සත් ජාතීන්ගේ සංවිධානයට -බෑන් කි මූන් මහත්මයාට- අපේ රටේ වග වීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව සලස්වන්නේ. අපේ රටේ මානව හිමිකම් පිළිබඳව සොයා බැලීම සඳහා වන ඉඩ ප්‍රස්ථාව, ඒකට අවශ්‍ය කරන පාර කැපුවේ.

දැන් මේ වාර්තාව එළියට ඇවිත් තිබෙනවා. ඒ වාර්තාවේ දෙවැනි පිටුවේ පටන් ගන්න කොටම ඉතාම පැහැදිලිව මොකක්ද කියන්නේ? "අපි මේ වාර්තාව ඉදිරිපත් කරන්නේ 2009 මැයි මාසයේ 23 වන දා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් බෑන් කි මූන් මහත්මයාත්, ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයාත් අතර ඇති කර ගත්ත අවබෝධතා ගිවිසුමට අනුවය." එහෙමයි කියන්නේ. එතකොට කොතැනද වැරදුණේ? රාජ්‍ය තාන්ත්‍රික මැදිහත් වීම වරද්දා ගත්තේ පළමුවන තැනින්. එදා යුද්ධය අවසන් වුණාට පස්සේ ඒ ජයග්‍රහණයේ ප්‍රීතිය භුක්ති වින්දා මිසක් එතැනින් එහාට රට ගෙන යන්නේ කොහොමද කියන එකට බුද්ධිමත්ව, රාජ්‍ය තාන්ත්‍රිකව මැදිහත් වුණේ නැහැ.

වරද්දා ගත්ත ආරම්භය එතැන. එතැනින් ආරම්භ වෙච්ච ඒ වැරදි ක්‍රියාවලිය දිගින් දිගටම ඉස්සරහට ගියා. ඒ දිනවලදීම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලයට, මානව හිමිකම් සභාවට දයාන් ජයතිලක මහත්මයා ඇතුළු ලංකාවෙන් ගිය පිරිස විශේෂ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ යෝජනාවෙන් ඉතා පැහැදිලිව මොකක්ද කියන්නේ? ඉතා පැහැදිලිව අවසාන වගන්තියේ කියනවා.

I quote:

"Urges the international community to …… the promotion and protection of all human rights, including economic, social and cultural rights."

ඒ එකඟතාවට තමයි ආවේ. ඒ විතරක් නොවෙයි. ඒ එකඟතාව අනුව මානව හිමිකම් කවුන්සිලයෙන් ආරාධනා කරන්නේ කාටද? වෝල්ටර් කැලින් හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලේකම්වරයාට. ලංකාවට ඇවිත් මේවා නිරීක්ෂණය කරන්න, ඒ පිළිබඳව සොයා බලන්න, මැදිහත් වන්න ඒ සියලු දෙනාට ආරාධනා කළා විතරක් නොවෙයි, ඒ පිළිබඳව අවශ්‍ය කරන උපදෙස් හා මැදිහත් වීම් කරන්නත් ඉතා පැහැදිලිව එකඟතාව පළ කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අදාළ මේ ලියවිලි මා **සභාගත*** කරනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේ ලියවිලිවල තිබෙන්නේ රාජ්‍ය තාන්ත්‍රිකව කර ගත්ත වරද්දා ගැනීම්. මේ රටට විවිධ නාඩගම් රූකඩ පෙන්වන අතරතුරේදී, ලංකාවේ දේශපාලනයේදී තමන්ගේ ඡන්ද ගොඩ වැඩි කර ගන්න, තමන්ගේ පටු බල වුවමනාව ඉෂ්ට කර ගන්න හුදු පුහු බොරු විරෝධය පෙන්වන ගමන් අනෙක් පැත්තෙන් මේ කමිටුව නීත්‍යානුකූල ආකාරයට පිළිගත්තා. විදේශ කටයුතු අමාත්‍යවරයා කියනවා, "මේක නීත්‍යානුකූල නැහැ. මේ කමිටුව පිළිගන්න බැහැ" කියලා. හැබැයි ශ්‍රී ලංකාව නියෝජනය කරන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය නියෝජිත පාලිත කොහොන මහත්මයා නිල වශයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය සහිතව ලිපි ලේඛන යවනවා, ඒ නීති විරෝධියි කියපු කමිටුවට. දරුස්මාන්ට යවන ලිපියේ මොකක්ද කියන්නේ? ඔහුට ආරාධනා කරනවා දවල් කෑමට එන්න කියලා! මෙහේ මාරාන්තික උපවාසය! මෙහේ කන්න නැතුව ලෙමන් පෆ් කකා උපවාස කරනවා. ලෙමන් පෆ් කකා දවස් දෙකේ උපවාස කරද්දී පාලිත කොහොන මහත්මයා ඒ කමිටුවට ආරාධනා කරනවා, දිවා භෝජන සංග්‍රහයට වාඩි වන්න එන්න කියලා. මේ කමිටුවෙන් පෙරළා ලිපියක් එවනවා. මොකක්ද ඒ ලිපියේ කියන්නේ? "ඔබගේ ආරාධනාව අපි සතුටින් භාර ගන්නවා. අපි දවල් කෑමට එනවා." කියලා. ඊට පස්සේ දවල් කෑමට යනවා. වාඩි වෙලා දවල් කෑම මේසයේදී සාකච්ඡා කරනවා. කෑම කාලා ඉවර වෙලා ගියාට පස්සේ දරුස්මාන් මහත්මයා නැවත ලිපියක් එවනවා, කොහොන මහත්මයාට, "ඔබගේ කෑම හරි රසයි. ඔබට බොහොම ස්තුතියි. දිවා භෝජන සංග්‍රහය අපි සතුටින් භුක්ති වින්දා. ඒ දිවා භෝජන සංග්‍රහයේදී වාචිකව ඔබ එකඟ වෙච්ච දේවල්...." ඒ කියන්නේ මොකක්ද? "අපේ කමිටුවට ශ්‍රී ලංකාවට එන්න ඉඩ දෙනවාය කියලා ඔබ කරපු ආරාධනාව ලිඛිතව අපි වෙත එවන්න." කියනවා. නීති විරෝධියි කියපු කමිටුව පාලිත කොහොන මහත්මයා නීත්‍යානුකූලයි කියලා පිළිගත්තා. පිළිගත්තා විතරක් නොවෙයි, දවල් කෑමත් දුන්නා. කෑම මේසයේදී ආරාධනා කළා. ආරාධනා කළාට පස්සේ ඒ උදවිය කිව්වා ඒක ලිඛිතව එවන්න කියලා. මෙන්න වරද්දා ගැනීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. පසු ගිය දවස්වල විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා, නීතිපතිවරයා, පාලිත කොහොන මහත්මයා, ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතයා කියන ඒ හතර දෙනාම ගිහින් බැන් කී මූන් මහත්මයා සමඟ විජය නම්බියාර්ලාත් හිටපු එකම මේසයේ සාකච්ඡා පැවැත්වූවා. පාර්ලිමේන්තුවේදී අපි විදේශ කටයුතු ඇමතිතුමාගෙන් ඒක ඇහුවා. එතකොට විදේශ කටයුතු ඇමතිතුමා රටේ හිටියේ නැහැ. එංගලන්තයේ හිටියේ. නියෝජ්‍ය විදේශ කටයුතු ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා, එක්සත් ජාතීන්ගේ සංවිධානයත් එක්ක මේ වාර්තාව ගැන සාකච්ඡාවක් පැවැත් වෙනවාද කියලා. එතුමා මේ සභාව මුළා කළා; සභාව නොමඟ යැව්වා; මේ සභාවට වැරදි ප්‍රකාශයක් කළා. මොකක්ද කළේ? නියෝජ්‍ය ඇමතිවරයා කිව්වා, “නැහැ, එහෙම කිසිදු නිල සාකච්ඡාවක් නැහැ. එහෙම කිසිදු සාකච්ඡාවකට නීතිපතිවරයා හෝ නිත්‍ය නියෝජිතයා සම්බන්ධ වෙලා නැහැ” කියලා. ඒ හැන්සාඩ් වාර්තාව බලන්න පුළුවන්. ඉතා පැහැදිලිව ඒක තිබෙනවා. අද මුළු ලෝකයටම ඔප්පු වෙලා තිබෙනවා ඒ කාරණය. ඒ නිත්‍ය නියෝජිතයා, නීතිපතිවරයා ඇතුළු කණ්ඩායම, විජය නම්බියාර් සහ බැන් කී මූන් එක්ක එක මේසයේ ඉඳ ගෙන සාකච්ඡා කරපු ඡායාරූප තිබෙනවා. ඒ සාකච්ඡාවේ අඩංගුව සියල්ල ලෝකය පුරා ප්‍රචාරය වන්න පටන් ගත්තා. ඊට පස්සේ ජී.එල්. පීරිස් මහත්මයාගෙන් ලන්ඩන්වලදී මාධ්‍යවේදියෙක් ඇහුවා, එහෙම සාකච්ඡාවක් පැවැත්වෙනවාද කියලා. ජී.එල්. පීරිස් මහත්මයාට "නැහැ" කියන්න විධියක් නැහැ. අන්න එතැනදී පිළිගත්තා, "ඔව්, එහෙම එකක් තිබෙනවා" කියලා. මම දන්නේ නැහැ, නියෝජ්‍ය ඇමතිතුමා නොදන්නාකමට එහෙම කිව්වාද කියලා. රටේ පාර්ලිමේන්තුවට එකක් කියනවා. එංගලන්තයේදී තව එකක් කියනවා.

ඉතින් මේ රාජ්‍ය තාන්ත්‍රික වරද්දා ගැනීම් ඇතුළේ තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානයට මෙවැනි වාර්තාවක් නිකුත් කරන්න අවශ්‍ය කරන ඉඩකඩ හැදුණේ. ඒ නිසා මේ ආණ්ඩුව එතැනදී දක්වපු අසමත්කම, ඒ ගත්ත වැරදි තීන්දු තීරණ නිසා තමයි අද ශ්‍රී ලාංකීය ජාතියක් විධියට රටත්, ජාතියත් මේ වාගේ බරපතළ අභියෝගයකට මුහුණ දීලා තිබෙන්නේ. අද මුළු රටම ඒ පිළිබඳව විමසිල්ලෙන් ඉන්නවා. මේ ඇති වෙච්ච තත්ත්වයත් එක්ක මුළු රටම අනතුරකට පත් වෙලා තිබෙනවා. ඒ අනතුරට වැට්ට වීම ගැන මේ ආණ්ඩුව ගත්ත වැරදි රාජ්‍ය තාන්ත්‍රික තීන්දු තීරණ වග කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යුද්ධය අවසන් වුණාට පස්සේ ඇති වෙච්ච අලුත් පරිච්ඡේදයේදී අපි කළ යුතුව තිබුණේ මොකක්ද? බැන් කී මූන්ලා අපට කියන්න ඕනෑ නැහැ, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න. බැන් කී මූන්ලා අපට කියන්න ඕනෑ නැහැ, අපේ රටේ හදිසි නීතිය ඉවත් කරන්න. අපට වග කීමක් තිබෙනවා, ආණ්ඩුවක් විධියට රටක් විධියට ජනතාවක් විධියට මේ රටේ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න; ඒ ජාතික සමගිය ඇති කරන්න. යුද්ධය අවසන් වුණාට පස්සේ පළමුවන ජාතික ප්‍රශ්නය වූ අවතැන් වූවන්ගේ කඳවුරුවල ජීවත් වන ජනතාවගේ ප්‍රශ්නය විසඳන්න, උතුරේ යුද පාලනය අහෝසි කරලා සිවිල් පරිපාලනය ස්ථාපිත කරන්න අපි අසමත් වෙලා තිබෙනවා. යුද්ධය අවසන් වෙලා දැනට අවුරුදු දෙකක් ගත වෙලාත් තවම ඒක කරන්න ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා. බැන් කී මූන් මහත්තයලා කියනතුරු ඉන්න ඕනෑ නැහැ, ඒක කරන්න. ඒක කළ යුතුව තිබුණා; කළ හැකිව තිබුණා. ඒ අත් අඩංගුවට ගත්ත සිරකරුවන්ගේ විස්තර හා තොරතුරු ඒ අයගේ දෙමවුපියන්ට, ඥාතීන්ට දැන ගන්න තිබෙන අයිතිය ආරක්ෂා කරන්න කියලා මේ පාර්ලිමේන්තුවේදී අපි කිව්වේ බැන් කී මූන්ලා කියන්න කලින්. අපි එදා කිව්වා, අවතැන් වූවන්ගේ කඳවුරුවල ජීවත් වන ජනතාවගේ ප්‍රශ්නය විසඳන්න, එහෙම කළේ නැත්නම් ඔය සුද්දා අපට ආපහු ඇඟිලි ගහනවා කියලා. එහෙම නොවුණොත් ජනතාවගේ ඇත්ත පීඩනය තවත් ඉස්සරහට යනවා, එහෙම වුණාම තමයි නැවත ප්‍රභාකරන්ලා බිහි වෙන්නේ කියලා අපි කිව්වා. ඒවා කියන කොට යුද්ධයේ ජයග්‍රහණයෙන් උන්මාදයට පත් වෙලා, අපි කියන ඒවා ප්‍රතික්ෂේප කරලා ඔහේ ගියා. අද උතුරු නැඟෙනහිර ජනතාව ඒ ඉල්ලා සිටින නිදහස දෙන්න මේ ආණ්ඩුව සමත් වෙලා නැහැ. ඒ නිසා තමයි අදත් මේ හදිසි නීතිය දීර්ඝ කිරීම නැවත සම්මත කරන්නේ.

ඒ විතරක් නොවෙයි. සුදු කොඩි චෝදනා නගද්දී, "නැහැ, එහෙම සුදු කොඩි සිද්ධියක් වුණේ නැහැ." කියලා ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා උසාවියේ කියන්න හදන කොට අද ආණ්ඩුව මොකක්ද කරන්නේ? "එහෙම එකක් වුණා." කියලා ඔප්පු කරන්න හදනවා.එහෙම ඔප්පු කරන්න හදන්නේ උසාවියෙන්. ඒකෙන් කාටද පාර කැපෙන්නේ? එක්සත් ජාතීන්ගේ සංවිධානයේ බැන් කී මූන්ගේ වුවමනාව නේද ඒකෙන් ඉෂ්ට වෙන්නේ? බැන් කී මූන්ගේ ඉත්තන් බවට පත් වෙලා තිබෙන්නේ ආණ්ඩුවේ ඒ වැරදි අමනෝඥ තීන්දුව නේද? ඒ නිසා අද මේ අභියෝගයට මුහුණ දෙන්න පළමුව අපි කළ යුතු වන්නේ මොකක්ද? මේ වරද්දා ගැනීම් දෙස ආපසු හැරී බලලා රාජ්‍ය තාන්ත්‍රිකව නිවැරදි කර ගෙන, ඉදිරියේදී රාජ්‍ය තාන්ත්‍රිකව නිවැරදිව මේ අභියෝගය ජයග්‍රහණය කරන්න අපි මැදිහත් වෙන්න ඕනෑ. දෙවනුව මේ රටේ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, මාධ්‍ය නිදහස වාගේම විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන්න වහාම කඩිනම් පියවර ගත යුතුයි. එවැනි නිදහස් වාතාවරණයක් ඇති කළොත් පමණයි මේ වගේ නැවත වතාවක් අපේ රටට ඇඟිලි ගහන්න බැන් කී මූන්ලාට ඉඩ තියන්න බැරි වෙන්නේ; ඉඩ නැති වෙන්නේ. එවැනි වාර්තා ඉදිරිපත් කරන්න සදාචාරාත්මක අයිතියක් නැති බව පෙන්වන්න නම් අපි මේ රටේ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න ඕනෑ. ඒ සඳහා මේ හදිසි නීතිය වහාම අහෝසි කරන්න ඕනෑය කියන කරුණ මතක් කරමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

[பி.ப. 6.43]

**ගරු සිල්වෙස්ත්‍රි අලන්ටින් මහතා**
(மாண்புமிகு சில்வேஸ்திரி அலன்றின்)
(The Hon. Silvastrie Alantin)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்தச் சபையிலே அவசரகாலச் சட்ட நீடிப்பு சம்பந்தமாகப் பேசிக்கொண்டிருக்கும் இவ்வேளையிலே, எனக்கு முன்பு உரைநிகழ்த்திய தமிழ்த் தேசியக் கூட்டமைப்பின் கௌரவ உறுப்பினர் சிவசக்தி ஆனந்தன் அவர்கள் யாழ். மாநகர சபையில் ஊழல் நடப்பதாகச் சில கருத்துக்களைக் கூறி, எம்மீது குற்றஞ் சுமத்தியிருக்கின்றார். அதேநேரம் வவுனியா நகர சபை நிர்வாகம் திறமைவாய்ந்தது என்றும் இந்த நேர்மையான சபையின் நிர்வாகத்தைச் சில அதிகாரிகளே குழப்புகின்றனர் என்ற தோரணையிலும் அவர் கருத்துக்களை முன்வைத்தார். இரண்டு வருடங்களுக்கு முன்பு தேர்தல்மூலம் அங்கு அதிகாரத்தைக் கைப்பற்றிய தமிழ்த் தேசியக் கூட்டமைப்பு இதுவரை அந்த வவுனியா நகர சபையில் செய்த சாதனை என்ன என்பதை மக்கள் அறிவார்கள். அவர் குறிப்பிடுவதுபோன்று அது ஆளுமையுடைய ஒரு சபை என்றால் அங்கு ஊழல் குற்றச்சாட்டுகள் சுமத்தப்பட்டுள்ளவர்மீது ஏன் நடவடிக்கை எடுக்க முடியவில்லை? ஒரு தலைவரை நியமிக்க முடியாத, ஒரு வரவு செலவுத் திட்டத்தைக் கொண்டுவந்து நிறைவேற்ற முடியாத நிலையிலுள்ள அந்தச் சபைக்கு நற்பெயர் சூட்ட முற்படும் அவர், அங்குள்ள பிரச்சினைக்குத் தீர்வு காணாது எமது பொறுப்பிலுள்ள யாழ். மாநகர சபை பற்றிக் குற்றஞ்சாட்டுகின்றார். யாழ். மாநகர சபை தவறிழைத்தாலோ அல்லது ஊழல் செய்தமை நிரூபிக்கப் பட்டாலோ அதற்கு எதிராக உரிய நடவடிக்கை எடுக்க எமது தலைவர் டக்ளஸ் தேவானந்தா அவர்கள் தயாராகவே இருக்கின்றார். யாழ். மாநகர சபையில் மட்டுமல்ல, எமது கட்சியின் நிர்வாகப் பொறுப்பிலுள்ள உறுப்பினர்களுக்கு மத்தியிலும் ஊழலுக்கு இடமே இல்லை; அதற்கு இடமளிக்கப் போவதுமில்லை. கௌரவ சிவசக்தி ஆனந்தன் தமது நகர சபையின் சீர்கேடுகளை நிவர்த்தி செய்ய உருப்படியான நடவடிக்கை எடுப்பதாகச் சொல்லியிருந்தால் அவரைப் பாராட்டி யிருக்கலாம். அதைவிடுத்து, அங்கு ஒன்றுக்கும் உதவாதவர்களுக்கு நற்பெயர் சூட்ட முயன்றதன்மூலம் இவர்கள் மக்களின் நலனில் எவ்வளவுதூரம் அக்கறையானவர்கள் என்பது தெளிவாகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தச் சபையிலே அவசரகாலச் சட்டத்தை நீடிக்கும் விவகாரம் தொடர்ந்துகொண்டிருக்கின்றது. இந்த நிலையில் நான் என்னுடைய உரையில் சில முக்கிய விடயங்களை முன்வைக்க விரும்புகின்றேன். முதலில் அவசரகாலச் சட்டம் தொடர்பாக எமது கட்சியாகிய ஈழ மக்கள் ஜனநாயகக் கட்சியின் நிலைப்பாட்டைத் தெளிவுபடுத்த விரும்புகின்றேன். எமது கட்சி அவசரகாலச் சட்டத்தை என்றைக்கும் மனப்பூர்வமாக விரும்பவேயில்லை. ஆனால், நாட்டில் நிலவிய இயல்பற்ற நிலைமையின் காரணமாக அவசரகாலச் சட்டத்தை நாம் ஆதரிக்க வேண்டிய நிலை இருந்தது. இப்போது நிலைமைகள் மாறிவிட்டன. இப்பொழுது யுத்தம் முடிந்து அமைதிச் சூழல் ஒன்று உருவாகியுள்ளது. இந்த அமைதிச் சூழலில் அவசரகாலச் சட்டத்தை நீக்குவதற்கு நாம் ஒரு காலவரையறையை நிர்ணயிக்க வேண்டும் என்று அரசாங்கத் தரப்புடன் அண்மையில் நடைபெற்ற பேச்சுவார்த்தையின்போது நாம் தெரிவித்திருக்கின்றோம். இதைவிட வேறு தனிப்பட்ட சந்திப்புக்களின்போதும் ஜனாதிபதியிடமும் வேறு அரசியல் பிரமுகர்களிடமும் அவசரகாலச் சட்டத்தை நீக்குவதைப் பற்றியும் தமிழ் மக்களின் பிரச்சினைகளைப் பற்றியும் நாம் வலியுறுத்தி வருகின்றோம். இந்தவகையில் விரைவில் அவசரகாலச் சட்டம் மேலும் நீடிக்கப்படாமல் நீக்கப்படும் ஒரு நிலை வருமென நாம் நம்புகின்றோம். கடந்த காலத்தில் நாம் வலியுறுத்திய பல விடயங்கள் இன்று நடைமுறைச்சாத்தியமாகியிருக்கின்றன. உயர் பாதுகாப்பு வலயங்கள் என்று கூறப்பட்ட இடங்களில் இன்று மக்கள் மீளக் குடியேறி வருகின்றனர். வலி வடக்கில் மீள்குடியேற்றம் நடக்காது என்று சிலர் கூறிவந்த நிலையை மாற்றி அங்கே மக்கள் மீள்குடியேற்றம் செய்யப்பட்டுள்ளனர். இதைப்போல எஞ்சியிருக்கும் பிரதேசங்களிலும் மீள்குடியேற்றம் நடைபெறுமென்று நாங்கள் மக்களுக்கு உறுதியளித்துள்ளோம். எது நடக்குமோ அதையே நாம் மக்களுக்குச் சொல்லி வருகின்றோம். எமது மக்களை, அதாவது, எம்மை நம்பிய மக்களை நாம் ஏமாற்ற விரும்பவில்லை. நாங்கள் மக்களுக்கு உண்மைகளையே சொல்கின்றோம்; அவர்களுக்கு நிலைமையின் யதார்த்தத்தைச் சொல்கின்றோம்; என்ன நடக்குமோ அதைத்தான் சொல்கிறோம். அதாவது, நடக்கக்கூடியதையே சொல்கின்றோம்; நடைமுறைக்குச் சாத்தியமானதைத்தான் சொல்கிறோம். நடக்கமுடியாத, எங்களால் செய்ய முடியாத எதையும் நாங்கள் சொல்லி அவர்களை ஏமாற்ற விரும்பவில்லை. போரினால் பாதிக்கப்பட்ட மக்களை, அரசியல்ரீதியாகப் பலவீனமாக்கப்பட்ட மக்களை இனிமேலும் யாரும் ஏமாற்ற அனுமதிக்க முடியாது. எனவே, நடக்கக்கூடிய விடயங்களைக் கூறி, அதை நோக்கி மக்களைத் தயார்படுத்துகிறோம்.

இன்று வடக்கு, கிழக்குப் பகுதியில் ஏராளம் தேவைகள் இருக்கின்றன. முப்பது ஆண்டுகளாக இழந்துபோன வாழ்க்கையை மீளக்கட்டியெழுப்பவேண்டிய தேவை உள்ளது. போரினால் அழிவடைந்த பிரதேசங்களை மீண்டும் இயல்பு நிலைக்குக் கொண்டு வரவேண்டிய அவசியம் இருக்கின்றது. போரின் விளைவாகச் சிதைந்திருக்கும் சமூகத்தை மீள்நிலைப்படுத்த வேண்டியுள்ளது. எதிர்காலத்தின் முன்னே கேள்விக்குறிகளாக்கப் பட்ட மக்கள் இப்பொழுது நம்பிக்கை தரும்படியான ஒரு காலத்துக்குள் அழைத்து வரப்பட்டிருக் கின்றனர். யுத்தம் முடிந்து அமைதி திரும்பியிருப்பது என்பது சாதாரணமான விடயமல்ல. மிகப்பெறுமதியான மனித உயிர்கள் இன்று பாதுகாக்கப் படுகின்றன. இதை இந்த நாட்டில் ஏற்பட்டிருக்கும் பாரிய வளர்ச்சி யென்றே நான் கருதுவேன். சாவும் அழிவும் என்ற நிலை மாற்றப்பட்டிருக்கின்றது. எனவே, அடுத்த கட்டமாக இன்று விவாதிக்கப்பட்டுக்கொண்டிருக்கும் அவசரகாலச் சட்டமும் நீக்கப்படும். அதன் பிறகு இதைவிட நல்ல நிலைமைகள் உருவாகுமென்று நம்புகின்றேன்.

கடந்த காலத்தைவிடவும் இப்பொழுது இனங்களுக்கிடை யிலான உறவு மேம்பட்டு வருகின்றது. இது ஒவ்வொருவரும் தமது கசப்பான கடந்த காலத்தைக் கடப்பதற்கான சூழலாகும். இதேவேளை, இன்னும் தீர்க்கப்படாத பல பிரச்சினைகள் இருக்கின்றன. அவற்றையும் நாம் தீர்க்க வேண்டும். நீண்ட காலமாக அரசியற் கைதிகளாக இருக்கின்ற பல்லாயிரக் கணக்கானவர்களின் விடுதலையை விரைவுபடுத்த நாம் முயற்சிக்க வேண்டும். விடுதலைப் புலிகளின் உறுப்பினர்களாக முன்னர் செயற்பட்ட ஆயிரக்கணக்கானவர்களுக்கு அரசாங்கம் புனர் வாழ்வளித்து சமூகத்துடன் இணைத்துள்ளது. அவர்கள் மீண்டும் இயல்பு வாழ்க்கைக்குத் திரும்பியிருக்கிறார்கள். அவர்களுக்கான உதவிகளை அனைவரும் செய்ய வேண்டும். எவருடைய மரணத் தையும் தாம் விரும்பவில்லையென்று மாண்புமிகு அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள் குறிப்பிட்டிருப்பதை இந்த மன்றிலே நான் நினைவுகொள்கிறேன். எவருடைய துயரத்தையும் நாங்கள் விரும்பவில்லை. இந்த நாட்டிலே அமைதி வேண்டும்; நிம்மதியான வாழ்க்கைச் சூழலொன்று உருவாக்கப்பட வேண்டும் என்பதற்காகவே நாம் தொடர்ந்து உழைத்து வருகின்றோம். ஆனால், யாழ்ப்பாணத்திலும் புலம்பெயர்ந்த மக்கள் வாழும் நாடுகளிலுமுள்ள சில தமிழ் ஊடகங்கள் இதை மறைத்துப் பொய்களையும் புனைகதைகளையும் உருவாக்கி வருகின்றன. எந்தத் தவறும் நீடித்திருக்க முடியாது. சில ஊடகங்கள் புனையும் கதைகள் சில காலத்துக்குத்தான் எடுபடும். அதற்குப் பிறகு அவை எடுபடாது. அதுவரை அலங்காரப் பொய் மக்களை மயக்கிக்கொண்டிருக்கும். ஆபத்திலும் அந்தரத்திலும் மக்களுக்கு உதவாமல் வெறுமனே வாய்ப்பேச்சுப் பேசிக் கொண்டிருக்கும் அரசியல் தலைமைகளை மக்கள் தொடர்ந்தும் அனுமதிக்க மாட்டார்கள். மக்களின் பிரச்சினைகளை யார் தீர்க்கிறார்களோ, மக்களுடைய மன உணர்வுகளுக்கும் அவர்களுடைய தேவைகளுக்கும் யார் முன்னுரிமை அளிக்கிறார்களோ,

அவர்களையே மக்கள் ஏற்றுக்கொள்வார்கள். இந்த உண்மையின் வழித்தடத்திலேயே நாங்கள் பயணித்து வருகின்றோம். எனவேதான் நாங்கள் மக்களைப் பொய் மயக்கத்தில் வைத்திருக் காமல் உண்மைக்கு நெருக்கமாக அவர்களை அழைத்து வருகின்றோம். எது கிடைக்கக்கூடியது, எது நடக்கக்கூடியது என்ற தெளிவு ஓர் அரசியல் தலைமைக்கு இருக்க வேண்டும். நாம் அந்தத் தெளிவோடு மக்களை வழிநடத்த விரும்புகின்றோம். அப்படி உண்மையோடு மக்களை நாம் இணைத்தோமென்றால், அவசர காலச் சட்டம் என்ற ஒன்றே தேவையற்றதாகிவிடும். மக்கள் கலவரமடையாமல் அமைதியாக, நிம்மதியாக சகல உரிமை களையும் பெற்று வாழக்கூடிய சூழலொன்றை நிச்சயமாக நம்மால் உருவாக்க முடியும். அதற்கு முன்னர் மக்களுக்கிருக்கும் பிரச்சினைகளைத் தீர்க்க வேண்டும். மக்களின் வாழ்வாதாரப் பிரச்சினைகளையும் காணி மற்றும் வீடு தொடர்பான பிரச்சினை களையும் முதலில் தீர்க்க வேண்டியுள்ளது. யாழ்ப்பாணத்திலும் அதற்கு வெளியிலும் பல்லாயிரக்கணக்கான குடும்பங்களுக்கு காணியும் வீடும் இல்லாத நிலை காணப்படுகின்றது. இந்தப் பிரச்சினைக்கு நாம் அவசரமாக ஒரு நிரந்தரத் தீர்வைக் காண வேண்டும். இனப்பிரச்சினைக்கான தீர்வு வரும்வரை இந்த மக்கள் அகதிகளாகவும் இரவல் வீடுகளிலும் வாழ முடியாது. இந்த மக்களுக்கு இவைதாம் முதற் பிரச்சினைகளாக இருக்கின்றன. ஆகவே, நாங்கள் விரைவாக இதனைத் தீர்க்க வேண்டியுள்ளது. இது ஓர் அவசரப்பணியும் அவசியப் பணியுமாகும் என்றே நான் கூறுவேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது அரசாங்கமானது அளப்பரிய சாதனைகளைச் செய்து வருகின்றது. மக்களுக்கு நிறைய உதவிகளைச் செய்து வருகின்றது. எமது நாடானது யுத்தத்தின் பிடியிலிருந்து மீண்ட ஒரு நாடாகும். ஒரே நாளில் அல்லது ஒரு சில ஆண்டுகளில் எல்லாப் பிரச்சினைகளும் தீர்த்துவிடும் என்று எவரும் கற்பனை செய்துவிட முடியாது. அதனைவிட, சர்வதேச சமூகத்தின் நலன்களின் விளைவான போட்டிகள் மற்றும் அழுத்தங்கள் என்பவற்றுக்கு மத்தியில் தன்னை நிதானப்படுத்திக் கொள்ளவேண்டிய நிலையில் இன்று இலங்கை இருக்கின்றது. எனவே, நாம் அனைவரும் இலங்கை யர்கள் என்ற உணர்வுடன் செயற்பட்டு, இந்த நெருக்கடிகளைத் தீர்த்துக்கொள்ளவேண்டும். இல்லையென்றால், மீண்டும் நாம் வெளியாருடைய அழுத்தங்களுக்கும் நெருக்கடிகளுக்கும் பலியாக வேண்டி வரலாம். உள்நாட்டு நெருக்கடியைக் காரணங்காட்டி, அந்நிய சக்திகள் இலங்கையைத் தமது காலடிக்குக் கீழே வைத்து, நசுக்க முனையும் போக்கை இப்போது நாம் தெளிவாக உணரமுடியும். கடந்த காலங்களிலும் இத்தகைய நெருக்கடிகளி னால் இலங்கை நசுக்கப்பட்டது. இவ்வாறானதொரு வெளி நெருக்கடி வருமானால் தமிழர்கள், சிங்களவர்கள், முஸ்லிம்கள் என்ற வேறுபாடில்லாமல் அனைவரும் இதனால் பாதிக்கப் படுவார்கள். நடைபெற்ற யுத்தத்தின் விளைவாக ஏற்பட்ட பொருளாதார நெருக்கடியை இன்று முழு இலங்கையர்களுமே அனுபவித்துக் கொண்டிருக்கின்றார்கள்; விலைவாசி ஏற்றத்தை அனைத்து இன மக்களும் சுமக்கின்றார்கள். இன்று இந்த மன்றிலே விவாதிக்கப்படும் அவசரகாலச் சட்ட நீடிப்பானது எல்லாத் தரப்பினருக்கும் ஒரு பிரச்சினையான விவகாரமாகும். இதில் தமிழர், சிங்களவர் என்ற பேதமில்லை. ஆகவே, இவற்றையெல்லாம் நாம் நீக்க வேண்டுமென்றால் நிச்சயமாக நாங்கள் இலங்கையர்கள் என்ற அடிப்படையில் சிந்திக்க வேண்டும். ஆனால், இனவாத அடிப்படையில் சிந்திப்போர் அவ்வாறு சிந்திப்பதில்லை. அவர்களிடத்தில் தமது நிலைப்பாடே நியாயமானது என்ற எண்ணம் மட்டுமே உண்டு; மற்றதெல்லாம் அவர்களுக்குப் பொருட்டல்ல. ஆனால், ஒரு சனநாயக நாட்டில் பல வழிமுறைகளும் அணுகுமுறைகளும் இருக்கும். இதனை அனைவரும் புரிந்துகொள்ளவேண்டும். மாற்றங்களும் நன்மை களும் எவற்றின்மூலமாகக் கிடைக்குமோ அந்த வழிகளைத் தெரிந்துகொள்வதே உலகத்தின் பொதுவான வழிமுறையாகும். இந்த வழிமுறையின்படி நாம் சிந்தித்தால் எந்தப் பெரிய தடைகளையும் இலகுவாகக் கடந்துவிடலாம். இந்த நாட்டிலே அமைதியும் அபிவிருத்தியும் ஈடேறும்போது அவசரகாலச் சட்டம் பற்றிய பேச்சே இல்லாமல் போய்விடும். அந்த நாளுக்காக நாங்கள் இன்றே - இந்தக் கணத்திலிருந்தே - உழைப்போம் என்று கேட்டு, என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු මාලනී ෆොන්සේකා මන්ත්‍රීතුමිය.

[අ. භා. 6.53]

**ගරු මාලනී ෆොන්සේකා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)
(The Hon. (Mrs) Malani Fonseka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උත්තරීතර සභාව තුළ අද දින පවත් වන හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයට කලාකාරිණියක හැටියට මටද සහභාගි වීමට අවස්ථාව ලැබීම ගැන මා අවංකවම සතුටු වනවා. ඒ ඇයිදැයි කියනවා නම් අපේ රටට -මාතෘ භූමියට- යම් උවදුරක්, මොන යම් හෝ පීඩාකාරි දෙයක් ඇති වන කාල වකවානුවක් එළඹුණු හැම අවස්ථාවකදීම ජාතියක, රටක පෙර ගමන්කරුවා යයි සැලකෙන කලාකරුවා පෙරමුණ ගත්තා. මහා සංහාරයක් වන විට සතුරා ඉදිරියට ගොස් මුහුණට මුහුණලා දැවැන්ත ලෙස සටන් කිරීමට නොහැකි වුවත්, සංවේදී මිනිසුන් පිරිසක් විධියට අඩුම තරමින් -හැකි පමණින්- දෙවියන් ඉදිරියේ හෝ කෑ ගසා, මොර දී රට බේරා දෙන ලෙස අහිංසකව කන්නලවු කරන්න වුවත් කලාකරුවන් හැටියට අපි පසුබට වුණේ නැහැ. මා මුලින් සඳහන් කළ පරිදි කලාකරුවන් හැටියට හැමෝම කරන්න පුළුවන් මොනම හරි දෙයක් කරන්න උත්සාහ කළා. සිනමා අධ්‍යක්ෂවරුන්, නිෂ්පාදකවරුන් ලාභයක් ලැබුණත්, නැතත් තමන්ගේ නිර්මාණ තුළින් මේ ශාප ලත් යුද්ධය ගැන කථා කළා. තිස් අවුරුදු යුද්ධයෙන් අනන්තයටම විනාශ වෙලා තිබුණු අපේ කර්මාන්තයේ අළු ගොඩ උඩ ඉඳ ගෙන හරි ඔවුන් මේ කාලකණ්ණි යුද්ධයෙන් අනාථ වන්නේ, විනාශ වන්නේ අපිම බව ලෝකයාට කියන්න උත්සාහ ගත්තා. ඒවා කොතෙක් දුරට සාර්ථක වුණාද, නැද්ද කියන කාරණයට වඩා අපි සිතිය යුත්තේ අපේ ඒ අහිංසක ව්‍යායාමය ගැනයි. මේ සියලුම බලවේග එක්තැන් වී අපේ ජීවිත කාලය තුළ අපට කිසි දිනක අත් විඳින්නට නොහැකි වේ යයි සිතූ ඒ ඓශ්වර්යවත් දේ සිද්ධ වුණා. යුද්ධය නිමා වුණා. යුද්ධයේදී සියලු ජාතීන්ට සිදු වූ වේදනාකාරී තුවාල දැන් ක්‍රමයෙන් සුව අතට හැරෙමින් පවතිනවා. මුළු ලෝකයම කළ යුත්තේ පුරා වසර තිහක් තිස්සේ සුව නොවූ, දැන් සුව වෙමින් පවතින ශ්‍රී ලාංකිකයන්ගේ වේදනාකාරී තුවාල ක්‍රමයෙන් සුව වන්නට හැරීම මිස ඒවා නැවත පෑරෙන සේ ජාතීන් අතර වෛරය, ක්‍රෝධය ඇති වන සේ පශ්චාත් මරණ පරීක්ෂණ පවත්වමින් එකිනෙකාට ඇඟිලි දිගු කිරීම නොවන බව මා කියා සිටිනවා.

මේ යුද්ධය ගැන නොයෙක් වාර්තා සපයන පුද්ගලයින් නොදන්නා, නොදැකපු අපට අමතක නැති සුළු සිද්ධීන් කිහිපයක් මම මේ ගරු සභාවේ දී මතක් කර සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් වශයෙන් මා පෙන්වා දෙන්නට කැමැතියි, අවසන් මෙහෙයුමේ දී අතර මං වූ අහිංසක, දමිළ කාන්තාවක් අපේ රණ විරුවන්ට වඳිමින් කළ එකම ඉල්ලීම. එය ජනමාධ්‍යවල විටින් විට ප්‍රචාරය වුණු බව මතක ඇතැයි මා සිතනවා. එම කාන්තාව හඬමින් කියා සිටියේ, "අනේ අපිව බේරා ගන්න, අපේ රජ්ජුරුවන්ට කියන්න අපිව බේරා ගන්න කියලා. මම මැරුණත් කමක් නැහැ. අපේ දරුවන්ට තුවාල වෙලා, ඒ ගොල්ලන්ව බේරා ගන්න, ඔවුන් ජීවත් වන්නේ අමාරුවෙන්" කියායි. ඉතින් මේ ආයාචනය තුළම ජාත්‍යන්තරයට කිව යුතු අවශ්‍ය සියලු දේ මැනවින් අන්තර්ගත වී තිබුණා. මානව හිමිකම් උල්ලංඝනය කරමින් වග කීමකින් තොරව අපේ හමුදාවන්

[ගරු මාලනී ෆොන්සේකා මහත්මිය]

හැසිරුණා යයි යමෙක් චෝදනා කරන්නේ නම් එයට එකම පිළිතුර මේ ආයාචනය තුළ ඇතැයි මා සිතනවා. "අල්-ජසීරා", "චැනල්-4" වැනි ආයතන ඒ සිදු වුණ දේ විකෘති කර පෙන්වද්දී, අපේ ජනමාධ්‍ය හා තොරතුරු සපයන්නන්ගෙන් මා මේ අවස්ථාවේ ඉල්ලීමක් කරන්න කැමැතියි, හැකි උපරිමයෙන්ම මෙවන් සිද්ධි ලෝකයා වෙත ගෙන යන්න කියා.

අන්ධ වූවන් ලෙස හැසිරෙන අන්තවාදින් වෙත ඔවුන්ගේ බුද්ධිය ස්පර්ශ වන ලෙස ඒ කාන්තාව පැවසූ දෙබස් උපශීර්ෂ - subtitle - දමා හරි ලෝකයාට පෙන්වන්නය කියා මා ඉල්ලා සිටිනවා. ත්‍රස්තවාදීන් ලෝක ජනමාධ්‍ය තුළත් තම ත්‍රස්තවාදයම පතුරවමින්, නැති දේවල් ඇති කර බොරු බේගල් හුවා දක්වමින් සම්පූර්ණ ක්‍රියාවලියම වෙනස් ආකාරයට ලොවට ප්‍රදර්ශනය කරනවා. මුදලට, ඩොලර්වලට ඕනෑම දෙයක් කරන ඒජන්තවරුන්ගේ උදවු ඇතිව ඔවුන් කළ කී දේවල්වල ප්‍රතිඵල මේ වන විටත් අපට විශාල වශයෙන් බලපෑම් එල්ල වන තරමට වැඩි වී තිබෙනවා. මම හිතන්නේ අපි මේ අවස්ථාවේදී වැඩි අවධානයක් යොමු කරන්නට ඕනෑ, රට තුළ තිබෙන ත්‍රස්තවාදය ගැන නොවෙයි, ලෝක ත්‍රස්තවාදය ගැනයි. අපට විරුද්ධව ලෝක ත්‍රස්තවාදය නැඟී ගෙන එන බවට අපට දැන් සාක්ෂි තිබෙනවා.

අපට තව එක් සිද්ධියක් තුළින් මේ මානුෂික මෙහෙවර ලෝකයා වෙත ගෙන යා හැකිය කියා මා යෝජනා කරනවා. අපි කලාකරුවන් හැටියට පසු ගිය කාලයේ උතුරේ යාපනය හා ඒ ආශ්‍රිතව නිර්මාණයන් බිහි කළා. ඒ එක් නිර්මාණයක යුද්ධයෙන් පසු ජන ජීවිතය සාමාන්‍ය අතට හැරී ඇති ආකාරයත්, අතිගරු ජනාධිපතිතුමා දමිළ ජනතාවට සහ අපට ලබා දුන් සාමය සහ ක්‍රමයෙන් කර ගෙන යන සංවර්ධනය ගැනත් අන්තර්ගත වුණා. එල්ටීටීඊ සංවිධානයේ සන්නද්ධ බල කායේ සිටි ගෝකුලම් නම් තරුණයා මෙහි රඟපානවා. හමුදා භාරයට පත් වී වවුනියාවේ පුනරුත්ථාපන කඳවුරකදී පුනරුත්ථාපනය වී පසු ගිය දා අපේ රංගන ශිල්පීන් සමඟ -අප සමඟ- ඔහු කරට කර රඟපෑවා. ඉතින් මම හිතනවා මීටත් වඩා දෙයක් ලෝකයාට අපි කිව යුතුද කියලා. අපි මේ නිදහසේ ජීවත් වන ක්‍රමය, අපි එකිනෙකා සමඟින් එකට ජීවත් වන ආකාරය මීට වඩා පැහැදිලිව ලෝකයාට පැවසිය යුතුයි. අපේ කලා ශිල්පීන් හැම කෙනෙක්ම නිර්මාණවලට දායක වී උතුරේ සැරිසරනවා. ඒ වාගේම නාට්‍ය සංදර්ශන, ටෙලි නාට්‍ය රූගත කිරීම් කරනවා. පුනරුත්ථාපනය වුණු දමිළ තරුණ තරුණියන් මේවාට එකතු වෙනවා. මේවා හැකි තාක් ජාත්‍යන්තරයට දැන ගැනීමට සැලැස්විය යුතුයි. පැය 24 පුරාම මේ රටේ වෙන දේ මේ රටේ ඉන්න අය නොවෙයි, ජාත්‍යන්තරයේ ඉන්න අය දැන ගත යුතුයි කියලා මා මේ වෙලාවේ සිතනවා. ත්‍රස්තවාදියකු විනාශ කළ අවස්ථාවේ ෂැම්පේන් බීලා සතුට පැතිරුවා සේ, අපිටත් අපේ රටේ ත්‍රස්තවාදියකු විනාශ කළ අවස්ථාවේ කිරි බත් කැල්ලක් කාලා සතුට සමරන්නට අයිතිය තිබෙන බව ලෝකයාට පෙන්විය යුතුයි. අප දැන් අවධානයෙන් සිටිය යුත්තේ රට තුළ තිබෙන ත්‍රස්තවාදය ගැන නොවෙයි, ජාත්‍යන්තරයෙන් ගොඩ නැඟෙන මේ තර්ජනය ගැනයි. මෙවන් වකවානුවකදී අප මවු බිම රැක ගන්නට හදිසි නීතිය ඉදිරියට ගෙන යා යුතු යැයි කියා මම යෝජනා කරනවා.

එමෙන්ම අප හැම දෙනාම අදහන ආගම් නාමයෙන්, ස්වභාව ධර්මයේ සත්‍යතාවේ නාමයෙන් මේ ජාත්‍යන්තර ත්‍රස්තවාදයට ඉක්මනින්ම පිළිතුරක් ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ අප හැම දෙනාගේම, කලාකරුවන් හැම දෙනාගේම ප්‍රාර්ථනයයි. හෙට දින අපි අධිෂ්ඨාන පූජාවක් පවත්වා මේ ප්‍රාර්ථනය කරන බව මම මේ වෙලාවේ සඳහන් කරන්නට කැමැතියි. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ස්තුතියි. මී ළඟට ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

[අ. භා. 7.01].

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක හදිසි නීති රෙගුලාසි අවශ්‍ය වන්නේ රටේ සාමාන්‍ය නීතිය, රටේ නීතිය හා සාමය පවත්වා ගැනීමට ප්‍රමාණවත් නොවන විටදීයි. යුද්ධය අවසන් වෙලාත් වසර දෙකක කාලයක් තිස්සේ හදිසි නීතිය පවත්වා ගෙන යන්නේ ප්‍රමාණවත් සාධාරණ හේතුවක් නැතුවයි කියන ස්ථාවරය එක්සත් ජාතික පක්ෂය දරනවා. ඒ නිසා දිගින් දිගටම හදිසි නීතිය දීර්ඝ කිරීමට එක්සත් ජාතික පක්ෂය විරෝධය පළ කරනවා.

රටේ සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම සතු රජය ඒ වගකීම ඉෂ්ට නොකර හදිසි නීති රෙගුලාසි මඟින් රට පාලනය කරන්නට උත්සාහ කිරීම එක අතකින් අතාර්කිකයි; එක අතකින් අසාධාරණයි; එක අතකින් අඥාන ක්‍රියාවක්. මේ රටේ යුක්තිය ඉටු කිරීම පිළිබඳ විශ්වාසයක් සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනාටම ජාති ආගම් කුල භේදයක් නැතුව මේ රට තුළ තහවුරු කරන එක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජයේ වග කීමයි. අපි නීතියේ ආධිපත්‍යය පිළිබඳ වටිනා සංකල්ප පිළිබඳව කථා කරනවා; ඉගෙන ගන්නවා. නීතියේ ආධිපත්‍යය තහවුරු කරන්න මූලධර්ම සහිත උත්තරීතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කර තිබෙනවා. රටක නීතිය හරියාකාරව ක්‍රියාත්මක වනවාද කියන කාරණය ගැන රට තුළ වාගේම ඒ රටේ ක්‍රියාකාරිත්වය පිළිබඳව විමසීමෙන් ඉන්න අන්තර්ජාතික ප්‍රජාවටත් පණිවුඩය ගෙන යන්නේ ඒ රට තුළ ඒ රටේ ආණ්ඩුව කරන කියන, හැසිරෙන ආකාරය අනුවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන කොට මේ රටේ පාලනය ක්‍රියාත්මක කරන්නේ මේ රටේ තිබෙන උත්තරීතර නීතිය හැල්ලු වන ආකාරයටයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව මඟින් අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ මූලික ප්‍රතිපත්ති සලසලා තිබෙනවා. අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම, යුක්තිය ඉටු වීම පිළිබඳව තිබෙන්නා වූ මූලික දර්ශකයක්. අද මේ ආණ්ඩුව තමන්ට මේ පාර්ලිමේන්තුව තුළ තිබෙන්නා වූ අසීමිත බලය උපයෝගී කර ගෙන මේ රටේ උත්තරීතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැල්ලුවට ලක් කරනවා; අධිකරණය හැල්ලුවට ලක් කරනවා. මේ රටේ අධිකරණයේත්, රාජ්‍ය සේවයේත් ස්වාධීනත්වය උදෙසා සියලු දෙනාගේම එකඟත්වයෙන් සකස් කරපු දහඟත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැල්ලු කරලා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ගෙනාපු මූලධර්ම අත් හැරලා දාපු මේ ආණ්ඩුව දැන් ලැහැස්ති වනවා, එක පුද්ගලයෙක් ගැන හිතලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැවතත් වෙනස් කරන්න. අද අපිට පුවත් පත්වල දකින්නට ලැබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව සංශෝධනය කරන්න යන බවට. අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් වන කවුරුන් හෝ චේවා වයස අවුරුදු 65 දක්වා යථා පැවැත්මෙන් සිටින කල් ධුරය දරනවායි කියන කාරණය 107 වන ව්‍යවස්ථාවේ දක්වා තිබෙනවා. ඒකේ තේරුම තමයි තමන්ගේ පූර්ණ ධුර කාලය හරියාකාරව වග කීමෙන් යුතුව ස්වාධීනව දරන්නට ශක්තිය ව්‍යවස්ථාවෙන් ලබා දී තිබෙනවාය යන්න. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජිත දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් අනාගතයේ අග විනිසුරු ධුරයට පත් වන්න ඉන්න තැනැත්තාගේ බලය සීමා කරන්න, ස්වාධීනත්වය සීමා කරන්න යනවා. අවුරුදු 65 දක්වා ධුරය දරන්න පුළුවන් ලෙසට සියලු දෙනාටම පොදුව තිබූ සීමාව, එක පුද්ගලයෙක් ගැන හිතලා අයින් කරලා අලුත් සීමාවක් ඇති කරන්න යනවා. එක පුද්ගලයෙක් ගැන හිතලා, මේ රටේ ව්‍යවස්ථාව තුළින් ආඥාදායකත්වයක් බිහි වන්න තිබුණු අවස්ථාව වළකපු ඒ සීමාවල්, දහඅටවන ආණ්ඩුක්‍රම සංශෝධනය මඟින් ඉවත් කළා. ඒ විධියටම දහනවවන සංශෝධනය මඟින් වසර පහක් පමණක් අග විනිසුරුකම දැරිය හැකියි කියන යෝජනාව

අරන් එන්න යනවා. මේක අනිවාර්යයෙන්ම මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය ගැන කරපු බරපතළ මැදිහත් වීමක්. එවැනි දෙයක් නොකරන්නයි කියලා ආයාචනය කරන්න කැමැතියි.

ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන ව්‍යවස්ථාවේ තිබෙනවා, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව වැදගත් වන්නා වූ තවත් ප්‍රතිපාදනයක්. මේ රටේ අධිකරණවල පරිපාලනය පිළිබඳව වග කියන්නේ, ස්වාධීනත්වය පිළිබඳව වග කියන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවයි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් ධුරය සඳහා කරන පත් කිරීම අධිකරණ සේවා කොමිසම විසින්ම කළ යුතු බවටයි දැන් තිබෙන ප්‍රතිපාදනය.

ඒ තත්ත්වය වෙනස් කරලා එම පත් කිරීමත් ජනාධිපතිවරයා විසින් කරන ලෙසට දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ප්‍රතිපාදන ගෙනෙන්නට යනවා. මේක මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ඉතාම බරපතළ අනතුරුදායක තත්ත්වයක්. මේ සංශෝධනයටත් වඩා අනතුර තමයි මේ සංශෝධනය තුළින් අධිකරණය කෙරෙහි මේ ආණ්ඩුවේ තිබෙන ආකල්පය දකින්නට පුළුවන් වීම. මේ පාර්ලිමේන්තුව තුළ තිබෙන අධික බලය පාවිච්චි කරලා මාසයෙන් මාසයට, අවුරුද්දෙන් අවුරුද්දට තමන්ගේ ආණ්ඩුවේ පැවැත්ම උදෙසා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ, යහ පාලනය පිළිබඳ මේ රටේ ජනතාව නීතියෙන් දිනා ගෙන තිබෙන අයිතිවාසිකම් පවා යටපත් කරන්න මේ ආණ්ඩුව පසුබට නොවන බවයි මේ යෝජිත සංශෝධනයෙන් පෙනෙන්නේ. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඊ ළඟට තව දෙයක් විශේෂයෙන් කියන්න කැමැතියි. යම් රටක නීතියේ ආධිපත්‍ය පිළිබඳ වැදගත්ම ලක්ෂණය තමයි පුද්ගලයාගේ තනතුරු, ජාතිය, ආගම, තරාතිරම බලන්නේ නැතිව නීතිය එක ලෙස ක්‍රියාත්මක වෙනවාද කියන කාරණය. අද මේ ආණ්ඩුව භාරයේ ඉන්න කුමරන් පත්මනාදන් -කේපී, හරියටම කිව්වොත් තර්මලිංගම් ෂන්මුගම් කුමරන්- ජාත්‍යන්තර පොලිසියේ -Interpol- වරෙන්තුවක් තිබෙන පුද්ගලයෙක්. Interpol Web අඩවියෙන් ලබා ගන්න පුළුවන් මේ වරෙන්තුව. ජාත්‍යන්තර පොලිසියේ වරෙන්තුකාරයෙක්ව තමන්ගේ අත් අඩංගුවේ නීතියට විරුද්ධව තියා ගෙන, ආණ්ඩුවේ අනීතික අවශ්‍යතා ඉෂ්ට කරන, රටේ අධිකරණය ඉදිරියට ඉදිරිපත් නොකරන ආණ්ඩුව සමාජයට දෙන පණිවුඩය තමයි රට තුළ යුක්තිය ඉටු කරන්න අවස්ථාවක් නැහැයි කියන එක. ඒ වාගේම ජෝර්ජ් මාස්ටර් වුණත්, දයා මාස්ටර් වුණත්, කරුණා වුණත් ඒ කවුරු වුණත් ගැන නිසියාකාර පරීක්ෂණයක් කරලා රටේ අධිකරණයක් ඉදිරියට ඉදිරිපත් කර නියම චෝදනා ඉදිරිපත් කරන්න ශක්තියක් තිබෙන නීතිපති දෙපාර්තමේන්තුවක් මේ රටේ නැහැ. ඒ නීතිපති දෙපාර්තමේන්තුව ජනාධිපතිවරයා වෙත පවරා ගෙන තිබුණු ස්වාධීනත්වයත් අඩ පණ කරපු මේ ආණ්ඩුවට මේ රට ඇතුළේ ජාති, ආගම් භේදයක් නැතිව පක්ෂ, කුල භේදයක් නැතිව යුක්තිය ඉෂ්ට කරන්න වුවමනාවක් නැති බව පෙනෙන්නේ දේශපාලන පක්ෂපාතකම් මත අධි චෝදනා ඉවත්කර ගැනීම් සහ දේශපාලන පක්ෂපාතකම් මත චෝදනා ඉදිරිපත් නොකර වැළකී තිබෙන නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අධිකරණ කටයුතු ගැන, මේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීම ගැන කරුණාකරලා සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කරන්න. සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කරලා අසමත් වනවා නම් තමයි හදිසි නීතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම හට ගන්නේ. මේ රට ඇතුළේ යහ පාලනය පිළිබඳ මූලධර්ම ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, මේ රට තුළ සාධාරණ යුක්තිය පිළිබඳ ලෝකය පිළිගත්ත, රට පිළිගත්ත මූලධර්ම ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, මේ යුද්ධයේදී ජීවිත පරිත්‍යාගයෙන් අප රට දිනා ගත්ත මේ රටේ රණ විරුවන්ගේ ශ්‍රේෂ්ඨ ජයග්‍රහණය ආපසු කරකවන්න අපි අන්තර්ජාතික බලවේගවලට අවස්ථාවක් දීමක් වෙනවා. ඒ අවස්ථාව නැවත සලසලා දෙන්න එපා කියන කාරණය ආයාචනය කරන්නට කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. දැන් සභානායක ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා.

[අ. භා. 7.11]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයට සහභාගි වූ ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ සියලුම මන්ත්‍රීතුමන්ලාට හා ඇමතිතුමන්ලාට මම ස්තුති කරන්නට කැමැතියි, විවිධ අදහස් රාශියක් ඉදිරිපත් කිරීම පිළිබඳව. අගමැතිතුමා සිය ආරම්භක කථාවේදී කිව්ව පරිදි හදිසි නීතිය අපි පුළුවන් තරම් දුරට ලිහිල් කරමින්, ජනතාව පීඩාවට පත් කරන වගන්ති ඉවත් කරමින් ඉතාම සුළු ස්වරූපයක් පමණයි හදිසි නීතිය තුළ අපි දැන් ඇතුළත් කරලා තිබෙන්නේ. ඒ ඉවත් කරන ලද හදිසි නීතියට අදාළ වගන්ති රාශියක් ගැන මම මීට පෙර පැවති විවාදයකදීත් මේ සභාව දැනුවත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා හදිසි නීතියෙන් මේ රට පාලනය කිරීමට අපේ බලාපොරොත්තුවක් නැහැ. දැන් අපේ අජිත් පෙරේරා මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, සාමාන්‍ය නීතිය යටතේ මේවා කරන්න කියලා.

මම අහන්නට කැමැතියි, හදිසි නීතිය යටතේ අපි නඩු කීයක් පවරා තිබෙනවාද කියලා. හදිසි නීතිය අපි අනවශ්‍ය ලෙස පාවිච්චි කරපු අවස්ථා පෙන්වා දෙන්න පුළුවන්ද? [බාධා කිරීමක්] ඒවා කතාවේදී කියන්න එපායැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කතා කියන්නන් වාලේ කියනවා විතරයි. ඒ ගරු මන්ත්‍රීතුමන්ලාට ඒවා පෙන්වා දෙන්නට තිබුණා. නීතියේ ආධිපත්‍යය කඩා දමමින්, යම් ආකාරයකින් ඒ නීති අබිබවා ගිහින්, හදිසි නීතිය උපයෝගී කර ගනිමින් අපි ජනතාවට හානිදායක යමක් කරලා තිබෙනවා කියලා පෙන්වන්නට විපක්ෂය අපොහොසත් වෙලා තිබෙනවා.

හදිසි නීතිය දීර්ඝ කිරීමේ ඇති වැදගත්කම පිළිබඳව කතා කරමින්, ඇයි අපට මෙවැනි අවශ්‍යතාවක් තිබෙන්නේ කියන කාරණය ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා. මේ රට රැක ගැනීමට වාගේම පසු ගිය කාලයේදී මේ රටේ සිදු වෙච්ච ඒ අවාසනාවන්ත සිද්ධීන් තවදුරටත් ඇති නොවීමේ පරමාර්ථයෙන් තමයි අපි මේ හදිසි නීතිය මේ ආකාරයෙන් දීර්ඝ කිරීමට අවසර ඉල්ලන්නේ.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමාත් තවත් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුත් කතා කරමින් කොමිෂන් සභා පත් කරලා නැහැ කියලා කිව්වා. ඒක වැරදියි. දැනටමත් අපි මානව හිමිකම් පිළිබඳව වූ කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව පත් කරලා අවසානයි. අද වන කොට රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අවශ්‍ය සාමාජිකයන්ගේ නම් යවා තිබෙනවා. ඒ නිසා ඒ අංශයෙන් මේ රජය දැනටමත් විශාල ඉදිරි පිම්මක් පැනලා තිබෙනවා. අපි හෙට අනිද්දා වන කොට කොමිෂන් සභා හතරක් පත් කරලා අවසන් කරනවා. ඉතිරි ඒවාත් ඉතා ඉක්මනින් පත් කරන බව රජය වෙනුවෙන් මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම අද මෙතුමන්ලා අතේ පත්තු වන දේවල් කිව්වා. යෝජිත දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගැන "ලංකාදීප" පත්තරේ තිබුණාය කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් ව්‍යවස්ථා සංශෝධනයක් කරන කොට ඒක කැබිනට් මණ්ඩලයට ගෙනැල්ලා, ඒ පිළිබඳව සාකච්ඡා කරලා, ඒ පිළිබඳව පනතක් සකස් කරලා තමයි ඉදිරිපත් කරන්නේ. එවැනි කිසිම සාකච්ඡාවක් අප අතර සිද්ධ වෙලා නැහැ. මේවා සිතින් මවා ගත්තු -මනඃකල්පිත- ප්‍රවෘත්ති. ඒ මනඃකල්පිත ප්‍රවෘත්ති පදනම් කරගෙන තමයි අද විපක්ෂය කතා කළේ. අද විපක්ෂයට කතා කරන්න තරම්වත් දෙයක් නැහැ. ඒ නිසා කොහොම හරි පත්තරයක ප්‍රවෘත්තියක් plant කරනවා. ඊට පස්සේ හරියට ඒක සිද්ධ වෙච්ච දෙයක් වාගේ ඒ ප්‍රවෘත්තිය ගැන පුළුවන් තරම් කතා කරනවා. නූපන් දරුවන් ගැන, කුසේ පිළිසිඳ ගත්තේවත් නැති දරුවන් ගැන කේන්දර හදන්න තමයි විපක්ෂය බලාපොරොත්තුවෙන් ඉන්නේ. ඒ වාගේම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා, ජනාධිපතිතුමා විසින් පත් කළ යුතුය කියලා සංශෝධනයක් ගෙනෙනවාය කියනවා. මේවා මනස්ගාත. පත්තරේ තිබුණාය කියනවා. මම හිතන විධියට විපක්ෂයම තමයි මේ අසත්‍ය ප්‍රවෘත්ති පත්තරයට දමලා තිබෙන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!
මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* MR. SPEAKER *took the Chair.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මම මේ කතා කරමින් සිටියේ දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් එනවා කියලා පත්තරයක පළ වෙලා තිබුණා කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියපු කාරණය ගැන. එහි කිසිම සත්‍යයක් නැහැ. ඒ වාගේම මේවා මනඃකල්පිත ප්‍රවෘත්ති මත පදනම් වුණු කතා බව ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ වාගේම අපේ ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා, "ආණ්ඩුවේ පැවැත්මට මේ හදිසි නීතිය ඕනෑලු" කියලා. ඒ කියන්නේ මෙතෙක් කල් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මේ ආණ්ඩුවේ පැවැත්ම ගෙනිහින් තිබෙන්නේ මේ හදිසි නීතියෙන්ද? අපට මේ රටේ ජනතාව ඡන්දය දුන්නා; විශිෂ්ට ජයග්‍රහණයක් අත් කරලා දුන්නා.

එක්සත් ජාතික පක්ෂයේ අයත් ඒ පක්ෂය දාලා ඇවිල්ලා ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහයෝගය දුන්නා. ඒ වාගේම ජනතාව මැතිවරණවලදී තමන්ගේ ජන මතය ප්‍රකාශ කරලා ඒ, ඒ දේශපාලන පක්ෂවලට හිමි විය යුතු තැන ලබා දුන්නා. සමහර ඒවා දේශපාලන කුණු කූඩයටත් දැම්මා. ඉතින් ඒකයි වුණේ. ඒ නිසා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මේ රජය ගෙන යන්නට හදිසි නීතිය වුවමනා නැහැ. මේ රටේ ජනතාව ශක්තිමත් ලෙස මේ රජය පිහිටුවලා, එය ආරක්ෂා කරලා, එය ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙනවා. පසු ගිය මැයි දිනයේ පෙළපාළිය දිහා බැලුවා නම්, ඒකට ආපු සෙනඟ දිහා බැලුවා නම්, ඔවුන්ගේ උද්යෝගිමත් ආකාරය දිහා බැලුවා නම් අපට පෙනී යනවා, මොන වාගේ සහයෝගයක් මේ රජයට තියෙනවාද කියන එක. කරුණාකර මෙන්න මේ දේශපාලන ප්‍රවණතාව තේරුම් ගන්න. ඒ බවත් මතක් කරමින්, හදිසි නීතිය තවත් මසකින් දීර්ඝ කිරීමේ යෝජනාව සම්මත කර ගැනීම සඳහා ඔබ සැමගේ සහයෝගය ඉල්ලා සිටිමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදී.***
***කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*வினா விடுக்கப்பட்டது.*
*குரல்களின்படி 'ஆம்' மேலோங்கிற்று என சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.*
*Question put.*
*MR. SPEAKER, having collected the Voices, declared that the "Ayes" had it.*

**ගරු ආර්. සම්පන්දන් මහතා**
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
Sir, I call for a Division.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, නමින් බෙදීමක් අවශ්‍යයි.

***පාර්ලිමේන්තුව මතු පළ වන අන්දමට-පක්ෂව 116 ; විරුද්ධව 23; යනුවෙන් බෙදුණේය.***
*பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 116; எதிராக 23.*
*The Parliament divided: Ayes 116; Noes 23.*

***පක්ෂව***
*சார்பாக*
*Ayes*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

ගරු ජීවන් කුමාරණතුංග මහතා
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon. Jeewan Kumaranatunga)

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු පියසේන ගමගේ මහතා
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

ගරු දයාශ්‍රිත තිසේරා මහතා
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සාලින්ද දිසානායක මහතා
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து)
(The Hon. Milroy Fernando)

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු ජගත් බාලසූරිය මහතා
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු රත්නසිරි වික්‍රමනායක මහතා
(மாண்புமிகு ரத்னசிறி விக்கிரமநாயக்க)
(The Hon. Ratnasiri Wickramanayaka )

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் )
(The Hon. Murugesu Chandrakumar )

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)

ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා
(மாண்புமிகு டபிள்யு.பி. ஏக்கநாயக்க)
(The Hon. W.B. Ekanayake)

ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු සරත් කුමාර ගුණරත්න මහතා
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)

ගරු සරණ ගුණවර්ධන මහතා
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)

ගරු අර්ල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)

ගරු බෂීර් සෙගු ඩාවුඩ් මහතා
(மாண்புமிகு பசீர் சேகு தாவூத்)
(The Hon. Basheer Segu Dawood)

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු දුමින්ද දිසානායක මහතා
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝමාල් පෙරේරා මහතා
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு சீ.பீ.டி. பண்டாரநாயக்க)
(The Hon. C.P.D. Bandaranaike)

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා
(மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன்)
(The Hon. Vinayagamoorthi Muralidaran)

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය
(மாண்புமிகு(திருமதி) நிரூபமா ராஜபக்ஷ)
(The Hon. (Mrs.) Nirupama Rajapaksa)

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera )

ගරු මුතු සිවලිංගම් මහතා
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

ගරු සී.ඒ. සූරියආරච්චි මහතා
(மாண்புமிகு சீ.ஏ. சூரியஆரச்சி)
(The Hon. C.A. Suriyaarachchi)

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)

ගරු ජයරත්න හේරත් මහතා
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු දිළුම් අමුණුගම මහතා
(மாண்புமிகு திளும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)

ගරු සිල්වෙස්ත්‍රි අලන්ටින් මහතා
(மாண்புமிகு சில்வேஸ்திரி அலன்றின்)
(The Hon. Silvastrie Alantin)

ගරු එම්.ටී. හසන් අලි මහතා
(மாண்புமிகு எம்.ரீ. ஹஸன் அலி)
(The Hon. M.T. Hasen Ali)

ගරු මොහමඩ් අස්ලම් මහතා
(மாண்புமிகு மொஹமட் அஸ்லம்)
(The Hon. Mohamed Aslam)

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා
(மாண்புமிகு வைத்திய கலாநிதி ரோஹண புஷ்பகுமார)
(The Hon. (Dr.) Rohana Pushpa Kumara)

ගරු හේමාල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஹேமால் குணசேக்கர)
(The Hon. Hemal Gunasekera)

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)

ගරු එම්.එස්. තව්ෆික් මහතා
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thowfeek)

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු මනූෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

ගරු පී. පියසේන මහතා
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
(மாண்புமிகு லக்ஷமன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்து புள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)

ගරු ජානක බණ්ඩාර මහතා
(மாண்புமிகு ஜானக பண்டார)
(The Hon. Janaka Bandara)

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු තාරානාත් බස්නායක මහතා
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க )
(The Hon. Tharanath Basnayaka)

ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා
(மாண்புமிகு ஏ.எம். சாமிக புத்ததாஸ )
(The Hon. A.M. Chamika Buddhadasa)

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

ගරු කමලා රණතුංග මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) கமலா ரணதுங்க)
(The Hon. (Ms.) Kamala Ranathunga)

ගරු රුවන් රණතුංග මහතා
(மாண்புமிகு ருவன் ரணதுங்க)
(The Hon. Ruwan Ranatunga)

ගරු රොෂාන් රණසිංහ මහතා
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)

ගරු පෙරුමාල් රාජදුරයි මහතා
(மாண்புமிகு பெருமாள் ராஜதுரை)
(The Hon. Perumal Rajathurai)

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுற விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க)
(The Hon. Neranjan Wickremasinghe)

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු නිමල් විජේසිංහ මහතා
(மாண்புமிகு நிமல் விஜேசிங்க)
(The Hon. Nimal Wijesinghe)

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

ගරු ආර්. දුමින්ද සිල්වා මහතා
(மாண்புமிகு ஆர். துமிந்த சில்வா)
(The Hon. R. Dumindha Silva)

ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු හුනෛයිස් ෆාරුක් මහතා
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon.Hunais Farook)

ගරු එම්. බී. ෆාරුක් මහතා
(மாண்புமிகு எம்.பி. பாறூக்)
(The Hon. M. B. Farook)

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය
(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)
(The Hon. (Mrs) Malani Fonseka)

*විරුද්ධව*
*எதிராக*
*Noes*

ගරු පී. අරියනේත්‍රන් මහතා
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

ගරු ටිරාන් අලස් මහතා
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Allas)

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

ගරු ජයන්ත කැටගොඩ මහතා
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

**ගරු රුවන් විජයවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana)

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

**ගරු ආර්. සම්පන්දන් මහතා**
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

**ගරු පොන්. සෙල්වරාසා මහතා**
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, සභාව තවදුරටත් පවත්වා ගැනීමට වේලාව,- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඡන්දය විමසීම පටන් ගත්තාම එය අදාළ වන්නේ නැහැ. එය මතක් කර දුන් එක හොඳයි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ. භා. 7.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.46ට, 2011 මැයි 06 වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 7.30 மணிக்குப் பிந்திவிட்டமையால் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப 7.46 மணிக்கு, பாராளுமன்றம் 2011 மே 06, வெள்ளிக்கிழமை பி.ப. 1.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 7.30 p.m., MR. SPEAKER adjourned Parliament without Question put.*

*Adjourned accordingly at 7.46 p.m. until 1.30 p.m. on Friday, 06th May, 2011.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### 1 වන ප්‍රශ්නය - 0181/'10

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නයට පිළිතුරු දීමට අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා සති දෙකක් කල් ඉල්ලා ඇත.

### 2 වන ප්‍රශ්නය - 0182/'10

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නයට පිළිතුරු දීමට අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා සති දෙකක් කල් ඉල්ලා ඇත.

**3 වන ප්‍රශ්නය - 0183/'10**

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නයට පිළිතුරු දීමට අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා සති දෙකක් කල් ඉල්ලා ඇත.

**4 වන ප්‍රශ්නය - 0184/'10**

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නයට පිළිතුරු දීමට අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා සති දෙකක් කල් ඉල්ලා ඇත.

**5 වන ප්‍රශ්නය - 0185/'10**

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නයට පිළිතුරු දීමට අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා සති දෙකක් කල් ඉල්ලා ඇත.

**6 වන ප්‍රශ්නය - 0186/'10**

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නයට පිළිතුරු දීමට අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා සති දෙකක් කල් ඉල්ලා ඇත.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.